සැ. යු.- මෙම අති විශේෂ ගැසට් පත්‍රයේ දෙමළ හා ඉංග්‍රීසි භෂාවන් වෙන වෙනම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1952/14 - 2016 පෙබරවාරි මස 02 වැනි අඟහරුවාදා - 2016.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත මහා නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය සමඟ කියවිය යුතු 1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා විනය, ඉඩම්, විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන, සංචාරක, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර අමාත්‍ය ක.වි. විග්නේශ්වරන් වන මවිසින් සාදන ලද මහා නගර සභාවන් සඳහා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා 1 සිට 6 දක්වා වූ අධිකාරයෙන් මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා, (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියට අදාලව උතුරු පළාතේ පළාත් සභාවේ තීරණය මගින් පිළිගෙන එකී අනුමැතිය *රජයේ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත්කළ විට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2(2) (අ) වන වගන්තියට අනුව උතුරු පළාතේ වූ මහා නගර සභාවන් එකී සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමට මෙයින් බලය ලබාදෙනු ලබන අතර ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 (2) (ආ) වන වගන්තියට අදාලව එකී අතුරු ව්‍යවස්ථාවන් හි කෙටුම්පත්වල අඩංගු විධිවිධාන ඇතුළත් අතුරු ව්‍යවස්ථා සෑදීමට මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 272 වන වගන්තිය සමග කියවිය යුතු 267 වන වගන්තිය මගින් උතුරු පළාතේ වූ මහා නගර සභාවන්ට බලය ලබා දෙනු ලැබේ.

ක. වි. විග්නේශ්වරන්,
ප්‍රධාන අමාත්‍යවරයා හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා විනය, ඉඩම්,
විදුලිබල, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන,
සංචාරක, පළාත් පාලන හා පළාත් පරිපාලන විෂයයන් භාර
අමාත්‍යවරයා.
උතුරු පළාතේ පළාත් සභාව.

2016 ජනවාරි මස 27 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
අංක 26, සෝමසුන්දරම් ඇවිනියු,
චුන්ඩුක්කුලි, යාපනය.

1A - PG 2823— 27 (2016/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1 වන අධිකාරය

*1 වන කොටස - මහා නගර සභාවේ සභා රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා මහා නගර සභා වල සභා රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. මහා නගර සභා රැස්වීම් නීතිරීති මාර්ගෝපදේශයට අනුවත්, ක්‍රියාදාමයට අනුවත් පැවැත්වීමට සංවිධානය කරන අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥාපනතේ 14 සිට 33 දක්වා වූ වගන්තින් හා 267(1) වන වගන්තිය සමඟ කියවිය යුතු 272(1)(ඊ) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

සාමාන්‍ය රැස්වීමක් හා විශේෂ රැස්වීමක්

4. (i) එක් එක් මාසයේ කලින් නියම කරගත් දිනයක හා වේලාවක දී මහා නගර සභාවක සාමාන්‍ය රැස්වීමක් මහා නගර සභා කාර්යාලයේ දී පැවැත්විය යුතුය. 1947 වසරයේ අංක 29 දරන මහා නගර සභා ආඥාපනතේ 17 වන වගන්තිය ප්‍රකාරව මාසයේ පළමු සතියේ හෝ ආසන්න එක් දිනයක දී නගරාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන එක් දිනයක සෑම මාසකටම එකක් බැගින් මාස 12ටම රැස්වීම් පැවැත්විය යුතු ය. එසේ කලින් නියම කරගත් දිනය 1971 අංක 29 දරන නිවාඩු පනත යටතේ රජයේ නිවාඩු දිනයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක එකී රැස්වීම ඊළඟ වැඩ කරන දිනයෙහි පැවැත්වීමට තීරණය කරන ලද සේ සැලකිය යුතුවාක් හැර එකී ඊළඟ වැඩ කරන දිනයෙහි පැවැත්විය යුතු ය. සෑම මාසික රැස්වීමක්, විශේෂ රැස්වීමක් කැඳවන දැන්වීම යැවීම සඳහා වූ උපදේශය අදාල කාලය තුළ නගරාධිපතිවරයා විසින් නාගරික කොමසාරිස්වරයා මගින් නාගරික ලේකම්වරයාට ලබාදිය යුතුය.

(ii) මහා නගර සභාවක සාමාන්‍ය රැස්වීමක් හෝ විශේෂ රැස්වීමක් කැඳවන දැන්වීම දෙමළෙන් හෝ සිංහලෙන් හෝ ඒ භාෂා දෙකෙන් ම විය යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවට අනුව රැස්වීමක් කැඳවන දැනුම්දීම යැවීමේ දැන්වීමට අනුව නාගරික ලේකම්වරයා විසින් අදාල න්‍යාය පත්‍රයත්, කැඳවීමේ දැන්වීමත් සභාවේ සියළුම සභිකයින් වෙත තැපෑලෙන් යවා තැබිය යුතු ය. තවද, මාසික රැස්වීමක් නම් කලින් මාසයේ කෙටුම්පත් රැස්වීම් වාර්තාවත් යවා තැබිය යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවට අනුව නගරාධිපතිවරයා විසින් ලබාදෙන උපදේශයන් නාගරික ලේකම්වරයා ප්‍රතික්ෂේප කිරීම හෝ කල් ප්‍රමාද කිරීම හෝ නොකළ යුතු ය. මහා නගර නගරාධිපතිවරයාගේ තීරණය මත හෝ අවම වශයෙන් මහා නගර සභා සභිකයින් තුන් දෙනෙකු විසින් ලිඛිතව කරන ලද ඉල්ලීමකට අනුව හෝ කවර හෝ කරුණක් සම්බන්ධව විශේෂ රැස්වීමක් කැඳවිය හැකි අතර එකී රැස්වීමේ දී සම්බන්ධ වූ කරුණ පමණක් සාකච්ඡා කිරීමට හැකි ය. වෙනත් කවර හෝ කිසිම හේතුවකට වෙනත් කරුණක් සම්බන්ධව සාකච්ඡා කිරීමට නොහැකි ය. යම් ඉල්ලීමක් ප්‍රකාරව පවත්වනු ලබන විශේෂ සභා රැස්වීමක් නගරාධිපතිවරයාට එකී ඉල්ලීම ලැබී දින 07ක් ඇතුළත ඉහත විධිවිධානවලට අනුකූලව පැවැත්වීම නගරාධිපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(iii) එක් එක් සාමාන්‍ය රැස්වීමක් පිළිබඳව, ඒ ඒ රැස්වීමේ න්‍යාය පත්‍රය සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින හැර (1901 වසරයේ අංක 21 දරන අර්ථ නිරූපන ආඥාපනතේ 8(3) වන ඡේදයට අනුව) එකී රැස්වීම පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින හතරකට කලින් එක් එක් සභිකයා වෙත භාරදිය යුතු ය. විශේෂ රැස්වීමක් වන්නේ නම් දින දෙකකට කලින් භාරදිය යුතු ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) සහ (iii) යන වගන්තිවල සඳහන් දැන්වීම යම් හේතුවක් නිසා පෞද්ගලිකව භාරදිය නොහැකි යම් අවස්ථාවක දී, එම දැන්වීම යොමු කරනු ලැබ ඇති

සභිකයා සාමාන්‍යයෙන් පදිංචි ස්ථානයේ තැබුවහොත් එය නිසිලෙස භාරදෙනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(v) (අ) යම් රැස්වීමක ගණපූරණය නැත්නම් එම රැස්වීමේ දී කටයුතු කිසිවක් නොකළ යුතු ය. මහා නගර සභාවක සාමාන්‍ය රැස්වීමක ගණපූරණය එම රැස්වීමේ දිනයේ දී ධුර දරන සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවක් විය යුතු ය. එම සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුව පූර්ණ සංඛ්‍යාවක් හා භාගයක් වන අවස්ථාවක එම පූර්ණ සංඛ්‍යාව හා භාගයට වැඩි ඊළඟ පූර්ණ සංඛ්‍යාව මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා තුනෙන් එක් පංගුව වශයෙන් සැලකිය යුතු ය.

(ආ) යම් රැස්වීමකට නියමිත වේලාවෙන් පසු පැය භාගයක් ඉකුත් වූ විට හෝ රැස්වීම ආරම්භ වීමෙන් පසු කවර වේලාවක හෝ ගණපූරණය නොමැති වන අවස්ථාවක, එම රැස්වීමේ සභාපතිවරයා විසින් එම රැස්වීම එම දිනයට පසු දින පහළොවකට පසු නොවන්නා වූ ද, ඔහු විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන්නාවූ ද දිනයක අඩාලව කල් තැබිය යුතු ය. එසේ අඩාලව කල්තබනු ලැබූ රැස්වීමේ දී ගණපූරණයක් තිබුණි නම්, එම රැස්වීමේ දී ඉදිරිපත් කළ හැකිව තිබූ කටයුතු පසුව පවත්වන රැස්වීමේදී ඉදිරිපත් කර ඒ සම්බන්ධව සුදුස්සක් කළ හැකි වන්නේ ය.

(vi) (අ) මහා නගර සභාවේ ගණපූරණයක් ඇති යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක නගරාධිපතිවරයා විසින් මහා නගර සභාවේ කැමැත්ත ඇතිව කලින් කල රැස්වීම අඩාලව කල් තැබිය හැකි යී එසේ අඩාලව කල් තැබීමට භාජනය වූ රැස්වීමේ න්‍යායපත්‍රයේ සඳහන් නමුත් නිම නොවී ඉතිරි වී ඇති කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක් එසේ පසුව පවත්වනු ලබන යම් රැස්වීමක දී මහා නගර සභාවේ අවසරය නොමැතිව නොකළ යුතු ය.

(ආ) අඩාලව කල් තබන රැස්වීම පැය විසිහතරක් ඇතුළත පැවැත්වීමට මුල් රැස්වීමේ දී තීරණය කළහොත් මිස, අඩාලව කල් තබන ලද රැස්වීමක් පිළිබඳ දැන්වීම එම රැස්වීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් දින තුනකට කලින් සභිකයින්ට භාරදිය යුතු ය.

(vii) මහා නගර සභාවේ රැස්වීම්වලට පැමිණි විට නාගරික ලේකම්වරයා භාරයේ ඇති පැමිණීමේ ලේඛනයක සියලුම සභිකයින් විසින් පැමිණි අනුපිළිවෙලින් තම නම, පැමිණි වේලාව සහ අත්සන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලේඛනය නාගරික ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු ය.

(viii) පුවත්පත් වාර්තාකරුවන් ඇතුළු අමුත්තන් සහ මහජනයා, සභා රැස්වීමක් පවත්වන ස්ථානයෙහි ඒ ඒ තැනැත්තන් සඳහා වෙන්කොට තිබෙන ස්ථානවල සිටිය හැකි ය. එහෙත් ඔවුන් මහජනයා සභා ගර්භයෙන් ඉවත් කිරීම මහජන යහපත සඳහා සුදුසු බව රැස්වීමට පැමිණ සිටින මහා නගර සභාවේ සභිකයින් බහුතර සංඛ්‍යාවක් විසින් යෝජනා සම්මුතියකින් ප්‍රකාශිත මතය වේ නම්, ඒ අනුව රැස්වීමේ සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඔවුන් සභා ගර්භයෙන් ඉවත්ව යා යුතු ය. අමුත්තන් වශයෙන් පැමිණි සිටින කවර හෝ තැනැත්තෙකු, සභාවේ වැඩ කටයුතුවලට කිසිම ආකාරයකින් සම්බන්ධ කර නොගත යුතු අතර කවර හෝ සභිකයෙකු එසේ පැමිණි සිටින කිසිම තැනැත්තෙකුව නම් කරමින් හෝ පෙන්නුම් කරමින් හෝ කථා නොකළ යුතුය.

5. මහා නගර සභා රැස්වීමේ වැඩ කටයුතු - රැස්වීම් කටයුතු කිරීමේ අනුපිළිවෙල

(i) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම;

(ii) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන;

(iii) මහා නගර සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම;

(iv) යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න;

(v) යථාපරිදි කල් දී ඇති යෝජනා;

(vi) කාරක සභාවල වාර්තා සභාව ඉදිරියේ තැබීම. එම වාර්තා එවෙලේ ම සලකා බැලීමට මහා නගර සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම සභාව විසින් කළ යුතු ය;

(vii) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ මහා නගර සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම;

(viii) රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා මහා නගර සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට කළ යුතු ය;
යන අනුපිළිවෙලින් කරගෙන යා යුතු ය.

සභික ජ්‍යෙෂ්ඨත්වය සහ ආසන වෙන් කිරීම

6. (i) මහා නගර සභාවේ සභිකයින්ගේ ප්‍රමුඛත්වය හා ජ්‍යෙෂ්ඨත්වය පිළිවෙලින් -
(අ) නගරාධිපතිවරයා,
(ආ) නියෝජ්‍ය නගරාධිපතිවරයා,
(ඇ) නැවත තෝරා පත්කර ගනු ලැබූ හිටපු සභිකයින් සම්බන්ධයෙන් වන විට මහා නගර සභාවේ ඔවුන්ගේ අඛණ්ඩ සභිකත්වයේ අනුපිළිවෙල අනුව, සහ
(ඈ) සෙසු සභිකයින් සම්බන්ධයෙන් වන විට ඔවුන් තෝරා පත්කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ද,
විය යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියේ (ඇ) වන උපවගන්තියේ සඳහන් කිසියම් සභිකයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ අඛණ්ඩ සභිකත්වය සමාන වන අවස්ථාවක දී, එකී සභිකයින් අවසන්වරට තෝරා පත්කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාව හා ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගතයුතු ය.

(iii) කිසියම් මහා නගර සභා ඡන්ද විමසීමකට පසුව එකී මහා නගර සභාවට සභිකයින් තෝරා පත්කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති ගැසට් නිවේදනයේ ප්‍රකාශිත ආකාරයට තෝරා පත්කර ගත් සභික සංඛ්‍යාවේ අනුපිළිවෙල අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා අදාල නොවිය යුතු ය.

නගරාධිපතිවරයාගේ කාර්යභාරය (7 - 11)

7. (i) රැස්වීමේ විනය ආරක්ෂා කිරීම, රැස්වීමක සභාපතිවරයාගේ කාර්යය විය යුතු අතර මතභේදයට ලක්වන සියලුම රීති ප්‍රශ්න පිළිබඳව ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(ii) රැස්වීමක දී මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන්ට පටහැනිව ක්‍රියාකරන කවර හෝ සභිකයෙකු අතුරු ව්‍යවස්ථානුකූල විය යුතු යැයි රැස්වීමේ සභාපතිවරයා විසින් ස්වකීය මෙහෙය වීමෙන් ම හෝ වෙනත් සභිකයෙකු විසින් රීති ප්‍රශ්නයක් මතු කිරීම මත නියෝග කළ හැකි ය.

8. තමා හෝ සභිකයින් විවාදයේ දී ඉදිරිපත් කළ තර්ක සභාව විඩාවට පත් කරමින්, නැවත නැවතත් අදාල නොවූ දේ ප්‍රකාශ කිරීමෙහි යෙදෙන සභිකයෙකුගේ හැසිරීම කෙරෙහි අවධානය යොමු කරවීමෙන් පසු, ඔහුගේ කථාව නවත්වන ලෙස රැස්වීමක සභාපතිවරයා විසින් විධාන කළ හැකි ය.

9. (i) බරපතල ලෙස විනය විරෝධීව හැසිරෙන සභිකයින්ට, මහා නගර සභාවේ සභා ගර්භයෙන් වහාම ඉවත්ව එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් ඉන් බැහැරව සිටින ලෙසට රැස්වීමක සභාපතිවරයා විසින් විධාන කළ හැකි ය.

(ii) මේ කොටසේ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ තමාගේ බලතල ප්‍රමාණවත් නොවන්නේ යැයි කිසියම් රැස්වීමක සභාපතිවරයා, යම් අවස්ථාවක දී අදහස් කරන්නේ නම්, ඔහු විසින් මේ කොටසේ 27 වන අතුරු ව්‍යවස්ථාවේ (iv) වන වගන්තියේ නියමයන් අනුව ක්‍රියා කරනු ලැබිය හැකිය.

10. යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කරනු ලබන සාකච්ඡාවක් අඩාලව කල් දැමීමට සභිකයෙකු විසින් කවර හෝ අවස්ථාවක යෝජනා කළ හැකි ය. එම යෝජනාව ස්ථිර කරනු ලැබුවහොත් ඒ පිළිබඳව වහාම ඡන්දයක් විමසිය යුතු ය. රැස්වීමක බරපතල විනය කඩකිරීමක් ඇති වූ විටෙක දී, රැස්වීම අඩාලව කල් තැබීම අවශ්‍ය යැයි රැස්වීමේ සභාපතිවරයා විසින් අදහස් කරනු ලබන්නේ නම්, අඩාලව කල් තැබීමේ ප්‍රශ්නය සභාවෙන් නොවිමසා ම, රැස්වීම ඔහු විසින් නියම කරන කාල සීමාවකට අඩාලව කල්තැබීම හෝ රැස්වීම අත්හිටුවීම කරනු ලැබිය හැකිය.

11. මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට පිළියෙල කළ රැස්වීමේ කටයුතු අනුපිළිවෙලට අදාල සියලු කටයුතු ඇතුළත් විය යුතු ය. කිසියම් සභා රැස්වීමක දී වෙනත් අනුපිළිවෙලක් සම්මත කරගෙන ඇත්තේ නම් මිස, 5 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අනුපිළිවෙල අනුව රැස්වීමේ කටයුතු කරනු ලැබිය යුතු ය.

නාගරික ලේකම්වරයාගේ වගකීම් සහ රැස්වීම් වාර්තා. (12 - 13)

12. (i) නාගරික ලේකම්වරයා විසින් මහා නගර සභාවේ රැස්වීම් වල කටයුතු, නියමයන් සහ තීරණ පිළිබඳ වාර්තා දෙමළෙන් හෝ සිංහලෙන් හෝ වාර්තා පොතක සටහන් කර තබා ගත යුතු ය.

(ii) සභා රැස්වීම්, ස්ථාවර කමිටු රැස්වීම් සහ පරිපාලන කමිටු රැස්වීම් පිළිබඳ වාර්තා, නාගරික ලේකම්වරයා විසින් පවත්වාගෙන ගනු ලැබිය යුතු අතර එම සභාවේ හෝ කාරක සභා රැස්වීම අවසන් වීමෙන් පසුව, හැකි ඉක්මනින් නගරාධිපතිවරයා හෝ මුලසුන දැරූ වෙනත් මහා නගර සභා සභිකයෙකු විසින් හෝ අත්සන් තැබිය යුතු ය. ඒ සමඟ ම එම වාර්තාවේ මුද්‍රිත පිටපත් හැකි ඉක්මනින් නාගරික ලේකම්වරයා විසින් පිළියෙල කිරීම් කළ යුතු ය.

(iii) එම වාර්තාවේ රැස්වීමට සහභාගී වූ මහා නගර සභා සභිකයින්ගේ නම් ද, සභාවේ දී හෝ කාරක සභාවේ දී විධිමත් ලෙස ගන්නා ලද සියළුම තීරණ ද, වාර්තා ගතව තිබිය යුතු ය.

(iv) යම් මන්ත්‍රීවරයෙකු රැස්වීම් ආරම්භ වීමෙන් පසුව රැස්වීමට සහභාගී වන්නේ නම්, ඔහු පැමිණි වේලාව වාර්තාවේ සටහන් කළ යුතු ය.

(v) යම්කිසි මන්ත්‍රීවරයෙකු රැස්වීම අවසන් වීමට පෙර රැස්වීමෙන් ඉවත් වන්නේ නම්, එම වේලාව ද වාර්තාවේ සටහන් කළ යුතු ය.

(vi) එක් එක් රැස්වීමක වාර්තාවක් ම, සභිකයින්ට ලබාදිය යුතු අතර ඊළඟ රැස්වීමේ දී වාර්තාව කියවන ලද ලෙස සලකා ස්ථිර කළයුතු බවට රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තා ගත කර ඇති පරිදි වූ වාර්තාව ස්ථිර කළ යුතු ය. නැතහොත් විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම්, ඒ නිවැරදි කිරීම් කවරේ ද, යන්න වාර්තාවට ඇතුලත් කළයුතු ය. අදාල වාර්තාවේ අවසානයේ නිවැරදි කිරීම් නැත්නම් ඒ බව ද නැතහොත් එකී නිවැරදි කිරීම් සටහන් කර ඒ නිවැරදි කිරීම්වලට යටත්ව වාර්තාව ස්ථිර කළ බවට සහතිකයක් රැස්වීමේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන වාර්තා සටහන් පොතේ තබා තහවුරු කරනු ලැබිය යුතුය.

(vii) සභා රැස්වීමේ දී සභිකයින් විසින් ප්‍රකාශ කරන ලද කරුණු සහ ප්‍රකාශයන් සභා වාර්තාවට ඇතුළත් නොකළ යුතු ය. එසේ වුව ද, කිසියම් සභිකයෙකු විසින් සභාවේ දී ඉදිරිපත් කරන ලද කරුණු හෝ ප්‍රකාශ පසුව දැනගැනීමට අවශ්‍ය වන්නේ යැයි මහා නගර සභාව

අදහස් කරන්නේ නම්, එකී සභා රැස්වීමේ හෝ රැස්වීම් වල කාර්යය පවත්වාගෙන යාම පිළිබඳ හඬපට වෙනම පිළියෙල කර මහා නගර සභාවේ ආරක්ෂිතව තබාගැනීම සහ සභිකයින් අතර බෙදාදීමට සැලැස්වීම කළ හැකි ය.

13. කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් එකඟ නොවන සභිකයෙකු එසේ එකඟ නොවීමට හේතු වාර්තා ගත කිරීමට බලය තිබිය යුතු අතර, ලියවිල්ලක් විය යුතු එම එකඟ නොවීම අදාල රැස්වීමෙන් එක් සතියක් ඇතුළත නාගරික ලේකම්වරයාට භාරදෙනු ලැබුවහොත්, නාගරික ලේකම්වරයා විසින් එකී රැස්වීමේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවේ එසේ එකඟ නොවීමට හේතු වූ කරුණු සටහන් කරනු ලැබිය යුතු ය.

කාරක සභා සහ විශේෂ කාරක සභා.(14 - 16)

14. (i) මහා නගර සභාව විසින් කවර හෝ අවස්ථාවක දී යෝජනා සම්මතයක් මගින් මුළු මහා නගර සභාවම කාරක සභාවක් බවට පරිවර්තනය විය හැකි ය. එසේ වුව ද, ඒ ආකාරයෙන් ම වන යෝජනා සම්මතයකින් ඒ කාරක සභාව නැවත මහා සභා අවස්ථාවකට පත්වීමෙන් පසුව එකී කාරක සභා අවස්ථාවේ සාකච්ඡා වූ කරුණු වල ප්‍රතිඵල ගැන මහා නගර සභාව විසින් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(ii) මුළු මහා නගර සභාවේ කාරක සභාවක යම් සාකච්ඡාවක් පවත්නා කවර හෝ අවස්ථාවක දී, මහා නගර සභාව මහා සභාවක් බවට නැවත පත්විය යුතු බවට කවර හෝ සභිකයෙකු විසින් යෝජනා කිරීමට බලය ඇත්තේ ය. මුළු මහා නගර සභාවේ කාරක සභාවේ රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය ගැන ඡන්දය විමසිය යුතු අතර, යෝජනාව සම්මත වුවහොත් මහා නගර සභාව වහාම කාරක සභා අවස්ථාවෙන් නැවත මහා සභාව බවට පත්විය යුතු ය.

15. (i) විශේෂකාරක සභාවක එක් එක් රැස්වීමකම ගණපූරණය එම රැස්වීම පැවැත්වෙන දින, ධුර දරන සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවක් විය යුතු ය. එම සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවක් පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන අවස්ථාවක එම පූර්ණ සංඛ්‍යාව සහ භාගයට වැඩි ඊළඟ පූර්ණ සංඛ්‍යාව මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා තුනෙන් එක් පංගුව සැලකිය යුතු ය.

(ii) විශේෂ කාරක සභාවක්, කිසියම් වාර්තාවකට එකඟ වී ඇති විටෙක, ඒ වාර්තාවට සියලු කාරක සභිකයින් විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර එකී විශේෂ කාරක සභාවේ කටයුතු ඇතුළත් වාර්තාව ද සමඟ මහා නගර සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(iii) ස්ථාවර හෝ විශේෂ කාරක සභා රැස්වීම් වලට පුවත්පත් වාර්තාකරුවන්ට ඇතුල්වීමට ඉඩ නොතිබිය යුතු ය.

(iv) මහා නගර සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ ස්ථාවර කාරක සභාවේ ලේකම්වරයා වශයෙන් නාගරික ලේකම්වරයා කටයුතු කළ යුතු අතර සෙසු ස්ථාවර කාරක සභා වල ලේකම්වරයා වශයෙන් කටයුතු කිරීමට මහා නගර සභාවේ යම් නිලධාරියෙකු පත්කිරීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ වගකීම විය යුතු ය.

(v) මහා නගර සභාවේ එක් එක් ස්ථාවර කාරක සභාවේ කටයුතු පිළිබඳ වාර්තා පවත්වා ගැනීම එකී ස්ථාවර කාරක සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු අතර එක් එක් කාරක සභාවේ වාර්තාව ඊට පසුව එළැඹෙන මහා නගර සභාවේ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

16. කිසියම් ස්ථාවර හෝ විශේෂ කාරක සභාවක රැස්වීම්වලට පැමිණි විට, එකී ස්ථාවර හෝ විශේෂ කාරක සභාවේ ලේකම්වරයා භාරයේ ඇති ලේඛනයක ස්ථාවර හෝ විශේෂ කාරක සභාවේ සියලුම සාමාජිකයන් විසින් පැමිණි අනුපිළිවෙලින් තම නම, පැමිණි වේලාව සහ අත්සන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලේඛනය ස්ථාවර හෝ විශේෂ කාරක සභාවේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු ය.

17. කිසියම් රැස්වීමක කටයුතු පිළිබඳව ගනු ලැබූ තීරණ හෝ සම්මතයන් සම්බන්ධයෙන් - යෝජනා (17 - 18)

(i) යෝජනාවක් සම්බන්ධයෙන් වන විට එකී යෝජනාව කුමක් ද යන වග;

(ii) යෝජනාව ඉදිරිපත් කළ සභිකයා සහ යෝජනාව ස්ථිර කළ සභිකයා කවරෙක් ද, යන වග;

(iii) යෝජනාවට පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් කළ සභිකයින් කවුරුන් ද, යන වග;

(iv) යෝජනාව සම්මත වීම හෝ ප්‍රතික්ෂේප වීම ඒකමතිකව සිදුවූයේ ද, නැතහොත්;

(v) යෝජනාව සම්බන්ධයෙන් ඡන්දයක් ඉල්ලා ඇති අවස්ථාවක දී එකී යෝජනාවට -

(අ) පක්ෂව ඡන්දය දුන් සභිකයින් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද යන වග;

(ආ) විපක්ෂව ඡන්දය දුන් සභිකයින් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද යන වග;

(ඇ) ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයින් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද යන වග;

සහ

(ඈ) රැස්වීමට පැමිණ ඇති සහ ඡන්දය විමසන අවස්ථාවේ දී සභා ගර්භයේ නොසිටි සභිකයින් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද, යන වග;

(vi) මහා නගර සභා රැස්වීමේ කටයුතු අනුපිළිවෙළෙහි වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් වන විට, එකී කරුණ පිළිබඳව සභාව විසින් ගනු ලැබූ තීරණය කුමක් ද යන වග,

එක් එක් යෝජනාව හෝ කරුණ සමඟ වාර්තාවට ඇතුළත් කළ යුතු ය.

18. (i) යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ සෑම දැන්වීමක් ම ලිඛිත විය යුතු අතර ඒ දැන්වීම කරන සභිකයා විසින් එය අත්සන් කර තිබිය යුතු ය. සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර මහා නගර සභාවේ රැස්වීමට කලින් දවස් හතක් ඒ දැන්වීම නාගරික ලේකම්වරයා භාරයේ තිබුණහොත් මිස, ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු ය.

(ii) යෝජනා පිළිබඳ සියලු දැන්වීම් ලැබෙන පරිදි දිනය සහ අංක යොදා ඒවා ලැබුණු අනුපිළිවෙලට නාගරික ලේකම්වරයා විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

(iii) යෝජනාවක් පිළිබඳ යම් දැන්වීමක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර නගරාධිපතිවරයා වෙත එය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය රීති විරෝධී බව ඔහුගේ මතය වේ නම්, ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු යැයි ඔහු විසින් නියම කර, ඒ දැන්වීම කළ සභිකයාට ඒ බව දැනුම්දීමට සැලැස්විය යුතු ය.

(iv) දැන්වීමක් මගින් කරනු ලබන සෑම යෝජනාවක් ම මහා නගර සභාවේ කටයුතු පරිපාලනය කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයකට අදාල විය යුතු ය.

(v) කලින් මාස හය තුළ සම්මත කරන ලද කිසිම යෝජනාවක් පරිච්ඡින්න කිරීම සඳහා වූ යෝජනාවක් හෝ කලින් මාස හය තුළ ප්‍රතික්ෂේප කරන ලද යෝජනාවකට සමාන ප්‍රතිඵල ගෙන දෙන වෙනත් යෝජනාවක් හෝ ඉදිරිපත් කිරීම, එය ඉදිරිපත් කරන බවට යෝජනා කරන සභිකයාගේ අත්සනට අමතරව තවත් සභිකයින් පහ දෙනෙකුගේ අත්සන් යෙදූ දැන්වීමක් කර, න්‍යාය පත්‍රයෙහි ඒ බව නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලට අනුකූල වන්නේ යැයි සලකනු නොලැබිය යුතු ය. ඒ යෝජනාව සම්බන්ධයෙන් සුදුසු කටයුතු කරනු ලැබීමෙන් පසු ඊළඟ මාස හයක කාල සීමාව තුළ ඒ හා සමාන යෝජනාවක් ඉදිරිපත් කිරීමට කවර හෝ සභිකයෙකුට බලය නොමැති විය යුතු ය.

(vi) කිසිම යෝජනාවක්, යෝජනා කර ස්ථිර කරනු ලබන තුරු විවාදය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(vii) කවර හෝ සභිකයෙකුට, සිය අසුනෙන් නැගී සිට මුලාසනයට හිස නමා ආචාර කිරීමෙන්, විවාදයේ පසු අවධියක දී කථා කිරීමට තමාට ඇති අයිතිවාසිකමට හානියක් නොමැතිව යම් යෝජනාවක් හෝ සංශෝධනයක් හෝ විධිමත් ව ස්ථිර කළ හැකි ය.

(viii) කල්තබා දැනුම් දී ඇති යෝජනා සම්බන්ධයෙන් ක්‍රියා කොට අවසන් වූ විගසම, කල් තබා දැනුම් දෙනු නොලැබූ කිසියම් යෝජනාවක් මහා නගර සභාවට ඉදිරිපත් කිරීමට සභාවේ අවසරය පතන යෝජනාවක් ඉදිරිපත් කිරීමට සභිකයෙකුට හිමිකමක් ඇත. එසේ වුව ද, යෝජක සභිකයා විසින් එය කලින් ලියා, අත්සන් කරනු ලැබ නාගරික ලේකම්වරයා වෙත භාරදිය යුතු ය.

(ix) යෝජනාවක් රැස්වීමකට ඉදිරිපත් කොට ස්ථිර කරනු ලැබ ඒ පිළිබඳව විවාදය අවසන් වූ පසු රැස්වීමේ සභාපතිවරයා විසින් ඒ යෝජනාව සම්මත කිරීම පිළිබඳව ප්‍රශ්නය විමසනු ලැබිය යුතු ය.

(x) කවර හෝ සභිකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් හෝ සංශෝධනයක් මහා නගර සභාව විසින් දෙන ලද අවසරය ඇති ව ඒ සභිකයා විසින් ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය. එම අවසරය විවාදයකින් තොරව ලබාදිය යුතු ය. කිසියම් යෝජනාවක් ඉදිරිපත් කරන්නා විසින් එවැනි අවසරයක් ඉල්ලා සිටීමෙන් පසුව, ඒ අවසරය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් මිස, ඒ යෝජනාව මත කථා කිරීමට කිසිම සභිකයෙකුට බලය නොතිබිය යුතු ය.

(xi) ඉල්ලා අස්කර ගනු ලැබූ යම් යෝජනාවක් පසුව පවත්වනු ලබන යම් රැස්වීමක දී නැවත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එනමුත් මෙම අතුරු ව්‍යවස්ථාවේ මාස හයක කාල පරිච්ඡේදය තුළ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන ලද යම් යෝජනාවකට සාරානුකූලව සමාන වන කිසිම යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(xii) (අ) යෝජනාවකට ගෙන එනු ලබන සෑම සංශෝධනයක් ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, යෝජනා කරන සභිකයා විසින් එකී ලිඛිත සංශෝධනය හෝ සංශෝධන නාගරික ලේකම්වරයාට භාරදිය යුතු ය.

(ආ) යෝජනාවකට ගෙන එනු ලබන එක් එක් සංශෝධනයක් ම, එය ඉදිරිපත් කරනු ලබන අවස්ථාවෙහි සාකච්ඡාවට භාජනව තිබෙන යෝජනාවට අදාල වන්නක් විය යුතු ය.

(ඇ) යෝජනාවකට ගෙන එනු ලබන එක් එක් සංශෝධනයක් ම, එය ඉදිරිපත් කිරීමට පෙර සභාවට කියවනු ලැබිය යුතු ය.

(ඈ) කිසිම සංශෝධනයක් ස්ථිර කරනු ලැබුවහොත් මිස, සාකච්ඡාවට භාජනය කිරීම හෝ මහා නගර සභාවට ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

(ඉ) සංශෝධනයක් විධිමත් ලෙසින් ස්ථිර කළ සභිකයෙකුට, ඊට පසුව ඒ ගැන කථා කිරීමට හිමිකම තිබිය යුතු ය.

(ඊ) සාකච්ඡාවට භාජනව පවතින යම් යෝජනාවකට සංශෝධනයක් යෝජනා කොට ස්ථිර කරනු ලැබ ඇති විට, පළමු වන සංශෝධනය සම්බන්ධයෙන් සුදුස්සක් කොට නිම වන තුරු, දෙවැනි හෝ ඊට පසුව කෙරෙන සංශෝධනයක් ඉදිරිපත් නොකළ යුතු ය. සංශෝධනයක් සම්මත වුවහොත් ඒ සංශෝධිත යෝජනාව මුල් යෝජනාවේ තැන ගත යුතු අතර තවදුරටත් කෙරෙන යම් සංශෝධන වේ නම්, ඒවා එම සංශෝධිත යෝජනාව සම්බන්ධයෙන් වන සංශෝධන විය යුතු ය.

19. (i) කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්මත කිරීම පිළිබඳව රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය විමසනු ලැබිය යුතු අතර, එසේ ප්‍රශ්නය විමසනු ලැබීමෙන් අනතුරුව කවර හෝ සභිකයෙකු විසින් ඒ පිළිබඳව ඡන්දයක් ඉල්ලා නොසිටියහොත්, ඒ යෝජනාව ඒකමතිකව සම්මත වූ ලෙස සැලකිය යුතු ය. එසේ වුව ද, එවැනි යෝජනාවක් සම්බන්ධයෙන් කිසියම් සභිකයෙකු විසින් ඡන්දයක් ඉල්ලා සිටින්නේ නම් හෝ රහස් ඡන්ද විමසීමක් ඉල්ලා සිටින්නේ නම් හෝ රැස්වීමේ සභාපතිවරයා විසින් ඡන්දය විමසීමට සලස්වනු ලැබිය යුතු ය. ඡන්ද විමසීම

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියේ සඳහන් ආකාරයෙන් කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්දය විමසීමක් අවශ්‍ය වන විටක -

(අ) එකී ඡන්ද විමසීම රහස් ඡන්ද විමසීමක් නොවන විට, නාගරික ලේකම්වරයා විසින් මේ කොටසේ 6 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සභිකයින්ගේ ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව එක් එක් සභිකයාගේ කැමැත්ත ඒ සභිකයාගෙන් වෙන් වෙන්ව අසා ඒ අනුව ඡන්දය සටහන් කිරීමෙන් ඡන්දය ගත යුතු ය;

*නැතහොත්*

(ආ) එකී ඡන්ද විමසීම රහස් ඡන්ද විමසීමක් වන විට, නාගරික ලේකම්වරයා විසින් එක් එක් සභිකයා වෙත වෙන් වෙන්ව නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකා මත ඒ සභිකයාගේ රහස් ඡන්දය සටහන් කරවා ගෙන ඒ අනුව ඡන්දය ගණන් ගැනීම කළ යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තියේ සඳහන් යම් ආකාරයකින් නාගරික ලේකම්වරයා විසින් ඡන්දය විමසීමෙන් අනතුරුව එකී කාරණය, ප්‍රශ්නය හෝ යෝජනාව සම්බන්ධයෙන් මහා නගර සභාව ගනු ලැබ සම්මතය රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(iv) මහා නගර සභාවේ දී හෝ මුළු මහා නගර සභාවෙන් ම සමන්විත කාරක සභාවේ දී හෝ යම් ප්‍රශ්නයක් විමසූ විට පැමිණ සිටින එක් එක් සභිකයෙකු ම තමන් ඡන්දය දීමෙන් වැළකී සිටින්නේ නම් මිස, ස්වකීය ඡන්දය පක්ෂව හෝ විපක්ෂව දිය යුතු ය.

(v) ඡන්දය විමසීමක් ඉල්ලා සිටින ලද අවස්ථාවක දී, කිසියම් සභිකයෙකු ඡන්දය දීමෙන් වැළකී සිටියහොත්, නාගරික ලේකම්වරයා විසින් එම සභිකයාගේ නම ඡන්දය දීමෙන් වැළකී සිටි සභිකයෙකු ලෙස වාර්තාවේ සටහන් කළ යුතු ය.

(vi) කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් මහා නගර සභාවේ හෝ මුළු මහා නගර සභාව ම කාරක සභාවක් බවට පත් ව ඇති විට හෝ අනෙකුත් සභිකයින් සමඟ පොදුවේ රැස්වීමේ සභාපතිවරයාට ද මුල් ඡන්දයක් තිබිය යුතු අතර, යම් ප්‍රශ්නයක් මත ඡන්ද ගණන සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඔහුට හිමි විය යුතු ය.

20. මේ කොටසේ 27 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තිය යටතේ සේවය අත්හිටවනු ලැබූ හෝ මේ කොටසේ 27 වන අතුරු ව්‍යවස්ථාවේ (iv) වන වගන්තිය යටතේ ඉවත්වන ලෙසට නියම කරනු ලැබූ සභිකයින් මහා නගර සභාවේ සභා ගර්භයෙන් වහාම ඉවත් විය යුතු ය. සභිකයින්ගේ රාජකාරී(20 - 21)

21. මහා නගර සභාව විසින් හෝ මුළු මහා නගර සභාවේ ම කාරක සභාවක් විසින් සලකා බලනු ලබන කාරණයක් සම්බන්ධයෙන් කථා කිරීමේ දී, පහත දැක්වෙන නියමයන් තරයේ පිළිපදිනු ලැබිය යුතු ය.

(i) රැස්වීමක දී එක් එක් සභිකයෙකු ම රැස්වීමේ සභාපතිවරයා අමතා කථා කළ යුතු අතර කාරක සභා අවස්ථාවේ දී හැර නැගී සිට කථා කළයුතු ය.

(ii) කවර හෝ සභිකයෙකු කථා කරන විට මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන්ට පටහැනි වුවහොත් මිස, ඔහුට බාධා කරනු නොලැබිය යුතු ය.

(iii) යම් සභිකයෙකු තම කථාව අවසන් වූ විට නැවත තම අසුනේ වාඩිවිය යුතු ය. එවිට සභාව ඇමතීමට කැමති වෙනත් සභිකයෙකු විසින් කථා කළ හැකි ය.

(iv) සභිකයෙකු විසින් ස්වකීය කථාව, සටහන් කරගත් කථාවක් ලෙස නොකියවිය යුතු ය. එසේ වුව ද, තමාගේ තර්ක සනාථ කිරීම පිනිස ලිඛිත හෝ මුද්‍රිත ලිපි වලින් උපුටාගත කොටස් ඔහු විසින් කියවිය හැකි ය.

(v) රැස්වීමක දී එකම වේලාවට සභිකයින් දෙදෙනෙකුට කථා කිරීමට අවශ්‍ය වුවහොත්, රැස්වීමේ සභාපතිවරයා විසින් සිය ඇස ගැටුණු පළමු වන සභිකයාට කථා කරන ලෙස දැනුම් දිය යුතු ය.

(vi) එක් එක් සභිකයෙකු විසින් ම සිය නිරීක්ෂණයන්, සැලකිල්ලට භාජනය වූ විෂයට පමණක් සීමා කළ යුතු ය.

(vii) කිසිම සභිකයෙකු විසින් තවත් සභිකයෙකු වෙත අනිසි චේතනා ආරෝපණය නොකළ යුතු ය.

(viii) පෞද්ගලික කරුණු සම්බන්ධ සියලු කථා වලින් වැළකී සිටිය යුතු ය.

(ix) සභිකයෙකු විසින් මහා නගර සභාව හමුවෙහි වූ ප්‍රශ්නය ගැන හෝ එහි යම් සංශෝධනයක් ගැන කථා කළ හැකි ය.

(x) රීති ප්‍රශ්නය ගැන සිය නිදහසට කරුණු කීමට අවශ්‍ය වන යම් අවස්ථාවක හෝ මහා නගර සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ අවස්ථාවක හේ විනා කිසිදු සභිකයෙක් මහා නගර සභාව ඉදිරියේ තිබෙන කාරණයක් ගැන එක් වරකට වඩා කථා නොකළ යුතු ය.

(xi) සභාව ඉදිරියේ ප්‍රශ්නයක් නොතිබුණ වුව ද, සභිකයෙකු විසින් මහා නගර සභාවේ කැමැත්ත ඇතිව පෞද්ගලික ස්වභාවයේ කරුණු පැහැදිලි කිරීමක් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, ඔහුගේ ක්‍රියා කලාපය නිදොස් කිරීම සඳහා පමණක්ම එකී කරුණු ඉදිරිපත් කිරීම සීමා කළ යුතු අතර ඒ කරුණු විවාදයට භාජනය නොකළ යුතු ය.

(xii) යම් යෝජනා සම්මතයක හෝ යෝජනාවක යෝජක විසින් පැමිණ සිටින සභිකයින් සියලු දෙනාට ම ඒ යෝජනා සම්මතය හෝ යෝජනාව ගැන මහා නගර සභාව ඇමතීමට අවස්ථාවක් ලබාදීමෙන් පසු සහ ප්‍රශ්නය සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රථම පිළිතුරු දීමක් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, ඔහුගේ කථාව කලින් කථා කළ කථිකයන්ට පිළිතුරු දීමට පමණක් සීමා කළ යුතු අතර විවාදයට අලුත් කරුණු ඉදිරිපත් කිරීමක් නොකළ යුතු ය. තවදුරටත්, එසේ ම පිළිතුරු දීමේ අයිතිය සංශෝධනයක යෝජකයාට හිමි නොවිය යුතු ය.

ප්‍රශ්න සහ පිළිතුරු.

22. (i) මහා නගර සභාවේ කටයුතු වලට අදාල ප්‍රශ්න සභාපතිවරයාගෙන් අසනු ලැබිය හැකි ය.

(ii) යම් ප්‍රශ්නයක් පිළිබඳව, ඉරිදා දින සහ රජයේ නිවාඩු දින හැර යටත් පිරිසෙයින් සම්පූර්ණ දවස් හතක කල් දීමක් කළ යුතු ය.

(iii) එක් එක් ප්‍රශ්නයට ලිඛිත පිළිතුරක් රැස්වීමක දී, රැස්වීමේ සභාපතිවරයා විසින් කියවිය යුතු ය.

(iv) යම් ප්‍රශ්නයක් මත කිසියම් සභිකයෙකු මහා නගර සභාව අමතා කථා නොකළ යුතු අතර, යම් ප්‍රශ්නයක දී පද මාලාවෙහි එම ප්‍රශ්නය පැහැදිලි කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට විනා කිසියම් තර්කයක් හෝ යම් චේතනාවක් ආරෝපණය කිරීමක් හෝ මත ප්‍රකාශයක් හෝ කරුණු කියාපෑමක් හෝ අන්තර්ගත නොවිය යුතු ය.

(v) රැස්වීමක දී පිළිතුරක් දී තිබෙන කාරණයක් හෝ සිද්ධියක් හෝ තවදුරටත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා කවර හෝ සභිකයෙකු විසින් පරිපූරක ප්‍රශ්නයක් නැගිය හැකි ය. එසේ වුව ද, තමාගේ මතය අනුව යම් පරිපූරක ප්‍රශ්නයකින් එකී ප්‍රශ්න වල විෂය කරුණු වලට අදාලව මෙම අතුරු ව්‍යවස්ථාවේ මීට ඉහතින් ඇති විධිවිධාන උල්ලංඝනය වේ නම්, ඒ ප්‍රශ්නය නැගීමට ඉඩ නොදීමට රැස්වීමේ සභාපතිවරයාට හැකි අතර එවැනි කවර අවස්ථාවක වුව ද, අදාල පරිපූරක ප්‍රශ්නය මහා නගර සභාවේ රැස්වීම් වාර්තාවෙහි සඳහන් නොවිය යුතු ය.

23. (i) පෙත්සමක් හෝ සංදේශයක් මහා නගර සභාව වෙත ඉදිරිපත් කරන යම් සභිකයෙකු විසින් ඒ පෙත්සමේ හෝ සංදේශයේ හෝ අරමුණ ලුහුඬින් ප්‍රකාශ කළ හැකි ය. පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

(ii) කවර හෝ සභිකයෙකු සමස්ත වශයෙන් ගෞරව පූර්වක ස්වරයකින් නොවන්නා වූ ද, ලියූ තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් නොවන්නා වූ ද, කිසිම පෙත්සමක් හෝ සංදේශයක් හෝ වෙනත් සංනිවේදනයක් හෝ මහා නගර සභාවට ඉදිරිපත් නොකළ යුතු ය.

(iii) පෙත්සමක් හෝ සංදේශයක් හෝ කියවිය යුතු යැයි කවර හෝ සභිකයෙකු විසින් යෝජනා කරනු ලැබිය හැකි ය. යෝජනාව ඉදිරිපත් කරන විට එය කියවිය යුතු යැයි අපේක්ෂා කරන්නේ කුමන හේතු නිසා දැයි ලුහුඬින් ප්‍රකාශ කළ යුතු ය.

(iv) ඒ යෝජනාව පිළිබඳ විවාදයකට ඉඩ නොදිය යුතු අතර යෝජනාව විධිමත් ව ස්ථිර කිරීම හැර පෙත්සම හෝ සංදේශය හෝ විෂය කොට ගෙන හෝ ඒ පිළිබඳව හෝ වෙනත් කිසියම් සභිකයෙකු කථා නොකළයුතු ය.

(v) එම යෝජනාව ස්ථිර කරනු ලැබූ විට, අදාල පෙත්සම හෝ සංදේශය හෝ කියවිය යුතු ද, යන ප්‍රශ්නය විමසිය යුතු ය.

(vi) මහා නගර සභවේ සභිකයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පෙත්සමක්, සංදේශයක්, පැමිණිල්ලක් හෝ වෙනත් ලියවිල්ලක් මහා නගර සභාවේ වෙනත් සභිකයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතු ය.

(vii) මහා නගර සභාවට ඉදිරිපත් කරන ලද පෙත්සමක් හෝ සංදේශයක් පිළිබඳව සුදුසු කටයුතු කිරීම සඳහා සභාපතිවරයාට හෝ ඒ පිළිබඳව අවසාන වශයෙන් කටයුතු කිරීම සඳහා වාර්තා කිරීමට කාරක සභාවකට හෝ යොමු කිරීමට සභිකයෙකු විසින් යෝජනා කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(viii) කාරක සභාවට, මහා නගර සභාවේ සභිකයින් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් සිටිය යුතු ය.

(ix) කාරක සභාවෙන් කරුණු විභාග කරනු ලැබ, එකී වාර්තාව සාමාන්‍ය රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

(x) විභාග කරනු ලැබූ වාර්තාව අවධානයට ගනු ලැබීම සඳහා සාමාන්‍ය රැස්වීම, කාරක සභා රැස්වීමට පරිවර්තනය කරමින්, මෙම වාර්තාව සම්පූර්ණයෙන් ම පරීක්ෂා කර බලා තීරණයක් ගත යුතු ය.

(xi) යම් සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විභාග කිරීමට අදහස් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම සාක්ෂි විභාගයට නියමිත දිනයට යටත් පිරිසෙයින් දින තුනකට පෙර එම සාක්ෂිකරුවන් අවශ්‍ය වන පෙත්සම්කරු හෝ සභිකයා විසින් එම සාක්ෂිකරුවන්ගේ නම්,පදිංචි ස්ථාන හා වෘත්තීන් ඇතුළත් ලැයිස්තුවක් නාගරික ලේකම්වරයාට භාරදිය යුතු අතර ඒ සාක්ෂි විභාග කිරීමට පැමිණසිටින ලෙස නාගරික ලේකම්වරයා විසින් එම සාක්ෂිකරුවන්ට ලිඛිතව දැනුම් දිය යුතු ය.

(xii) කැඳවන දැන්වීම්, එකී සාක්‍ෂිකරුවන් පැමිණිය යුතු නියමිත වේලාවට යටත් පිරිසෙයින් දින තුනකට කලින් සාක්‍ෂිකරුවන්ට භාරදිය යුතු හෝ ඔවුන් පදිංචි ස්ථාන වලට භාරදෙනු ලැබීම නාගරික ලේකම්වරයා විසින් කටයුතු කරනු ලැබිය යුතු ය.

(xiii) සභාවෙහි පෙත්සම සම්බන්ධව පළමු වතාවට සාකච්ජා කරනු ලැබූ දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත, පෙත්සම විභාග කරනු ලබන කාර්යයන් අවසන් විය යුතු ය.

ඉටු නොකළයුතු කාර්යයන් (24 - 27)

24. රීති ප්‍රශ්නයක් නැගීමෙන් පසු එය නැගූ සභිකයා අසුන් ගත යුතු අතර රැස්වීමේ සභාපතිවරයා විසින් ඒ ප්‍රශ්නය විසඳන තෙක් රැස්වීමේ සභාපතිවරයාගේ අවසරය ඇතිව මිස, වෙනත් කිසි ම සභිකයෙකු කථා නොකළ යුතු ය. ඊට පසු ප්‍රශ්නය මතු කළ වේලෙහි මහානගර සභාව අමතමින් සිටි සභිකයාට තමා රැස්වීමේ සභාපතිවරයාගේ, මහා නගර සභාවේ හෝ මහා නගර සභාවේ කාරක සභාවේ තීරණයට අනුකූල වන්නේ නම්, ස්වකීය කථාව නැවත කරගෙන යාමේ අයිතිය තිබිය යුතු ය. ඔහු එසේ අනුකූල නොවන්නේ නම්, ඔහුට කථාව නැවත කරගෙන යාමට ඉඩදීම ප්‍රතික්ෂේප කරනු ලැබීමට රැස්වීමේ සභාපතිවරයාට හැකි ය.

25. තමා විසින් පාවිච්චි කරන ලද නොනිසි වචන සම්බන්ධයෙන් කරුණු දැක්වීම හෝ එම වචන ඉල්ලා අස්කර ගැනීම හෝ එම වචන පාවිච්චි කිරීම ගැන මහා නගර සභාව සෑහීමකට පත්වන ආකාරයට ස්වකීය කණගාටුව පළ කිරීම නොකළ සභිකයෙකුට දොස් පැවරීම හෝ සුදුසුයැයි මහා නගර සභාව අදහස් කරන ආකාරයට ඔහු සම්බන්ධයෙන් කටයුතු කිරීම මහා නගර සභාව විසින් කළ හැකිය.

26. රැස්වීමක සභාපතිවරයා කථා කිරීමට කැමැත්ත පළකළ විට, එවේලෙහි කථා කරමින් සිටින යම් සභිකයෙකු වහාම සිය අසුනේ වාඩිවිය යුතු ය.

27. (i) මූලසානයේ අධිකාරය නොතකන හෝ මහා නගර සභාවේ වැඩ කටයුතු වලට නැවත නැවතත් හා ඕනෑකමින් ම බාධා කිරීමෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට පටහැනිව ක්‍රියාකරන යම් සභිකයෙකු, රැස්වීමක සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි අතර යම් සභිකයෙකු විසින් හෝ රැස්වීමේ නගරාධිපතිවරයා විසින්-එම සභිකයාගේ මහානගර සභා සේවය අත්හිටුවිය යුතු ය" යනුවෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය වහාම විමසිය යුතු ය. එවැනි යෝජනාවකට සංශෝධනයක් කිරීම, කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ නොතිබිය යුතු ය.

(ii) එවැනි යම් යෝජනාවක් සම්මත වී, මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ යම් සභිකයෙකුගේ සභා සේවය අත්හිටවනු ලැබුවේ නම්, ප්‍රථම වාරයේ දී ඒ අත්හිටුවීම එක් මාසයක් සඳහා ද, දෙවන වර කෙරෙන අත්හිටුවීම මාස දෙකක් සඳහා ද, තෙවන වර හෝ ඊටපසු යම් වරක දී කෙරෙන අත්හිටුවීම මාස තුනක් සඳහා ද විය යුතු ය.

(iii) පැමිණ සිටින සභිකයින්ගෙන් කීපදෙනෙකු එක්ව රැස්වීමක සභාපතිවරයාගේ අධිකාරය නොතකා ඇතොත් මිස, වරකට එක් සභිකයෙකුට වැඩි දෙනෙකු නම් කිරීම නොකළ යුතු ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සභා සේවය අත්හිටුවන ලද යම් සභිකයෙකු හෝ එක්ව ක්‍රියාකරන සභිකයින් කීපදෙනෙකු සභා ගර්භයෙන් ඉවත්වීමට රැස්වීමක සභාපතිවරයා විසින් කරන ලද විධානවලට අනුකූලවීම, එකී අත්හිටුවීමේ කාලය තුළ යම් අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරන්නේ නම්, ස්වකීය තීරණය ක්‍රියාත්මක නොකළ සභිකයෙකු වශයෙන් නම්කර සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා අමාත්‍යවරයා වෙත වාර්තා කළ හැකි ය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපනය හා නිර්වචන

''නගරාධිපතිවරයා'' යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්, මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේ ය.

''රැස්වීමේ සභාපතිවරයා'' යන්නෙන්, තත් කාලයේ දී මහා නගර සභාවේ රැස්වීමේ මූලාසනය දරන නගරාධිපතිවරයා හෝ ඔහුනොමැති යම් අවස්ථාවක රැස්වීමේ මූලාසනය දරන මහා නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස් වන අතර නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා නොමැති යම් අවස්ථාවක එදින රැස්වීමේ මූලාසනය සඳහා සභිකයින්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන වෙනත් කිසියම් සභිකයෙකු ද ඊට ඇතුළත් විය යුතු ය.

''මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා'' යන්නෙන්, මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර කිසියම් මහා නගර සභාවක තේරීම් භාර නිලධාරියා ද ඊට අතුළත් විය යුතු ය.

''හඬ පට'' යන්නෙන්, යන්ත්‍රානුසාරයෙන් පටිගත කරනු ලැබූ යම් හඬ ගබඩා කිරීමේ පටියක් අදහස් වන අතර, හඬ ගබඩා කළ හැකි සංයුක්ත තැටියක් හෝ හඬ දත්ත ගබඩා කළ හැකි වෙනත් යම් ආකාරයක උපකරණයක් ඊට ඇතුළත් විය යුතු ය.

***II වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා***

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ වන සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

අරමුණ

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන පරිසර දූෂණය වැළැක්වීම, මහජනයාගේ පිරිසිදු භාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම සම්මත අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥාපනතේ 267(1) වන වගන්තිය සමඟ කියවිය යුතු 272(14)වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

4. ඇමුණුම.01 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

ඉටු කළයුතු කාර්යයන් (4 - 25)

5. පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ කොණ්ඩා සකසන ස්ථානයකට, බාබර් සාප්පුවකට සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයකට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය.

(ii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(iii) ඉහත බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර නැතහොත් මතුපිට කොටස සිමෙන්තියෙන් ඔපදමා, තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල (සීලිමක්)සවිකර තිබිය යුතුඅතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක් වත් තිබිය යුතු ය.

(vii) එක් එක් කාමරයක ම ඇතුළත පොළොව, සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු අතර බිත්තිය සහ පොළොව සම්බන්ධ වන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතු ය.

(viii) එක් ගනුදෙනුකරුවකුට සේවා සැපයීම සඳහා වෙන් කරන ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 1.5කට නොඅඩුවන සේ එකවර සේවා සපයන ගනුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබියයුතු ය.

(ix) ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමේ දී, සේදීම සඳහා ජලය භාවිතා කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කළ අප ජලය ගලා යාමට ප්‍රමාණවත් ජලනල සවිකර තිබිය යුතු ය.

(x) මහා නගරසභාව විසින් අපජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙනයනු ලබන්නේ නම්, බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුව අපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතුඅතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතු ය.

(xi) බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ හා සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතුය.

(xii) බලපත්‍රලත් ස්ථානයේ ඇතුළත, නිවාසයක කාර්යය සඳහා යොදා ගැනීම නොකළයුතු අතර නිවාසය සඳහා යොදා ගන්නා කොටසෙන් වෙන් කර තිබිය යුතු ය.

(xiii) බලපත්‍රලත් ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ ක්‍රියාකාරී තත්වයෙන් සපයා තිබිය යුතු අතර එකී ස්ථානයට විදුලි සම්බන්ධතාව තිබේ නම්, අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ ද සවිකර තිබිය යුතු ය.

(xiv) ගොඩනැගිල්ලේ ඇතුළත පරිශ්‍රයේ ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යයි මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සියළුම ස්ථාන එලෙස ම අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් තීන්ත ආලේප කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ බිම අවම වශයෙන් මාසයකට එක් වතාවක්වත් විෂබීජ නාශක යොදා සෝදා හැරීම කළ යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන් සඳහා විවෘතව තබන සෑම අවස්ථාවකදී ම ප්‍රමාණවත් ජල සැපයීමේ පහසුකමක් සලස්වා තිබිය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ සේවය සැපයීමේ දී පාවිච්චි කරන උපකරණ සහ මෙවලම් ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුර වන ක්‍රමයක් හෝ ජීවානුහරණය ක්‍රමයක් සහ ජීවානුහරණය සඳහා භාවිතා කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබිය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩ කරගෙන යාමේ දී අත් සෝදා ගැනීමේ පහසුකම් සහිත බේසම් සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් හෝ වෙනත් ලා පාටකින් යුක්ත වන එහෙත් තද පාටින් යුක්ත නොවන තුවා සහ උඩුකය ආවරණය වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක් සපයා තිබිය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ කපන ලද කෙස් සහ වෙනත් අපද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසෙන පියනකින් යුත් එහා මෙහා ගෙනයා හැකි භාජන තිබිය යුතු ය.

13. බලපත්‍රලත් ස්ථානයේ විදුලියෙන් ක්‍රියාත්මක කරන උපකරණ යොදා ගන්නේ නම්, එක් ගනුදෙනු කරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි පේනු එකක් බැගින් සවිකර තිබිය යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ නාගරික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පෙට්ටියක් සපයා තිබිය යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ට සහ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට පහසුකමින් පාවිච්චියට ගත හැකි ආකාරයේ ප්‍රමාණවත් පඩික්කම් සපයා තිබිය යුතු ය.

16. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයෙකු ම-

(i) දිනපතා දිය නෑමෙන් හෝ ඇඟ සෝදා ගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවට;

(ii) අඳින ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් ඇති බවට;

(iii) නියපොතු කපා කුණුවලින් තොරව තබා ගන්නා බවට; සහ

(iv) එක් එක් ගනුදෙනුකරුවන් සඳහා සේවය කිරීමට පෙර, සබන් හෝ සබන් දියර ගා අත් සෝදා ගන්නා බවට;
සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

17. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා -

(i) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරණය කිරීම;

(ii) බුරුසු සහ පනා සෑම දිනයකම පාවිච්චියට ගැනීමට පෙර හොඳින් සෝදා පිරිසිදු කර ජීවානුහරණය කිරීම;

(iii) සියලුම පූකුරු, කෝප්ප සහ සබන් බුරුසු, පනා යනාදිය ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුවඋණුවතුරෙහි ගිල්වා සෝදා හැරීම;

සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

18. බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා එක් එක් ගනුදෙනුකරුවකුගේ ම -

(i) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් ඉවත් කරන කෙස්කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ විදුලිබලයෙන් ක්‍රියාකරන උරා ගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර, ඒ සඳහා වෙන්කළ භාජනයට දැමීම කරනු ලබන බවට;

සහ

(ii) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කර ගන්නා මාරු කළ හැකි දැළි පිහියේ තලය (බ්ලේඩ්) එක් එක් ගනුදෙනුකරුවෙකුට ම අළුතින් මාරු කරනු ලබන බවට;

සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

19. බලපත්‍රලත් ස්ථානයේ දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බඳුනේ ඇති දිරන අපද්‍රව්‍ය අවම වශයෙන් පොළොවෙන් මීටර් එකකට නොඅඩු ගැඹුරකින් වළ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය. එසේ ම ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය සුළඟේ ගසාගෙන යාම හෝ පරිසරය තුළ යම් ස්ථානයක විසිරී යාම වැලැක්වීමට ක්‍රියාකිරීම ද බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

20. බලපත්‍රලත් ස්ථානයේ රැස් කරන කෙස් කැබලි සහ වෙනත් අපද්‍රව්‍ය මේ කොටසේ 19 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවක දී මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් මහා නගර සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දීමට ක්‍රියා කළ යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අපද්‍රව්‍ය රැස්කිරීමේ භාජනය හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

22. බලපත්‍රලත් ස්ථානයේ ඇතුළේ විවෘතව පෙනෙන ස්ථානයක අයකරන ගාස්තු ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

23. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ අනන්‍යතාවත්, නමත්, ලිපිනයත් සටහන් කරන ලේඛනයක් බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යා යුතු ය. නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට අවශ්‍ය වන තැන්හි දී, පරීක්ෂා කිරීමට ඉඩ සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

24. බලපත්‍රලත් ස්ථානයේ බලපත්‍රලාභියා විසින් ''තමන්ගේ නමත්", -බලයලත් කොණ්ඩා සැකසීමේ ස්ථානය හෝ බාබර් සාප්පු හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානය" යන වාක්‍ය ත්‍රිවිධ භාෂාවෙන් ලියූ පුවරුවක් එකී ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

25. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටුනොකල යුතු කාර්යයන් (26 - 34)

26. අදාල නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගරසභා බල ප්‍රදේශය තුළ කොණ්ඩා සැකසීමේ ස්ථානයක්, බාබර් සාප්පුවක්, රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

27. (i) කවර හෝ තැනැත්තෙකු කොණ්ඩා සැකසීමේ ස්ථානයක හෝ බාබර් සාප්පුවක හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක කවර හෝ සතෙකු තබා ගැනීම හෝ එසේ තබා ගැනීමට ඉඩදීම නොකළ යුතුය.

(ii) බලපත්‍රලාභියා විසින් රෙදි සේදීමේ කාර්යය සඳහා අනුමැතිය නොලත් රසායන ද්‍රව්‍යයන් හෝ අහිතකර වන දෑ පාවිච්චි කිරීම නොකළ යුතුය.

28. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන් යටතේ බලපත්‍රලත් ස්ථානයක දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදාගන්නා හෝ ආහාරගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

30. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක -

(i) කවර ආකාරයෙන් හෝ ලේ නවත්වන පැන්සල් වර්ගයක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක්;

(ii) යම් ලේ ගැලීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයක් (එය කුඩු වශයෙන් හෝ ද්‍රව වශයෙන් ඇත්නම් මිස) කිසිම ගනුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම;

නොකළ යුතුය.

31. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩුකය ආවරණය වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමුවරට පාවිච්චි කරන තුවායක් නොවන කිසියම් තුවායක් හෝ උඩුකය ආවරණය වැස්මක්ව කවර හෝ ගණුදෙනු කරුවෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

32. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන් යටතේ බලපත්‍රලත් ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසර ඇත්තේ නම් මිස, නොකළ යුතුය.

33. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් කොණ්ඩා සැකසීමේ ස්ථානයක හෝ බාබර් සාප්පුවක හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක ඇතුළත ඒ සඳහා තබා ඇති පඩික්කම තුළ හැර වෙනත් ස්ථානයන්හි කෙළ ගැසීම නොකළ යුතු ය.

34. අනුමත කළ ස්ථානයේ රටේ නිතියෙන් තහනම් කළ නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් තහනම් කළ කිසිදු ද්‍රව්‍යයක්, උපකරණයක් පාවිච්චි කිරීම නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්ය්‍ය භාරය

35. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

36. (i) කිසියම් කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ (2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන වන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

(ii) මහා නගර සභාවෙන් පනවන වාර්ෂික බලපත්‍ර ගාස්තුව සම්බන්ධ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

37. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. — බලයපැවරීම

38. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය. — බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

39. (i) මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන්, අදාල කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. — පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය (39 - 41)

(ii) නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

40. මේ කොටසේ 35 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

41. මේ කොටසේ 40 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

42. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේ ය. — පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

43. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

44. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. — දඩ හා දණ්ඩන

45. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල ''නගරාධිපතිවරයා'' යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන — අර්ථ නිරූපනය හා නිර්වචන

වලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්, මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේ ය.

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය''යන්නෙන්, අදාල බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ට සේවය සපයන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''උඩුකය ආවරණය වැස්ම''යන්නෙන්, බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා කිසියම් ගණුදෙනුකරුවෙකුගේ උඩුකය ආවරණය කිරීමට පාවිච්චි කරන කිසියම් ආවරණ රෙද්දක් අදහස් වේ.

''කොණ්ඩා කපන ස්ථාන'' හෝ -බාබර් සාප්පු'' යන්නෙන් ස්ත්‍රීන්ගේ හෝ පුරුෂයන්ගේ කොණ්ඩා කැපීම, රැවුල කැපීම,රැවුල හෝ කොණ්ඩා සැකසීම, කොණ්ඩ පීරීම හා මුහුණ හා කොණ්ඩය ආශ්‍රිත සැකසීම සහිතව රූපලාවන්‍ය හැඩගැන්වීම කරනු ලබන ඕනෑම ස්ථානයක් අදහස් වේ.

ඇමුණුම.01

*මහා නගර සභා බල ප්‍රදේශය තුළ කොණ්ඩා සකසන ස්ථානයක්, බාබර් සාප්පුවක් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ව්‍යාපරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම් පත්‍රය - 20...වර්ෂය*

1. ව්‍යාපාරික ස්ථානයේ නම: ……………………………………………....…………………………….. 

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානය:
   (i) කොට්ඨාශය : ..………………… වරිපනම් අංකය:…………………………………
   
   (ii) වීථියේ/පාරේ නම ……………………………….
   
   (iii) ග්‍රාම නිලධාරී:- කොට්ඨාශ අංකය ………………කොට්ඨාශයේ නම ................................

3. අයදුම්කරුගේ ඃ

(i) සම්පූර්ණ නම ඃ ......................................

(ii) ස්ථිර ලිපිනය ඃ ......................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඃ ......................................

(iv) ජාතික හැඳුනුම්පතේ අංකය ඃ ......................................

(v) දුරකථන අංකය ඃ ......................................

(vi) විද්‍යුත් තැපැල් ලිපිනය ඃ ......................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය ඃ ......................................

(ii) ව්‍යාපාරයේ ස්වභාවය ඃ ......................................

(iii) ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/ නියෝජිතයාගේ ඃ

(a) නම ඃ ......................................

(b) දුරකථන අංකය ඃ ......................................

5.ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම්ඃ

(i) අයිතිකරුගේ නම ඃ ......................................

(ii) ලිපිනයඃ ......................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද ? ඔව්ඃ .............................. නැතඃ ................................

ඔව් නම්ඃ බලපත්‍රය අංකය .................. දිනය ඃ..................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරැදි බවත් සහතික කරමි. කර්මාන්තය/ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 ......................................වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

......................................

අයදුම්කරුගේ අත්සන

දිනය ඃ ......................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..............................................................

නාගරික කොමසාරිස්වරයා/බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයඃ ...................................... වරිපනම් අංකයඃ ......................................

වීථියේ/පාරේ නම ඃ......................................

අයිතිකරුගේ නම ඃ......................................

දේපලෙහි ස්වභාවය ඃ ......................................

වාර්ෂික වටිනාකමඃ…………… හිඟ වරිපනම් මුදලඃ………… ඇතඃ……………… නැතඃ …………………

………… ………………………
දිනය පරිපාලන නිලධාරී

**ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය : …………………………
ගෙවිය යුතු ගාස්තුව : …………………………
ඒකකය ABC …………………………
සටහන් : …………………………

……………………… ………………………
දිනය ආදයම් පරීක්ෂක

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්‍ෂකගේ වාර්තාව :
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

……………………… ………………………
දිනය මහජන සෞඛ්‍ය පරීක්ෂක

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

……………………… ………………………
දිනය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

**ප්‍රධාන ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුමඃ ……………………… ව්‍යාපාරයේ ස්වභාවයඃ………………… පාරිසරික බලපත්‍රඃ…………………………………………
MOH වාර්තාව……………………අනුකූලතා සහතිකය……………… …මත්පැන් බදු බලපත්‍රඃ…………………………………………

පහත සඳහන් හේතුන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………

…..................………… ………………………… 
දිනය ප්‍රධාන ආදයම් පරීක්ෂක

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

…..................………… ………………………… 
දිනය ගණකාධිකාරී

අනුමත කරමි. / නොකරමි.

…..................………… ………………………… 
දිනය නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**
ලදුපත් අංකයඃ…..................………… ලදුපත් දිනය ඃ…..................…………
බලපත්‍ර අංකය ඃ …..................………… බලපත්‍ර දිනය : …..................…………

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

…..................………… ………………………… 
දිනය ආදයම් පරිපාලන නිලධාරී

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

…..................………… ………………………… 
දිනය ගණකාධිකාරී

බලපත්‍රය අත්සන් කරන ලදී.

…..................………… ………………………… 
දිනය නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

## III වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ ආදාහනාගාර පවත්වාගෙනයාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීමහා ගාස්තු අයකිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

1. මහා නගර සභා බල ප්‍රදේශයේ ආදාහනාගාර විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. අතුරු ව්‍යවස්ථාවේ නාමය

අරමුණ

2. මහා නගර සභා ආඥා පනතේ 4 වනවගන්තිය ප්‍රකාරව, මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්ෂා කිරීමත්, පොදු පරිහරණ සේවා, නිශ්චල දේපල නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම යනාදි අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) වන වගන්තිය සමඟ කියවියයුතු 272(7) සහ (15) වන වගන්තින් යටතේ පොදු සුසාන භූමි, ආදාහනාගාර ආඥා පනතට අනුකූලව මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන් (4 - 7)

4. මේ කොටසේ 8 වන අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන අවසරපත්‍රයක් ලබාගැනීම අපේක්ෂා කරන (මෙහි මින්මතු -ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු, මෙහි පහත දැක්වෙන ලේඛන සමඟ මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) මියගිය තැනැත්තා සහ ඉල්ලුම්කරු අතර සම්බන්ධතාව තහවුරු කිරීමට අදාල කරගත හැකිවනු පිණිස -

(අ) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකය; හෝ
(ආ) මියගිය අයගේ උප්පැන්න සහතිකය; හෝ
(ඇ) ඉල්ලුම්කරුගේ විවාහ සහතිකය; හෝ
(ඈ) මියගිය තැනැත්තා පදිංචි වී සිටි කොට්ඨාශයේ ග්‍රාම සේවක නිලධාරියා විසින් නිකුත් කළ සහතිකය.

(ii) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, එකී පරීක්ෂණය පවත්වන ලද මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41 (ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර දෙමින් නිකුත් කළ සහතිකය හෝ අජීවී උපතකින් බිහිකළ මෘත ශරීරයක් නම්, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය;

සහ

(iii) මියගිය තැනැත්තාගේ මරණ සහතිකය.

5. සතියේ සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාර ගැනීම හා ආදාහනය කිරීම කළ හැකි ය. වෙනත් විකල්ප වේලාවක් තුළ මෘත ශරීරයක් ආදාහනයකිරීමටඅවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් විශේෂ අවසරයක් ලබාගෙන තිබිය යුතු ය. එක් දිනකට ආදාහනයකරනු ලබන උපරිම මෘත ශරීර ගණන සභාව විසින් තීරණය කර, ආදාහනාගාරයෙහි දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කළ යුතු ය.

6. (i) එක් එක් මෘත දේහයක්ම ආදාහනය කර පැය හැත්තෑ දෙකක් ගතවීමට මත්තෙන්, ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාරගත යුතු ය.

(ii) එසේ වුවද, ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තිය යටතේ භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබාගැනීමට දීර්ඝ කරන කාලය, ආදාහනය සිදු කළ දින සිට සති හයකට නොවැඩි විය යුතු ය.

(iv) එලෙස භස්මාවශේෂ ඉවත් කර ගැනීමට ඉඩදෙන ලද කාලය අවසන් වීමෙන් පසුව ද, ඉවත් කර නොගත් භස්මාවශේෂ බැහැර කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ ආදාහනාගාර භාරකරුට බලය තිබිය යුතු ය.

(v) කිසියම් ඉල්ලුම්කරුවකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් භාර නොගත් භස්මාවශේෂ, ආදාහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වළ දැමීමට කටයුතු සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය.

7. මේ කොටසේ 12 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද -

(i) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තෙකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු සමග එකී අවස්ථාවට සහභාගී වන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන්;

සහ

(ii) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භස්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර, අවසරපත්‍රය ලබාඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමඟ පැමිණෙන වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන්;

ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වීමට අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඉටුනොකල යුතු කාර්යයන් (8 - 13)

8. (i) නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් කවර හෝ නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසරපත්‍රයක් නොමැතිව, මහා නගර සභාවට අයත් කිසියම් ආදාහනාගාරයක කවර හෝ මෘතශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

(ii) විධිමත් අවසරපත්‍රයකින් ආදාහනය කිරීම සඳහා අවසර ලබාදී ඇති මෘත ශරීරයක්, එම අවසර දී ඇති වේලාව තුළ ආදාහනය කිරීම අත්හිටුවීම කළ හැක්කේ අධිකරණය විසින් හෝ පොලිස් ස්ථානාධිපතිවරයාගේ ලිඛිත නියෝගයක් මත පමණි. මෙහිදීවෙන් කරන ලද වේලාවට විකල්ප වේලාවක් ලබාදීමට හෝ ඒ වෙනුවට ගෙවන ලද ගාස්තුව ආපසු ගෙවීමට මහා නගර සභාව වගකීමටබැඳී නොමැති අතර, ආපසු ගෙවන මෙන් ඉල්ලා සිටීමට ඉල්ලුම්කරුට කිසිදු හිමිකමක්ද නොමැත.

9. මියගිය යම් තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ මහේස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදාහනය කිරීමට එකී මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘතදේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසරපත්‍රයක් නිකුත් කිරීම හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

10. මියගිය යම් තැනැත්තකුගේ මරණ සහතිකයේ 7 වැනි තීරුවේ -මරණයට හේතුව හා භූමදාන හෝ ආදාහනය කරන ස්ථානය" යන්නෙහි, මහා නගර සභාවේ අදාල ආදාහනාගාරය නම් කර සඳහන්ව ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාරගැනීම හෝ ආදාහනය කිරීමට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් අවසරපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

11. කිසියම් ආදාහනාගාරයක, ආදාහන කුටීරයට මෘත දේහය ඇතුල් කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් හැර වෙනත් යම් තැනැත්තෙකු ඇතුල්වීම නොකළ යුතු ය.

12. නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව කවර හෝ තැනැත්තෙකු යම් ආදාහනාගාර පරිශ්‍රයකට ඇතුල්වීම නොකළ යුතු ය.

13. යම් ආදාහනාගාර පරිශ්‍රයක් තුළ කවර හෝ තැනැත්තෙකු -

(i) සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,

(ii) ආදාහනාගාර පරිශ්‍රය තුළ ඇති මහා නගර සභාවට අයත් දේපල වලට අලාභහානි කිරීම හෝ එසේ කිරීමට තැත්කිරීම,

(iii) ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයකුගේ රාජකාරියට බාධා කිරීම,

(iv) ආදාහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම,

නොකළ යුතු ය.

මහා නගරසභාවේ කාර්ය භාරය (14 - 19)

14. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසරපත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍රයක් මත අවසරපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම්, එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙහි තුන්වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ලේඛනයක ලේඛනගත කිරීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛනය අයදුම්පත් භාරගන්නා මහා නගර සභාවේ කාර්යාලයේ පවත්වා ගෙන යා යුතු ය.

15. ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුව යම් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා භාර ගැනීමට තීරණයක කරන ලද්දේ නම්, මේ කොටසේ 20 වන අතුරු ව්‍යවස්ථාවට අනුව පනවන ලද නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසුව, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා වන අවසරපත්‍රය ඉල්ලුම්කරු වෙතනිකුත් කරනු ලැබිය යුතු ය. එකී අවසරපත්‍රයට අනුව ආදාහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය හා වේලාව එකී අවසරපත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

16. කිසියම් හේතුවක් මත ආදාහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාහෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතුවූ කරුණු ද සමඟ ඒ බව, වහාම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

17. එක් එක් ආදාහනාගාරයකම, ආදාහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් සිව්වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ලේඛනයක් ආදාහනාගාර භාරකරු විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

18. මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතු ය.

19. ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය සිදු කරන අවස්ථාවකදී සිදුවන කාර්මික දෝෂයක් හේතුවෙන් සුළු වේලාවක් තුළනැවත යථා තත්ත්වයට පත්කර ගත නොහැකි අවස්ථාවකදී, එම මෘත දේහය හෝ මෘත දේහයේ කොටසක් ගෞරවාන්විතව මිහිදන්කිරීමේ හෝ ආදාහනා කිරීමේ හිමිකම මහා නගර සභාව සතුවනු ඇත.

20. යම් ආදාහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදාහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් ත්‍රිවිධ භාෂාත්‍රයෙන්ම මෘතදේහ ආදාහනය සඳහා අවසරපත් නිකුත් කරන කාර්යාලයේ සහ ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම නගරාධිපතිවරයාගේ හෝ නාගරිකකොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතු ය.

21. (i) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබියහැකි අතර එවැනිම යෝජනා සම්මතයක් මගින් එකී ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකි ය. — අයකිරීම් හා ගාස්තු

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේඉහත (i) වන වගන්තිය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබියයුතු අතර ආදාහනාගාරය වෙන් කරවා ගැනීමට අයදුම්පත් භාරගන්නා ස්ථානයේ සහ ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම ද කළ යුතු ය.

(iii) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු මෙහි පළමුවැනි උපලේඛනයේ දැක්වෙන වර්ගීකරණය යටතේ පනවනු ලැබිය හැකි ය.

22. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තෘව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. — බලයපැවරීම

23. නිකුත් කළ අවසරපත්‍රයේ නිරූපිත වේලාවට හෝ ඊට පෙර මෘත දේහය ආදාහනාගාර භාරකරුට භාරදිය යුතු ය. එකී වේලාවට මෘත දේහය භාරදීමට ප්‍රමාදවීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තකුට සිදුවන යම් අපහසුතාවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් මහා නගර සභාව හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතු ය. කෙසේ වුව ද, නිකුත් කළ අවසරපත්‍රය නිකුත් කළ දිනට පමණක් වලංගු විය යුතු ය. — බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

24. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන්, අදාල කාලය තුළ ආදාහනාගාර පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. — පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

25. අවසරපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය. — පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

26. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

27. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. — දඩ හා දණ්ඩන

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - — අර්ථ නිරූපනය හා නිර්වචන

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම්

තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''ආදාහන කුටීරය" යන්නෙන්, ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය ද අදහස් වේ.

''ආදාහනාගාර පරිශ්‍රය" යන්නෙන්, සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය ද අදහස් වේ.

''ආදාහනාගාර භාරකරු" යන්නෙන්, තත් කාලයේ දී මහා නගර සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයෙකු ද අදහස් වේ.

''භෂ්මාවශේෂ" යන්නෙන්, යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන් ද අදහස් වේ.

''මෘත ශරීරය" යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තෙකුගේ සම්පූර්ණ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය හෝ යම් මෘත දේහයකින් කිසියම් කොටසක් ද අදහස් වේ.

පළමුවන උපලේඛනය

**21 (iii) වන අතුරු ව්‍යවස්ථාව**

***ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අයකරන ගාස්තු***

| | | රු. ශත. |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | ............ |
| 02. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට- | ............ |
| 03. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | ............ |
| 04. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | ............ |
| 05. | බල ප්‍රදේශය තුළ පදිංචි සමෘද්ධිලාභියකුගේ පවුලේ වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | ............ |
| 06. | බල ප්‍රදේශය තුළ පදිංචි සෘමද්ධිලාභියකුගේ පවුලේ වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | ............ |

මෙහි වැඩිහිටි අයෙකු නොවන අයෙකු යන්නෙන්, වයස අවුරුදු 12ට අඩු ළමයෙකු අදහස් වේ.

දෙවන උපලේඛනය

4 වන අතුරු ව්‍යවස්ථාව

(ඉදිරි පිටුව)

(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය.)

.................................... මහා නගර සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසරපත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම-

01. (i) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නමː- ....................................................................................................
(ii) ලිපිනයː- ....................................................................................................
(iii) ජාතික හැඳුනුම්පතේ අංකයː- ....................................................................................................
(iv) ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය හා නමː- ....................................................................................................

02. (i) මියගිය අයගේ සම්පූර්ණ නමː- ....................................................................................................
(ii) ස්ත්‍රී/පුරුෂ භාවයː- ....................................................................................................
(iii) පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනයː- ....................................................................................................
(iv) ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය හා නමː- ....................................................................................................
(v) ජාතික හැඳුනුම්පතේ අංකයː- ....................................................................................................

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධයː- ....................................................................................................
(තහවුරු කිරීමට 4 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියේ සඳහන් සහතිකය අමුණන්න.)

04. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනයː- ....................................................................................................
(මරණ සහතිකයේ පිටපත අමුණන්න)

05. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නමː- ....................................................................................................

06. මරණයට හේතුවː- ....................................................................................................

07. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, (4 වැනි අතුරු ව්‍යවස්ථාවේ. (ii) වන වගන්තියේ සහතිකය අමුණන්න.)

(i) පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරමː- ....................................................................................................
(ii) පරීක්ෂණය පැවැත් වූ දිනයː- ....................................................................................................
(iii) පරීක්ෂණ නිලධාරියාගේ නිගමනයː- ....................................................................................................
(iv) මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිලධාරියා අවසර දීතිබේ ද?ː- ....................................................................................................

08. ආදාහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව (කැමැත්තේ අනුපිළිවෙල අනුව)ː

| | *දිනය* | *වේලාව* | | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| (i) | 20........... | පැයː.................. | (i) | 20........... | පැයː.................. |
| (ii) | 20........... | පැයː.................. | (ii) | 20........... | පැයː.................. |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාර ගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාල සහතික අමුණා ඇත.

.....................................
අයදුම්කරුගේ අත්සන

දිනයː..............................

(පසු පිටුව)

**දෙවන උපලේඛනය**

.................................................................... මහත්මා/මහත්මිය/මෙනෙවිය
.................................................................................................

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

**මෘත දේහයක් ආදාහනය කිරීමට අවසරපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්‍ෂේප කිරීම.**

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසුපිටේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුව, අවසරපත්‍රයක් නිකුත් කිරීම පහත දැක්වෙන හේතු/හේතුන් මත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................
5. ..........................................................................................................................................

............................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියාගේ අත්සන

දිනය:......................

## 15 වන අතුරු ව්‍යවස්ථාව

ආදාහනාගාර භාරකරු,
........................................................ ආදාහනාගාරය.

**මෘත දේහයක් ආදාහනය කිරීමට නිකුත් කරන අවසරපත්‍රය.**

(අ) ..................................................................................... යන අයගේ මෘත දේහය20........................ ක් වූ .............................. මස .................................. දිනපෙරවරු/පස්වරු............................... ට.........................................................ආදාහනාගාරයේ දී ආදාහනය කිරීමට මෙයින් අවසර දෙමි.

(ආ) පසුපිට අයදුම්පත්‍රයේ දැක්වෙන තොරතුරු 6 වන අතුරුව්‍යවස්ථාවේ පරිදි ලේඛනයේ සටහන් කරන ලදී.

(ඇ) 20.............................. වන දින, අංක...................................... දරන ලදුපත මගින් රු........................ ක් අයකර ගෙන ඇත.

(ඈ) මේ අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 17 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාල ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදාහනය කිරීමට ක්‍රියා කරන්න.

(ඉ) අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය.....................................................වේ.

............................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියාගේ අත්සන

දිනය:......................

තුන්වන උපලේඛනය

*14 වන අතුරු ව්‍යවස්ථාව*

........................................................ මහා නගර සභාවේ ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසරපත්‍ර ලේඛනය

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා.හැ.පතේ අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | | | මහෙස්ත්‍රාත් /හදිසි මරණ පරීක්ෂක නියෝගයේ | | අවසරපත් අංකය | ලදුපතේ | | ආදාහනය සඳහා වෙන්කළ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අංකය | දිනය | නම | මරණකරුගෙස ඇති නෑකම | ලිපිනය | ජා.හැ.පතේ අංකය | යොමු අංකය | දිනය | | අංකය | මුදල (රු. ශත.) | දිනය | වේලාව |
| 01. | | | | | | | | | | | | | | | | | |
| 02. | | | | | | | | | | | | | | | | | |
| 03. | | | | | | | | | | | | | | | | | |
| 04. | | | | | | | | | | | | | | | | | |
| 05. | | | | | | | | | | | | | | | | | |

(සැ.යු.- ලේඛනයේ වම්පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරු වල ප්‍රමාණවත් ඉඩකඩක් ඇති කරගත යුතු ය.)

*සිව් වන උපලේඛනය*

*17 වන අතුරු ව්‍යවස්ථාව*

*............................................................ මහා නගර සභාවේ ආදාහනාගාරයේ ආදාහනය කරන ලද මෘත දේහ පිළිබඳ ලේඛනය*

| අනු. අංකය | මියගිය අයගේ නම | ජා.හැ.පතේ අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනයේ අනු අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | අවසර පත් අංකය | ලදුපතේ | | ආදාහනය සඳහා වෙන්කළ | | භෂ්මාවශේෂ ගෙන ගිය දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | නම | ජා.හැ.පතේ අංකය | | අංකය | මුදල (රු. ශත.) | දිනය | වේලාව | |
| 01. | | | | | | | | | | | | | | | |
| 02. | | | | | | | | | | | | | | | |
| 03. | | | | | | | | | | | | | | | |
| 04. | | | | | | | | | | | | | | | |
| 05. | | | | | | | | | | | | | | | |

(සැ.යු.- ලේඛනයේ වම්පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩකඩක් ඇති කරගත යුතු ය.)

---

## 2 වන අධිකාරය

### *1 වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ ආපන ශාලා, බත් කඩ, තේ කඩ, කෝපි කඩ හා මේ හා ආශ්‍රිත කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ ආපන ශාලා, බත් කඩ, තේ කඩ, කෝපි කඩ හා මේ හා ආශ්‍රිත කඩ පවත්වා ගෙන යාම නියාමනය කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. *(අතුරු ව්‍යවස්ථාවේ නාමය)*

2. මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *(අරමුණ)*

3. මහා නගර සභා ආඥාපනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272(22) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. *(අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන)*

4. ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේ ය. *(ඉටු කළයුතු කාර්යයන් (4 - 17))*

5. පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ ආපන ශාලාවකට, බත් කඩයකට, තේ කඩ, කෝපි කඩ හා මේ හා ආශ්‍රිත කඩයකට යනාදියට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය.

(ii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(iii) ඉහත බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු යග කෙසේ වුව ද, මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූල වන ලෙස සැලකිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල (සීලිමක්) සවිකර තිබිය යුතු අතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළු වල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය. කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර සණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතු ය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක් වත් තිබිය යුතු ය.

(vii) එක් එක් කාමරයකම බිම් කොටස, සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් (බිම් ගඩොල්) අල්ලා තිබිය යුතුය.

(viii) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(xi) මුළුතැන්ගෙය තුළ තබන භාජන වලට මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(x) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මේ කොටසේ 11 වන අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(xi) බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති හා මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන එක් එක් මේසයක් ම,

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේප කර තිබිය යුතු අතර එකී මේසය මතුපිට ඔප දැමූ ජලය අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔප දැමූ ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(xii) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xiii) බලපත්‍රලත් ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(xiv) ගනුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(xv) ගනුදෙනුකරුවන්ගේ හා සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වන සේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය. එලෙස වූ වැසිකිළි හා කැසිකිළි මුළුතැන්ගෙය, ආහාරපාන පිළිගන්වන ස්ථාන නැතහොත් ගබඩා කාමර යනාදිය සමඟ සෘජුව සම්බන්ධ නොවන ආකාරයෙන් සෞඛ්‍යය රකින ආකාරයෙන් වූ දුරකින් තනා තිබිය යුතු ය.

(xvi) එක් එක් වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් තැනූ බිත්ති වන විට, ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා තීන්ත ආලේප කර තිබිය යුතු ය. මල නොබැඳෙන ලෝහ තහඩු වලින් තැනූ බිත්ති වන විට, ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය. බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(xvii) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (xvi) වන වගන්තියේ සඳහන් වැසිකිළි වලට අදාල නියමයන් එකී නාන කාමර වල බිමට සහ බිත්ති වලට අදාල විය යුතු ය.

(xviii) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චි කරන ජලය සියළුම කාමර වලට ආරක්ෂාකාරී අන්දමින් නල මගින් ලබාදීමේ පහසුකම් සලස්වා තිබිය යුතු ය.

(xix) බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ, ගනුදෙනුකරුවන්ගේ අත්, කට සේදීමට පහසුකම් සලස්වා තිබිය යුතු අතර මල නොබැඳෙන ලෝහ තහඩු වලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(xx) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය කවර හෝ කොටසක අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇති කර තිබිය යුතු ය.

(xxi) මහා නගර සභාව විසින් අපජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන්නේ නම්, බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුව අපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතු ය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතු අතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතු ය.

(xxii) බලපත්‍රලත් ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ ක්‍රියාකාරී තත්වයෙන් සපයා තිබිය යුතු අතර එකී ස්ථානයට විදුලි සම්බන්ධතාව තිබේ නම්, අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ ද සවිකර තිබිය යුතු ය.

(xxiii) බලපත්‍රලත් ස්ථානයේ තේ, කෝපි, කිරි හෝ වෙනයම් පාන වර්ගයන් පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසකට ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළයුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ජලයෙන් සෝදා, පිරිසිදු කිරීම කළ යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ ඇති නාන කාමර, වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීමට, ප්‍රදර්ශනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක්ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර හා පාවිච්චි කිරිමෙන් පසුව සබන් හෝ සබන් දියර පාවිච්චි කරමින් පිරිසිදු ජලයෙන් සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළමේ කොටසේ 12 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කළ යුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර, අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

12. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවහායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්, ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය.

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජන වලට හෝ ටැංකි වලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ii) ඉහත :(i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජන වල හෝ ටැංකි වල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

13. එක් එක් බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. ගනුදෙනුකරුවන් විසින් ඇණවුම් කරන ලද ආහාර පිළිගැන්වීමේ දී, ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ අඬුවක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් සුදුසු ආකාරයේ උපකරණයක් යොදා ගත යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම්, පිරිසිදු සුදු පාටින් වූ කමිස (ඒප්‍රන්), හිස් වැසුම් (තොප්පි) යනාදි වෙනත් අවශ්‍ය ආරක්ෂිත පිළිවැසුම් සපයා තිබිය යුතු ය. ඒ සමඟම කාර්යයේ නියුක්ත වන එක් එක් සේවකයෙකු ම, සෑම අවස්ථාවක ම කාර්ය්‍ය ආරම්භ කිරීමට පෙර හොඳින් ඇඟපත සේදීම මගින් නැතහොත් නෑම මගින් ශරීරය පිරිසිදු කරමින්, එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත එක් එක් සේවකයෙකු සඳහා ම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ ආපන ශාලාවක්, බත් කඩයක්, තේ කඩයක්, කෝපි කඩයක් හා මේ හා ආශ්‍රිත කඩයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය. ඉටු නොකළ යුතු කාර්යයන් (18 - 23)

19. (i) බලපත්‍රලත් ස්ථානයේ ආහාර පිළියෙල කිරීම හෝ පිළිගන්වන කාර්යයන් වල නියුක්ත වන කවර හෝ සේවකයෙක් සෞඛ්‍යයට අහිත කර වන නැතහොත් අප්‍රිය වන කිසියම් කාර්යයක නියුක්තවීම නොකළ යුතු ය.

(ii) කවර හො සේවකයෙකු ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියා කරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීම හෝ නොකළ යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

21. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

22. කවර හෝ බලපත්‍රලාභියෙකු මේ කොටසේ 24 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් මිළ දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

23. (i) 1980 වසරේ 26 වන අංකය දරන ආහාර පනත යටතේ 1991.08.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් (අති විශෙෂ) පළ කරන ලද පහත 01 වන උපලේඛනයෙන් දක්වා ඇති කිරි වලට අවශ්‍ය කරන අවම වශයෙන් යම් ද්‍රව්‍යයක් එකතු නොකළ බාල කළ කිරි, කිරි ද්‍රව්‍යයන් කිසිවක් කවර හෝ බලපත්‍රලාභියෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය.

(ii) කවර හෝ බලපත්‍රලාභියෙකු ස්ථානයක මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු නැතහොත් නරක් වූ සම්පූර්ණ යොද සහිත කිරි කිසිවක් තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය.

24. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක නිෂ්පාදනය කරන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක් පරීක්ෂණ අරමුණ සඳහා එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. මහා නගර සභාවේ කාර්යභාරය (24 - 25)

25. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් ආපන ශාලාවක්, බත් කඩයක්, තේ කඩයක්, කෝපි කඩයක් හා මේ හා ආශ්‍රිත කඩයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

26. කිසියම් ආපන ශාලාවක්, බත් කඩයක්, තේ කඩයක්, කෝපි කඩයක් හා මේ හා ආශ්‍රිත කඩයක් පවත්වා ගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

බලය පැවරීම

27. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

28. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (29 - 32)

29. මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

30. මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතු ය.

31. මේ කොටසේ 25 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

32. මේ කොටසේ 31 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේ ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

33. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

34. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

දඩ හා දණ්ඩන

35. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා

ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

36\. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපනය හා නිර්වචන

''නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්, මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේ ය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''ආපන ශාලාව හෝ බත් කඩය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් අදහස් වන අතර ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය. ''තේ හෝ කෝපි කඩය"යන්නෙන්, බේකරි නිෂ්පාදන හෝ වෙනත් කෙටි ආහාර සමඟ නැතහොත් ආහාර නොමැතිව තේ හෝ කෝපි හෝ ඒ ආශ්‍රිත බීම වර්ග පිළියෙල කර විකිණිම සඳහා පවත්වාගෙන යනු ලබන ස්ථානයක් යනුවෙන් අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

**උපලේඛන 01 - කිරි වල සංයුතිය**

| *I වන තීරය*<br>*කිරි වර්ගය* | *II වන තීරය*<br>*කිරි වල නාමය* | *III වන තීරය*<br>*ක්ෂීර මේදය*<br>*අවම ප්‍රතිශතය* | *IV වන තීරය*<br>*ක්ෂීර මේදය*<br>*හැර ක්ෂීර ඝණද්‍රව්‍ය*<br>*අවම ප්‍රතිශතය* |
|---|---|---|---|
| 1. මීකිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත | 7.0 | 9.0 |
| 2. එළකිරි | එම | 3.5 | 8.5 |
| 3. ප්‍රමිත කළ | පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත | 3.25 | 8.25 |
| 4. සකස් කළ | එම | 2.0 | 8.5 |
| 5. රස කළ | එම | 2.0 | 7.2 |
| 6. යොදය රහිත හෝ මේදය රහිත | එම | - - | 8.5 |

*ඇමුණුම. 01*

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ ආපන ශාලා, බත් කඩ, තේ කඩ, කෝපි කඩ හා මේ හා ආශ්‍රිත කඩ පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20 .................. වර්ෂය**

1. ව්‍යාපාරික ස්ථානයේ නම: ...........................................................................................

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානය:
   (i) කොට්ඨාශය: .................................................... වරිපනම් අංකය:....................................................
   (ii) වීථියේ/ පාරේ නම : .........................................................................
   (iii) ග්‍රාම නිලධාරී:- කොට්ඨාශ අංකය ............................
   කොට්ඨාශයේ නම .................................

3. අයදුම්කරුගේ :
   (i) සම්පූර්ණ නම : .........................................................................
   (ii) ස්ථිර ලිපිනය : .........................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : .........................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : .........................................................................
   (v) දුරකථන අංකය :.........................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :.........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය :.........................................................................
   (ii) ව්‍යාපාරයේ ස්වභාවය :.........................................................................
   (iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :
   (a) නම:.......................................
   (b) දුරකථන අංකය:.......................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම්:
   (i) අයිතිකරුගේ නම:...........................................................................
   (ii) ලිපිනය :.........................................................................
6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද:.................................... ඔව්:........................ නැත:........................
   ඔව් නම්: බලපත්‍රය අංකය: :........................ දිනය::....................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. කර්මාන්තයරැ /වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 :.........................................................................වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

.................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : .........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශය::.................................... වරිපනම් අංකය::.......................................................................................................

වීථියේ/පාරේ නම :.........................................................................
අයිතිකරුගේ නම :.........................................................................
දේපලෙහි ස්වභාවය :.........................................................................
වාර්ෂික වටිනාකම::.........................................................................
හිඟ වරිපනම් මුදල:......................................................................... ඇත:.............................. නැත:.........................................

........................................ ..........................................................
දිනය පරිපාලන නිලධාරි

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:.........................................................................
ගෙවිය යුතු ගාස්තුව:.........................................................................
ඒකකය A B C :.........................................................................
සටහන් :.........................................................................

..........................................................
ආදායම් පරීක්ෂක.

දිනය : ...........................................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්‍ෂකගේ වාර්තාව :

.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................

..........................................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : ..........................................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස

.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................

..........................................................

මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි.

දිනය : ..........................................................

**ප්‍රධාන ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ..........................................................ව්‍යාපාරයේ ස්වභාවය:.......................................................... පාරිසරික බලපත්‍ර:.......................................................... MOH වාර්තාව.......................................................................................................

අනුකූලතා සහතිකය : .......................................................... මත්පැන් බදු බලපත්‍ර:..........................................................

පහත සඳහන් හේතුන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................

..........................................................

ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය : ..........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.............................................................
ගණකාධිකාරී.

දිනය : ..........................................................

අනුමත කරමි. / නොකරමි.

.............................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ..........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය:.................................................................................. ලදුපත් දිනය :.....................................................................................
බලපත්‍ර අංකය : ........................................................................... බලපත්‍ර දිනය : .....................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

.............................................................
ආදායම් පරිපාලන නිලධාරි

දිනය : ..........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

.............................................................
ගණකාධිකාරි

දිනය : ..........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

.............................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ..........................................................

*11 වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් පවත්වා ගෙන යාම,විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

අරමුණ

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය සමඟ කියවිය යුතු 272(22) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන් (4 - 19)

4. ඇමුණුම.01 හි දැක්වෙන අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේ ය.

5. නාගරික සංවර්ධන අධිකාරියේ 1978 වසරේ අංක.41 දරන පනතට අනුව නිකුත් කරන ලද අදාල විධිවිධාන වලට අතිරේකව පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ හෝටලයක් පවත්වා ගෙන යාමට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතු ය.

(ii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(iii) ඉහත බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු යග කෙසේ වුව ද, මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූල වන ලෙස සැලකිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහලක් (සීලිමක්) සවිකර තිබිය යුතුඅතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය.කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1ක් වත් තිබිය යුතු ය.

(vii) එක් එක් කාමරයකම බිම් කොටස සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(viii) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(ix) මුළුතැන්ගෙය තුළ තබන භාජන වලට මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(x) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතුය.

(xi) බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති හා මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන එක් එක් මේසයක් ම,

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේප කර තිබිය යුතු අතර එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතුය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මල නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(xii) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය මෙම ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xiii) බලපත්‍රලත් ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(xiv) ගනුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(xv) ගනුදෙනුකරුවන්ගේ හා සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතුය. එලෙස වූ වැසිකිළි හා කැසිකිළි මුළුතැන්ගෙය, ආහාරපාන පිළිගන්වන ස්ථාන නැතහොත් ගබඩා කාමර යනාදිය සමඟ සෘජුව සම්බන්ධ නොවන ආකාරයෙන් සෞඛ්‍යය රකින ආකාරයෙන් වූ දුරකින් තනා තිබිය යුතු ය.

(xvi) එක් එක් වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් තැනූ බිත්ති වන විට, ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා තීන්ත ආලේප කර තිබිය යුතු ය. මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට, ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය. බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(xvii) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (xvi) වන වගන්තියේ සඳහන් වැසිකිළි වලට අදාල නියමයන් එකී නාන කාමර වල බිමට සහ බිත්ති වලට අදාල විය යුතු ය.

(xviii) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චි කරන ජලය සියළුම කාමර වලට ආරක්ෂාකාරී අන්දමින් නල මගින් ලබාදීමේ පහසුකම් සලස්වා තිබිය යුතු ය.

(xix) බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ, ගනුදෙනුකරුවන්ගේ අත්, කට සේදීමට මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(xx) බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(xxi) මහා නගර සභාව විසින් අපජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙනයනු ලබන්නේ නම්,බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුවඅපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලායාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතුඅතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතු ය.

(xxii) බලපත්‍රලත් ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ ක්‍රියාකාරී තත්වයෙන් සපයා තිබිය යුතු අතර එකී ස්ථානයට විදුලි සම්බන්ධතාව ඇත්නම්, අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ ද සවිකර තිබිය යුතු ය.

(xxiii) බලපත්‍රලත් ස්ථානයේ තේ, කෝපි, කිරි හෝ වෙනයම් පාන වර්ගයන් පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය.

(xxiv) බලපත්‍රලත් ස්ථානයේ සියළුම නිදන කාමර වල ගනුදෙනුකරුවන් හා සේවකයන් නිදාගැනීමට එක් තැනැත්තෙකුට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් හතරක්ව (දිග 2 M x පළල 2 M) තිබිය යුතු අතර එක් එක් නිදන කාමරයක ම ඇඳුම් තැබීම සඳහා අල්මාරියක් හෝ කැබිනෙට්ටුවක්, තුවා හෝ භාණ්ඩ තැබීම සඳහා ලී හෝ ලෝහ තහඩු තිබිය යුතු ය. නවාතැන් ගෙන සිටින්නා හෝ සිටින්නන්ගේ බඩුබාහිරාදිය තැබීමට මේසයක් සහ වැසිකිලියක් සහිත නාන කාමරයක් තිබිය යුතුය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සෑම කොටසකට ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු ය. අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර, ජලයෙන් සෝදා හැරීම කළ යුතුය.

8. බලපත්‍රලත් ස්ථානයේ එක් එක් නිදන කාමරයක ම, එක් ගනුදෙනුකරුවෙකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගනුදෙනුකරුවෙකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර, එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස, අනෙක් ගණුදෙනුකරුවෙකුගේ පාවිච්චියට ඉඩ සැලැස්විය යුතු ය. ඒ සමග පසුව පැමිණෙන ගනුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර, එකී කාමරයේ කවුළු අවම වශයෙන් පැය හතරක්වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැලැස්විය යුතුය. කෙසේ වුවද, කාමර වායු සමනය කර ක්‍රියාකාරී තත්ත්වයෙන් තිබෙන අවස්ථාවේ දී, පසුව පැමිණෙන ගනුදෙනුකරුවාගේ පාවිච්චියට ඉඩ සැලැස්වීමේ කාල පරතරය අවම වශයෙන් විනාඩි තිහක්වත් තිබිය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ නවාතැන් ගන්නාගේ අනන්‍යතාවත්, නමත්, ලිපිනයත් සටහන් කරන ලේඛනයක් බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යා යුතු ය. නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට අවශ්‍ය වන තැන්හි දී, පරීක්ෂා කිරීමට ඉඩ සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

10. එක් එක් බලපත්‍රලත් ස්ථානයකම එක් එක් කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනකම මධ්‍යාහ්නයට පෙර අතු ගා, පිරිසිදු කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

11. බලපත්‍රලත් ස්ථානයේ ඇති නාන කාමර, වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය. කෙසේ වුව ද, ගනුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක නාන කාමරය, වැසිකිළිය දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකිය.

12. බලපත්‍රලත් ස්ථානයේ ආහාරපාන පිළියෙල කිරීමට, විකිණීමට, ප්‍රදර්ශනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක්ම ඒවා පාවිච්චියට ගැනීමට පෙරත්, පාවිච්චි කිරීමෙන් පසුත් සබන් හෝ සබන් දියර පාවිච්චි කර පිරිසිදු ජලයෙන් සෝදා පිරිසිදු කිරීමට කටයුතු කරලීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

13. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ මේ කොටසේ14 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කළ යුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

14. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ආ) වීදුරු ;
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය ;
(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(උ) අන්තරායකර අපද්‍රව්‍ය ;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

15. එක් එක් බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. ගනුදෙනුකරු විසින් ඇනවුම් කරන ලද ආහාර පිළිගැන්වීමේ දී, ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ අඬුවක් හෝ ගෑරුප්පුවක් හෝ වෙනත් සුදුසු ආකාරයේ උපකරණයක් යොදා ගත යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම්, පිරිසිදු සුදු පාටින් වූ කමිස (ඒප්‍රන්), හිස් වැසුම් (තොප්පි) යනාදි වෙනත් අවශ්‍ය ආරක්ෂිත පිළිවැසුම් සපයා තිබිය යුතු ය. ඒ සමඟම කාර්යයේ නියුක්ත වන එක් එක් සේවකයෙකු ම, සෑම අවස්ථාවක ම කාර්ය්‍ය ආරම්භ කිරීමට පෙර හොඳින් ඇඟපත සේදීම මගින් නැතහොත් නෑම මගින් ශරීරය පිරිසිදු කරමින්, එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

19. බලපත්‍රලත් හෝටලයක සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකළයුතු කාර්යයන් (20 - 29)

20. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටලයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරය හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදා ගැනීමට ඉඩදීම නොකළ යුතුය.

22. මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවේ (xxiv) වන වගන්තියේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදාගැනීමට බලපත්‍රලාභියා විසින් ඉඩදීම නොකළ යුතු ය.

23. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක හෝ ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

24. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

25. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

26. (i) බලපත්‍රලත් ස්ථානයේ ආහාර පිළියෙල කිරීම හෝ පිළිගන්වන කාර්යයන් වල නියුක්ත වන කවර හෝ සේවකයෙක් සෞඛ්‍යයට අහිතකර වන නැතහොත් අප්‍රිය වන කිසියම් කාර්යයක නියුක්තවීම නොකළ යුතු ය.

(ii) කවර හෝ සේවකයෙකු ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියා කරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීම හෝ නොකළ යුතුය.

27. කවර හෝ බලපත්‍රලාභියෙකු මේ කොටසේ 30 වන අතුරුව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

28. (i) 1980 වසරේ 26 වන අංකය දරන ආහාර පනත යටතේ 1991.08.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙන් (අති විශෙෂ) පළ කරන ලද පහත 01 වන උපලේඛනයෙන් දක්වා ඇති කිරි වලට අවශ්‍ය කරන අවම වශයෙන් යම් ද්‍රව්‍යයක් එකතු නොකළ බාල කළ කිරි, කිරි ද්‍රව්‍යයන් කිසිවක් කවර හෝ බලපත්‍රලාභියෙකු තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතුය.

(ii) කවර හෝ බලපත්‍රලාභියෙකු මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු නැතහොත් නරක් වූ සම්පූර්ණ යොද සහිත කිරි කිසිවක් තබාගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය.

29. කිසියම් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ අවස්ථාවක නිදන කාමර වල -

(i) තනි නිදන කාමරයක එක් ඇඳකට වැඩියෙන් ද,

(ii) යුගල නිදන කාමරයක ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකකට වැඩියෙන් ද,

(iii) ත්‍රිත්ව නිදන කාමරයක ද්විත්ව ඇඳක් හා තනි ඇඳකට හෝ තනි ඇඳන් තුනකට වැඩියෙන් ද,

(iv) පවුල් නිදන කාමරයක ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහකට වැඩියෙන් නොතිබිය යුතු ය.

එසේ ම, කවර හෝ හෝටලයක තනි නිදන කාමරයක එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ යුගල නිදන කාමරයක දෙදෙනෙකුට වැඩියෙන් හෝ ත්‍රිත්ව නිදන කාමරයක තුන් දෙනෙකුට වැඩියෙන් හෝ එලෙස සියළු ම කාමර වල නිදා ගැනීමට ඉඩදීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය. කෙසේ වුව ද, මෙම කවර හෝ කාමරයක නිදාගන්නා යම්තැනැත්තෙකු වයස අවුරුදු 12ට අඩු අයෙකු වන විට, මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සඳහා ඔහු එක් අයෙකු ලෙස අදහස් නොකළ යුතු ය.

30. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක නිෂ්පාදනය කරන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝ විකිණීමටතබා ඇති යම් කැම වර්ගයකින් සාම්පලයක් පරීක්ෂණ අරමුණ සඳහා එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. මහා නගර සභාවේ කාර්යභාරය (30 - 31)

31. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

32. කිසියම් හෝටලයක් පවත්වාගෙන යාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය. අයකිරීම් හා ගාස්තු

33. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

34. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය (35 - 37)

35. මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

36. මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතු ය.

37. මේ කොටසේ 31 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

38. මේ කොටසේ 37 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

39. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

40. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

දඩ හා දණ්ඩන

41. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ)හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ)හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථනිරූපනය හා නිර්වචන

42. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල -

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහ නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහ නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්, මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, 1978 වසරේ 41 වන අංකය දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සංස්ථාපනය කරන ලද නාගරික සංවර්ධන අධිකාරිය යනුවෙන් අදහස් වේ.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''හෝටලය"යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබාගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක්, ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් හෝ එකී කාර්යයන් සමඟ ගනුදෙනුකරුවන් නවාතැන් ගැනීමට ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය"යන්නෙන්, අදාල ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''පවුල් නිදන කාමරය" යන්නෙන්, එකවර තැනැත්තන් පස් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහක් සහිත කාමරයක් ද,

''ත්‍රිත්ව නිදන කාමරය" යන්නෙන්, එකවර තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හා තනි ඇඳක් හෝ තනි ඇඳන් තුනක් සහිත කාමරයක් ද,

''යුගල නිදන කාමරය" යන්නෙන්, එකවර තැනැත්තන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකක් සහිත කාමරයක් ද,

''තනි නිදන කාමරය" යන්නෙන්, එක් තැනැත්තෙකුට පමණක් නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ තනි ඇඳක් සහිත කාමරයක් ද,

''යුගල ඇඳ" යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200 ක් දිග හා පළල සෙන්ටි මීටර් 125 ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද,

''තනි ඇඳ"යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200 ක් හා පළල සෙන්ටි මීටර් 95 ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද, යන්නෙන් අදහස් වේ.

*උපලේඛන 01 - කිරි වල සංයුතිය*

| *I වන තීරය*<br>*කිරි වර්ගය* | | *II වන තීරය*<br>*කිරි වල නාමය* | *III වන තීරය*<br>*ක්ෂීර මේදය*<br>*අවම ප්‍රතිශතය* | *IV වන තීරය*<br>*ක්ෂීර මේදය*<br>*හැර ක්ෂීර ඝණද්‍රව්‍ය*<br>*අවම ප්‍රතිශතය* |
|---|---|---|---|---|
| 1. | මීකිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත | 7.0 | 9.0 |
| 2. | එළකිරි | එම | 3.5 | 8.5 |
| 3. | ප්‍රමිත කළ | පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත | 3.25 | 8.25 |
| 4. | සකස් කළ | එම | 2.0 | 8.5 |
| 5. | රස කළ | එම | 2.0 | 7.2 |
| 6. | යොදය රහිත හෝ මේදය රහිත | එම | - - | 8.5 |

ඇමුණුම.01

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටලයක් පවත්වා ගෙනයාම සඳහා**
**ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...................වර්ෂය**

1. ව්‍යාපාරික ස්ථානයේ නමː ..........................................................................................................................................

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානයː
   (i) කොට්ඨාශයː .................................................... වරිපනම් අංකයː....................................................
   (ii) වීථියේ/ පාරේ නම : .........................................................................
   (iii) ග්‍රාම නිලධාරීː- කොට්ඨාශ අංකය . : .........................................................................
   කොට්ඨාශයේ නම : .........................................................................

3. අයදුම්කරුගේ :
   (i) සම්පූර්ණ නම : .........................................................................
   (ii) ස්ථිර ලිපිනය : .........................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : .........................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : .........................................................................
   (v) දුරකථන අංකය :.........................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :.........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය :......................................................................
(ii) ව්‍යාපාරයේ ස්වභාවය :......................................................................
(iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :
(a) නම:......................................
(b) දුරකථන අංකය:......................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම්:
(i) අයිතිකරුගේ නම:.........................................................................
(ii) ලිපිනය :.........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද:.......................... ඔව්:....................... නැත:.............................
ඔව් නම්: බලපත්‍රය අංකය :....................... දිනය : ....................................................

7. හෝටලය තුළ -
(i) තනි කාමර සංඛ්‍යාව :.........................................................................
(ii) යුගල කාමර සංඛ්‍යාව :.........................................................................
(iii) ත්‍රිත්ව කාමර සංඛ්‍යාව :.........................................................................
(iv) පවුල් කාමර සංඛ්‍යාව :.........................................................................
(v) එකවර නවාතැන් ගත හැකි සම්පූර්ණ සංඛ්‍යාව :.........................................................................

8. හෝටලයෙහි නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරු ද සමඟ):...............................................................

9. වැසිකිළි/කැසිකිළි -
(i) පිරිමි සේවක වැසිකිළි/කැසිකිළි සංඛ්‍යාව:..............................................................................
(ii) කාන්තා සේවක වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..............................................................................
iii) ගනුදෙනුකාර පිරිමි වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..............................................................................
(iv) ගනුදෙනුකාර කාන්තා වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..............................................................................

10. නාන කාමර -
(i) පිරිමි නාන කාමර සංඛ්‍යාව :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . .
(ii) කාන්තා නාන කාමර සංඛ්‍යාව :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

11. මුළුතැන් ගෙවල් සංඛ්‍යාව :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . ..
12. ජල සම්පාදන ප්‍රභවය :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . .
13. ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරැදි බවත් සහතික කරමි. හෝටලය පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........................................වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

..................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයඃ.................................... වරිපනම් අංකයඃ.................................................................................................

වීථියේ/පාරේ නම ඃ.........................................................................
අයිතිකරුගේ නම ඃ........................................................................
දේපලෙහි ස්වභාවය ඃ.........................................................................
වාර්ෂික වටිනාකමඃ..........................................................................
හිඟ වරිපනම් මුදලඃ....................................................................... ඇතඃ.............................. නැතඃ.....................................

.........................................
පරිපාලන නිලධාරි

දිනය ඃ .........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවයඃ..........................................................................
ගෙවිය යුතු ගාස්තුවඃ.........................................................................
ඒකකය A B C ඃ.........................................................................
සටහන් ඃ..........................................................................

.........................................
ආදයම් පරීක්ෂක.

දිනය ඃ .........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව ඃ
...........................................................................................................................................................................................
...........................................................................................................................................................................................
...........................................................................................................................................................................................
...........................................................................................................................................................................................

.........................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය ඃ .........................................

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස

.............................................................................................................................................................................
.............................................................................................................................................................................
.............................................................................................................................................................................
.............................................................................................................................................................................
.............................................................................................................................................................................

.........................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි.

දිනය : .........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ..........................................................ව්‍යාපාරයේ ස්වභාවය:.............................................................................

පාරිසරික බලපත්‍ර:.......................................................... MOH වාර්තාව...........................................................................

අනුකූලතා සහතිකය : .......................................................... මත්පැන් බදු බලපත්‍ර:..................................................................

පහත සඳහන් හේතුන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

.............................................................................................................................................................................
.............................................................................................................................................................................
.............................................................................................................................................................................
.............................................................................................................................................................................
.............................................................................................................................................................................

............................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ............................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

............................................................
ගණකාධිකාරි.

දිනය : ............................................................

අනුමත කරමි. / නොකරමි.

............................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ............................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය:........................................................ ලදුපත් දිනය :........................................................................................

බලපත්‍ර අංකය : ........................................................ බලපත්‍ර දිනය : ..................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

........................................................

ආදයම් පරිපාලන නිලධාරි

දිනය : ........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

........................................................

ගණකාධිකාරි

දිනය : ........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

........................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ........................................................

**3 වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා**

| | | |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථාවේ නාමය | 1. | මහා නගර සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. |
| අරමුණ | 2. | මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම සම්මත අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. |
| අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන | 3. | මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය සමඟ කියවිය යුතු 272(22) උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. |
| ඉටු කළයුතු කාර්යයන් (4 - 14) | 4. | ඇමුණුම අංක.01 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය. |

5. නාගරික සංවර්ධන අධිකාරියේ 1978 වසරේ අංක.41 දරන පනතට අනුව නිකුත් කරන ලද අදාල විධිවිධාන වලට අතිරේකව පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ නවාතැන් පොළක් පවත්වා ගෙන යාමට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(iii) ඉහත බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු යගකෙසේ වුව ද, මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූල වන ලෙස සැලකිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහලක් (සීලිමක්)සවිකර තිබිය යුතුඅතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය.කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක් වත් තිබිය යුතු ය.

(vii) එක් එක් කාමරයකම බිම් කොටස සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(viii) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(xi) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මේ කොටසේ 12 වන අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතුය.

(x) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළයුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xi) බලපත්‍රලත් ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්‍ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(xii) ගනුදෙනුකරුවන්ගේ හා සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්‍ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා

කැසිකිළි තනා තිබිය යුතුය. එලෙස වූ වැසිකිළි හා කැසිකිළි මුළුතැන්ගෙය, ආහාරපාන පිළිගන්වන ස්ථාන නැතහොත් ගබඩා කාමර යනාදිය සමඟ ඍජුව සම්බන්ධ නොවන ආකාරයෙන් සෞඛ්‍යය රකින ආකාරයෙන් වූ දුරකින් තනා තිබිය යුතු ය.

(xiii) එක් එක් වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් තැනූ බිත්ති වන විට, ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා තීන්ත ආලේප කර තිබිය යුතු ය. මල නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට, ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය. බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(xiv) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ XIII වන වගන්තියේ සඳහන් වැසිකිළි වලට අදාල නියමයන් එකී නාන කාමර වල බිමට සහ බිත්ති වලට අදාල විය යුතු ය.

(xv) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චි කරන ජලය සියළුම කාමර වලට ආරක්ෂාකාරී අන්දමින් නල මගින් ලබාදීමේ පහසුකම් සලස්වා තිබිය යුතු ය.

(xvi) බලපත්‍රලත් ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ, ගනුදෙනුකරුවන්ගේ අත්, කට සේදීමට මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය.

(xvii) බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(xviii) මහා නගර සභාව විසින් අපජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙනයනු ලබන්නේ නම්,බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුව අපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතුඅතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතු ය.

(xix) බලපත්‍රලත් ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ ක්‍රියාකාරී තත්වයෙන් සපයා තිබිය යුතු අතර එකී ස්ථානයට විදුලි සම්බන්ධතාව තිබේ නම්, අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ ද සවිකර තිබිය යුතු ය.

(xx) බලපත්‍රලත් ස්ථානයේ සියළුම නිදන කාමර වල ගනුදෙනුකරුවන් හා සේවකයන් නිදාගැනීමට එක් තැනැත්තෙකුට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් හතරක්ව (දිග 2 M x පළල 2M ) තිබිය යුතු අතර එක් එක් නිදන කාමරයක ම ඇඳුම් තැබීම සඳහා අල්මාරියක් හෝ කැබිනෙට්ටුවක්, තුවා හෝ භාණ්ඩ තැබීම සඳහා ලී හෝ ලෝහ තහඩු තිබිය යුතු ය. නවාතැන් ගෙන සිටින්නා හෝ සිටින්නන්ගේ බඩුබාහිරාදිය තැබීමට මේසයක් සහ වැසිකිළියක් සහිත නාන කාමරයක් තිබිය යුතුය.

(xxi) බලපත්‍රලත් ස්ථානයේ දුම් මනාව වායුගෝලයට පිටවන පරිද්දෙන් වාතාශ්‍රය සමගින් වූ මුළුතැන්ගෙයක් සඳහා තනි කාමරයක් වෙන් කළ යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සෑම කොටසකට ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ එක් එක් නිදන කාමරයක ම, එක් ගනුදෙනුකරුවෙකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගනුදෙනුකරුවෙකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර, එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස, අනෙක් ගණුදෙනුකරුවෙකුගේ පාවිච්චියට ඉඩ සැලැස්විය යුතු ය. ඒ සමඟ පසුව පැමිණෙන ගනුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර, එකී කාමරයේ කවුළු අවම වශයෙන් පැය හතරක්වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැලැස්විය යුතුය.කෙසේ වුවද, කාමර වායු සමනය කර ක්‍රියාකාරී තත්ත්වයෙන් තිබෙන අවස්ථාවේ දී, පසුව පැමිණෙන ගනුදෙනුකරුවාගේ පාවිච්චියට ඉඩ සැලැස්වීමේ කාල පරතරය අවම වශයෙන් විනාඩි තිහක්වත් තිබිය යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ නවාතැන්ගන්නාගේ අනන්‍යතාවත්, නමත්, ලිපිනයත් සටහන් කරන ලේඛනයක් බලපත්‍රලාභියා විසින් පවත්වා ගෙන යා යුතු ය. නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට අවශ්‍ය වන තැන්හි දී, පරීක්ෂා කිරීමට ඉඩ සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

9. (i) බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළයුතු ය. අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර, ජලයෙන් සෝදා හැරීම කළ යුතුය.

(ii) එක් එක් බලපත්‍රලත් ස්ථානයකම එක් එක් කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනකම මධ්‍යාහ්නයට පෙර අතු ගා, පිරිසිදු කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය.

10. බලපත්‍රලත් ස්ථානයේ ඇති නාන කාමර, වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය. කෙසේ වුව ද, ගනුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක නාන කාමරය, වැසිකිළිය දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකිය.

11. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කළයුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර, අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

12. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවහායන අපද්‍රව්‍ය ;
(ආ) වීදුරු ;
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය ;
(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ; ;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(උ) අන්තරායකර අපද්‍රව්‍ය ;
යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

13. බලපත්‍රලත් නවාතැන් පොළක සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

ඉටු නොකළයුතු කාර්යයන් (15 - 22)

15. අදාල නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළනවාතැන් පොළක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

16. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදාගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

17. මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවේ (xx) වන වගන්තියේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදාගැනීමට බලපත්‍රලාභියා විසින් ඉඩදීම නොකළ යුතු ය.

18. කිසියම් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ අවස්ථාවක නිදන කාමර වල -
   (i) තනි නිදන කාමරයක එක් ඇඳකට වැඩියෙන් ද,
   (ii) යුගල නිදන කාමරයක ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකකට වැඩියෙන් ද,
   (iii) ත්‍රිත්ව නිදන කාමරයක ද්විත්ව ඇඳක් හා තනි ඇඳකට හෝ තනි ඇඳන් තුනකට වැඩියෙන් ද,
   (iv) පවුල් නිදන කාමරයක ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහකට වැඩියෙන් නොතිබිය යුතු ය.

   එසේ ම කවර හෝ නවාතැන් පොළක තනි නිදන කාමරයක එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ යුගල නිදන කාමරයක දෙදෙනෙකුට වැඩියෙන් හෝ ත්‍රිත්ව නිදන කාමරයක තුන් දෙනෙකුට වැඩියෙන් හෝ එලෙස සියළු ම කාමර වල නිදා ගැනීමට ඉඩදීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය. කෙසේ වුව ද, මෙම කවර හෝ කාමරයක නිදාගන්නා යම්තැනැත්තෙකු වයස අවුරුදු 12 ට අඩු අයෙකු වන විට, මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සඳහා ඔහු එක් අයෙකු ලෙස අදහස් නොකළ යුතු ය.

19. කවර හෝ නවාතැන් පොළක සදාචාර විරෝධී කාර්යයන් සඳහා යොදා ගැනීමට ඉඩ නොදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර කවර හෝ තැනැත්තෙකු විසින් නවාතැන් පොළෙහි වෙනත් නවාතැන්කරුවන්ගේ හෝ නවාතැන් පොළ ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියා කරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීම හෝ නොකළ යුතුය.

20. බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ ස්ථානයක කිසිම සත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

22. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

   (ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

23. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් නවාතැන් පොළක්පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය. — මහා නගර සභාවේ කාර්යභාරය

24. කිසියම් නවාතැන් පොළක් පවත්වාගෙන යාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය. — අයකිරීම් හා ගාස්තු

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. — බලය පැවරීම

26. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය. — බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගුකාලය

27. මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. — පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය (27 - 30)

28. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

29. මේ කොටසේ 23 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

30. මේ කොටසේ 29 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

31. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරිකකොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය. — පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

32. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

33. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට — දඩ හා දණ්ඩන

යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථනිරූපනය හා නිර්වචන

34. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල -

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''නාගරික සංවර්ධන අධිකාරිය'' යන්නෙන්, 1978 වසරේ 41 වන අංකය දරන නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සංස්ථාපනය කරන ලද නාගරික සංවර්ධන අධිකාරිය යනුවෙන් අදහස් වේ. ''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත් කාර්යය සදහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''නවාතැන් පොළක්'' හෝ -නිදන නිවසක්''යන්නෙන්, නිවසක් හෝ නිවසේ එක් කොටසක් මුදල් අයකිරීමක් මගින් අදාල නිවසේ පවුලේ සාමාජිකයින් නොවූ දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් යුත් තැනැත්තන්ට නවාතැන් ගැනීමට පහසුකම් සලස්වා දෙනු ලබන ස්ථානයක් අදහස් වේ. එනමුත් එයට රෝහලක් හෝ අනුබද්ධ නිවාස ඇතුළත් නොවේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය'' යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''පවුල් නිදන කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් පස් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහක් සහිත කාමරයක් ද,

''ත්‍රිත්ව නිදන කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හා තනි ඇඳක් හෝ තනි ඇඳන් තුනක් සහිත කාමරයක් ද,

''යුගල නිදන කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකක් සහිත කාමරයක් ද,

''තනි නිදන කාමරය'' යන්නෙන්, එක් තැනැත්තෙකුට පමණක් නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ තනි ඇඳක් සහිත කාමරයක් ද,

-යුගල ඇඳ" යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200 ක් දිග හා පළල සෙන්ටි මීටර් 125 ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද,

-තනි ඇඳ"යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටි මීටර් 200 ක් හා පළල සෙන්ටි මීටර් 95 ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද, යන්නෙන් අදහස් වේ.

ඇමුණුම.01

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළක් පවත්වාගෙන යාම සඳහා**
**ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20....................වර්ෂය**

1. ව්‍යාපාරික ස්ථානයේ නම: ..........................................................................................................................................
2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානය:
   (i) කොට්ඨාශය: .................................................... වරිපනම් අංකය:...................................................
   (ii) වීථියේ/ පාරේ නම : .........................................................................
   (iii) ග්‍රාම නිලධාරී:- කොට්ඨාශ අංකය . : .........................................................................
   කොට්ඨාශයේ නම : .........................................................................

3. අයදුම්කරුගේ :
   (i) සම්පූර්ණ නම : .........................................................................
   (ii) ස්ථිර ලිපිනය : .........................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : .........................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : .........................................................................
   (v) දුරකථන අංකය :.........................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :.........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය :.........................................................................
   (ii) ව්‍යාපාරයේ ස්වභාවය :.........................................................................
   (iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :
   (a) නම:......................................
   (b) දුරකථන අංකය:......................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම්:
   (i) අයිතිකරුගේ නම:.........................................................................
   (ii) ලිපිනය :.........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද:.......................... ඔව්:...................... නැත:..................................................
   ඔව් නම්: බලපත්‍රය අංකය: :...................... දිනය::..........................................................................................................

7. හෝටලය තුළ -
   (i) තනි කාමර සංඛ්‍යාව :.........................................................................
   (ii) යුගල කාමර සංඛ්‍යාව :.........................................................................
   (iii) ත්‍රිත්ව කාමර සංඛ්‍යාව :.........................................................................
   (iv) පවුල් කාමර සංඛ්‍යාව :.........................................................................
   (v) එකවර නවාතැන් ගත හැකි සම්පූර්ණ සංඛ්‍යාව :..........................................................................................

8. හෝටලයෙහි නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරුද සමඟ):..........................................................................................

9. වැසිකිළි/කැසිකිළි -
   (i) පිරිමි සේවක වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..........................................................................................
   (ii) කාන්තා සේවක වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..........................................................................................
   (iii) ගනුදෙනුකාර පිරිමි වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..........................................................................................
   (iv) ගනුදෙනුකාර කාන්තා වැසිකිළි /කැසිකිළි සංඛ්‍යාව:..........................................................................................

10. නාන කාමර -
   (i) පිරිමි නාන කාමර සංඛ්‍යාව :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . .
   (ii) කාන්තා නාන කාමර සංඛ්‍යාව :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . .

11. මුළුතැන් ගෙවල් සංඛ්‍යාව :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . .
12. ජල සම්පාදන ප්‍රභවය :. . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
13. ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරැදි බවත් සහතික කරමි. හෝටලය පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........................................වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

..........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයः:.................................... වරිපනම් අංකය:..........................................................................................

වීථියේ/පාරේ නම :.............................................................................
අයිතිකරුගේ නම :.............................................................................
දේපලෙහි ස්වභාවය :.........................................................................
වාර්ෂික වටිනාකමः:.............................................................................
හිඟ වරිපනම් මුදල:.......................................................................... ඇත:............................ නැත:.....................................

.........................................
පරිපාලන නිලධාරි.

දිනය : .........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:..........................................................................

ගෙවිය යුතු ගාස්තුව:..........................................................................

ඒකකය A B C :.........................................................................

සටහන් :..........................................................................

.........................................

ආදයම් පරීක්ෂක.

දිනය : .........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

.........................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : .........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

.........................................

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : .........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ......................................................... ව්‍යාපාරයේ ස්වභාවය:..................................................................................... ...

පාරිසරික බලපත්‍ර:.......................................................... MOH වාර්තාව............................................................................ .......................

අනුකූලතා සහතිකය : ......................................................... මත්පැන් බදු බලපත්‍ර:..................................................................................

පහත සඳහන් හේතුන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

................................................................................................................................................................................................................................

..................................................................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................................................................

............................................................

ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය : ............................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

............................................................

ගණකාධිකාරී.

දිනය : ............................................................

අනුමත කරමි. / නොකරමි.

............................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ............................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ............................................................ ලදුපත් දිනය ඃ.............................................................................................

බලපත්‍ර අංකය ඃ ............................................................ බලපත්‍ර දිනය ඃ .............................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

............................................................

ආදායම් පරිපාලන නිලධාරි

දිනය : ............................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

............................................................

ගණකාධිකාරි

දිනය : ............................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

............................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ............................................................

*IV වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ බේකරි පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.*

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළබේකරි විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය. අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම සම්මත අතුරු ව්‍යවස්ථා සකස් කර ඇත. අරමුණ

3. මහා නගර සභා ආඥා පනතේ 267(1)වන වගන්තිය සමග කියවිය යුතු 272(8)(අ)උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම සම්මත අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අතුරු ව්‍යවස්ථා සම්පාදානය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. ඇමුණුම. I හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේ ය. ඉටු කළයුතු කාර්යයන් (4 - 24)

5. පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ බේකරියකට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බේකරියක් දරෙන් හෝ විදුලියෙන් හෝ තාපය ලබා ගන්නා මාධ්‍ය කවරක් වුවද,බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ii) බේකරියේ එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය.කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(iii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල(සීලිමක්)සවිකර තිබිය යුතුඅතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(iv) එක් එක් කාමරයකම බිම් කොටස,සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් (බිම්ගඩොල්) අල්ලා තිබිය යුතු ය.

(v) බේකරියේ උඳුන (පෝරණුව) ස්ථානගත කර ඇති කාමරයේ බිත්තියේ උස පොළොව මට්ටමේ සිට ඇතුල් වහල (සීලිම) දක්වා මීටර් 3.0කට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(vi) තව ද, කාමර වල බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු යග තව ද, වෙනත් කාමර ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමග ලී පාවිච්චි කරමින් බිත්ති සම්පූර්ණ කර තිබෙන අවස්ථාවක ලීයේ මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(vii) බේකරිය තුළ ලීයෙන් කළ සියලුම සවිකිරීම් කොටස් වල තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(viii) වහලය කිසියම් ස්ථිර සණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1 ක් වත් තිබිය යුතු ය.

(xi) බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(x) බලපත්‍රලත් ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්‍ෂක විධිවිධාන සලස්වා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(xi) නිෂ්පාදන කාර්යය සඳහා ජලය පාවිච්චි කරන සෑම කාමරයකට ම ආරක්ෂිත ජල සැපයුමක් නල මගින් සපයා තිබිය යුතුය.

(xii) මහා නගර සභාව විසින් අපජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙනයනු ලබන්නේ නම්,බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුවඅපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතුඅතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතු ය.

(xiii) මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයට අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය.

(xiv) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය දර පාවිච්චි කරන බේකරියක් වන විට -

(අ) බේකරි උඳුනේ (පෝරණුව)දුම් කවුළුවේ ඉහළ කෙළවර අවම වශයෙන් පොළොව මට්ටමෙන් මීටර් 7.5 උසට ඉදිකර තිබිය යුතු ය.

(ආ) බේකරි උඳුනෙන් ඉවත් කරන දැවී ගිය අළු සහ ශේෂ දැව කොටස් ඉවත් කිරීමට ප්‍රමාණවත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් සපයා තිබිය යුතු ය.

(ඇ) බේකරි උඳුනේ පිටත තීන්ත හෝ හුණු ගා තිබිය යුතු ය.

(ඈ) ඉන්ධන ගබඩා කිරීම සඳහා වෙනම කාමරයක් හෝ ස්ථානයක් තිබිය යුතුය.

(xv) බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය විදුලි බලයෙන් ක්‍රියා කරන බේකරියක් වන විට -

(අ) බේකරි උපකරණවලට විදුලිය සම්බන්ධ කරන ,විදුලි පේනු, ආරක්ෂිත තත්ත්වයේ පැවතිය යුතු අතර අධි වෝල්ටීයතාව ඇතිවන අවස්ථාවක දී හෝ විදුලිය කාන්දු වීමක දී විදුලිය ස්වයංක්‍රියව විසන්ධි කෙරෙන උපකරණ සවිකර තිබිය යුතු ය.

(ආ) බේකරි පරිශ්‍රය තුළ සවිකර ඇති විදුලි පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම් වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතු ය.

6. බලපත්‍රලත් ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර එකී ස්ථානයට විදුලි සම්බන්ධතාව ලබාගෙන ඇත්නම්, අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ ද ක්‍රියාකාරී තත්වයෙන් සපයා තිබිය යුතු ය.

7. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සෑම කොටසකට ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමකළ යුතු ය.

8. පිටි ඇනීම සඳහා යොදා ගන්නා එක් එක් කාමරයක ම බිම් කොටස, යටත් පිරිසෙයින් සෑම මසකටම අවම වශයෙන් එක් වතාවක්වත් සේදීම කළ යුතු ය.

9. පිටි අනන සියලු ම මේස මතුපිට පළුඳු නොතිබෙන සේ සුමට කර තිබිය යුතු අතර ලී පිරිද්දුම් අතර හිඩැස් නොමැති වනසේ පුරුද්දා තිබිය තිබිය යුතු ය. නැතහොත් මල නොබැඳෙන ලෝහ තහඩුවකින් පිරිද්දුම් වලින් තොරව ආවරණය කර තිබිය යුතු ය.

10. බලපත්‍රලත් බේකරියක සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. බේකරිය සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

12. බේකරියේ සේවයේ යෙදෙනඑක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම්, පිරිසිදු සුදු පාටින් වූ කමිස (ඒප්‍රන්), හිස් වැසුම් (තොප්පි) යනාදි වෙනත් අවශ්‍ය ආරක්ෂිත පිළිවැසුම් සපයා තිබිය යුතුය. ඒ සමගම කාර්යයේ නියුක්ත වන එක් එක් සේවකයෙකු ම,සෑම අවස්ථාවක ම කාර්ය්‍ය ආරම්භ කිරීමට පෙර හොඳින් ඇඟපත සේදීම මගින් නැතහොත් නෑම මගින් ශරීරය පිරිසිදු කරමින්, එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ මේ කොටසේ14 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

14. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය ;

(ආ) වීදුරු ;

(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය ;

(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරි වන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය,

යන ආකාරයෙන් වර්ග කර,ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

15. බේකරියේ පාවිච්චිය සඳහා තබා ගන්නා පිටි සහ වෙනත් එකතු කරනු ලබන ද්‍රව්‍යයන් ගබඩා කිරීමට ඒ සඳහාම වෙන්වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු ය. මෙම කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රයකින් යුක්ත විය යුතු ය. තව ද,මීයන්, මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි ලෙස ආරක්ෂාකාරීව ද තිබිය යුතු ය.

16. මේ කොටසේ 15 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ගබඩා කාමරයේ පිටි ගබඩා කිරීමේ දී, අවම වශයෙන් පොළොව මට්ටමෙන් සෙන්ටි මීටර් 20 ක් උස පාද මත තැනූ ලෑලි තට්ටුවක් යොදාගත යුතු අතර එකී ලෑලි තට්ටුව හිස්ව තිබෙන විට පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි ආකාරයෙන් නිම කර තිබිය යුතු ය. එසේම එකී ලෑලි තට්ටුව යටින් මීයන්ට,මැස්සන්ට, කෘමීන්ට හෝ වෙනත් සතුන්ට රැඳී සිටිය නොහැකි වන සේ ආවරණය කර තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් බිත්තියෙන් සෙන්ටි මීටර් 23.0 ක් ඈතින් තබා තිබිය යුතු ය.

17. මේ කොටසේ16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ලෑලි තට්ටු අවම වශයෙන් මාසයකට දෙවරක් බැගින් කාමරයෙන් පිටතට ගෙන පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

18. සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතුය. එලෙස වූ වැසිකිළි හා කැසිකිළි බේකරියෙන් ආහාර නිෂ්පාදනය කරන කාමර, ගබඩා කාමර හෝ බේකරි නිෂ්පාදන විකිණීමට ප්‍රදර්ශනය කර ඇති කාමර යනාදිය සමඟ ඍජුව සම්බන්ධ නොවන ආකාරයෙන් සෞඛ්‍යය රකින ආකාරයෙන් වූ දුරකින් තනා තිබිය යුතුය.

19. මෙම බේකරියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

20. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් සෑම බේකරියක ම සම්මත පඩි සහිත තරාදියක්, ඉලෙක්ට්‍රොනික් තරාදියක් හෝ වෙනත් කිසියම් වර්ගයක සම්මත තරාදියක් තැබීමට සැලැස්වීම සහ කිසියම් ගනුදෙනුකරුවකු විසින් ඉල්ලා සිටි විට විකුණන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති යම් බේකරි නිෂ්පාදනයක බර කිරා බැලීමට හෝ බර කිරා පෙන්වීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

21. කිසියම් බේකරියක, බේකරි නිෂ්පාදන විකිණීමට ප්‍රවාහනය කිරීමේ දී, දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය හෝ ජලය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ පෙට්ටි යොදා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

22. බේකරියේ බලපත්‍රලාභියා විසින්,තමන්ගේ නමත්, බලයලත් බේකරිය, යන වාක්‍ය ත්‍රිවිධ භාෂාවෙන් ලියූ පුවරුවක් එකී ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතු වන්නේ ය.

23. බේකරි නිෂ්පාදන දේවල් විකිණීම සඳහා ගෙනයන තැනැත්තන්,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙක් විසින් අත්සන් කළ ලියාපදිංචි අවසරපත්‍රයක් තබාගත යුතු ය.

24. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙක් විසින් පරීක්ෂා කිරීම සඳහාසියලුම සේවකයින්ගේ (පාන් වෙළෙඳාම්කරු ඇතුළුව) නම් සහ, ලිපින ඇතුළත් ලේඛනයක් බලපත්‍රධාරියා විසින් පවත්වාගෙන යා යුතුය.

ඉටු නොකල යුතු කාර්යයන් (25 - 33)

25. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

26. බේකරි නිෂ්පාදන සඳහා යොදා ගන්නා පිටි සහ වෙනත් එකතු කරනු ලබන ද්‍රව්‍යයන් කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස, කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය බේකරි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළයුතු ය.

27. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ

නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

28. අනුමැතිය නොලත් රසායනික ද්‍රව්‍යයන්, වර්ණයන් යනාදිය බේකරි නිෂ්පාදන පිළියෙල කිරීමෙහි දී යොදා ගැනීම නොකළ යුතු ය.

29. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර බේකරියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතු ය. කෙසේ වුව ද, බේකරියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය.

30. බේකරි නිෂ්පාදන සඳහා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ජලය යොදා ගැනීම නොකළ යුතු අතර බේකරියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම්, එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18 කට අඩු දුරකින් කසළ වලක් හෝ පෝර වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

31. බලපත්‍රලත් ස්ථානයේ බේකරියේ කිසියම් ස්ථානයක හෝ එක් කොටසක කවර සතෙකු හෝ තබා ගැනීම හෝ එසේ තබා ගැනීමට ඉඩදීම නොකළ යුතුය.

32. බලපත්‍රලත් ස්ථානයේ කෙළ ගැසීම සඳහා තබා ඇති පඩික්කම් හැර වෙනත් කවර හෝ ස්ථානයක කෙළ ගැසීම නොකළ යුතු ය.

33. කවර හෝ බලපත්‍රලාභියෙකු මේ කොටසේ 34 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය (34 - 35)

34. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයේ නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති විකිණීමට තබා ඇති බේකරි නිෂ්පාදනයක සාම්පලයක්, පරීක්ෂණ අරමුණ සඳහා එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය.

35. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

36. කිසියම් බේකරියක් පවත්වා ගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2)වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

බලය පැවරීම

37. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තෘව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

38. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නො ලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (39 - 42)

39. මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

40. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

41. මේ කොටසේ35 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

42. මේ කොටසේ41 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

43. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

44. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

දඩ හා දණ්ඩන

45. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

46. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

-නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

-නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම

හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

-මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

-බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

-බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

-බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

-බේකරි නිෂ්පාදන" යන්නෙන්, විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත කිසියම් බේකරියක නිපදවන පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ කිසියම් රස කැවිලි යනාදිය අදහස් වේ.

-බේකරිය" යන්නෙන්, විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ රස කැවිලි සාදන යම් ස්ථානයක් අදහස් වන අතර එවැනි ආහාර පිළියෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තබන කිසියම් ස්ථානයක් ද අදහස් වේ.

ඇමුණුම.1

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20.............වර්ෂය**

1. ව්‍යාපාරික ස්ථානයේ නම : ..............................................................................................................................................

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානය:
   (i) කොට්ඨාශය: ..................................................... වරිපනම් අංකය:...........................................................................
   (ii) වීථියේ/ පාරේ නම : ........................................................................
   (iii) ග්‍රාම නිලධාරී:- කොට්ඨාශ අංකය . : ........................................................................
   කොට්ඨාශයේ නම : ........................................................................

3. අයදුම්කරුගේ :
   (i) සම්පූර්ණ නම : ........................................................................
   (ii) ස්ථිර ලිපිනය : ........................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ........................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : ........................................................................
   (v) දුරකථනඅංකය :........................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය :..........................................................................
(ii) ව්‍යාපාරයේ ස්වභාවය :..........................................................................
(iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :
(a) නම:.......................................
(b) දුරකථන අංකය:.......................................

5. ගොඩනැගිල්ල කුලීයට ලබාගෙන ඇත්තේ නම්:
(i) අයිතිකරුගේ නම:..........................................................................
(ii) ලිපිනය :..........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද:.......................... ඔව්:........................ නැත:........................
ඔව් නම්: බලපත්‍රය අංකය: :........................ දිනය::....................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරැදි බවත් සහතික කරමි. කර්මාන්තය, වෙළඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20........................................වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශය::.......................................................... වරිපනම් අංකය::..........................................................................................

වීථියේ/පාරේ නම :..........................................................................
අයිතිකරුගේ නම :..........................................................................
දේපලෙහි ස්වභාවය :..........................................................................
වාර්ෂික වටිනාකම::..........................................................................
හිඟ වරිපනම් මුදල:.......................................................................... ඇත:................................................ නැත:....................................

.........................................
පරිපාලන නිලධාරි.

දිනය : ........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:...........................................................................
ගෙවිය යුතු ගාස්තුව:...........................................................................
ඒකකය A B C :...........................................................................
සටහන් :...........................................................................

දිනය : ........................................
........................................
ආදයම් පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................

........................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : ........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................

........................................
දිනය : ........................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ........................................................ව්‍යාපාරයේ ස්වභාවය:.................................................................. පාරිසරික බලපත්‍ර:........................................................ MOH වාර්තාව.................................................................. අනුකූලතා සහතිකය : ........................................................ මත්පැන් බදු බලපත්‍ර:........................................................ පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................

..........................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ..........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

දිනය : ........................................................... ...........................................................

ගණකාධිකාරී.

අනුමත කරමි. / නොකරමි.

දිනය : ........................................................... ...........................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ....................................................................................... ලදුපත් දිනය :...............................................................................

බලපත්‍ර අංකය : ....................................................................................... බලපත්‍ර දිනය : .........................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

දිනය : ........................................................... ...........................................................

ආදයම් පරිපාලන නිලධාරි

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

දිනය : ........................................................... ...........................................................

ගණකාධිකාරි

බලපත්‍රය අත්සන් කරන ලදී.

දිනය : ........................................................... ...........................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

## 3 වන අධිකාරය

### *1 වන කොටස - මහා නගර බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

01. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පොදු ක්‍රීඩා භූමි පවත්වා ගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

02. මහා නගර සභා අඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ප්‍රජා සංවර්ධනය සඳහා ක්‍රීඩා භූමි පහසුකම් සැපයීම, නිශ්චල දේපල නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම යනාදි අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අරමුණ

03. මහා නගර සභා ආඥා පනතේ 267(1)වන වගන්තිය සමඟ කියවිය යුතු 272(28)(ඊ)යන උපවගන්ති යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

04. මහා නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසරපත්‍රයක් ලබාගැනීමට අදහස් කරන කවර හෝ තැනැත්තෙකු ඇමුණුම. I හි දැක්වෙන ඉල්ලුම්පත්‍රයක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය. — ඉටු කළ යුතු කාර්යයන් (04 - 06)

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, මහා නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසරපත්‍රයක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කළ යුතු ය.

06. පරිහරණය කිරීම සඳහා ක්‍රීඩා භූමියක් වෙන්කර ගැනීමට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන්කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදුකළ යුතු ය. එකී ඉල්ලීමට අනුව කරනු ලබන වෙන් කිරීම මේ කොටසේ 7 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් විය යුතු ය.

07. (i) කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියකට හානි පැමුණුවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළයුතු අතර ක්‍රීඩා භූමිය තුළට ගවයන්, ඌරන්, අශ්වයන්, පෝනියන්, කොටළුවන් හෝ බල්ලන් හෝ වෙනත් සතුන් ගෙනයාම නොකළ යුතු ය. එසේම තවදුරටත්, නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් ලබාගත් අවසරපත්‍රයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ ක්‍රීඩා භූමියකට ඇතුල් කිරීම නොකළ යුතු ය. — ඉටු නොකළ යුතු කාර්යයන්

(ii) කවර හෝ තැනැත්තෙකු ක්‍රීඩා භූමියක බීමත්ව හැසිරීම, අශෝභන ලෙස හැසිරීම, මත්ද්‍රව්‍ය පාවිච්චි කර හැසිරීම, බාහිර පාර්ශ්වයන්ට අනවශ්‍ය ලෙස හිරිහැර කිරීම නොකළ යුතු ය.

(iii) කවර හෝ තැනැත්තෙකු විසින් වෙන්කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක්, වෙන්කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

(iv) ක්‍රීඩා භූමියක් වෙන්කිරීමට නිකුත් කරන ලද අවසරපත්‍රයක්, කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

(v) භාණ්ඩ වලට, සවිකිරීම් වලට, විදුලි උපකරණ වලට, ජලය සපයන උපකරණ වලට සහ ක්‍රීඩා භූමිය තුළ වූ මහා නගර සභාවට අයිති දේපල යනාදියට අවසරපත ලත් තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයන්ගෙන් හෝ එකී ක්‍රීඩා භූමිය පාවිච්චි කරන්නන් හෝ ප්‍රේක්ෂකයන්, කවර හෝ තැනැත්තෙකු අලාභයක් ඇති නොකළ යුතු ය.

08. (i) ක්‍රීඩා භූමි ප්‍රයෝජනයට ගැනීමට අවසරපත්‍රයක් සඳහා වූ ඉල්ලීමට අදාල එක් එක් ඉල්ලුම්පත්‍රයක් ම,මහා නගර සභා කාර්යාලයට ලැබෙන අනුපිළිවෙල අනුව සලකා බැලිය යුතු ය. — මහා නගර සභාවේ කාර්යභාරය (08 - 12)

(ii) ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ලැබෙන අයදුම්පත්‍ර අතරින් කිසියම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් වන අයදුම්පත්‍රයකට ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.

09. මෙම අතුරු ව්‍යවස්ථා වල විධිවිධාන යටතේ වෙන්කර ගන්නා ලද කිසියම් ක්‍රීඩා භූමියක, එකී වෙන්කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවකුට අවශ්‍ය වන අවස්ථාවක, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට ඒ සඳහා අනුමත කළ හැකි ය.

(i) වෙන්කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරන විට -

(අ) ක්‍රීඩා භූමිය වෙන්කරන ලද දිනට මාස තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සීයයට පහක්.

(ආ) ක්‍රීඩා භූමිය වෙන්කරන ලද දිනට මාස දෙකකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සීයයට දහයක්.

(ඇ) ක්‍රීඩා භූමිය වෙන්කරන ලද දිනට මාසයකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සීයයට පහළොවක්.

(ඈ) ක්‍රීඩා භූමිය වෙන්කරන ලද දිනට දින පහළොවකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සීයයට විසි පහක්.

(ඉ) ක්‍රීඩා භූමිය වෙන්කරන ලද දිනට දින හතකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සීයයට පනහක්.

(ඊ) ක්‍රීඩා භූමිය වෙන්කරන ලද දිනට දින තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සීයයට හැත්තෑ පහක්.
මහා නගර සභා අරමුදලින් ආපසු නොගෙවිය යුතු ය.

(ii) වෙන් කළ ක්‍රීඩා භූමිය අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයක දී නම්, ගෙවනු ලැබූ ගාස්තුව ආපසු නොගෙවිය යුතු ය.

කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටක දී, එකී වෙන්කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පතු මුදල සම්පූර්ණයෙන් ආපසු ලබා ගැනීමේ හිමිකම ඉල්ලුම්කරුට තිබෙන්නේ ය.

10. කවර හෝ තැනැත්තෙකු විසින් ක්‍රීඩා භූමියක් වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී, එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින්, හැකි තරම් ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ දිනයේදී ම හෝ සාධාරණ කාලයක් තුළ ඒ බව එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව ක්‍රීඩා භූමියක් කිසියම් කාර්යයක් සඳහා වෙන්කර නොමැති කවර හෝ අවස්ථාවක එකී ක්‍රීඩා භූමියේ ක්‍රීඩා කිරීම හෝ ක්‍රීඩා පුහුණුවීම් කටයුතු සඳහා ගාස්තුවක් නොමැතිව යොදා ගැනීමට ඉඩදීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වෙන්කර ගනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක්, එසේ වෙන්කර ගනු ලැබූ දිනයේ දී මහා නගර සභාවේ කිසියම් අත්‍යවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක, එකී වෙන්කිරීම අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද, එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේ නම්,

(i) එකී අවලංගු කිරීම ක්‍රීඩා භූමිය වෙන්කරනු ලැබූ දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුවාත් මෙන් ම, ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය. එසේ ම, මෙලෙස වූ අවලංගු කිරීමක්, වෙන්කර ගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයකදී සිදු නොකළ යුතු ය.

(ii) දින තුනකට අඩු කාලයක් තුළ ඉදිරිපත් කළ අවසරපත්‍රයක්,වෙන් කර ගනු ලැබූ දිනයේ දී හදිසි හා විශේෂ අවශ්‍යතාවයක් මත අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. කෙසේ වුව ද, අවලංගු කිරීමෙන් ඇතිවන සාධාරණ අලාභය අවසරපත ලත් තැනැත්තාට ලබාදිය යුතු ය. එනමුත්, අදාල අවසරපත්‍රය අවලංගු නොකිරීම නිසා ඇතිවන අලාභයට වඩා, අවසරපත ලත් තැනැත්තා අලාභය ලබාදීමෙන් මහා නගර සභාවට යහපතක් සිදුවන බව සහතික කිරීමෙන් අනතුරුව අවසරපත්‍රය අවලංගු කළ යුතු ය.

ඉහත (i) වන වගන්තියට අනුව වෙන්කර ගනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක්,මහා නගර සභාව විසින් විශේෂ අවශ්‍යතාවයක් මත අවලංගු කරන අවස්ථාවේ දී, අවසරපත ලත් තැනැත්තාට හෝ ආයතනයට සිදුවුණු නැතහොත් සිදුවිය හැකි අලාභයට වන්දි ගෙවීම සම්බන්ධව සභාව වග කියනු නොලැබේ.

13. (i) ඇමුණුම. II හි සඳහන් ආදර්ශ ගාස්තු චක්‍රයට අනුව මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ක්‍රීඩා භූමි වෙන්කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ඉල්ලුම්කරු ගෙවීමෙන් අනතුරුව අවසරපත්‍රය නිකුත් කළ යුතු ය. අයකිරීම් හා ගාස්තු (13 - 14)

(ii) ක්‍රීඩා පිටියක් පරිහරණය කිරීමට ඉඩ දෙනු ලබන්නේ නම්, සභාව විසින් වරින් වර තීරණය කරනු ලබන ගාස්තුවත්, ඇප මුදලත් දින තුනකට පෙර ගෙවීම් කරන මෙන් දැන්වීමට සභාවට බලය ඇත්තේය.

14. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබූ ක්‍රීඩා භූමියක් අදාල කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

(i) ක්‍රීඩා භූමිය හෝ එහි යම් කොටසකට හෝ ක්‍රීඩා භූමිය තුළ වූ මහා නගර සභාවේ දේපල වලට කිසියම් අලාභයක් සිදුවී ඇත්නම්, ඒ අලාභයේ වටිනාකම

සහ

(ii) ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව අඩුකර ගැනීමෙන් අනතුරුව, ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවිය හැකි ය.

15. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

16. (i) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම අවසරපත්‍රයක්ම කලින් අවලංගු කළහොත් මිස, අවසරපත්‍රය කවර දින වලට නැතහොත් කවර පැය වලට අනුමත කරනු ලැබුවේ ද, එකී කාල වලට පමණක් වලංගු වේ. බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

(ii) අවසරපත්‍රයක් ලැබූ කිසියම් කාර්යයක් සඳහා වෙන්කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක්, එසේ වෙන්කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම මේ කොටසේ9 වන සහ 10 වන අතුරු ව්‍යවස්ථා වල නියමයන්ට යටත් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය (17 - 18)

17. ක්‍රීඩා භූමිය අදාල කාලය තුළපරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ පරිහරණය සඳහා අවසරලත් ක්‍රීඩා භූමියක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම අවසරපතලත් තැනැත්තාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

19. අවසරපත ලත් තැනැත්තා හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

20. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

21. (i) මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් කඩ කිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් සිදුකර ඇති අවස්ථාවක නිකුත් කර ඇති අවසරපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(ii) ක්‍රීඩා භූමියට හෝ ක්‍රීඩා භූමිය තුළ වූ දේපල වලට සිදුකළ හානි සඳහා වූ අලාභය,අවසරපතලත් තැනැත්තාගෙන් අයකර ගැනීම මහා නගර සභාවට නීත්‍යානුකූල වන්නේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල -

-නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

-නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහ නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහ නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබු ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

-මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

-බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

-අවසරපත ලත් තැනැත්තා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ අවසරපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වේ.

-ක්‍රීඩා භූමිය" යන්නෙන්, ක්‍රීඩා කිරීම සඳහා මහා නගර සභාව විසින් වෙන්කර දෙනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් අදහස් වන අතර ක්‍රීඩා භූමිය වටා ඉදිකර ඇති තාප්පය හෝ වැට හෝ ඒ තුළ ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමක කොටසක් හෝ කිසියම් සවිකිරීමක් හෝ උපකරණ එයට ඇතුළත් වේ.

-ක්‍රීඩාව" යන්නෙන්, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ ඊට දී ඇති අර්ථය ම අදහස් විය යුතුය.

ඇමුණුම.1

**මහා නගර සභාවේ ක්‍රීඩා භූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රය.**

(01) ඉල්ලුම්කරුගේ නම : ..............................................................................................................

ලිපිනය : ..............................................................................................................

ජාතික හැඳුනුම්පතේ අංකය : ..............................................................................................................

(02) ක්‍රීඩා භූමිය ඉල්ලුම්කරන කාරණය: ..............................................................................................................

(03) අවශ්‍ය කරන දිනය හා වේලාව :

| *දින සිට* | *දින තෙක්* | *වේලාව* |
|---|---|---|
| ........................................ | ........................................ | ........................................ |
| ........................................ | ........................................ | ........................................ |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. මෙම ක්‍රීඩා භූමිය වෙන්කර දෙනු ලැබුවහොත්, එකී ක්‍රීඩා භූමියේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට සහ සවිකිරීම්වලට කිසියම් හානියක් සිදුවන අවස්ථාක එහි අලාභය මාගේ තැන්පත් මුදලින් මහා නගර සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟවන අතර එකී තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තවදුරටත් අවශ්‍ය වන මුදල් මහා නගර සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

. . . . . . . . . . . . . . . . . . . . . . . .
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :........................................

ඇමුණුම. 11

**මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 වන වගන්තිය**

ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ඉඩදීමට අයකරන ගාස්තු චක්‍රය

| *අනු අංකය* | *ක්‍රීඩා භූමියේ නම* | *ගාස්තුව* | *තැන්පත් මුදල* | *අතිරේක පැයකට ගාස්තුව* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | .................................................. | . . . . . . . . | . . . . . . . | . . . . . . . |
| 02. | .................................................. | . . . . . . . . | . . . . . . . | . . . . . . . |
| 03. | .................................................. | . . . . . . . . | . . . . . . . | . . . . . . . |
| 04. | .................................................. | . . . . . . . . | . . . . . . . | . . . . . . . |

*11 වන කොටස - මහා නගර සහා බල ප්‍රදේශය තුළ පොදු මාර්ග වලට අලාභහානි ඇති කිරීම හා එම මාර්ගවල ගමනාගමනයට බාධා ඇති කිරීම වැළැක්වීම, විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.*

අතුරුව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභාවට අයත් පොදු මාර්ගවලට අලාභහානි ඇති කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා ඇති කිරීම වැළැක්වීම,විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

අරමුණ

2. මහා නගරසභාවට අයත් මාර්ග වලට හානි ඇති කිරීම අවම කිරීම හා මාර්ග වල ගමනාගමනයට බාධාවීම වැළැක්වීම යනාදි අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272(6)(ආ),(ඇ) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන්

4. මහා නගර සභාවට අයත් කිසියම් පොදු මාර්ගයක් ඔස්සේ ඇති පොදු කාණුවක් හරහා කිසියම් ඉඩමකට ඇතුල්වීමට අවශ්‍යවන දිගින් යුතු පාලමක්, වේදිකාවක් හෝ ආරුක්කුවක් මහා නගර සභාවේ අනුමැතිය සමඟින් තැනීම එකී ඉඩමේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ කාර්යය වියයුතු ය.

ඉටුනොකලයුතු කාර්යයන් (5 - 16)

5. කවරහෝ තැනැත්තෙකු විසින් මහා නගර සභාව සතු යම් මාර්ගයකට හානි පැමිණිවීම නොකළ යුතු අතර මාර්ගයේ ගමන් ගන්නා වාහනවලට හෝ පදික වේදිකාව පාවිච්චි කරනු ලබන පාගමන් කරුවන්ට බාධාවන ආකාරයෙන් මාර්ගයේ හෝ පදික වේදිකාවේ පහත දැක්වෙන කාර්යයන් වල නිරත නොවිය යුතු ය.

(i) වෙළෙඳාම් කිරීම,

(ii) ඉවත්කරගෙනයාම සඳහා පණ ගැන්වීමට හෝ වෙනත් ආපදාවක් හේතුවෙන් වෙනත් තැනකට පදවාගෙන යාමට නොහැකි වන කිසියම් හේතුවක් මත්තේ නම් මිස මාර්ගයේ වෙන් නොකළ තැන් වල වාහන නතර කර තැබීම,

(iii) වාහන අළුත්වැඩියා කිරීම හෝ වාහන සේදීම,

(iv) ගර්හිත වාහන කොටස් රඳවා තැබීම,

(v) කිසියම් මාර්ගයක කෙරෙන යම් අළුත්වැඩියාවක් සඳහා මහා නගර සභාවේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ තීරණයක් මත කෙරෙන කාර්යයක දී හැර ගල්, වැලි, බොරළු, පස්, ගඩොල් හෝ ලී කොට බෑම හෝ රඳවා තැබීම.

6. කිසියම් මාර්ගයක් ඔස්සේ ඇති කාණුවක් ගොඩ කිරීම හෝ ඊට හානි කිරීම හෝ එකී කිසියම් කාණුවක් දිගේ ගලායන ජලය පහසුවෙන් ගලා යාමට බාධා ඇති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7. නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ විධිවිධාන යටතේ පළලින් අඩි පනහකට (මීටර් 15.24) වැඩියෙන් වන මාර්ගයක් සඳහා වීථි රේඛා නියම කරනු නොලැබූ යම් මාර්ගයක මධ්‍ය රේඛාවේ සිට අඩි විසිපහක් (මීටර් 7.62) ඇතුළත කවර හෝ ආකාරයක ඉදිකිරීමක් කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු අතර වෙනත් යම් ඉදිකිරීමක් සඳහා ගෙන එන ලද කවර හෝ ඉදිකිරීම් ද්‍රව්‍යයක් කිසියම් මාර්ගයක හෝ එහි යම් කොටසක තැබීම නොකළ යුතුය.

8. මේ කොටසේ18 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නගරාධිපතිවරයා නැතහොත් නාගරික කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් නියෝගයකට පටහැනි ආකාරයෙන් ක්‍රියාකිරීම හෝ එකී යම් නියෝගයකට අනුව ක්‍රියා කරන කිසියම් තැනැත්තෙකුට බාධා ඇති කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

9. නගරාධිපතිවරයා නැතහොත් නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ ලිඛිත අවසරයක්ඇත්තේනම්මිස, කවරහෝ තැනැත්තෙකු විසින්මහා නගර සභාවසතු කිසියම් මාර්ගයක රැ දී තිබෙන ගල්, පීජ්පා, වැලි, පස් හෝ වෙනත් කිසියම් ද්‍රව්‍යයක් එකතු කිරීම හෝ ගොඩගැසීම හෝ ඉවතට ගෙනයාම නොකළයුතු ය.

10. ඉඩමක හෝ ඉඩමක පිහිටා ඇති ගොඩනැගිල්ලේ පතිත ජලය හෝ ළිඳ පවිත්‍ර කිරීමෙහි දී බැහැර කෙරෙන ජලය හැර වෙනත් ජලය, අපජලය උරා ගන්නා වලකට ගලායාමට සැලැස්විය යුතු අතර මහා නගර සභාව සතු මාර්ගයකට හෝ මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට ගලායාමට සැලැස්වීම නොකළ යුතු ය.

11. යම්කිසි වාහනයක ද්‍රව්‍යයන් හෝ දූවිලි හෝ වැලි යනාදිය ප්‍රවාහනය කරනු ලබන අවස්ථාවේ දී, කුඩා කැබලි වශයෙන් විසිරීම වළක්වන මතුපිට පියනක් හෝ ආවරණයක් නොමැතිව, තැනැත්තෙකු විසින් එවැනි කිසියම් ද්‍රව්‍යයක් මහා නගර සභාව සතු මාර්ගයක ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

12. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මාර්ගයකට අයත් කිසියම් සැතපුම් ගල්, කණු, මායිම් ගල්, මායිම් කණු, පහන් කණු, දුර පෙන්වන සලකුණු, පාලම්, බෝක්කු, කාණු, ආරක්ෂිත බැම්ම, දම්වැල් වැට, මාර්ග නාම පුවරු, සංඥා පුවරු යනාදිය මකා දැමීම, ගලවා දැමීම හෝ අශෝභන කිරීම, අනික් පැත්තට හරවා තැබීම හෝ එයට බාධා ඇති කිරීම හෝ ඒවා මත කිසියම් බිත්ති දැන්වීම් (පෝස්ටර්) හෝ අත්පත්‍රිකා පිටපත් ඇලවීම් නොකළ යුතු ය.

13. කිසියම් මාර්ගයක් පාවිච්චි කිරීම තාවකාලිකව නතර කර තැබීමට හෝ අළුත්වැඩියා කිරීමකට කවර හෝ බලයලත් තැනැත්තෙකුගේ නියෝගයකට අනුව එහි දමා ඇති හෝ ඉදි කර ඇති කිසියම් වැටක්, කණුවක්, ලෑලි හෝ වෙනත් බාධාකයන් කවර හෝ තැනැත්තෙකු ඉවත් නොකළ යුතු ය.

14. කිසියම් වාහනයක් නැතහොත් කරත්තයක් එකී වාහනයේ නැතහොත් කරත්තයේ රෝද වලට පාර්ශ්විකව ගස්, ලෑලි, යකඩ නැතහොත් වෙනත් ද්‍රව්‍යයන් එකී පැති වලට එහායින් දිග් අතට තිබෙන ආකාරයෙන් වාහනය පැදවීම හෝ ඒ අසලින් නවත්වා තැබීම නොකළ යුතු ය.

15. වාහනයකින් නැතහොත් කරත්තයකින් ගස් හෝ වෙනත් ද්‍රව්‍යයන් මාර්ගයේ ඇදගෙන යාම හෝ එකී ද්‍රව්‍යයන් මාර්ගයේ ඇදීමට තිබීම නොකළ යුතු ය.

16. කිසියම් මාර්ගයක මතුපිට හෝ එහි හරහට රැඳවුමක් හෝ වළක් හෝ කාණුවක් හෝ ඇලක් ඉදි කිරීම හෝ මාර්ගය හරහා ජලනල ඉදි කිරීම හෝ ඉදි කිරීමට උත්සාහ කිරීම නොකළ යුතු අතර වෙනත් යම්කිසි ආකාරයෙන් මාර්ගයේ මතුපිට පැත්ත කඩා දැමීම හෝ විනාශ කිරීම නොකළ යුතු ය.

17. කොන්ක්‍රීට් කරන ලද හෝ කුට්ටිගල් අතුරන ලද මාර්ගවල ටොන් පහකට (05)වඩා වැඩි බරකින් යුත් වාහන ගමනාගමනය නොකළ යුතුය.

මහ නගර සභාවේ කාර්ය භාරය

18. මහා නගර සභාවසතු කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය කරන කාර්යයක් සඳහා -

(i) එකී මාර්ගය සම්පූර්ණයෙන් ම හෝ මාර්ගයෙන් කොටසක් හෝ මාර්ගයේ කිසියම් දිසාවකට ධාවනයවන යම් මං තීරුවක් කිසියම් කාලයකට වාහන ගමනා ගමනයට වසා තැබීමට,

(ii) කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය එකී මාර්ගයේ කිසියම් කොටසක ගොඩ ගැසීමට,

(iii) එකී මාර්ගයට යාබදව ඇති ඉඩමකට ඇතුල්වීමට හෝ ඉදිකිරීම් ද්‍රව්‍යයන් අදාල ඉඩමේ තැබීමට (ඉඩමේ අයිතිකරුට අදාල කටයුත්ත සම්බන්ධව දන්වා, හැකි ආකාරයෙන් ඔහුගේ සහයෝගය ලබාගැනීමට කටයුතු කළයුතු ය.)

(iv) එකී මාර්ගයට යාබදව ඇති ඉඩමේ යම් දේපලකට හානියක් ඇති නොවන ආකාරයෙන්, එකීඉඩම ඔස්සේ වාහන ගමනාගමනයට ඉඩසැලැස්වීමට අදාල ඉඩමේ අයිතිකරුගේ අවසරය සමගින් (ඉඩමේ අයිතිකරුට අදාල කටයුත්ත සම්බන්ධව දන්වා, හැකි ආකාරයෙන් ඔහුගේ සහයෝගය ලබාගැනීමට කටයුතු කළ යුතු ය.)

නියෝග කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාටබලයක් ඇත්තේ ය.

බලය පැවරීම

19. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තෘව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකුල වන්නේ ය.

පැමිණිලිහා පිලියම් යාන්ත්‍රණය

20. කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරිකකොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම (21 - 22)

21. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

22. මේ කොටසේ7 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් උල්ලංඝනය කරමින් කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභාව සතු යම් මාර්ගයක හෝ එහි කොටසක කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් තබනු ලැබ ඇති අවස්ථාවක මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් එකී ඉදිකිරීම් ද්‍රව්‍යයන් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ මහා නගර සභාව සතු කිරීමට ක්‍රියා කිරීම නීත්‍යානුකූල වන්නේ ය. මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියා විසින් ඉහත ආකාරයෙන් ක්‍රියාකිරීම හේතුවෙන් එකී ඉදිකිරීම් ද්‍රව්‍යයන් මාර්ගයේ තබන ලද හෝ තැබීමට සලස්වනු ලැබූ තැනැත්තාට සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් එකී ද්‍රව්‍යයන් ඉවත් කිරීමට ක්‍රියා කළ නිලධාරියා හෝ මහා නගර සභාව වගකීමට යටත් නොවනු ඇත. එසේම, තවදුරටත් එසේ ඉවත් කළ ද්‍රව්‍යයන් වෙනුවෙන් කවර හෝ ප්‍රමාණයක වන්දියක් ගෙවීමට මහා නගර සභාව හෝ මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා යටත් නොවනු ඇත.

23. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. දඩ හා දණ්ඩන

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපනය හා නිර්වචන

-නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

-නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහ නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහ නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

-මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

-බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සදහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

-පොදු මාර්ගය" යන්නෙන්, මහා නගර සභාව තුළකිසියම්මංමාවතක්, මාර්ගයක්, මහ මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩිපෙළක්, ඒදණ්ඩක් හෝ මඟීපාලමක් අදහස් වන අතර මහා නගර සභාව තුළ කිසියම් මංමාවතකට, මාර්ගයකට, මහ මාර්ගයකට, පටුමගකට, වීථියකට, දෙවැටකට, පඩිපෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුරපෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන්කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක බෝක්කුවක්, දියපැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරකබැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාමපුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

-වාහනය"යන්නෙන්, රථවාහන ආඥාපනත යටතේ ඊට දී ඇති අර්ථ නිරූපනය අදහස් විය යුතු අතරකරත්තයක්, පාපැදියක් හෝ රෝද සවිකරන ලද යාන්ත්‍රිකව රථවාහන ආඥා පනතේ නොවූ වෙනත් ආකාරයකින් ක්‍රියා කරනු ලබන උපකරණයක් ද අදහස්වේ.

-හානි පැමුණුවීම"යන්නෙන්, විනාශ කිරීම, ගලවාදැමීම, විකෘතිකිරීම, පෙරලාදැමීම, බැහැරකිරීම, වෙනත් කවර හෝ ආකාරයෙන් හානි පැමිණවීම, කිසියම් කොටසක් මත පෝස්ටරයක් හෝ අත් පත්‍රිකාවක් ඇලවීම හෝ තීන්ත හෝ වෙනත් යම් ලාටු වර්ගයක් හෝ තාර ගෑම අදහස් වන අතර කිසියම් නාමපුවරුවක අකුරු වෙනස් කිරීම, මකාදැමීම, සූරා දැමීම හෝ ගලවා දැමීම ද ඊට ඇතුළත් වියයුතු අතර මහා නගර සභාව විසින් හෝ මහා නගර සභාවේ නගරාධිපතිවරයා විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් බලයලත් යම්නිලධාරියෙකු විසින් හෝ කිසියම් මාර්ගයක් අළුත්වැඩියාවක් සඳහා කරවනු ලබනයම් කාර්යයක් ඊට ඇතුලත් නොවිය යුතු ය.

## III වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ ලොන්ඩරි පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ලොන්ඩරි විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනයකිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ වන සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා වන අරමුණින් මෙම සම්මත අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 147 වන සහ 267(1) වන වගන්තින් සමග කියවිය යුතු 272(21) උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන් (4 - 5)

4. ඇමුණුම.01 හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

5. පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කරඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ ලොන්ඩරියකටබලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ii) ස්ථානයේ වූ එක් එක් කාමරයක ම බිත්ති මීටර් 3.0කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(iii) වහලය කිසියම් ස්ථිර සණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1 ක් වත් තිබිය යුතු ය.

(iv) ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහලක් (සීලිමක්)බැගින් සවිකර තිබිය යුතු අතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ කවුළු වල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය. කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(vi) කිළිටි රෙදි සහ සේදූ රෙදි සඳහා වෙන වෙනම කාමර සපයා තිබිය යුතුය.

(vii) සේවකයින්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දස දෙනෙකුට ම එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්‍ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතුය.

(viii) මහා නගර සභාව විසින් අපජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙනයනු ලබන්නේ නම්,බලපත්‍රලත් ස්ථානයෙන් රෙදි සේදීමෙන් පසු බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුව අපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතු අතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබියයුතු ය.

(ix) බලපත්‍රලත් ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ ක්‍රියාකාරී තත්වයෙන් සපයා තිබිය යුතු අතර එකී ස්ථානයට විදුලි සම්බන්ධතාව ඇත්නම්, අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ ද සපයා තිබිය යුතුය.

(x) බලපත්‍රලත් ලොන්ඩරියක සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක්වත් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

ඉටු නොකල යුතු කාර්යයන් (6 - 8)

6. අදාල නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ ලොන්ඩරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

7. (i) ලොන්ඩරියක් කවර හෝ අවස්ථාවක ගෘහ කාර්යය සඳහා භාවිත නොකළ යුතුය.

(ii) ලොන්ඩරියක කවර හෝ සතෙකු තබා ගැනීම හෝ එසේ තබා ගැනීමට ඉඩදීම නොකළ යුතුය.

(iii) කිළිටි රෙදි සහ සේදූ රෙදි එකට තැබීම හෝ තබන්නට සැලැස්වීම නොකළ යුතුය.

(iv) රෙදි සේදීමේ කාර්යය සඳහා අනුමැතිය නොලත් රසායන ද්‍රව්‍යයන් හෝ අහිතකර වන දෑ පාවිච්චි නොකළ යුතුය.

(v) රෙදි මැදීමේ කාර්යය සඳහා (Ironing) පොල්කටු අඟුරු හෝ කිසියම් සුදුසු අඟුරු වගයක් භාවිත කරනු ලබන්නේ නම්, එයින් බැහැර කරනු ලබන ශේෂ කොටස් ජලය යොදා නිවා දැමීමෙන් අනතුරුව වෙනම භාජනයක තැබීමට සැලැස්විය යුතු අතර බලපත්‍රලත් ස්ථානය ඇතුළත අඟුරු කැට නිපදවීම සඳහා පොල් කටු හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් පිළිස්සීම නොකළ යුතු ය.

(vi) මහා නගර සභාවෙන් අනුමත නොකළ නැතහොත් මහා නගර සභාවෙන් වෙන්කිරීමක් නොකළ කවර හෝ ස්ථානයක බලපත්‍රලාභියා විසින් රෙදි සේදීම, වියලීම නොකළ යුතු ය.

(vii) එක් එක් ලොන්ඩරිකරුවෙකු ම තමන්ගේ දෛනික කටයුතු අවසන් වීමෙන් පසු ලොන්ඩරියෙන් පිටවීමට පෙර, ඔවුන් විසින් දල්වන ලද ගින්දර හෝ ප්‍රභවය යනාදිය නිවීමටනැතහොත් ඒවා නිවා දැමීමට කටයුතු කළයුතු අතර යම්කිසි ගොඩනැගිල්ලක හෝ එහි ඇති රෙදි වල ආරක්ෂාවට අනතුරු සිදුවිය හැකි ප්‍රභවයක්, ගින්දරක් කවර හෝ වේලාවක දී පත්තු වීමට හෝ පත්තු කිරීමට ඉඩ නොදිය කළ යුතුය.

8. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග

ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේසඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්ය භාරය

9. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් ලොන්ඩරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

10. කිසියම් ලොන්ඩරියක් හෝ වියළීම ක්‍රමයකින් ලොන්ඩරියක් පවත්වා ගෙන යාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන වන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

බලය පැවරීම

11. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තෘව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගුකාලය

12. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (13 - 15)

13. (i) මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමටනගරාධිපතිවරයාටහෝනාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

14. මේ කොටසේ 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

15. මේ කොටසේ14 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේ ය.

16. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේ ය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

17. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

18. (i) මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. දඩ හා දණ්ඩන

(ii) මහා නගර සභා ආඥා පනතේ 147(3) වන වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක් නොමැතිව මහා නගර සභා බල ප්‍රදේශය තුළවියළීම ක්‍රමයකින් ලොන්ඩරියක් පවත්වාගෙන යාමේ වරදකට, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහක් නොඉක්මවන දඩයටකට ඔහු යටත් විය යුතු අතර අධිකරණ තීන්දුවෙන් පසුත්, ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සීයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල - අර්ථනිරූපනය හා නිර්වචන

-නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේනගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

-නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහ නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහ නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

-මහා නගර සභාව" යන්නෙන්, මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේ ය.

-බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සදහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

-පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය"යන්නෙන්, අදාල ස්ථානයේ රෙදි සේදීම, වියළීම මගින් පිරිසිදු කිරීම හෝ මැදීම හෝ යනාදි කාර්යයක් හෝ කාර්යයන් සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

-බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත් කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''ලොන්ඩරිය'' යන්නෙන්, රෙදි ශෝධකයෙකු ලෙස ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙකු විසින් රෙදි සේදීම, වියලීම මගින් පිරිසිදු කිරීම හෝ මැදීම හෝ යන කිසියම් කාර්යයක් හෝ කාර්යයන් කිහිපයක් සඳහා පාවිච්චි කරන කවර හෝ වර්ගයක ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක් හෝ ස්ථානයක් හෝ පරිශ්‍රයක් හෝ අදහස් වන අතර එවැනි යම් රෙදි ගබඩා කිරීම සඳහා පාවිච්චි කරන යම් ගොඩනැගිල්ලක් ද එවැනි තැනැත්තෙකු විසින් හෝ ඔහුගේ ව්‍යාපාරයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක්, ටැංකියක් හෝ ජලය ලබා ගන්නා වෙනත් ප්‍රභවයක් ඊට ඇතුළත් විය යුතු ය.

ඇමුණුම. 01

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ ලොන්ඩරියක් පවත්වාගෙන යාම සඳහා**
**ව්‍යාපරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20 වර්ෂය**
**(රෙදි සේදීම/ මැදීම / මැදීමත් සමඟින් රෙදි සේදීම / වියලීම මගින් පිරිසිදු කිරීම)**

1. ව්‍යාපාරික ස්ථානයේ නමඃ ..........................................................................................

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානයඃ
   (i) කොට්ඨාශයඃ ..................................................... වරිපනම් අංකයඃ....................................................
   (ii) වීථියේ/ පාරේ නම ඃ .........................................................................
   (iii) ග්‍රාම නිලධාරීඃ- කොට්ඨාශඅංකය . ඃ .........................................................................
   කොට්ඨාශයේ නම ඃ .........................................................................

3. අයදුම්කරුගේ ඃ
   (i) සම්පූර්ණ නම ඃ .........................................................................
   (ii) ස්ථිර ලිපිනය ඃ .........................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඃ .........................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය ඃ .........................................................................
   (v) දුරකථනඅංකය ඃ.........................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය ඃ.........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය ඃ.........................................................................
   (ii) ව්‍යාපාරයේ ස්වභාවය ඃ.........................................................................
   (iii) කර්මාන්තය/ ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ ඃ
   (a) නමඃ.......................................
   (b) දුරකථන අංකයඃ.......................................

5. (i) ව්‍යාපාරික ස්ථානයේ කිළිටි රෙදි සෝදන ස්ථානයක් තනා ඇත් ද, නැතහොත් වෙනම ස්ථානයක් තනා ඇත් ද? ඃ.........................................................................
   (ii) රෙදි සෝදන ස්ථානයක් තනා ඇත්නම්, අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි අපජලය බැහැර කිරීමට ජලාපවහන පද්ධතියක් සකස් කර ඇත් ද? ඃ.........................................................................
   (iii) වෙනම ස්ථානයක් කිළිටි රෙදි සේදීමට තනා ඇත්නම්, එකී ස්ථානය මහා නගර සභාවෙන් අනුමත කර තිබේ ද? ඃ.........................................................................

6. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම්:
   (i) අයිතිකරුගේ නම : ..........................................................................
   (ii) ලිපිනය : ..........................................................................

7. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද/ ඔව්:................................ නැත:................................
   ඔව් නම්: බලපත්‍රය අංකය:.............................. දිනය :..........................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරැදි බවත් සහතික කරමි. කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20..........................................................................වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

.........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ....................................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශය:.............................................................. වරිපනම් අංකය:..........................................................................

වීථියේ/පාරේ නම :..........................................................................
අයිතිකරුගේ නම :..........................................................................
දේපලෙහි ස්වභාවය :..........................................................................
වාර්ෂික වටිනාකම:..........................................................................
හිඟ වරිපනම් මුදල:.......................................................................... ඇත:.............................. නැත:..............................

.........................................
දිනය : ........................................ පරිපාලන නිලධාරි.

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:..........................................................................
ගෙවිය යුතු ගාස්තුව:..........................................................................
ඒකකය A B C :..........................................................................
සටහන් :..........................................................................

දිනය : ....................................... .........................................
ආදයම් පරීක්ෂක.

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්‍ෂකගේ වාර්තාව :

..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................

.........................................

දිනය : ......................................... මහජන සෞඛ්‍ය පරීක්ෂක.

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................

.........................................

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : .........................................

**ප්‍රධාන ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ..........................................................ව්‍යාපාරයේ ස්වභාවය:..........................................................................................................

පාරිසරික බලපත්‍ර:.......................................................... MOH වාර්තාව..........................................................................................................

අනුකූලතා සහතිකය : .......................................................... මත්පැන් බදු බලපත්‍ර:.......................................................... පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................
..................................................................................................................................................................................................................

............................................................

ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ............................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

............................................................

ගණකාධිකාරී.

දිනය : ............................................................

අනුමත කරමි. / නොකරමි.

............................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ............................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය:............................................................ ලදුපත් දිනය :............................................................

බලපත්‍ර අංකය : ............................................................ බලපත්‍ර දිනය : ............................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

............................................................

ආදයම් පරිපාලන නිලධාරි

දිනය : ............................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

............................................................

ගණකාධිකාරි

දිනය : ............................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

............................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ............................................................

## 4 වන අධිකාරය

*1 වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කෙරෙන සියළුම ප්‍රචාරක දැන්වීම් මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ ආරක්‍ෂාව, පහසුකම්, හිතකරභාවය සහතික කරලීමට අනුකූලව විධිමත්ව නියාමනය කිරීම හා පාලනය කිරීමෙහි අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 147 වන සහ 267(1) වන වගන්තින් සමඟ කියවිය යුතු 272 වන වගන්තියේ 27 වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන් (4 - 12)

4. (i) කිසියම් ප්‍රචාරක දැන්වීමක් මහා නගර සභා බල ප්‍රදේශය තුළප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අපේක්‍ෂිත එක් එක් තැනැත්තෙකු ම, අවම වශයෙන් එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට, දවස්හතරකට පෙර මෙහි ඇමුණුම.1 හි සඳහන් ආදර්ශ ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පත්‍රයක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

5. (i) බලපත්‍රයක් ලබාගැනීමට ඉදිරිපත් කරන එක් එක් ඉල්ලුම්පත්‍රයක් සමඟ මිලි මීටර් 210 x මිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක, 1:1000 පරිමානයට අනුව පිළියෙල කළ දැන්වීමේ ආදර්ශයක් සහ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානයේ හෝ ස්ථානවල මිලි මීටර් 210 x මිලි මීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමානයට අඳින ලද භූමි සිතියමක්හෝ සිතියමක් ඉදිරිපත් කර තිබිය යුතු අතර ප්‍රචාරක දැන්වීමේ නියම දිග හා පළල එහි සටහන් කර තිබිය යුතු ය.

(ii) අයදුම්කරුවෙක් නොවන වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් සංවිධානයකට අයත් ස්ථානයක් වන අවස්ථාවක එකී තැනැත්තා හෝ එකී සංවිධානය විසින් ඉහත ප්‍රචාරක දැන්වීම අදාල ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර තිබිය යුතු ය.

6. ප්‍රදර්ශනය කරනු ලබන එක් එක් දැන්වීමක් සඳහා ම නිකුත් කළ බලපත්‍රයේ අංකය, ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර, එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළවරේ සටහන් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබාගැනීමට ඉදිරිපත් කළ අයදුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම, ප්‍රදර්ශනය කරනු ලබන අවසාන දිනයෙන් පසුව පැය හතලිස් අටක් ගත වීමට මත්තෙන් එකී ප්‍රචාරක දැන්වීම හා ඊට යොදාගත් වෙනත් සියලුම ද්‍රව්‍ය කොටස් ඒ ස්ථානයෙන් සිට හෝ ස්ථානවලින් ඉවත් කරවීමට සැලැස්වීම එකී බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

8. (i) ශුද්ධ මුදල් ප්‍රමාණය යොදවන පුණ්‍ය කටයුතු සඳහා වූ යම් ප්‍රසංගයක ප්‍රචාරක දැන්වීමක්, කවර හෝ ප්‍රසංගයක් පවත්වන ස්ථානයක එකී ප්‍රසංගයට සම්බන්ධව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීම්, රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ පළාත් පාලන ආයතනයෙන් ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම්, ආගමික වශයෙන්, දේශපාලන වශයෙන් හෝ ඍජු හෝ වක්‍ර ව්‍යාපාරික දැන්වීම්නොවන මහජන රැස්වීම් සම්බන්ධ ප්‍රචාරක දැන්වීම් යනාදිය ගාස්තුවෙන් නිදහස් කළ හැකි ය. කෙසේ වුව ද, අදාල අවසරපත්‍රය මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් ලබාගත යුතු ය. තව ද, දිලිසෙන දීප්ත ප්‍රචාරක දැන්වීම් පුවරු හෝ ගුවන් නාම පුවරු යනාදිය සමඟ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන්ට අනුකූලව ගාස්තුව ගෙවීම් කර අවසරපත්‍රය ලබාගත යුතු ය.

(ii) කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය සහ ලිපිනය සමඟ වෙනත් කිසියම් වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබ ඇති අවස්ථාවක සහ කිසියම් නිවාසයක, කවර හෝ ආකාරයේ වෙළෙඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති අවස්ථාවක, එකී ප්‍රචාරක දැන්වීම හෝ ප්‍රචාරක දැන්වීම් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට යටත් විය යුතු ය. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් අවසරපත්‍ර ලබාගත යුතු තැනැත්තා ලෙස, එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටින කවර හෝ තැනැත්තෙකු අදහස් විය යුතු ය.

(iii) මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය පෙන්නුම් කෙරෙන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපලක් බදුදීමට හෝ විකිණීමට හෝ කුලීයට දීමට හෝ එකී දේපල මත ප්‍රදර්ශනය කරනු ලබන -බදු දීමට තිබේ"හෝ -විකිණීමට තිබේ" හෝ -කුලීයට දීමට තිබේ" යනුවෙන් සඳහන් වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා අයකිරීම්ගාස්තුවෙන් නිදහස් කරනු ලැබියයුතු ය. එනමුත්, මේ කොටසේඅතුරු ව්‍යවස්ථාවේ සෙසු නියමයන් ද අදාල විය යුතු ය. කෙසේ වුව ද, ඒ ආකාරයේ දැන්වීම් පුවරු එකකට වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කෙරෙන අවස්ථාවක, එසේ වැඩිවන එක් එක් දැන්වීම් පුවරුවක් සඳහා ම මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල විය යුතු ය.

9. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා පාවිච්චි කරන ප්‍රචාරක පුවරුවේ හිමිකරු හෝ බදුකරු විසින් -

(i) එකී ප්‍රචාරක පුවරුව මනාව අලුත්වැඩියා කළ තත්ත්වයෙනුත්, ආරක්ෂාකාරී තත්ත්වයෙනුත් පවත්වාගෙන යා යුතු ය. ඒ සමඟ

(ii) එකී ප්‍රචාරක පුවරුව ඉදිරිපස පැත්තෙහි තරාදියක් ආකාරයෙන්පැහැදිලිව කියවීමට හැකි අකුරින් ඔහුගේ නාමයත්, ලිපිනයත්, දුරකථන අංකයත් විවෘතව පෙනෙන පරිදි තිබිය යුතු ය.

10. මාර්ගයක් හෝ පදික වේදිකාවක් පාවිච්චි කරන තැනැත්තන්ට අනතුරක් සිදුනොවන ආකාරයෙන් ගුවන් නාම පුවරු සවිකළ යුතු අතර කිසියම් අවස්ථාවක මෙම ගුවන් නාම පුවරුව කඩා වැටී කවර හෝ තැනැත්තෙකුට හෝ දේපලකට අලාභයක් ඇති වුවහොත්, එකී ගුවන් නාම පුවරුවේ හිමිකරු විසින් එකී අලාභය එකී තැනැත්තාට නැතහොත් දේපල හිමිකරුට ගෙවිය යුතු අතර නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ එලෙස වූ අලාභය ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

11. ගුවන් නාම පුවරු නාගරික ඉංජිනේරුවරයාගේ උපදේශයට අනුකූලව සකස් කර, ඔහුගේ අනුමැතිය සමඟ ප්‍රදර්ශනය කළයුතු ය.

12. (i) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක්, සවිකිරීමක් හෝ ඒ සඳහා යොදා ගනු ලැබූ වෙනත් යම් දෙයක් හේතුවෙන් හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් දර්ශනය කෙරෙන අර්ථය හෝ හැඟෙන වෙනත් අර්ථය හේතුවෙන් කිසියම් තැනැත්තෙකුට සිදුවන හෝ සිදුවිය හැකි යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධව බලපත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය.

(ii) ප්‍රදර්ශනය සඳහා වලංගු බලපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන යම් හානියක් හෝ විකෘති කිරීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් මහා නගර සභාව කවර ආකාරයක හෝ වගකීමකට යටත් නොවිය යුතු ය.

ඉටු නොකල යුතු කාර්යයන් (13 - 21)

13. (i) නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා මෙහි ඇමුණුම.1හි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ අයදුම්පත්‍රයට අනුව නිකුත් කරන ලද වලංගු අවසරපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගරසභා බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

(ii) ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු අවසරපත්‍රයක් ලබා ඇත්තේ වුව ද, කවර වූ හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාල බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථානවල හැර, වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

14. දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා සිටින ස්ථානය සඳහා වෙනත් තැනැත්තෙකුට කලින් නිකුත් කළ බලපත්‍රයක වලංගු කාල සීමාව අවසන් වී තිබිය යුතු ය. ඒ සමඟ අදාල ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් ද තිබිය යුතු ය. එසේ වුව ද, කලින් කල නිකුත් කළ හා අනුගාමී වලංගු බලපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැකුම් පැළැල්ලක සඳහන් දැන්වීම දර්ශනය වීමට බාධාවක් ඇති නොවන පරිදි ඊට ආසන්නයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට බාධාවක් නොවිය යුතු ය.

15. (i) ප්‍රදර්ශනය කිරීම සඳහා ඉල්ලුම් කරන දැන්වීම, අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හානිකර හෝ කවර හෝ ආගමකට හෝ ජන වර්ගයකට හෝ ජන කොට්ඨාශයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් උදාවීමට ඉඩ තිබෙන ආකාරයේ දර්ශන හෝ වදන් ඇතුළත් වන ආකාරයේ නොතිබිය යුතු ය.

(ii) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම නොකළයුතු ය.

16. කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් ගන්නා කවර හෝ තැනැත්තෙකුට, වාහනයකට හෝ අවහිර වීමක්, අනතුරක් හෝ සිදුවන ආකාරයෙන් කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි නොකළ යුතු ය. තව ද, වාහන පදවාගෙන යනු ලබන කිසියම් රියැදුරෙකුගේ අවධානය වෙනස් කරන ආකාරයෙන් නැතහොත් ඔහුගේ දර්ශනයට අවහිර වන ආකාරයෙන් විදුලි ආලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්තියක් ඇතිවන ආකාරයෙන් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ද නොකළ යුතු ය.

17. කිසියම් ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු වැඳුම් පිදුම් ස්ථාන, උයන්, පාලම්, මාර්ග, පහන් කණු, දුරකථන කණු යනාදියෙහි හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක හෝ වෙනත් කිසියම් කොටසකට හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවිකිරීම, ඇලවීම, එල්ලීම, බැඳ තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම කවරෙකු විසින් හෝ නොකළ යුතු ය.

18. යම් පදික වේදිකාවකට, වීථියකට හෝ පාරක රිය මඟට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයට වන ප්‍රචාරක දැන්වීමක්, එකී ප්‍රචාරක දැන්වීම, පදිකයන්ගේ පාවිච්චිය සඳහා මඟී පාලකමකට සවිකර හෝ යා කර ඇත්නම් මිස හෝ නාගරික ඉංජිනේරුවරයා විසින් අනුමත කර ඇති ආකාරයට ඉදිකර නිර්මාණය කර ඇති නෙරා සිටින දැන්වීම් පුවරුවක් මිස, ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

19. (i) කවර හෝ තැනැත්තෙකු නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කළආකාරයට පටහැනිව හෝ ආදර්ශ ආකෘති හැඩයට නොවූ කවර හෝ ප්‍රචාරක දැන්වීමක් වාහනයෙන් ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(ii) කවර හෝ තැනැත්තෙකු මහා නගර සභාවේ අනුමැතියට අතිරේකව, පොලිස් අධිකාරීයෙකු විසින් අනුමත නොකළ දිලිසෙන ප්‍රචාරක දැන්වීමක් සමඟින් යම් වාහනයක් පාරේ හෝ කිසියම් මාර්ගයක පදවාගෙන යාම නොකළ යුතුය.

20. කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මගින් එකී ප්‍රචාරක දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලැබූ නීතිමය අවසරයක් සහිත බවට නොසැලකිය යුතු අතර එලෙස තේරුම් ගැනීම ද නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය (21 - 24)

21. (i) මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහා නගර සභාවට අයත් ස්ථාන වලින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේ ද, යන්න මහා නගර සභාව විසින් තීරණය කළයුතු ය.

(ii) ඉදිරිපත් කරනු ලැබ ඇති කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක, ඒ බව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබීමෙන් අනතුරුව ඔහු විසින් මේ කොටසේ 25 වන අතුරු ව්‍යවස්ථාවේ ඃස* වන වගන්තියේසඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුව සහ 22 වන අතුරු ව්‍යවස්ථාවේඃස* වන වගන්තියේ සඳහන් ඇප මුදල, මහා නගර සභාව වෙත ගෙවනු ලැබීමෙන් පසුව අදාල බලපත්‍රය නිකුත් කිරීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය විය යුතුය.

(iii) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ පිළිබඳව කලින් මහා නගර සභාව විසින් ගනු ලබන තීරණය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සැලැස්වීම නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන අතර එකී නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(iv) මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කවර හෝ ප්‍රදේශයක මහා නගර සභාව සතු කිසියම් ඉඩමක හෝ මහා නගර සභාව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව ලබාගන්නා වෙනත් කිසියම් තැනැත්තෙකු සතු ඉඩමක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැළලි ඉදිකර පවත්වාගෙන යාමට මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

(v) ඉහත II වන වගන්තිය යටතේ මහා නගරසභාව විසින් ඉදිකරනු ලැබ ඇති කිසියම් දැකුම් පැළැල්ලක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මහා නගර සභාව විසින් කලින්තීරණය කළගාස්තුවක් ප්‍රදර්ශකයන්ගෙන් අයකර ගැනීමට මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

(vi) මේ කොටසේ 25වන අතුරු ව්‍යවස්ථාවේ I වන වගන්තියේ විධිවිධාන යටතේ මහා නගර සභාව විසින් පනවනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

22. (i) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන කිසියම් ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට තීරණය කර ඇති අවස්ථාවක, මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ප්‍රමාණයේ ඇප මුදලක් ඉල්ලුම්කරු විසින් මහා නගර සභාවේ තැන්පත් කරනු ලබන තෙක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී ඉල්ලුම්පත්‍රයට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(ii) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර, මහා නගර සභාවේ තැන්පත් කළ යුතු ඇප මුදල් ප්‍රමාණය පිළිබඳව මහා නගර සභාව විසින් ගනු ලබන තීරණය ගැසට් පත්‍රයේ නිවේදනය කිරීම නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

23. (i) මේ කොටසේ 7 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් ප්‍රචාරක දැන්වීම් පුවරුව ඉවත් කිරීමෙන් අනතුරුව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා වෙත ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත අදාල බලපත්‍රය ලබාගැනීම සඳහා කලින් මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබූ ඇප මුදල බලපත්‍රලාභියා විසින් ආපසු ලබා ගැනීමට හැකි ය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී ඇප මුදල බලපත්‍රලාභියා වෙත නිදහස් කිරීමට පෙර -

(අ) මේ කොටසේ 7 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් බලපත්‍රලාභියා විසින් නිසි ආකාරයෙන් ඉටු කර තිබේද, යන්නත්;

(ආ) දැන්වීම ප්‍රදර්ශනය කරනු ලැබ ඇත්තේ මහා නගර සභාව විසින් ඉදිකරන ලද දැකුම් පැළැල්ලක වන අවස්ථාවක, එකී දැන්වීම ඉවත් කිරීමේදී හෝ බලපත්‍රලාභියා විසින් වගකිව යුතු කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ එකී දැකුම් පැළැල්ලට කිසිදු හානියක් සිදු වී නොමැති බවත්;

තහවුරු කර ගැනීම නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) බලපත්‍රලාභියා විසින් මේ කොටසේ7 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියාකර ඇති බව සහ මහා නගර සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී නොමැති බවත්,ඉහත II (ආ) වන වගන්තියේ සඳහන් ආකාරයට තහවුරු කර ගැනීමේදී නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම් මිස, එකී ඇපමුදල බලපත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන් නිදහස් කිරීම නොකළ යුතු ය. කිසියම් බලපත්‍රලාභියෙකු විසින් මේ කොටසේ 7 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ මහා නගර සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදු වී ඇති විට, අවස්ථාවෝචිත පරිදි එකී කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ල අලුත්වැඩියා කිරීම හෝ එකී කාර්යයන් දෙකම සඳහා මහා නගර සභාවට දරන්නට සිදුවන වියදම් තැන්පත් මුදලෙන් අයකර ගත යුතු අතර ඉතිරිවන යම් මුදල් ප්‍රමාණයක් වෙතොත්, එකී මුදල පමණක් බලපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකි ය.

(iv) ඉහත (iii) වන වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේ දී මහා නගර සභාවෙන් අයකර ගත යුතු මුදල, තැන්පත් කරනු ලැබූ ඇප මුදලට වඩා වැඩිවන අවස්ථාවක, එසේ වැඩිපුර අයකළ යුතු මුදල බලපත්‍රලාභියා විසින් මහා නගර සභාවට ගෙවිය යුතු ය.

(v) කෙසේ වුව ද, ඇප මුදල නිදහස් කිරීමට බලපත්‍රලාභියා විසින් කරන ලද ලිඛිත ඉල්ලීම ලැබී දවස් 14 ක් ඇතුළත ඇප මුදල ආපසු ගෙවිය යුතු ය. එසේ නොවන අවස්ථාවක, ඇප මුදල ආපසු ගෙවීමට නොහැකි වන කරුණු සඳහන් කරමින්, දවස් 14 ක් ඇතුළත බලපත්‍රලාභියා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

24. මහා නගර සභාවේ බලපත්‍රයක් නොමැතිව, ප්‍රදර්ශනය කරනු ලබන කරනු ලබන සියළුම ප්‍රචාරක දැන්වීම් ඉවත් කරමින්, මහා නගර සභාව යටතට ගෙන ඒම හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වන්නේය.

25. (i) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා මහා නගරසභාආඥා පනතේ 247අ(2)වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන වන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලයඇත්තේ ය. අයකිරීම් හා ගාස්තු

ඒ සමඟ

(ii) (අ) මහා නගර සභාව විසින් මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ ඉදිකළ දැකුම් පැළැල්ලක් වනවිට ඒ දැකුම් පැළැල්ලේ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මේ කොටසේ 21 වන අතුරු ව්‍යවස්ථාවේ (V) වන වගන්තිය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තුව මහා නගර සභාවට ගෙවා තිබිය යුතු ය;

නැතහොත්

(ආ) ප්‍රදර්ශකයෙකුට හෝ වෙනත් යම් තැනැත්තෙකුට හෝ යම් සංවිධානයකට අයත් ස්ථානයක් වන අවස්ථාවක, ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මහා නගර සභාවෙන් කාලයෙන් කාලයට තීරණය කරනු ලබන ගාස්තුව ප්‍රදර්ශකයා විසින් මහා නගර සභාවට ගෙවිය යුතු ය.

(iii) එසේ ම මේ කොටසේ 22 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ ඇප මුදලත් ගෙවිය යුතු ය.

(iv) සභාවෙන් කාලයෙන් කාලයට තීරණය කරනු ලබන තාවකාලික බලපත්‍ර සඳහා වූ ගාස්තුව, තාවකාලික අවසරපත්‍රයට අයදුම් කරනු ලබන තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(v) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා නිකුත් කරනු ලැබූ අවසරපත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව අනුගාමී වර්ෂය තුළදීත්, එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවක එකී අනුගාමී වර්ෂය සඳහා එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නැවුම් අවසරපත්‍රයක් ලබාගත යුතුය.

එසේ වුව ද, ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට නිකුත් කරනු ලබන අවසරපත්‍රයක් වෙනුවෙන් අනුගාමී වර්ෂය තුළ අයකිරීමට මහා නගර සභාව සම්මත කර ඇති අවසරපත්‍ර ගාස්තුව කුමක් වුව ද, එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා නිකුත් කරනු ලබන නැවුම් අවසරපත්‍රයට කලින් සම්මත කළඅවසරපත්‍ර ගාස්තුව ම අයකිරීම කළයුතු ය.

26. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන්හි නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

27. (i) මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, එකී බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

(ii) කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, නිකුත් කරන ලද තාවකාලික අවසරපත්‍රය නිකුත් කරන ලද දවස් වලට පමණක් වලංගු විය යුතුය.

පරීක්ෂණ ක්‍රියාපටිපාටිය හා අධිකාරය

28. (i) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර අන්දමේ හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදිකිරීමක් හෝ සවිකිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තෙකුට හෝ යම් තැනැත්තෙකුගේ දේපලකට අන්තරාදායකවන හෝ හානිවන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්ත්වයට පත්කරන ලෙස බලපත්‍රලාභියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

(ii) ඉහත (i) වන වගන්තිය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙු එකී දැන්වීමේ සඳහන් කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක දී, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කළ බලපත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(iii) ඉහත (ii) වන වගන්තියේ විධිවිධාන යටතේ කිසියම් බලපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබ ඇති ඇප මුදල මහා නගර සභාව සතු විය යුතු අතර එම ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

(iv) අවශ්‍ය වන අවස්ථාවක දවස් 14කට අඩු තාවකාලික අවසරපත්‍රයක් නිකුත් කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට නීත්‍යානුකූල වන්නේ ය. කෙසේ වුව ද, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල සඳහන් නියමයන් තාවකාලික අවසරපත්‍ර නිකුත් කිරීමේ කරුණටත් අදාල විය යුතු ය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

29. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම (30 - 31)

30. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩ කර ඇති අවස්ථාවක, එකී කඩකිරීම පිළිබඳව අවධානය යොමු කරන නිවේදනයක් සමග නිකුත් කරනු ලැබූ කිසියම් බලපත්‍රයක් අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට නීත්‍යානුකූල බලයක් ඇත්තේ ය.

දඩ හා දණ්ඩන

32. (i) මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් කවර හෝ විධි විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (අ),(ආ) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින්

එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි (ඇ) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

(ii) මහා නගර සභා ආඥා පනතේ 147(3) වන වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක් නොමැතිව මහා නගර සභා බල ප්‍රදේශය තුළප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ වරදකට, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහක් නොඉක්මවන දඩයටකට ඔහු යටත් විය යුතු අතර අධිකරණ තීන්දුවෙන් පසුත්, ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සීයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපනය හා නිර්වචන

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''නාගරික ඉංජිනේරුවරයා'' යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ ඉංජිනේරුවරයා අදහස් වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්,මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්,මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පොලිස් අධිකාරී'' යන්නෙන්,තත්කාර්යය සඳහා මූලස්ථාන පොලිස් ස්ථානාධිපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ පොලිස් ස්ථානයේ යම් නිලධාරියෙකු ද අදහස් වේ.

''කටවුට්''යන්නෙන්, ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කළ කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක් ද,

''දැකුම් පැළැල්ල" යන්නෙන්, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවි කිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

''ප්‍රචාරක දැන්වීම" යන්නෙන්, කවර හෝ තැනැත්තකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහළින් හෝ ඒ මත සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයකින් ස්ථානගත කරනු ලබන ප්‍රචාරක කාර්යය සඳහා යොදා ගනු ලබන හෝ කිසියම් අක්ෂර හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළෙඳ දැන්වීමක් ද, අදහස් වේ.

ඇමුණුම අංක.1

**මහා නගර සභාව ප්‍රචාරක කටයුතු සම්බන්ධ අයදුම්පත්‍රය**

1. සම්පූර්ණ නමː- .............................................
2. ස්ථිර ලිපිනයː- .............................................
3. ජාතික හැඳුනුම්පතේ අංකයː- .............................................
4. ජංගම දුරකථන අංකයː- .............................................
5. විද්‍යුත් තැපැල ː- .............................................
6. ප්‍රචාරකයේ ආදර්ශ ආකෘතිය අමුණා ඇත්තේ දː- ☐
7. ප්‍රදර්ශනය කරන ස්ථානයේ ආදර්ශ සිතියම අමුණා ඇත්තේ දː- ☐
8. ප්‍රචාරකයේ වර්ගයː- එක් පැත්තක් ☐ දෙපැත්තක් ☐ ආලෝකය සහිතයි ☐
9. අවසරය ඉල්ලා සිටින කාලයː- .............................................සිට .............................................දක්වා
10. ප්‍රචාරකදැන්වීමේ ප්‍රමාණයː- දිග................... පළල.......................... . උස................................
11. ප්‍රදර්ශනය කරන ස්ථානයේ විස්තරː- පුද්ගලික ඉඩම/RDD පාර RDA පාර/මහා නගර සභාව සතු දේපල

ඉහත මා විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත්, යම් හෙයකින් එකී තොරතුරු අසත්‍ය තොරතුරු බවට තහවුරු වුවහොත්, අදාල ප්‍රචාරකය කිසිදු පෙර දැනුම් දීමකින් තොරව ඒ සියල්ල කපා ඉවත් කර, මහා නගර සභාව සතු කිරීමට යටත් වන බවට එකඟ වෙමි.

.............................................

අයදුම්කරුගේ අත්සන

දිනය ː .............................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

ප්‍රධාන ආදායම් පරීක්ෂක,

අදාල ස්ථානයේ ........................................................................ ප්‍රමාණයේ ප්‍රචාරක දැන්වීම තැනීම ගැලපේ. /නොගැලපේ.

..............................................
ආදායම් පරීක්ෂක.

දිනය : .............................................

නාගරික කොමසාරිස්,

ඉහත ප්‍රචාරක දැන්වීමේ පිහිටීම නිර්දේශ කරමි./නොකරමි.

නාගරික කොමසාරිස්,

ප්‍රචාරක දැන්වීමේ ප්‍රමාණයඃ- දිග ..........................................පළල .......................................මුළු ප්‍රමාණය (වර්ග අඩි)................................

| *විස්තර* | *පුද්ගලික ඉඩම* | *RDD පාර* | *RDA පාර* | *මහා නගර සභාව සතු දේපල* | *මහා නගර සභාව සතු පාර* |
|---|---|---|---|---|---|
| ගිවිසුම ඇත | | | | | |
| බිම් කුලීය | | | | | |
| ප්‍රදර්ශන ගාස්තුව | | | | | |
| මුළු ගාස්තුව | | | | | |
| VAT | | | | | |
| NBT | | | | | |
| මුළු මුදල | | | | | |

.............................................................
විෂය කළමනාකරු.

.............................
දිනය

අදාල ප්‍රචාරක දැන්වීම අනුමත කරමි./නොකරමි.

.............................................................
නාගරික කොමසාරිස්.

.............................
දිනය

ලදුපතේ අංකය :- ........................................................................................................................

දිනය :- ........................................................................................................................

ගොනු අංකය :- ........................................................................................................................

...........................................

පරිපාලන නිලධාරී.

...................

දිනය

නාගරික කොමසාරිස්,

අදාල ප්‍රචාරක දැන්වීම නිවැරැදි ස්ථානයේ, නිවැරැදි ප්‍රමාණයෙන් /වෙනත් ස්ථානයක, වෙනස් ප්‍රමාණයක තනා ඇති බව සහතික කරමි.

.......................................................................

ක්ෂේත්‍ර නිලධාරී (සැලසුම් ඒකකය)

....................

දිනය

## *II වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාහන නතර කිරීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ වූ මාර්ගවල රථ වාහන නතර කිරීම විධිමත් කිරීම, නියාමනය කිරීම,අධීක්‍ෂණය කිරීම,පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. මහා නගර සභා බල ප්‍රදේශයේ සුදුසු ස්ථානයන්හි රථවාහන ගාලපරිපාලනය කිරීම මගින් වාහන තදබදය පාලනය කිරීම, මගීන් ආරක්ෂා කිරීම සහ රථවාහන අනතුරු වලක්වා ගැනීම යනාදි අරමුණු උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 267(1)වන වගන්තිය සමඟ කියවිය යුතු 272(32) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටු කළ යුතු කාර්යයන් (4 - 15)

4. මහා නගරසභා බල ප්‍රදේශය ඇතුළත හෝ මහා නගර සභාබල ප්‍රදේශයේ සීමාව හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන කවර හෝ වාහනයක රියැදුරෙකු විසින් මේ කොටසේ 23 වන අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තියේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

5. සෑම රථ ගාලක ම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකි ආකාරයෙන් ත්‍රිවිධ භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේ දී සහ ඉන් පිටතට ගැනීමේදී ධාවනය කළ යුතු දිසාව පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටි මීටර් 20.0ක පළලින් යුතු සුදු පාට රේඛාවක් සහිත ඊතල සලකුනු කර තිබිය යුතු ය.

6. සෑම රථ ගාලක ම බිම තාර දමා හෝ කොන්ක්‍රීට් දමා තිබිය යුතු අතර එකී රථ ගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයට වෙන් වෙන් වූ වැසිකිළි තනා තිබිය යුතු ය. එසේම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් ගලායාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය.

7. සෑම රථ ගාලක ම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේදී, රථ ගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මං තීරු ඇතිකර තිබිය යුතු ය.

8. කිසියම් වාහනයක් රථ ගාල ඇතුළත ධාවනය කිරීමේදී හා ගාල් කිරීමේ දී, ඒ තුළ ගාල් කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථ ගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතු අතර එක් එක් වාහනය සඳහා වෙන්කර ඇති සීමාව පෙන්නුම් කෙරෙන සෙන්ටි මීටර් 10.0ක පළලින් යුතු සුදු පාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

9. (i) කිසියම් රථ ගාලක නවතා තබන වාහනවලින් ගාස්තු අයකිරීම සඳහා මෙහි මින් මතු -රථ ගාල භාරකරු" යනුවෙන් හඳුන්වනු ලබන -

(අ) මහා නගරසභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු;

හෝ

(ආ) මහා නගරසභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලැබූ කිසියම් සාර්ථක ටෙන්ඩර්කරුවකු හෝ එකී ටෙන්ඩර්කරු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු;

නියුක්ත කරවීම කළ හැකි ය.

(ii) කෙසේ වුව ද, කිසියම් රථ ගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට මහා නගරසභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාත් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියැදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

10. (i) මේ කොටසේ 26 වන අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තිය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථ ගාලට ඇතුල්කරන අවස්ථාවේදී, එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟදී එකී වාහනයේ රියැදුරා වෙත මේ කොටසේ දෙවන උපලේඛනයට සාරනුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දැක්වෙන ඇතුල්වීමේ අවසර කාඩ්පත්‍රයක් නිකුත් කිරීම රථ ගාල භාරකරුගේ කාර්යය විය යුතු ය.

(ii) ඇතුල්වීමේ අවසරපත්‍රයක් සහිත සෑම වාහනයක් ම රථ ගාලෙන් පිටත්ව යාමට පෙර -

(අ) ඉහත (i) වන වගන්තියේ සඳහන් කාඩ්පත්‍රය රථ ගාල භාරකරුට ආපසු භාරදීම;

(ආ) මේ කොටසේ 28 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට මහා නගර සභාව මහා නගර සභාවේ විසින් තීරණය කරනු ලැබූ ඉඩ ප්‍රමාණයන්ට ගැලපෙන වාහන, නවතා තැබීමේ ගාස්තුව රථ ගාල භාරකරුට ගෙවීම; සහ

(ඇ) ගෙවන ලද ගාස්තුවට ගැලපෙන මේ කොටසේ 9 වන අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තියේ සඳහන් කුවිතාන්සියක් ලබා ගැනීම, එකී වාහනයේ රියැදුරාගේ කාර්යය විය යුතු ය.

11. මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාහෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තිබෙන,

යම් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියැදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුල්වීමේ අවසර කාඩ්පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින අවස්ථාවක, එය පරීක්ෂා කිරීම සඳහා ලබාදීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියැදුරුගේ කාර්යය විය යුතු ය.

12. මහා නගරසභා ප්‍රදේශය ඇතුළත පිහිටුවා තිබෙන යම් රථ ගාලක් ඇතුළත නවතා තබන -

(i) රජයේ වාහන වලට;
(ii) පළාත් සභාවේ වාහන වලට;
(iii) පළාත තුළ සංස්ථාපනය කර ඇති කිසියම් පළාත් පාලන ආයතනයක වාහන වලට;
(iv) ජලසම්පාදන, දුරකථන, විදුලි යනාදි ලබාදීම් සේවාවන්හි සේවයේ නියුක්ත ආයතනයන් හි අළුත්වැඩියා හෝ නඩත්තු කාර්යයේ යොදවා ඇති වාහන වලට;

මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල විධිවිධානයන්ට අනුව ගාස්තු කිසිවක් ගෙවීම් කළ යුතු නොවන්නේ ය. කිසියම් රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් වාහනයකට මේ කොටසේ 28 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් ම අදාල විය යුතු ය.

13. (i) අවසරපත්‍රයක් නොමැතිව මෝටර් වාහනරථ ගාලක වාහනයක් නවත්වා ඇත්තේ නම්, එකී වාහනය එකී ස්ථානයෙන් ඉවත් කිරීමට,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යානුකුල විය යුතු ය. ඒ සඳහා පොලිසියේ උදව්ව ද පැතිය හැකිය.

(ii) එසේ ඉවත් කරන විට වාහනයට සිදුවන කිසියම් හානියකට මහා නගර සභාවෙන්, වාහන හිමිකරු හෝ රියදුරු අලාභයක් ඉල්ලා සිටිය නොහැකිය.එකී වාහනය ඉවත් කිරීම සඳහා වාහනය අදාල ස්ථානයට ගෙනයාම සඳහා වූ වියදමත්, ආරක්ෂා කිරීමේ වියදමත් නාගරික කොමසාරිස්වරයා විසින් ඇස්තමේන්තු කරනු ලබන වෙනත් වියදමුත් හිමිකරු හෝ රියදුරු විසින් මහා නගර සභාවට ගෙවීම් කළ යුතු ය.

(iii) නිකුත් කරනු ලැබූ එක් එක්කුවිතාන්සි වල, එය නිකුත් කරනු ලැබුවේ යම් වාහනයක් සම්බන්ධයෙන් ද, එකී වාහනයේ හැඳින්වීමේ අංකය එහි සඳහන් විය යුතු අතර අදාල කුවිතාන්සියේ සඳහන් කාල සීමාවට පමණක් එය වලංගු වන්නේ ය.

(iv) අවසරපත්‍ර ලබාගන්නා එක් එක් තැනැත්තෙකු ම වාහනයට පිටතින් පැහැදිලිව පෙනෙන පරිදි ලබාගත් අවසරපත්‍රය ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

14. මහා නගර සභාවෙන් විශේෂ වාහන රථ ගාලක් ව හඳුන්වා දී ඇති ස්ථානයක, කාලයෙන් කාලයට සභාවේ යෝජනා සම්මතයකින් තීරණය කරනු ලබන ගාස්තුව ගෙවා විධිවිධාන වලට යටත්ව මාසික අවසරපත්‍රයක් ලබා ගත යුතු ය.

15. රජයේ ආයතන හෝ පළාත් පාලන ආයතන නොවන වෙනත් ආයතන සඳහා මහා නගර සභාව විසින් කාලයෙන් කාලයට තීරණය කරනු ලබන ගාස්තුව ගෙවා කවර හෝ ආයතනයක් වාහන රථ ගාල වෙන් කර ගැනීමට හැකි ය.

ඉටු නොකලයුතු කාර්යයන් (16 - 22)

16. කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභාවේ අනුමැතිය නොමැතිව කිසියම් පෞද්ගලික වාහන රථ ගාලක් පවත්වා ගෙන නොයා යුතු ය.

17. මේ කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුන ද,23 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබ, සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මගින් නියම කරනු ලැබ ඇති සීමාවන් -

(i) එකී විථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ මහා නගරසභා බල ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදා ගන්නා මහා නගරසභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා;

(ii) එකී විථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ මහා නගරසභා බල ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ඇතිවන වාහන තදබදයක් මඟ හැරවීම සඳහා හෝ මහා නගරසභා බල ප්‍රදේශය ඇතුළත ඇති වන වෙනත් කිසියම් අනපේක්ෂිත තත්ත්වයක් පාලනය කිරීම සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් අවස්ථාවෝචිත පරිදි කරනු ලබන විධානයක් අනුව ක්‍රියා කිරීම සඳහා;
මේ කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

18. (i) කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තැබීමට ඉඩදීමට මහා නගරසභාව විසින් තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස, වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථ ගාලක නවතා තැබීම හෝ රථ ගාලකට ඇතුල්කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

(ii) රථ ගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පණ ගැන්වීමට නොහැකි වන අවස්ථාවකදී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථ ගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථ ගාලට ඇතුල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම්, එසේ පැමිණෙන වෙනත් වාහනයකට (i) වන වගන්තියේ විධිවිධාන අදාල නොවිය යුතු ය. කෙසේ වුව ද, එකී වාහනය ඇදගෙන යාමේදී රථ ගාලේ නවතා තිබෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙන යාම නොකළ යුතු ය.

19. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක ඇතුළත -

(i) වාහනයක් සේදීමට හෝ එසේ කිරීමට ඉඩ සැලැස්වීම;

(ii) යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පණ ගැන්වීමට අත්‍යවශ්‍ය අලුත්වැඩියාවක් හෝ රෝදයක් මාරු කිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් කිරීම;

(iii) ඉහත (i) වන වගන්තියේ සඳහන් කිසියම් අලුත්වැඩියා කිරීමක දී, අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීම හැර අනවශ්‍ය වන්නා වූ හෝ බාධාකාරී වන්නා වූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම;

(iv) මෙම වාහනය එකී රථ ගාල භාරකරුගේ අවසරයක් නොමැතිව වාහනය නවතා ඇති ස්ථානයක සිට එම රථ ගාලේම වෙනත් ස්ථානයකට ගෙන ගොස් නැවතීම;

(v) මෙම වාහනය එකී රථ ගාලේ ධාවන මං තීරු හෝ ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු අවහිර වන සේ වාහන නවතා තැබීම;

(vi) අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයක සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම;

(vii) ගාල් කර ඇති හෝ එකී රථ ගාලට ඇතුල්වන හෝ ඉන් පිටවන කිසියම් වාහනයක නලාව හැඬවීම;

(viii) මත්පැන් පානය කිරීම හෝ බුලත් සැපීම හා කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කළ කෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම හෝ;
යනාදි කාර්යයන් නොකළ යුතු ය.

20. කිසියම් රථ ගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථ ගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාත් හැර යම් වාහනයකට රථ ගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් මහා නගරසභාව හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ රථ ගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතු ය.

21. මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් කිසියම් රථ ගාලක් ඇතුළත පිහිටි ධාවන මං තීරුවක වාහන ධාවනය කළ යුතු දිසාව පෙන්වන සලකුණු කර ඇති දිසාවට පටහැනි දිසාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතු ය.

22. කිසියම් රථ ගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුළ පවත්නා යම් උපකරණයකට හෝ හානි කිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය (23 - 27)

23. (i) මහා නගරසභා බල ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක -
(අ) රථවාහන නවතා තැබීම තහනම් කිරීම;
(ආ) සීමා කිරීම;
(ඇ) එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩ දීම;
(ඈ) බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම;
(ඉ) මගීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම;
(ඊ) බස් නැවතුම් ස්ථාන නම් කිරීම;
(උ) තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළ හැකි දිසාව තීරණය කිරීම;

සඳහා බලයක් මහා නගරසභාවට ඇත්තේ ය.

(ii) මහා නගරසභාව විසින් (i) වන වගන්තිය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාල ස්ථානයේ සවිකිරීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එකී සීමා කිරීම් පිළිබඳ මාර්ග සංඥා, මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වන දිනැති අංක.444/18 දරන I වන කොටස (i) වන වගන්තිය අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති විධිවිධානයන් අනුව විය යුතුවාත් හැර, එකී විධිවිධාන වලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට ද යටත් විය යුතු ය.

24. සෑම රථ ගාලක ම පරිශ්‍රය තුළ එකතුවන කසළ දිනපතා බැහැර කිරීමට සහ එකී ස්ථානයේ පවත්නා වැසිකිළි දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය.

25. සෑම රථ ගාල භාරකරුවෙකු ම,එකී කාර්යයේ නියුක්ත වන කාලය ඇතුළත මහා නගරසභාව විසින් තීරණය කරනු ලබන හා රථ ගාල භාරකරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ වගකීම වේ.

26. (i) මහා නගරසභා බල ප්‍රදේශය තුළ, මෙහි මින් මතු ''රථ ගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා -

(අ) මහා නගර සභාව සතු කිසියම් ඉඩමක්;

හෝ

(ආ) වෙනත් කිසියම් අධිකාරයක් සමඟ ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක් වෙන් කිරීමට මහා නගරසභාවට බලය තිබිය යුතු ය.

(ii) කිසියම් රථ ගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය සහ එකවර නවතා තැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොපමණ ද, යන්න තීරණය කිරීම මහා නගරසභාව විසින් කරනු ලැබිය හැකි ය.

(iii) කිසියම් රථ ගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් කාලයෙන් කාලයට මහා නගරසභාව විසින් තීරණය කළ පරිදි ගාස්තු අයකළ යුතු ය.අදාල ගාස්තුව රථ ගාලේ ඇතුල්වීමේ දොරටුවේ ප්‍රකටව පෙනෙන පරිදි ත්‍රිවිධ භාෂාවෙන් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

27. සෑම රථ ගාලක ම අවම වශයෙන් වාහන ඇතුල්කිරීම එක් දොරටුවකින් ද, පිටවීම තව එක් දොරටුවකින් ද, දොරටු දෙකක් වෙන් කර තිබිය යුතු ය. එසේ වුව ද, රථ ගාල ඇතුළත වාහන හැරවීම සඳහා ම වෙන් වූ කොටසක් ඇති කර තබන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළ හැකි ද්විත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුල්වීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැලැස්විය හැකි ය.

28. (i) මහා නගර සභාවට අයත් රථ ගාල වල වාහන නවතා තැබීම වෙනුවෙන් මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අයකිරීම කළයුතු ය. අයකිරීම් හා ගාස්තු

(ii) යම් පෞද්ගලික රථ ගාලක් පවත්වාගෙන යාම සඳහා මහ නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට මහා නගර සභාවට බලය ඇත්තේය.

(iii) කිසියම් පෞද්ගලික රථ ගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අයකිරීම කළයුතු ය. තව ද, මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන පෞද්ගලික රථ ගාල් අයකිරීම් වලින් 25% ප්‍රතිශතයක් මහා නගර සභාවට ගෙවීම් කළයුතු වන්නේ ය.ඒ සඳහා වෙනම ම ගිවිසුමක් ගිවිසා ගත යුතු ය. මේ සඳහා මහා නගර සභාව විසින් අනුමත කළ අවසරපත් පොත් පමණක් මෙම අයකිරීමට පාවිච්චිකළ යුතු ය.

(iv) මහා නගර සභාවට අයත් මෝටර් වාහන රථ ගාල් වල, රාත්‍රි කාලයේ වාහන නවත්වා තබන්නේ නම්, ඒ සඳහා කාලයෙන් කාලයට මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුව ගෙවිය යුතු ය.

(v) මහා නගර සභාවට අයත් රථ ගාල් වලින් ගාස්තු අයකිරීම් අයිතිය වාර්ෂික බදුකරුවෙකුට භාර දී, ගිවිසුමට අනුව බදු මුදලක් අයකිරීමට මහා නගර සභාවට බලය ඇත්තේය.

(vi) කෙසේ වුව ද, සියළු ම ගාස්තු සම්බන්ධ විස්තර ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කර තිබිය යුතු ය.

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තෘව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

30. (i) මේ කොටසේ අතුරු ව්‍යවස්ථා මහා නගර සභාව විසින් කාලයෙන් කාලයට තීරණය කරනු ලබන වේලාවන් තුළ ක්‍රියාත්මක විය යුතු ය. එසේ නොවන අවස්ථාවන්හි දී ක්‍රියාත්මක වන වේලාව උදේ 6.00 සිට රාත්‍රි 9.00 දක්වා වේ.

(ii) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම පෞද්ගලික බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නො ලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (31 - 32)

31. මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට පොදු රථ ගාල වල වාහන නවතා ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

32. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ අවසරපත්‍රය ලබාගත් බව පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාටහෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම අවසරපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

33. අවසරපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේ ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

34. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

35. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් කවර හෝ විධි විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (අ),(ආ) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි (ඇ) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපනය භානිර්වචන

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

"මහා නගර සභාව" යන්නෙන්, මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''අවසරපත්‍රලාභියා''යන්නෙන්,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියාවිසින් මහා නගර සභාවට අයත් වාහන රථ ගාලක වාහනය නවත්වා තැබීමට අවසරපත්‍රය ලැබූ තැනැත්තා අදහස් වේ.

''මාර්ගය'' යන්නෙන්, මහා නගරසභාව සතු කිසියම් මං මාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක්, ඒ දණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර මහා නගරසභාව සතු කිසියම් මං මාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමගකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

''වාහනය'' යන්නෙන්, රථ වාහන ආඥාපනතේ ඊට දී ඇති අර්ථකථනය අදහස් විය යුතු අතර, කරත්තයක්, පාපැදියක් හෝ රෝද සවිකරන ලද යාන්ත්‍රිකව හෝ වෙනත් අයුරකින් ක්‍රියාත්මක කරන උපකරණයක් ද අදහස් වේ.

ඇමුණුම. 1

*උපලේඛන*

**9 වන අතුරු ව්‍යවස්ථාවේ (ii) වගන්තිය**

**. . . . . . . . . . . . . . . . . . . . . . . . .මහා නගර සභාව**

**. . . . . . . . . . . . . . . . . රථ ගාල**

***වාහන නවතා තැබීමේ ගාස්තු***

ලදුපත් අංකය : . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

---

වාහනයේ අංකය : . . . . . . . . . . . . . . . . .. . . . . .

දිනය : 20 . . . . . . . . . . . . . . .. . . . . . .. . . .

පැමිණි වේලාව : පෙ. ව. / ප. ව. : . . . . . . . . . . . .

පිටවූ වේලාව : පෙ. ව. / ප. ව. : . . . . . . . . . . . .

අයකළ ගාස්තුව : රුපියල් : . . . . . . . . . . .. . . . . . . .

ඇමුණුම.II

10 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වගන්තිය

කාඩ් පත්‍රයේ ඉදිරිපස

| |
|---|
| .............................................................. [2] සභාව |
| .............................................................. රථ ගාල |
| ඇතුලත්වීමේ අවසර කාඩ්පත්‍රය |

කාඩ් පත්‍රයේ පිටුපස

| |
|---|
| මෙම කාඩ්පත්‍රය අන්සතු නොකළ යුතු ය. |
| රථ ගාලෙන් පිටවන අවස්ථාවේ දී ආපසු භාරදිය යුතු ය. |

***III වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිණුම් තටාක ඉදිකිරීම, පවත්වා ගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා***

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මෙම මහා නගරසභා බල ප්‍රදේශය තුළ පිහිණුම් තටාක ඉදිකිරීම, පවත්වාගෙනයාම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

අරමුණ

2. මහා නගරසභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන පිහිණුම් තටාක නියමිත ප්‍රමිතියකින් යුතුව භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය සුරකෙන පරිදි පවත්වා ගෙන යාම සහතික කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථා සම්පාදානය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 267(1) වන වගන්තිය සමඟ කියවිය යුතු 272 (28) (ඉ) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

4. ඇමුණුම.01 හි දැක්වෙන අයදුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය. ඉටු කළ යුතු කාර්යයන්

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ පිහිණුම් තටාකයකට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) පූර්ව ස්නානය සඳහා සහ පිහිණුම් තටාකය සඳහා සපයන ජලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නිර්දේශිත ප්‍රමිතියෙන් යුක්තව සැපයීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ජල සැපයුම් සඳහා ප්‍රමාණවත් විෂබීජ නාශක යොදා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙල යොදා තිබිය යුතු ය.

(iii) තටාකයේ පිහිණීමට පෙර පූර්ව ස්නානය සඳහා වතුර මල් සපයා තිබිය යුතුය.

(iv) එකී පිහිණුම් තටාකයේ සම්පූර්ණ ජල ධාරිතාව පැය විසිහතරක කාලයක් තුළ දෙවතාවක් පවිත්‍රකරණය සහ විෂබීජහරණය සඳහා ජලය සංසරණය කෙරෙන පොම්ප සහිත පෙරන කට්ටලයක් සවිකර තිබිය යුතු ය.

(v) පිහිණුම් තටාකයේ එක් එක් ස්ථානයේ ගැඹුර කොපමන ද, යන්න තටාක වේදිකාවේ පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

(vi) පිහිණුම් තටාකය වටේ අවම වශයෙන් සෑම මීටර් 8 කට එකක් බැගින් වනසේ පිහිණුම් තටාකයට බැසීමට සහ තටාකයෙන් පිටතට පැමිණීම සඳහා මල නොබැඳෙන වානේවලින් සාදන ලද අත් වැටක් සහ ඉණිමඟක් බැගින් සවිකර තිබිය යුතු ය.

(vii) පිහිණුම් තටාකයට ජලය පිරවීමෙන් අනතුරුව එහි පතුල සහ බිත්ති හොඳින් පෙනෙන ආකාරයේ වර්ණයෙන් යුතු වූ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(viii) වයස අවුරුදු දොළහෙන් පහළ ළමයින්ට පිහිණීමට ඉඩදෙනු ලබන්නේ නම්, ඒ සඳහා මීටර් 1.0 කට නොවැඩි ගැඹුරකින් යුක්ත වෙනම කොටසක් තනා තිබිය යුතු ය.

(ix) පිහිණුම් තටාකයේ දිය මතට පැනීමට අට්ටාල තනා තිබේ නම්, ඒවා කොන්ක්‍රීට්වලින් තනා තිබිය යුතු අතර එහි ඉහළට නැගීමට යකඩ හෝ වානේවලින් තැනූ ශක්තිමත් ඉණි මඟක් සවිකර තිබිය යුතු ය.

(x) තටාකය පාවිච්චි කිරීමට ප්‍රමාණවත් ජීවිතාරක්ෂක සහ ප්‍රථමාධාර වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය.

(xi) පිහිණුම් තටාකය පරිහරණය කරන්නන්ට ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් වෙන්ව ඇඳුම් මාරු කිරීමේ ස්ථාන සහ වැසිකිළි සපයා තිබිය යුතු ය.

(xii) ඇඳුම් මාරු කරන කාමර වල, වැසිකිළි වල සහ ස්නාන ස්ථාන වල බිම සහ බිත්ති, විෂබීජනාශක සහ පිරිසිදු කිරීම පහසුවීම සඳහා අපාරගම්‍ය ඔප දැමූ ද්‍රව්‍යයකින් තබා ගත යුතු ය.

(xiii) පස්වරු 6.30න් පසුව ද පිහිණීම සඳහා ඉඩදෙනු ලබන්නේ නම්, තටාකය ඇතුළතට සහ පිටතට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතු ය.

(xiv) සියළුම පිහිනුම් තටාක වල පතුලේ තැන්පත් වන කැළි කසල හා ජලයේ මතුපිට පාවෙන දෘශ්‍යමාන බාහිර ද්‍රව්‍ය දිනකට අවම වශයෙන් එක් වරක් හෝ ඒවා ඉවත් කිරීම අවශ්‍ය වන තරම් වාර ගණනකින් හෝ ඉවත් කළ යුතු ය.

(xv) කොටු කළ ප්‍රදේශය සෑම කල්හි ම මනා තත්ත්වයකින් ද, පිරිසිදුව, මනා සෞඛ්‍යයෙන් යුතු තත්ත්වයකින් ද පවත්වා ගෙන යා යුතු ය.

(xvi) වැසිකිළිවල සහ නාන ස්ථානවල පාවිච්චි කරන ජලය බාධාවකින් තොරව ගලා යන පරිදි කාණු පද්ධතියක් සකස් කර තිබිය යුතු ය.

(xvii) පතුලේ තැන්පත් වන අපද්‍රව්‍ය යටත් පිරිසෙයින් දිනකට වරක් බැගින් ඉවත් කළ යුතු ය.

(xviii) පිහිණුම් තටාකයේ සම්පූර්ණ ජලධාරිතාව අවම වශයෙන් දිනකට දෙවතාවක් පවිත්‍රකරණය සහ විෂබීජහරණය කළ යුතු ය.

(xix) බලපත්‍රලත් සෑම පිහිණුම් තටාක වල පහත සඳහන් දේ මැනීම සඳහා පරීක්ෂණ කට්ටල හෝ පරීක්ෂණ උපකරණ තිබිය යුතුම ය.

(අ) ශේෂවිෂබීජ නාශකය,
(ආ) පී. එච්. අගය,
(ඇ) පිටකිරීම් සහ සයනුරික් අම්ලය හෝ ක්ලෝරිනීකෘත අසීසෝ යනාදියෙන් එකක් භාවිතා කිරීමේ දී,
(ඈ) පිහිණුම් තටාකයේ ජලයට සයනුරික් අම්ලය එක් කිරීමේ දී.

6. (i) පිහිණුම් තටාකයේ පුරවා ඇති ජලයේ විෂබීජ නාශනය සඳහා නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නියම කරනු ලබන ආකාරයේ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු අතර ඔහු විසින් නියම කරනු ලබන ආකාරයේ උපකරණ සපයා තිබිය යුතු ය.

(ii) වැසිකිළි වලත් සහ පූර්ව ස්නානය සඳහා වතුර මල් සපයා ඇති ස්ථාන වලත් බිම හා බිත්ති පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

7. (i) භාවිතයට යොදා ගන්නා කාල වල දී, සියළුම පිහිණුම් තටාක වල පහත දැක්වෙන සියළුම නියමයන්ට අනුකූල වන රසායන ද්‍රව්‍යයකින් සහ හෝ ක්‍රියාවලියකින් නොකඩවාම විෂබීජ නාශනය කරනු ලැබිය යුතු ය.

(අ) විෂබීජ නාශනය හෝ විෂබීජ නාශී ක්‍රියාවලිය බීමට සුදුසු ජලය සඳහා සම්මත එකක් විය යුතු ය.

(ආ) ශේෂ පරීක්ෂණ කාර්ය පරිපාටියකින් පහසුවෙන් සහ නිවැරැදිව මැනිය හැකි ශේෂ ප්‍රතිඵලයක් එයින් ලැබිය යුතු ය.

(ඇ) එය සාමාන්‍යයෙන් පිහිණුම් තටාක ජලය පිරිසිදු කිරීමෙහි ලා භාවිතා කරන අනිකුත් රසයායනික ද්‍රව්‍ය සමඟ භාවිතයට ගැලපිය යුතු ය.

(ඈ) උපදෙස් වලට අනුකූලව භාවිතා කළවිට පිළිගත හැකි ක්ලෝරීන් කරන මට්ටම් ඉක්මවන ආකාරයේ ධූලක ගති ලක්ෂණ ජලයට ඉන් නොලැබිය යුතු ය.

(ii) විෂබීජ නාශකයේ සක්‍රීය කාරකය ක්ලෝරීන් වන අවස්ථාවක, සම්මත ක්‍රමයකට මැනගත් පරිදි අස්ථායී කෘත නිදහසේ පවතින ක්ලෝරීන් ප්‍රමාණය පිහිණුම් තටාකජලයේ පී. එච්. අගයට අනුව යටත් පිරිසෙයින් පහත සඳහන් සාන්ද්‍රණ වලින් තිබිය යුතු ය.

| *පී. එච්. අගය* | *නිදහසේ පවතින ශේෂ ක්ලෝරීන් අවම ප්‍රමාණය මි.ග්‍රෑ./ලී. (සයෝනුරික් අම්ලයෙන් ස්ථායී නොකළ)* |
|---|---|
| 7.5 | 0.40 |
| 7.6 | 0.50 |
| 7.7 | 0.60 |
| 7.8 | 0.70 |
| 7.9 | 0.80 |
| 8.0 | 1.00 |

(iii) නිදහසේ පවතින ශේෂ ක්ලෝරීන් ස්ථායීකරණය සඳහා සයනුරික් අම්ලය භාවිතා කරන්නේ නම් හෝ විෂබීජ නාශක රසායන ද්‍රව්‍ය වශයෙන් ක්ලෝරීනීකෘත අසීසෝ සයනුරේට් සංයෝගයක් භාවිතා කරනේනේ නම්, ජලයේ සයනුරික් සාන්ද්‍රණය යටත් පිරිසෙයින් 30 මි.ග්‍රෑ./ලී. සමාන විය යුතු අතර සම්මත ක්‍රමයකට මනින ලද පරිදි වූ නිදහසේ පවතින ශේෂ ක්ලෝරීන් ප්‍රමාණය පිහිණුම් තටාක ජලයේ පී.එච්. අගයට අනුව යටත් පිරිසෙයින් පහත සඳහන් සාන්ද්‍රණ වලින් තිබිය යුතු ය.

පී.එච්. නිදහසේ පවතින ශේෂ ක්ලෝරීන් අවම ප්‍රමාණය මි.ග්‍රෑ.ලීටරයකට (සයනුරික් අම්ලය යටත් පිරිසෙයින් 30 මි.ග්‍රෑ.ලීටරයකට සමාන විය යුතු අතර එනමුත් 100 මි.ග්‍රෑ.ලීටරයකට වැඩි නොවිය යුතු ය.)

| | |
|---|---|
| 7.5 | 1.00 |
| 7.6 | 1.25 |
| 7.7 | 1.50 |
| 7.8 | 1.75 |
| 7.9 | 2.00 |
| 8.0 | 2.50 |

(iv) පිහිණුම් තටාකයේ ජලයේ විෂබීජනාශනය සිදු කරන්නේ ක්ලෝරීනීන් සංයෝගයක් හැර වෙනත් රසායනික ද්‍රව්‍යයක් මගින් නම්, විෂබීජනාශක ක්‍රියාව යටත් පිරිසෙයින් 7.5 ක පී.එච්. අගයක දී නිදහසේ පවතින ස්ථාපිත නොවූ 0.4 මි.ග්‍රෑ.ලීටරයක් මගින් සිදුවන ක්‍රියාවට සමාන වියයුතු ය.

(v) (අ) යම් ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණය සඳහා ලබාගන්නා සාම්පල, තටාකය භාවිතා වෙමින් තිබියදී ලබාගත යුතු අතර, ඒවා ලබාගෙන ශේෂ විෂබීජනාශකය නිශ්ක්‍රීය කර ජලයේ ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණය සම්මත ක්‍රමයට පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(ආ) පිහිණුම් තටාකයේ ජලයේ -

(i) සම්මත ඒගා ප්ලේට් ගණනයේ නිශ්චය කරන ලද පරිදි මි.ලීටරයකට ජනපද 200 කට වැඩියෙන්,

(ii) මි.ලීටර් 100 ක කෝලිෆෝම් ජීවීන් සහ ඊ.කොලි 1 වර්ගය අඩංගු නොවිය යුතු ය.

(vi) සියළුම පිහිණුම් තටාක වල ජලය භාවිතා කරන අවස්ථාවේ දී, පහත දැක්වෙන රසායනික හා භෞතික ගති ලක්ෂණ වලින් යුක්ත විය යුතු ය.

(අ) 7.5 කට නොඅඩු වූ ද, 8.0 කට නොවැඩි වූ ද, පී.එච්. අගයකින් දැක්වෙන පරිදි එම ජලය ක්ෂාරී විය යුතු ය.

(ආ) මීතයිල් ඔරෙන්ජ් පරීක්ෂණයෙන් මනින ලද පරිදි යටත් පිරිසෙයින් 50 මි.ග්‍රෑ./ලී. ප්‍රමාණයක වූ ද, එහෙත් 150 මි.ග්‍රෑ./ලී. ප්‍රමාණයට නොවැඩි වූ ද, මුළු ක්ෂාරීතාවයක් තිබිය යුතු ය.

(ඇ) පිහිණුම් තටාකයේ පැත්තක සිට බැලූ විට, පිහිණුම් තටාකයේ ගැඹුරුම ස්ථානයේ ඇති සෙ.මී.15.0ක (අඟල් 6ක) විෂ්කම්භයක් ඇති කළු සුදු තැටියක් පැහැදිලිව පෙනෙන තරමේ ජලයේ පැහැදිලිතාවයක් තිබිය යුතු ය.

8. (i) සෑම පිහිණුම් තටාකයක් ම භාවිතයේ තිබෙන විට, එහි කටයුතු පිළිබඳ නිසි වාර්තා තැබිය යුතු අතර නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ඒ සඳහා පොදුවේ හෝ විශේෂයෙන් බලය දෙන ලද සභාවේ නිලධාරියෙකු විසින් එම වාර්තා පරීක්ෂා කිරීම සඳහා ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ii) කටයුතු පිළිබඳ වාර්තා වල සම්බන්ධවූවන් විසින් පහත දැක්වෙන විෂයයන් සම්බන්ධයෙන් වූ දෛනික සටහන් ඇතුළත් විය යුතු ය.

(අ) භාවිතය සඳහා විවෘත කරන වේලාව සහ භාවිතයේ පවතින පැය ගණන.
(ආ) ස්නානය කරන්නන්ගේ මුළු සංඛ්‍යාව.
(ඇ) ස්නානය කරන්නන් වැඩිම සංඛ්‍යාවක් සිටින අවස්ථාව.
(ඈ) ජල පරිමාව.
(ඉ) සංසරණ පොම්ප සහ පිල්ටර් ක්‍රියා කරන වේලාවන් සහ අනුරූප ගැලී ප්‍රමාණ මාපක කියවීම.
(ඊ) භාවිතා කරන රසායන ද්‍රව්‍ය ප්‍රමාණය.
(උ) ශේෂ විෂබීජ නාශක කියවීම.
(ඌ) පී.එච්. කියවීම.
(එ) වෙනත් රසායනික පරීක්ෂණවල කියවීම.
(ඒ) පිහිණුම් තටාකයේ ගැඹුරුම ස්ථානයෙහි ජලයේ පැහැදිලිතාවය.
(ඔ) උපකරණ නඩත්තුව සහ අළුත්වැඩියා කිරීම.

9. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ මේ කොටසේ 10 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

10. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්,එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවහායන අපද්‍රව්‍ය,
(ආ) වීදුරු,
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය,
(ඈ) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,
(උ) අන්තරායකර අපද්‍රව්‍ය,

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i)වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

ඉටුනොකල යුතු කාර්යයන් (11 - 12)

11. (i) නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගරසභා බල ප්‍රදේශය තුළ පිහිණුම් තටාකයක් ඉදි කිරීම හෝ පරිපාලනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(ii) ඉහත (i) වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනය වන විටත් මහා නගරසභා බල ප්‍රදේශය තුළ ඉදිකර තිබෙන කිසියම් පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දින සිට මාස 03 ක කාලයක් ලබා දෙන අතර එකී කාලය අවසන් වීමෙන් අනතුරුව බලපත්‍රයක් ලබා නොගෙන ඒ පිහිණුම් තටාකය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

12. පිහිණීම සඳහා පැමිණෙන පාරිභෝගිකයන් පූර්ව ස්නානය කිරීමකින් තොරව සහ පිහිණීම සඳහා වෙන්කළ ඇඳුමක් පාවිච්චි නොකර, පිහිණුම් තටාකය කවර හෝ ආකාරයකින් පාවිච්චි නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය

13. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පිහිණුම් තටාකයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතුය.

14. මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

15. මේ කොටසේ 14 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

අයකිරීම් හා ගාස්තු

16. (i) කිසියම් පිහිණුම් තටාකයක් පවත්වා ගෙනයාම සඳහා මහා නගරසභා ආඥා පනතේ 247අ (2)වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

(ii) ශ්‍රී ලාංකික රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ පවත්වා ගෙන යනු ලබන පිහිණුම් තටාක වලට ගාස්තු වලින් පමණක් නිදහස් කරනු ලැබේ.

බලය පැවරීම

17. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ වලංගු කාලය

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (20 - 21)

19. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට බලයලත් අදාල කාලය තුළ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

20. පිහිණුම් තටාකය භාවිතා කරන අතරතුර දී, සෑම පිහිණුම් තටාකයකින් ම ජල සාම්පල ලබාගෙන ක්ෂුද්‍රජීව විද්‍යාත්මක ගුණය පරීක්ෂා කර බැලිය යුතු ය. එවැනි සාම්පල ලබාගත් විට එම අවස්ථාවේදී ම පී.එච්. අගය ද, ශේෂ විෂබීජ නාශක සාන්ද්‍රණය ද පරීක්ෂා කළ යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට කවර හෝ තැනැත්තෙකු බාධා කිරීමක් නොකළ යුතුය.

21. පිහිණුම් තටාකය පිහිටා ඇති ප්‍රදේශයේ හෝ ඊට ආසන්න ප්‍රදේශයක කිසියම් වසංගත රෝගයක් හෝ ආසාදන රෝගයක් හෝ පවතින බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් තීරණයකරනු ලැබ ඇති අවස්ථාවක, එකීපිහිණුම් තටාකය වසා තබන මෙන්, පිහිණුම් තටාකයේ අයිතිකරුට හෝ එයට භාරව සිටින තැනැත්තාට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා නියෝගය කළයුතු ය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

22. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරිකකොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

23. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

24. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (අ),(ආ)උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක, ඉහත කී 267 වන වගන්තියෙහි (ඇ) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

අර්ථ නිරූපනය හා නිර්වචන

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තකට ම පාවිච්චි කරන ස්ථානය හෝ ස්ථාන අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''පිහිණුම් තටාකය" යන්නෙන්, ව්‍යායාම කිරීම සඳහා හෝ විනෝදය සඳහා හෝ පිහිණීම ඉගෙන ගැනීම සඳහා හෝ පිහිණීමට පිටතින් පැමිණෙන කවර හෝ තැනැත්තෙකුගෙන් ගාස්තුවක් අයකර හෝ ගාස්තු අයකිරීමකින් තොරව පිහිණීම සඳහා ඉදි කරන කරන ලද කිසියම් ජල තටාකයක් අදහස් වේ.

ඇමුණුම.01

**මහා නගර සභාව බල ප්‍රදේශය තුළ පිහිණුම් තටාකයක් පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20.................වර්ෂය**

1. පිහිනුම් තටාකයේ නම: ..........................................................................................

2. පිහිනුම් තටාකය පිහිටා ඇති ස්ථානය:
   (i) කොට්ඨාශය: ....................................................
   (ii) වරිපනම් අංකය:.............................................................
   (iii) වීථියේ/ පාරේ නම : .......................................................................
   (iv) ග්‍රාම නිලධාරී:- කොට්ඨාශඅංකය . : .......................................................................
   කොට්ඨාශයේ නම : .......................................................................

3. අයදුම්කරුගේ :
   (i) සම්පූර්ණ නම : .......................................................................
   (ii) ස්ථිර ලිපිනය : ........................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : .......................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : .......................................................................
   (v) දුරකථන අංකය :.........................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :.......................................................................

4. (i) පිහිනුම් තටාකය ආරම්භ කළ දිනය :.......................................................................
   (ii) ව්‍යාපාරයේ ස්වභාවය :.......................................................................
   (iii) පිහිනුම් තටාකයේ අයිතිකරුගේ/කළමනාකරුගේ/නියෝජිතයාගේ :
   (අ) නම:......................................
   (ආ) දුරකථන අංකය:......................................

5. ගොඩනැගිල්ල/පොළොව, කුලියට /බද්දට ලබාගෙන ඇත්තේ නම් :
   (i) අයිතිකරුගේ : ..........................................................................
   (ii) ලිපිනය : ..........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබගෙන තිබේද/ ඔව් ................................ නැත ................................
   ඔව් නම් : බලපත්‍රය අංකය : ...................................... දිනය : ................................

7. වැඩිහිටියන් සහ කුඩා ළමුන් සඳහා වෙන් වෙන් වූ පිහිණුම් තටාන ඉදිකර ඇත්තේ ද? ඔව්/නැත
   එසේ වෙන් වෙන් ව පිහිණුම් තටාක ඉදිකර ඇත්තේ නම් :

   (i) වැඩිහිටියන් සඳහා වූ පිහිණුම් තටාකයේ විශාලත්වය වර්ග මීටර් : ................................
   (ii) ළමුන් සඳහා වූ පිහිණුම් තටාකයේ විශාලත්ය : වර්ග මීටර් : ............................

8. ඇඳුම් මාරු කරන කාමරඃ

   (i) පිරිමින් සඳහා ඇඳුම් මාරු කරන කාමරවල සංඛ්‍යාවඃ.................................................
   (ii) කාන්තාවන් සඳහා ඇඳුම් මාරු කරන කාමරවල සංඛ්‍යාවඃ.................................................

9. පිහිණුම් තටාකය පවත්වාගෙන යාමට නියුක්ත කර ඇති සේවක සංඛ්‍යාව (කළමනාකරුද සමඟ)ඃ................................................

10. වැසිකිළි :

    (i) පිරිමි සේවක වැසිකිළි සංඛ්‍යාවඃ .................................................
    (ii) කාන්තා සේවක වැසිකිළි සංඛ්‍යාව ඃ.................................................

11. ජලය :

    (i) පිහිණුම් තටාකයට ජලය ලබාගන්නා ක්‍රමවේදය/ක්‍රමවේදයන් සහ ඒවායේ සංඛ්‍යාවඃ................................................
    (ii) පාරිභෝගිකයින් සඳහා වූ පානීය ජල සම්පාදන ප්‍රභවය/ප්‍රභවයන් හා ඒවායේ සංඛ්‍යාවඃ................................................

12. අපජලය බැහැර කරන ක්‍රමවේදය ඃ................................................

13. ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :

    ......................................................................................................................................................
    ......................................................................................................................................................
    ......................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරැදි බවත් සහතික කරමි. කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 ............................................ වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

..........................................................

අයදුම්කරුගේ අත්සන

දිනය : ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

............................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයඃ.................................... වරිපනම් අංකයඃ..........................................................................................................

වීථියේ/පාරේ නම :...........................................................................
අයිතිකරුගේ නම :...........................................................................
දේපලෙහි ස්වභාවය :...........................................................................
වාර්ෂික වටිනාකමඃ...........................................................................
හිඟ වරිපනම් මුදලඃ........................................................................... ඇතඃ.............................. නැතඃ..............................

.....................................................................
පරිපාලන නිලධාරි.

දිනය : .........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවයඃ...........................................................................
ගෙවිය යුතු ගාස්තුවඃ...........................................................................
ඒකකය A B C :...........................................................................
සටහන් :...........................................................................

.....................................................................
ආදායම් පරීක්ෂක.

දිනය : .........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :
..........................................................................................................................................................................................
..........................................................................................................................................................................................
..........................................................................................................................................................................................
..........................................................................................................................................................................................

.........................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : .........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

..............................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : ........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ...........................................................ව්‍යාපාරයේ ස්වභාවය:........................................................... පාරිසරික බලපත්‍ර:........................................................... MOH වාර්තාව...........................................................................................................අනුකූලතා සහතිකය : ........................................................ මත්පැන් බදු බලපත්‍ර:........................................................ පහත සඳහන් හේතුන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

...........................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ...........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

...........................................................
ගණකාධිකාරී.

දිනය : ...........................................................

අනුමත කරමි. / නොකරමි.

...........................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ...........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ............................................................................ ලදුපත් දිනය ඃ........................................................................................
බලපත්‍ර අංකය ඃ ............................................................................ බලපත්‍ර දිනය ඃ ........................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

............................................................
ආදයම් පරිපාලන නිලධාරි

දිනය ඃ ...........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

............................................................
ගණකාධිකාරි

දිනය ඃ ...........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

............................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය ඃ ...........................................................

**5 වන අධිකාරය**

***I වන කොටස - මහා නගර සභාබල ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා***

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අයිස් කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම,අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළවූ අයිස් කර්මාන්ත ශාලා, මහජනයාගේ සෞඛ්‍යයට හිතකරව හා පරිසරයට හානියක් නොවන පරිදි විධිමත් ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අරමුණ

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 147 වන සහ 267(1)වන වගන්තීන් සමඟ කියවිය යුතු 272(19)වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

ඉටු කල යුතු කාර්යයන් (4 - 15)

4. ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

5. පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ අයිස් කර්මාන්ත ශාලාවකට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයෙන් ද, සුළඟින් යුතුව ද පවත්වාගෙන යා යුතු ය.

(ii) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය.කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(iii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල (සීලිමක්)සවිකර තිබිය යුතු අතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(iv) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0 ක් වත් තිබිය යුතු ය.

(v) කර්මාන්ත ශාලාවේ අයිස් නිෂ්පාදන යන්ත්‍ර සවිකර ඇති සියළුම කාමර වල බිත්ති, උසින් මීටර් 3.0කට නොඅඩු විය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ ගලෙන් තනා ඇතුල් පැත්තේ කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. නැතහොත් ශක්තිමත් ලෝහ තහඩු පාවිච්චි කරමින් තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(vi) ලී වලින් තැනූ කොටස් වල තෙල් සායම් ආලේප කර හෝ ඔප දමා තිබිය යුතුය.

(vii) එක් එක් කාමරයකම බිම් කොටස, සිමෙන්ති දමා කපරාරු කර මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(viii) අයිස් නිෂ්පාදනය සඳහා පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළයුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xi) අයිස් කර්මාන්තයට සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(x) බලපත්‍රලත් ස්ථානයේ ජනනය වන කසළ බැහැර කිරීම සඳහා 12 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට අනුව බැහැර කිරීමට හැකි වන ආකාරයෙන් ක්‍රියාකර තිබිය යුතු ය.

(xi) මහා නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන්නේ නම්, බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය ඉහත ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරා ගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරා ගන්නා වල, මාර්ගය සම්බන්ධවන ආකාරයෙන් විවෘත කර නොතැබිය යුතුඅතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතුය.

(xii) බලපත්‍රලත් ස්ථානයේ ඉදිකර තිබෙන කිසියම් වැසිකිළියක්, කසළ වලක් හෝ විවෘත කසළ කාණුවක් හෝ උරාගන්නා වලක්, අයිස් නිෂ්පාදනය කරන කාමරය සහ නිපදවන ලද අයිස් බැහැරට නිකුත් කරන ස්ථානය මීටර් පහළොවකට නොඅඩු දුරකින් තනා තිබිය යුතුය.

(xiii) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි ගිනි නිවීමේ උපකරණ අවශ්‍ය ප්‍රමාණයෙන් ක්‍රියාකාරී තත්ත්වයෙන් සපයා තිබිය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 5 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට අනුව සෑම කොටසක් ම යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක් බැගින් තීන්ත ආලේප කිරීම කිරීමට සැලැස්විය යුතු ය.

7. අයිස් නිෂ්පාදනය කරන ස්ථානයත්, අයිස් බැහැරට නිකුත් කරන ස්ථානයත් අවම වශයෙන් දිනකට එක් වරක් බැගින් ජලයෙන් සෝදා හැරීමට සැලැස්විය යුතු ය.

8. අයිස් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක, සියලුම බලපත්‍රලාභීන් විසින් -තමන්ගේ නමත්",- බලයලත් අයිස් කර්මාන්ත ශාලාව"යන වාක්‍ය ත්‍රිවිධ භාෂාවෙන් ලියූ පුවරුවක් එකී ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

9. අයිස් කර්මාන්ත ශාලාවක, නිෂ්පාදන කරන දේවල් විකිණීම සඳහා ගෙනයන තැනැත්තන්,අයිස් කර්මාන්ත ශාලාවේ බලපත්‍රලාභියා විසින් අත්සන් කළ ලියාපදිංචි අවසරපත්‍රයක් ළඟ තබාගත යුතු ය.

10. අයිස් කර්මාන්ත ශාලාවක, බලපත්‍රලාභියා වෙත නිකුත් කළ බලපත්‍රයේ පිටපතක් බලපත්‍රලත් ස්ථානයේ විවෘතව ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

11. අයිස් නිෂ්පාදනයේ යෙදෙන එක් එක් සේවකයෙකු වෙත ම ආරක්ෂිත හිස් වැසුම්, මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් අයිස් නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික කරවීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර අන් සියළු වේලාවන්වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතුය.

13. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම් අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතුය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය,
(ආ) වීදුරු,
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය,

(ඇ) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,
(උ) අන්තරායකර අපද්‍රව්‍ය,
යන ආකාරයෙන් වර්ග කර,ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතුය.

14. බලපත්‍රලත් ස්ථානය, පාවිච්චි කළ උපකරණ දිනපතා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු අතර මනා අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වා ගෙන තිබිය යුතු ය.

15. බලපත්‍රලත් අයිස් කර්මාන්ත ශාලාවක සේවයේ නියුක්ත කර ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්‍ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

ඉටු නොකළ යුතු කාර්යයන් (16 - 22)

16. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

17. කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේසඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

18. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

19. අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අපාරගම්‍ය හා පහසුවෙන් පිරිසිදු කළ හැකි භාජන යොදා ගත යුතු අතර එකී ද්‍රව්‍ය ගබඩා ස්ථානයෙන් පිටත තබා ගැනීම නොකළ යුතු ය.

20. (i) අයිස් නිෂ්පාදනය සඳහා වෙන්කර ඇති කාමරය වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

(i) ඉන්ධන ගබඩා කර තැබීම සඳහා වෙනම කාමරයක් හෝ ස්ථානයක් තිබිය යුතු අතර අයිස් ගබඩා කරන හෝ අයිස් බැහැරට නිකුත් කරන කාමර හරහා ඉන්ධන එහා මෙහා ගෙන යාම නොකළ යුතු ය.

21. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් ස්ථානයක හෝ එක් කොටසක කවර සතෙකු හෝ පක්ෂියෙකු තබා ගැනීම හෝ එසේ තබා ගැනීමට ඉඩදීම නොකළ යුතුය.

22. කර්මාන්ත ශාලාවක කවර හෝ හිමිකරුවෙකු විසින් අයිස් නිෂ්පාදනයට පාවිච්චි කරන උපකරණ, භාණ්ඩ හැර කවර හෝ උපකරණයක්, භාණ්ඩයක් කර්මාන්ත ශාලාව තුළට නොගෙන ආ යුතු ය.

23. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයේ නිෂ්පාදනය කරන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝ විකිණීමටතබා ඇති යම් අයිස් කැටයක සාම්පලයක්, පරීක්ෂණ අරමුණ සඳහා එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේය. මහා නගර සභාවේ කාර්යභාරය (23 - 24)

24. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදීමට සැලැස්විය යුතු ය.

25. යම් අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම සඳහා මහ නගර සභා ආඥා පනතේ 247(අ)2 වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. අයකිරීම් හා ගාස්තු

26. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

27. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නො ලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතු ය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

28. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (28 - 31 )

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය තුළනාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීම සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවත්වීමට බාධාකිරීමක් නොකළ යුතුය.

30. මේ කොටසේ 24 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය තිබේ. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

31. මේ කොටසේ 30 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලයක් ඇත්තේ ය.

32. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේ ය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

33. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

34. (i) මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධි විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි (අ),(ආ) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි (ඇ) වන උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

(ii) මහා නගර සභා ආඥා පනතේ 147(3) වන වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක් නොමැතිව මහා නගර සභා බල ප්‍රදේශය තුළඅයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාමේ වරදකට,වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහක් නොඉක්මවන දඩයටකට ඔහු යටත් විය යුතු අතර අධිකරණ තීන්දුවෙන් පසුත්,ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සීයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

35. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

-නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇතිමහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

-බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''අයිස් කර්මාන්ත ශාලාව" යන්නෙන්, වාණිජමය පදනමෙන් පරිභෝජනය සඳහා යාන්ත්‍රික ක්‍රමයට ජලය මිදීමට සලස්වනු ලබන කර්මාන්ත ශාලාවක් අදහස් වේ.

ඇමුණුම. 1

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපාරික බදු /වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...................වර්ෂය**

1. අයිස් කර්මාන්ත ශාලාවේ නමඃ .............................................................

2. අයිස් කර්මාන්ත ශාලාව පිහිටා ඇති ස්ථානයඃ
   (i) කොට්ඨාශයඃ ......................................................
   (ii) වරිපනම් අංකයඃ.........................................................................
   (iii) වීථියේ/ පාරේ නම : ..........................................................................
   (iv) ග්‍රාම නිලධාරීඃ- කොට්ඨාශ අංකය . : ..........................................................................
   කොට්ඨාශයේ නම : ..........................................................................

3. (i) අයදුම්කරුගේ : ..........................................................................
   (ii) සම්පූර්ණ නම : ..........................................................................
   (iii) ස්ථිර ලිපිනය : ..........................................................................
   (iv) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ..........................................................................
   (v) ජාතික හැඳුනුම්පතේ අංකය : ..........................................................................
   (vi) දුරකථන අංකය :..........................................................................
   (vii) විද්‍යුත් තැපැල් ලිපිනය :..........................................................................

4. (i) අයිස් කර්මාන්ත ශාලාව ආරම්භ කළ දිනය :..........................................................................................................
   (iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :
   (අ) නමඃ.......................................
   (ආ) දුරකථන අංකයඃ......................................

5. පොළව/ගොඩනැගිල්ල කුලියට/බද්දට ලබාගෙන ඇත්නම් :.................................................................
   (i) අයිතිකරුගේ නම :..........................................................................
   (ii) ලිපිනය :..........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේ ද/ ඔව්ඃ. ............................. නැතඃ ..........................
   ඔව් නම් බලපත්‍රය අංකය :...................................... දිනය : ................................................

7. අයිස් කර්මාන්ත ශාලාවේ නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරු ද සමඟ) .........................

8. වැසිකිළි :-

   පිරිමි සේවක කැසිකිළි/වැසිකිළි සංඛ්‍යාව : .....................................................
   කාන්තා සේවක කැසිකිළි/වැසිකිළි සංඛ්‍යාව : .....................................................

9. ජල සම්පාදන ප්‍රභවය/ප්‍රභවයන් හා ඒවායේ සංඛ්‍යාවඃ
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................
   ..........................................................................................................................................................

10. අපජලය බැහැර කරන ක්‍රමවේදය/ ක්‍රමවේදයන් : ......................................................
11. ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදයඃ .
................................................................................................................................................................
................................................................................................................................................................
................................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු වලට අනුවඅයිස් කර්මාන්ත ශාලාව පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 .............................................. වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකග වෙමි.

.................................................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ..............................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

.........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයඃ........................................................... වරිපනම් අංකයඃ......................................................................................

වීථියේ/පාරේ නම :..........................................................................
අයිතිකරුගේ නම :..........................................................................
දේපලෙහි ස්වභාවය :..........................................................................
වාර්ෂික වටිනාකමඃ..........................................................................
හිඟ වරිපනම් මුදලඃ.......................................................................... ඇතඃ.............................. නැතඃ..............................

..........................................................................
පරිපාලන නිලධාරි.

දිනය : ........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවයඃ..........................................................................
ගෙවිය යුතු ගාස්තුවඃ..........................................................................
ඒකකය A B C :..........................................................................
සටහන් :..........................................................................

..........................................................................
ආදයම් පරීක්ෂක.

දිනය : ........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්‍ෂකගේ වාර්තාව :

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..................................................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : ........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..........................................................................................................................................................................

..................................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : ........................................

**ප්‍රධාන ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ..........................................................ව්‍යාපාරයේ ස්වභාවය:......................................................... පාරිසරික බලපත්‍ර:.......................................................... MOH වාර්තාව.......................................................... අනුකූලතා සහතිකය : .......................................................... මත්පැන් බදු බලපත්‍ර:.......................................................... පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

..........................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ..........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.........................................................

ගණකාධිකාරී.

දිනය : .........................................................

අනුමත කරමි. / නොකරමි.

.........................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : .........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ............................................................................ ලදුපත් දිනය :......................................................................................

බලපත්‍ර අංකය : .................................................................................... බලපත්‍ර දිනය : .........................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

.........................................................

ආදයම් පරිපාලන නිලධාරි

දිනය : .........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

.........................................................

ගණකාධිකාරි

දිනය : .........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

.........................................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : .........................................................

*II වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලා පවත්වා ගෙනයාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේසෞඛ්‍යයට හිතකරව හා පරිසරය ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අරමුණ

3. මහා නගර සභා ආඥා පනතේ 147 වන සහ 267(1)වන වගන්තින් සමඟ කියවිය යුතු 272(19)වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේ ය. — ඉටු කළයුතු කාර්යයන් (4 - 16)

5. පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලාවකට බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

   (i) සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලාව පිහිටා ඇති ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

   (ii) සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලාවේ වූ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

   (iii) ඉහත බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. කෙසේ වුව ද, මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූල වන ලෙස සැලකිය යුතු ය.

   (iv) සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලාවේ වූ එක් එක් කාමරයක ම ඇතුල් වහලක් (සීලිමක්) සවිකර තිබිය යුතුඅතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

   (v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

   (vi) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0 ක් වත් තිබිය යුතු ය.

   (vii) එක් එක් කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(viii) සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදනය සඳහා යොදාගන්නා කාමර වලින් හිස් බෝතල සේදීමේ දී සහ සේවකයන්ගේ නානකාමරවලින් බැහැර කෙරෙන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් ඇතිකර තිබිය යුතු ය.

(ix) සිසිල්බීම(වාතික පාන) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් වර්ග,වෙනත් රසායනික ද්‍රව්‍ය, සිසිල් බීම(වාතික පාන) ඇසිරීම සඳහායොදාගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍යගබඩා කර තැබීම සඳහා අවම වශයෙන් එක කාමරයක්වත් වෙනම සපයා තිබිය යුතු අතර එකී කාමරය මීයන්ගෙන් සහ වෙනත් කෘමී සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතු ය.

(x) සිසිල් බීම (වාතික පාන)කර්මාන්ත ශාලාවේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xi) සිසිල් බීම කර්මාන්ත ශාලාවට සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්‍ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(xii) හිස් බෝතල සේදීම සඳහා වන ස්ථානය සිසිල් බීම (වාතික පාන) නිෂ්පාදනය කරන කාමරවලින් වෙන් ව ස්ථානගත කරතිබිය යුතු අතර ඉහත (x වන වගන්තියේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතු ය.

(xiii) සිසිල් බීම(වාතික පාන) කර්මාන්ත ශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය මේ කොටසේ 12 වන අතුරු ව්‍යවස්ථාවේසඳහන් ආකාරයට වර්ග කර බැහැර කළ හැකි ආකාරයෙන් වෙන් කළ භාජන හෝ ටැංකි තිබිය යුතු ය.

(xiv) සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලාවේ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්‍ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතුය. එලෙස වූ වැසිකිළි හා කැසිකිළි සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදනය කරන කාමර වලින් සෘජුව සම්බන්ධ නොවන ආකාරයෙන් සෞඛ්‍යය රකින ආකාරයෙන් වූ දුරකින් තනා තිබිය යුතු ය.

(xv) සිසිල් බීම (වාතික පාන) නිෂ්පාදනය කරන කිසියම් කාමරයක හෝ ඒ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ස්ථාන වල සිට මීටර් 18කට නොඅඩු දුරකින් කසළ වලක් හෝ පෝර වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර තිබිය යුතු ය.

(xvi) සිසිල් බීම(වාතික පාන)නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා ජලය ළිඳෙන් ලබාගන්නේ නම්, එකී ස්ථාන වල සිට මීටර් 18කට නොඅඩු දුරකින් කසළ වලක් හෝ පෝර වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර තිබිය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි මේ කොටසේ 5 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා සියළුම කාමර අවම වශයෙන් දිනකට එක් වරක් බැගින් ජලයෙන් සෝදා හැරීමට සැලැස්විය යුතු ය.

8. සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගන්නා සියළුම කාමර එහි වටපිටාව ද, කාණු, ලී බඩු ද, භාජන සහ උපකරණ පිරිසිදුව, මනා අළුත්වැඩියා තත්ත්වයකින් ද තබාගත යුතු ය.

9. සිසිල් බීම (වාතික පාන)කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන සිසිල් බීම(වාතික පාන)වර්ග ඇසිරීමට යොදා ගන්නා බෝතල් පිරිසිදු කිරීමේ දී -

(i) එකී බෝතල්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත්කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක්ටැංකියක් ද,

සහ

(ii) එකී බෝතල් අවසාන පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද,යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිත කළ යුතු අතර
එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මගින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

10. සිසිල් බීම(වාතික පාන)ඇසිරීම සඳහා වීදුරුවලින් නිපදවන ලද බෝතල්හැර වෙනත් කිසියම් ඇසුරුම් වර්ගයක් හෝ ඇසුරුම් වර්ග යොදා ගනු ලබන අවස්ථාවක, එකී ඇසුරුම් එක් වරක් පමණක් භාවිතයට ගනු ලැබිය යුතුවාක් හැර සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍යවලින් නිපදවා ඇති ඇසුරුම් බවට තහවුරු කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. මේ කාර්යයයේ දී එකී ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදකයා විසින් හෝ මහා නගර සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂවරයා විසින් දෙනු ලබන ලිඛිත සහතිකයක් ප්‍රමාණවත් ලෙස සැලකිය යුතු ය.

11. සිසිල් බීම කර්මාන්ත ශාලාවේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම් ඇතුළුව වෙනත් අවශ්‍ය ආරක්ෂිත පිළිවැසුම් සපයා තිබිය යුතු අතර මෙම සේවකයන් සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදනය කරන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කළයුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර, අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

13. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ආ) වීදුරු ;
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය ;
(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවනකොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(උ) අන්තරායකර අපද්‍රව්‍ය ;
යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

14. බලපත්‍රලත් සිසිල් බීම(වාතික පාන)නිෂ්පාදනාගාරයක, සියලුම බලපත්‍රලාභීන් විසින් -තමන්ගේ නමත්",- බලයලත් අයිස් කර්මාන්ත ශාලාව"යන වාක්‍ය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් සවිකර තිබිය යුතු ය.

15. සිසිල් බීම(වාතික පාන)නිෂ්පාදනාගාරයක සෑම බලපත්‍රලාභියෙකු විසින්ම, සිසිල් බීම(වාතික පාන)නිෂ්පාදනාගාර වලට අදාල බලපත්‍රය රාමු කර ප්‍රකටව පෙනෙන තැනක එල්ලා තැබීමට සැලැස්විය යුතු ය. සිසිල් බීම(වාතික පාන) වෙළෙන්දන් ඇතුළුව සියළුසේවා නියුක්තයන්ගේ නම් සහ ලිපින ඇතුළත් ලැයිස්තුවක් නිෂ්පාදනාගාරයේ තැබීමට ද,එය සියළු සාධාරණ වේලාවන් තුළ දී නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කළ හැකි වන පරිදි තැබීමට ද ඔහු විසින් සැලැස්විය යුතු ය.

16. බලපත්‍රලත් සිසිල් බීම(වාතික පාන)නිෂ්පාදනාගාරයක සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

ඉටු නොකළ යුතු කාර්යයන් (17 - 20)

17. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළසිසිල් බීම (වාතික පාන)කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම නොකළ යුතු ය.

18. සිසිල් බීම (වාතික පාන)නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් වර්ග සහ වෙනත් රසායනික ද්‍රව්‍ය කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත්කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

19. (i) කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙක් ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

20. සිසිල් බීම (වාතික පාන)නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් සහ අනෙකුත් රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අපාරගම්‍ය හා පහසුවෙන් පිරිසිදු කළ හැකි භාජන යොදා ගත යුතු අතර එකී ද්‍රව්‍ය සිසිල්බීම (වාතික පාන)නිෂ්පාදනය සඳහා සිසිල් බීම (වාතික පාන) නිෂ්පාදන කාමරයේ තබාගන්නේ නම් මිස ඒවා ගබඩා ස්ථානයෙන් පිටත තබා ගැනීම නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය (21 - 22)

21. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක නිෂ්පාදනය කරන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝ විකිණීමටතබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක් පරීක්ෂණ අරමුණ සඳහා එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

22. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් සිසිල් බීම (වාතික පාන)කර්මාන්ත ශාලා පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රධාරියා, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදිය යුතු ය.

23. කිසියම් සිසිල් බීම (වාතික පාන)කර්මාන්ත ශාලා පවත්වා ගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2)වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. අයකිරීම් හා ගාස්තු

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

26. මෙම අතුරු ව්‍යවස්ථා වලින් විධානය කරනු ලැබ ඇති නියමයන්, නිසි කාලය තුළ බලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (26 - 29)

27. මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

28. මේ කොටසේ 22 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

29. මේ කොටසේ 28 වනඅතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

30. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරිකකොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

32. (i) මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ දඩ හා දණ්ඩන

(අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ)හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

(ii) මහා නගර සභා ආඥා පනතේ 147(3) වන වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක් නොමැතිව මහා නගර සභා බල ප්‍රදේශය තුළඅයිස් සිසිල් බීම(වාතික පාන) නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාමේ වරදකට, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහක් නොඉක්මවන දඩයටකට ඔහු යටත් විය යුතු අතර අධිකරණ තීන්දුවෙන් පසුත්,ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සීයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල-

-නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේනගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''හා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''සිසිල් බීම(වාතික පාන)" යන්නෙන් පළතුරු, එසන්ස්, සිරප් යන සියල්ලමහෝ එක් වර්ගයක් උපයෝගී කරගෙන නිෂ්පාදනයකරනු ලබන හා බෝතල්වල හෝ වෙනත් යම්ආකාරයක ඇසුරුමක අසුරනු ලබන බීම වර්ග අදහස්වන අතර සෝඩා බීම ද ඊට ඇතුළත් විය යුතු ය.

ඇමුණුම. 01

**මහා නගර සභාව බල ප්‍රදේශය තුළ සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලා පවත්වා ගෙන යාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20............................වර්ෂය**

1. ව්‍යාපාරික ස්ථානයේ නමඃ ......................................................

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානයඃ

   (i) කොට්ඨාශයඃ .................................................... වරිපනම් අංකයඃ.......................................................................

   (ii) වීථියේ/ පාරේ නම : ........................................................................

   (iii) ග්‍රාම නිලධාරීඃ- කොට්ඨාශ අංකය . : ........................................................................
   කොට්ඨාශයේ නම : ........................................................................

3. අයදුම්කරුගේ ඃ

   (i) සම්පූර්ණ නම : ........................................................................

   (ii) ස්ථිර ලිපිනය : ........................................................................

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : ........................................................................

   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : ........................................................................

   (v) දුරකථන අංකය :........................................................................

   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය :........................................................................

   (ii) ව්‍යාපාරයේ ස්වභාවය :........................................................................

   (iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :

   (අ) නමඃ.......................................

   (ආ) දුරකථන අංකයඃ......................................

   (iv) කලින් කර්මාන්තය/ව්‍යාපාරය : ................................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් ඃ

   (i) අයිතිකරුගේ නම : ........................................................................

   (ii) ලිපිනය : ........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබගෙන තිබේ ද/ ඔව් ............................... නැත ...............................
   ඔව් නම් : බලපත්‍රය අංකය : ...................................... දිනය : ................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරැදි බවත් සහතික කරමි. කර්මාන්තය/වෙළෙඳාම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 ........................................... වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

.........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

............................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශය:........................................................................... වරිපනම් අංකය:...........................................................................

වීථියේ/පාරේ නම :...........................................................................
අයිතිකරුගේ නම :...........................................................................
දේපළෙහි ස්වභාවය :...........................................................................
වාර්ෂික වටිනාකම : ...........................................................................
හිඟ වරිපනම් මුදල :........................................................................... ඇත :.............................. නැත :..............................

...........................................................................
පරිපාලන නිලධාරි.

දිනය : .........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:...........................................................................
ගෙවිය යුතු ගාස්තුව:...........................................................................
ඒකකය A B C :...........................................................................
සටහන් :...........................................................................

...........................................................................
ආදායම් පරීක්ෂක.

දිනය : .........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :
......................................................................................................................................................................................................
......................................................................................................................................................................................................
......................................................................................................................................................................................................
......................................................................................................................................................................................................

...........................................................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : .........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

..........................................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : ........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ..................................................................ව්‍යාපාරයේ ස්වභාවය:.................................................................. පාරිසරික බලපත්‍ර:...................................................... MOH වාර්තාව...................................................................................................අනුකූලතා සහතිකය : ...................................................... මත්පැන් බදු බලපත්‍ර:...................................................... පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි / නොකරමි.

.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

.....................................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : .........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.....................................................................
ගණකාධිකාරී.

දිනය : .........................................................

අනුමත කරමි. / නොකරමි.

................................................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : .........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ........................................................................... ලදුපත් දිනය :.............................................................................................

බලපත්‍ර අංකය : ............................................................................ බලපත්‍ර දිනය : ..................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

..........................................................................................

ආදායම් පරිපාලන නිලධාරි

දිනය : ..........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

.............................................................................

ගණකාධිකාරි

දිනය : ..........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

.............................................................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ..........................................................

### 6 වන අධිකාරය

***1 වන කොටස - මහානගරසභා බල ප්‍රදේශය තුළ වෙළෙඳ පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම,පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා***

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පොදු වෙළෙඳ පොළවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම, නියාමනය කිරීම, පාලනය කිරීම හා අධීක්‍ෂණය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. — අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. මහා නගරසභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාට වෙළෙඳ පොළ පහසුකම්, හා ද්‍රව්‍යයන් විකිණීම් සහ මිළ දී ගැනීම් පහසුකම් ඇති කර දීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අරමුණ

3. මහා නගර සභා ආඥාපනතේ 155 - 160 සහ 267(1) යන වගන්තින් සමඟ කියවිය යුතු 272(8) යන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. — අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. (i) පොදු වෙළෙඳ පොළෙහි ඇති කිසියම් කඩ කාමරයක කුලීකරු හෝ කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවසරපතක් ලබාගෙන ඇති කිසියම් තැනැත්තෙකු හෝ වෙළෙඳාමේ නියුක්ත කඩ කාමරය හා ඒ අසල හෝ වෙළෙඳ මැස්ස මත හෝ ඒ අසල ජනනය වන සියළුම අපද්‍රව්‍ය - — ඉටු කළයුතු කාර්යයන් (4 - 32)

   (අ) ජෛවහායන අපද්‍රව්‍යය,
   (ආ) වීදුරු,
   (ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍යය,
   (ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍යය,
   (ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
   (ඊ) අන්තරායකර අපද්‍රව්‍යය,

   යන වර්ග යටතේ වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍යය බහාලීමට මහා නගර සභාව විසින් තනා ඇති වෙන් වෙන් වූ වළ වලට හෝ භාජන වලට හෝ ටැංකි වලට දැමීම, එකී කුලීකරුගේ හෝ එකී වෙළෙඳ මැස්සේ අවසරපතක් ලබාගෙන ඇති තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

   (ii) පොදු වෙළෙඳ පොළට පැමිණෙන තැනැත්තන් විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍යය බහාලීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තිය යටතේ වර්ග කර බැහැරලීම පහසු කරවන කුඩා ප්‍රමාණයේ භාජන පොදු වෙළෙඳ පොළෙහි සුදුසු ස්ථාන වල තැබීමට සැලැස්විය යුතු අතර එකී භාජන තුළ වූ අපද්‍රව්‍යය ප්‍රමාණවත් කාලාන්තරයෙන් අදාල වළට, භාජනයට හෝ ටැංකියට දැමීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

   (iii) අපද්‍රව්‍යය රැස්කිරීම සඳහා තබා ඇති භාජන වල බහාලීමට සඳහන් කර ඇති වර්ගයේ අපද්‍රව්‍යය පමණක් දැමිය යුතු ය.

   (iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියේ නියමයන් යටතේ ජෛවහායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනා ඇති වළට හෝ භාජනයට හෝ ටැංකියට අපද්‍රව්‍ය බහාලන අවස්ථාවේ හෝ අපද්‍රව්‍ය ඉන් පිටතට ගන්න අවස්ථාවේ දී හැර, වෙනත් සෑම අවස්ථාවකදී ම එකී වළේ හෝ භාජනයේ හෝ ටැංකියේ පියන හොඳින් වසා තැබීම කළ යුතු ය.

5. පොදු වෙළෙඳ පොළෙහි එළවළු, පළතුරු, මස්, මාළු හෝ වෙනත් ආහාර හෝ පාන වර්ග විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන එක් එක් ස්ථානයක් ම, එකී කඩ කාමරයක් ම,

මේසයක්ම, බංකුවක්ම, භාණ්ඩ තබන ලෑල්ලක්ම දෛනික කටයුතු අවසානයේ අවස්ථාවෝචිත පරිදි සෝදා හෝ සූරා පිරිසිදු කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම එකී ස්ථානයේ වෙළෙඳ කාර්යයේ නියුක්ත වන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

6. පොදු වෙළෙඳ පොළෙහි ඇති එක් එක් වැසිකිළියක් හා කැසිකිළියක් ම අවම වශයෙන් දිනකට තුන් වතාවක් බැගින් විෂබීජ නාශක යොදා සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත්, ජලය ගලායාමට ඉදිකර ඇති එක් එක් කාණුවක් ම අවම වශයෙන් දිනකට දෙවතාවක් බැගින් ජලයෙන් සෝදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

7. මේ කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියෙන් සහ මේ කොටසේ 61 වන අතුරු ව්‍යවස්ථාවේ (xxiv) වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයෙන් තනා ඇති එක් එක් සාතනාගාරයක, භාජනයක හෝ ටැංකියක රැස් කරනු ලබන අපද්‍රව්‍යය අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. ඒ සමඟින් එකී අපද්‍රව්‍යය එකී ස්ථානයෙන් ඉවත් කිරීමේ දී අපද්‍රව්‍යය පැටවූ කොටස සම්පූර්ණයෙන් ආවරණය කළ වාහනයකින් ප්‍රවාහනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

8. එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයේ රැස්වන පස් හෝ වැලි හෝ වෙනත් ද්‍රව්‍ය අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් ඉවත් කිරීමත්, එම ස්ථානයේ ජලය ගලායාමට ඇතිවන බාධා වැළැක්වීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීමත් නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

9. පොදු වෙළෙඳ පොළෙහි සවිකර ඇති ගිනි නිවීම උපකරණ වල ක්‍රියාකාරීත්වය නිසි පරිදි පවතින්නේ ද, යන්න අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් පරීක්ෂා කරවා ගැනීමත්, අක්‍රීය වූ ගිනි නිවීමේ උපකරණ වෙනුවට අළුත් උපකරණ සවිකිරීමටත් සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

10. පොදු වෙළෙඳ පොළෙහි -

(i) කඩ කාමර වල ඇතුළත බිත්ති හැර සෙසු බිත්තිත්, එක් එක් වෙළෙඳ මැස්සක වූ කුඩා තාප්පත්, සිමෙන්තියෙන් කපරාරු කළ කොටස් හා ගැල්වනයිස් කළ යකඩයෙන් නිමකර ඇති ඉදිකිරීම් සහ කඩ කාමර වල ඇතුල් වහල (සීලිම) හැර සෙසු කොටස් අවම වශයෙන් වසරකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(ii) කඩ කාමර වල ඇතුළත බිත්ති, කඩ කාමර වල ඇතුළත ගැල්වනයිස් කළ යකඩයෙන් නිමකර ඇති ඉදිකිරීම් සහ කඩ කාමර වල ඇතුල් වහල (සීලිම) අවම වශයෙන් වසරකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම එකී කඩ කාමරයේ කුලීකරුගේ කාර්යය විය යුතු ය.

11. මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළෙඳ පොළක් විවෘතව තැබිය යුතු දිනයන් සහ වේලාවන් කලින් කල මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය. මහා නගර සභාව විසින් එසේ තීරණය කරනු ලැබූ ආකාරයට පොදු වෙළෙඳ පොළ විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේ ද, යන්න ත්‍රිවිධ භාෂාත්‍රයෙන් ම වූ දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් පොදු වෙළෙඳ පොළට ඇතුල්වීමේ දොරටුව අසළ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. මහා නගර සභාවෙන් තීරණයක් නොකළ අවස්ථාවක, පොදු වෙළෙඳ පොළ විවෘතව තබන වේලාව පෙරවරු 5.00 සිට පස්වරු 9.00 දක්වා වේ.

12. (i) පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමර වලින් බැහැර කොටසේ තනා ඇති කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම අවශ්‍ය කරන එක් එක් තැනැත්තෙකු ම, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ මහා නගර සභාවේ බලය මත හෝ ඒ යටතේ නිකුත් කළ වලංගු අවසරපතක් ලබාගත යුතු ය.

(ii) ඉහත (i) වන වගන්තියේ නියමය යටතේ නිකුත් කරනු ලබන අවසරපත මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත යුතු ය.

13. (i) පොදු වෙළෙඳ පොළෙහි ගොඩනැගිල්ලේ මස් කඩයක් නොවන කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කුලීකරුවෙකු තෝරා ගැනීමත්, කඩ කාමර වලින් පිටතින් වූ ස්ථාන වල කුලීය අයකිරීම සඳහා වෙළෙඳ පොළ බදුකරුවෙකු තෝරා ගැනීමත් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් සිදු කිරීම මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තිය යටතේ කිසියම් කඩ කාමරයක් කුලියට දීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ දී, එකී කඩ කාමරය සඳහා ගෙවිය යුතු මාසික කුලීය තීරණය කිරීම, ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව විය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තිය යටතේ කුලීකරුවෙකු තෝරා ගැනීමට ටෙන්ඩර් කැඳවිය යුතු අවස්ථා වශයෙන් -

(අ) කුලීකරු විසින් ස්වකීය කැමැත්තෙන් ම කුලී ගිවිසුම අවලංගු කරවා ගනු ලැබ ඇති අවස්ථාවක්,

හෝ

(ආ) මෙම කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් කඩ කිරීම හෝ කුලී ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම හේතුවෙන් කුලී ගිවිසුම අවලංගු කර ඇති හෝ අවලංගු වී ඇතැයි සැලකෙන අවස්ථාවක්,

හෝ

(ඇ) කිසියම් කුලීකරුවෙකුට කලත්‍රයා හෝ දරුවෙකු නොමැතිව සිටිය දී, කුලීකරු මියගිය අවස්ථාවක්,

සැලකිය යුතු අතර,

(iv) මේ කොටසේ 55 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමය පරිදි කිසියම් කුලීකරුවෙකු විසින් යම් ඉදිරි වර්ෂයක් සඳහා එකී කුලී ගිවිසුම වලංගු කරවා ගනු ලැබීම ප්‍රතික්ෂේප කර ඇත්තේ නම් හෝ එකී වලංගු කරවා ගැනීම උවමනාවෙන් ම මඟහැර සිටින්නේ නම් මිස, මහා නගර සභාව සහ එකී කුලීකරු එකඟ වී අත්සන් කරනු ලැබූ කුලී ගිවිසුම අවලංගු වී ඇති සේ නොසැලකිය යුතු ය.

14. මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් යටතේ ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා තෝරා ගනු ලැබූ කුලීකරු මහා නගර සභාව සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

15. මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනය වන විට මහා නගර සභාව සතුව තිබෙන කිසියම් පොදු වෙළෙඳ පොළක සෑම එක් එක් කඩ කාමරය සම්බන්ධයෙන් මහා නගර සභාව සමඟ අවසන් වරට අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් කුලීකරු, එකී බලාත්මක දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මේ කොටසේ 13 වන අතුරු ව්‍යවස්ථාව යටතේ එකී කඩ කාමරය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරාගනු ලැබූ කුලීකරු වශයෙන් සැළකීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ ම, තවදුරටත් මෙම අතුරු ව්‍යවස්ථාව අදාල වන කවර හෝ කුලීකරුවෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත මේ කොටසේ 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට අනුව නව කුලී ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

16. (i) මේ කොටසේ 14 වන සහ 15 වන අතුරු ව්‍යවස්ථා වල සඳහන් නියමයන් යටතේ මහා නගර සභාව සමඟ අත්සන් කරනු ලැබූ යම් ගිවිසුමක්, එක් වසරක කාලයක් සඳහා

පමණක් වලංගු විය යුතු අතර එකී වසරයක කාලය අවසන් වීමට මාසයකට පෙර ඉදිරි වසර සඳහා මහා නගර සභාව සමඟ නව ගිවිසුමකට එළැඹීමෙන් පසුව, තවත් එක් වසරක කාලයක් සඳහා එකී කඩ කාමරයේ කුලී කාලය වලංගු කරවා ගනු ලැබිය හැකි ය. ඒ ආකාරයෙන් ම යම් අනුගාමී වසරක් සඳහා එකී කඩ කාමරයේ කුලී කාලය වාර්ෂිකව වලංගු කරවා ගෙන, එකී කඩ කාමරය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට එකී කුලීකරුට හිමිකම තිබිය යුතු ය.

(ii) කෙසේ වුව ද, මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තිය යටතේ කිසියම් කුලීකරුවෙකු විසින් අනුගාමී වසර සඳහා කුලී කාලය වලංගු කරවා ගෙන, එකී කඩ කාමරය පාවිච්චි කරන හෝ පරිහරණය කිරීම සඳහා එකී අනුගාමී වසර තුළ ගෙවිය යුතු මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව තීරණය කිරීම මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

17. එළවළු, පළතුරු හෝ වෙනත් වෙනත් ද්‍රව්‍යයන් විකුණනන් සඳහා වෙන් වෙන් වූ ස්ථාන වෙන්කර තිබිය යුතු ය.

18. පොදු වෙළෙඳ පොළක හෝ පෞද්ගලික වෙළෙඳ පොළක කඩ කාමර වල ස්ථිර වෙළෙඳාමේ නියුක්ත තැනැත්තන්, මහා නගර සභාවෙන් වාර්ෂිකව වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම ඔවුන්ගේ වගකීම වන්නේ ය.

19. පොදු වෙළෙඳ පොළක් ඇතුළෙහි මාළු වෙළෙඳ පොළක් තිබෙන විට, වෙළෙඳ මැහි කලින් සඳහන් නියමයන්ට අනුකූලව සකස් කළ යුතුවාත් මෙන් ම, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් සඳහන් සියළුම නිබන්ධයන් එයට අදාල වේ.

20. (i) මස් හා කුකුල් මස් විකුණනන්ගෙන් ජනනය වන සියළුම අපද්‍රව්‍යය ඉවත් කිරීමට මේ කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් කටයුතු කිරීම කළයුතු වන්නේ ය.

(ii) සජීවී කුකුළන් විකිණීමට වෙළෙඳ පොළෙහි තනිව වෙන්කරන ලද ස්ථානයක් වෙන්කර දීම මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

21. (i) බලපත්‍රයක් දරන තැනැත්තා හෝ ඔහුගේ අනු නියෝජිතයෙකු නැතහොත් සේවකයෙකු ලෙස නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් විධිමත්ව ලියාපදිංචි කළ අනුමත කාඩ්පතක් ලැබ තිබෙන තැනැත්තෙකු හැර, වෙනත් කිසිම තැනැත්තෙකු විසින් ඒ කිසිම කොටසක් දැරීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ පරිහරණය කිරීම නැතහොත් එහි භාණ්ඩ කිසිවක් විකිණීම නොකළ යුතු අතර හිමිකරු සහ ඔහුගේ සේවකයින් ද අවසරපත්‍රය ලබාගැනීමට පෙර සෑම වර්ෂයකම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වී, එකී වාර්තාව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) තමාගේ කඩ කාමරයෙහි තමාගේ අනු නියෝජිතයා හෝ සේවකයා ලෙස යම් තැනැත්තෙකු සේවයේ නියුක්ත කර ගැනීමට අපේක්ෂා කරන කඩ කාමරයක් ලබාගත් එක් එක් තැනැත්තෙකු ම, ඒ සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා වෙත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සෑම ඉල්ලුම්පත්‍රයක්ම සමඟ ම අදාල තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ ඡායාස්ථිත පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතු ය.

(iii) එකී ඉල්ලුම්පත්‍රය ලැබුණු විට, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ක්‍රමවත්ව අංක යෙදූ ලියාපදිංචි කිරීමේ කාඩ්පත ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ ජාතික හැඳුනුම්පතේ එක් ඡායාස්ථිත පිටපත සමඟින් කඩ කාමරයේ කුලීකරුවාට නිකුත් කළ යුතු ය. අනෙක් ජාතික හැඳුනුම්පතේ ඡායාස්ථිත පිටපත තමා තබා ගත යුතු ය.

(iv) මේ අතුරු ව්‍යවස්ථා යටතේ ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් නිකුත් කරනු ලැබ ඇති එක් එක් තැනැත්තෙකු ම, මහා නගර සභාවේ යම් නිලධරයෙකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, පරීක්‍ෂා කිරීමේ කාර්යය සඳහා ඒ කාඩ්පත ඉදිරිපත් කළ යුතු ය.

(v) මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ කාඩ්පතක් අවංලගු කිරීම අවශ්‍ය බව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සලකනු ලැබුවහොත් ඔහු විසින් ඕනෑම වේලාවක දී එසේ අවලංගු කළ හැකි ය.

(vi) යම් අවස්ථාවක දී සේවා නියුක්තියේ වෙනසක් සිදුවන විට, බලපත්‍රලාභියා විසින් ඒ බව ලිඛිතව නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා වෙත දැන්විය යුතු ය.

22. යම් පොදු වෙළෙඳ පොළක කඩ කාමරයක් දැරීමට හෝ පරිහරණය කිරීමට බලපත්‍රයක් ඇත්තා වූ හෝ මස්, මාළු හෝ වෙනත් ද්‍රව්‍යයන් පොදු වෙළෙඳ පොළක් නොවන වෙනත් ව්‍යාපාරික ස්ථානයක විකිණීම සඳහා මේ කොටසේ විධිවිධාන යටතේ නීත්‍යානුකූලව නිකුත් කළ හැකි විශේෂ බලපත්‍රයක් දරන්නා වූ සෑම තැනැත්තෙක් ම, ඒ කඩ කාමරය හෝ ව්‍යාපාරික ස්ථානය දිනපතාම පෙරවරු 5.00 සහ පස්වරු 9.00 අතර කාලය තුළ මහජනයා සඳහා විවෘතව තැබීමට බැඳී සිටින්නේ ය. අනුක්‍රමික දවස් දෙකක් තුළ ඒ කඩ කාමරය හෝ ව්‍යාපාරික ස්ථානය නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව, වසා තබන නැතහොත් ඕනෑකමින් ම මහජනයාට සේවය සැපයීම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන කවර හෝ තැනැත්තෙක් වරදක් කරන අතර එසේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකුගේ බලපත්‍රය නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම ද, ඒ යම් තැනැත්තෙකුට ඉන්පසුව එවැනි යම් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම ද නීත්‍යානුකූල වන්නේ ය. එසේ ම, කඩ කාමරයක් හෝ ව්‍යාපාරික ස්ථානය ආපසු සභාව වෙත පවරා ගත යුතු ය.

23. පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමරය හැර පොදු වෙළෙඳ පොළ වාර්ෂික බද්දට නොදුන්නේ නම්, වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට වලංගු අවසරපත් නිකුත් කිරීමට හා එකී අවසරපත් සඳහා මුදල් අය කිරීමට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් බලයලත් නිලධාරියෙකු යොදවනු ලැබිය හැකි ය. එසේ ම,ඒ බලයලත් නිලධාරියා විසින් එකී අවසරපත් නිකුත් කිරීමෙන් දිනපතා එකතු කරනු ලබන මුදල්, එදින පස්වරු 3.00ට පෙර මහා නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීම එකී බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. කිසියම් දිනක එකී බලයලත් නිලධාරියා විසින් එකතු කරනු ලබන මුදල්, මහා නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීමෙන් පසුව, පොදු වෙළෙඳ පොළෙහි අවසරපත් නිකුත් කිරීමෙන් එකතු කරනු ලැබූ යම් මුදලක් වේ නම්, එය අනුගාමීව වැඩ කරන දිනයේ මහා නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීම කළ යුතු ය.

24. පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමර හැර, වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය වන යම් තැනැත්තන්ට අවසරපත් නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම සම්බන්ධව, මේ කොටසේ 23 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් නාගරික කොමසාරිස්වරයා විසින් බලයලත් කවර හෝ නිලධාරියෙකු යෙදවීමට නොහැකි වන්නේ නම්, එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් මගින් තෝරා ගනු ලබන (මෙහි මින්මතු-බදුකරු" යනුවෙන් සඳහන් කරනු ලබන තැනැත්තෙකුට පැවරීමට මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

25. මේ කොටසේ 24 වන අතුරු ව්‍යවස්ථාව යටතේ තෝරාගනු ලැබූ කිසියම් බදුකරුවෙකුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයකට පමණක් වලංගු විය යුතු අතර, අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් බදුකරුවෙක් තෝරා ගත යුතු ය.

26. (i) මේ කොටසේ 25 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් යටතේ බදුකරුවෙක් තෝරා ගනු ලැබූ විට, ඔහු විසින් -

(අ) එකී තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට, මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක් මහා නගර සභාවේ තැන්පත් කිරීමට;

(ආ) එකී වලංගු අවසරපත් නිකුත් කිරීම හා ගාස්තු එකතු කිරීම පිළිබඳව මහා නගර සභාව සමඟ ගිවිසුමකට එළඹීම;

(ඇ) ඉහත (ආ) වගන්තියේ නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමෙන් එකඟ වී ඇති වාර්ෂික ගාස්තුවෙන් තුනෙන් එක් පංගුවකට සමාන හෝ ඊට වැඩි තැන්පත් මුදලක් මහා නගර සභාවේ තැන්පත් කිරීමට ;
කටයුතු කළ යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියේ සඳහන් නියමයන් ඒ අකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකුට මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළෙඳ පොළක වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට අවසරපත් නිකුත් කිරීමට හා එකී අවසරපත් වෙනුවෙන් මුදල් එකතු කිරීමට ඉඩ ලබානොදිය යුතුය.

27. මේ කොටසේ 26 වන අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තියෙහි (ආ) උපවගන්තියේ නියමයන්ට අනුව කිසියම් බදුකරුවෙකු සමඟ අත්සන් කරනු ලබන ගිවිසුමෙහි -

(i) වෙළෙඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා අවසරපත් නිකුත් කළ යුතු ආකාරය;

(ii) එකී අවසරපත් සඳහා මුදල් අය කරන ආකාරය සහ අයකළ හැකි උපරිම මුදල් ප්‍රමාණය;

(iii) බදුකරු විසින් ගිවිස ගන්නා වර්ෂය වෙනුවෙන් මහා නගර සභාවට ගෙවිය යුතු සම්පූර්ණ මුදල;

(iv) එකී වාර්ෂික මුදල සමාන වාරික 12කින් මහා නගර සභාවට ගෙවිය යුතු බව සහ එක වාරිකයක වටිනාකම;

(v) එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු මුදල මහා නගර සභාවට ගෙවිය යුතු දිනය;

(vi) නියමිත දිනයේ දී මාසික මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, එකී මුදලින් 10%ක් ප්‍රමාද ගාස්තු වශයෙන් මහා නගර සභාවට ගෙවීමට බදුකරු යටත් වන බව;

(vii) මහා නගර සභාවට ගෙවිය යුතු ගාස්තුව මාස 03කට වඩා වැඩි කාලයක් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, මේ කොටසේ 28 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් අනුව ගිවිසුම අවලංගු කිරීමට යටත් වන බව සහ එකී ගිවිසුම අවලංගු කරන ලද බව නගරාධිපතිවරයාගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් ලියවිල්ලකින් යුතු දැන්වීමක් ලැබුණු දිනයේ සිට එකී වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීමට වලංගු අවසරපත් තැනැත්තන්ට නිකුත් කිරීම සහ එකී අවසරපත් වෙනුවෙන් මුදල් අයකර ගැනීමට බදුකරුට පැවරී තිබුණු බලය අවසන් වන බව;

ගිවිසගත් කොන්දේසි වශයෙන් ඇතුළත් කිරීම මහා නගර සභාවේ කාර්යය වන්නේ ය.

28. (i) බදුකරු විසින් මහා නගර සභාවට ගෙවිය යුතු වන මාසික ගාස්තුව නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ ගාස්තුව මාස 03ක ගාස්තුවකට වඩා වැඩි වන යම් අවස්ථාවක, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස බදුකරුට ලියවිල්ලකින් වන දැන්වීමක් භාරදීමට කටයුතු කරවීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන වගන්තිය යටතේ වන දැන්වීම ලැබූ කවර හෝ බදුකරුවෙකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින 07ක් ඇතුළත, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව මහා නගර සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, එකී දැන්වීම ඔහුට ලැබුණු දිනෙන් දින 07ක් ඉකුත් වූ දින සිට එකී බදුකරු සමඟ මහා නගර සභාව අත්සන් කළ ගිවිසුම අවලංගු විය යුතුවාත් හැර, ඒ අවලංගු වීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ ම, එකී ගිවිසුම අවලංගු වූ ලෙස සැලකෙන දිනයේ ම, එකී බදුකරු වෙත ඒ බව ලියවිල්ලකින් දන්වා යැවීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තියේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව, කවර හෝ අවස්ථාවක එකී ගිවිසුමේ එක් පාර්ශ්වකරුවෙකු වන බදුකරු විසින් එකී පොදු වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කවර හෝ තැනැත්තෙකුට අවසරපතක් නිකුත් කරනු ලැබීම හෝ එකී අවසරපතක් නිකුත් කිරීම වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීම හෝ නොකළ යුතු ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තියේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව, එළැඹෙන දිනයේ සිට එකී දිනයේ පොදු වෙළෙඳ පොළෙහි වෙළෙඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවසරපත් නිකුත් කරනු ලැබීමට සහ එකී අවසරපත් වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීමටත් මහා නගර සභාවේ කිසියම් නිලධාරියෙකු නියුක්ත කරවීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය. ඒ සමඟ ම අදාල නිලධාරියෙකු යොදවා එකී කාර්යය තවදුරටත් කරගෙන යෑමට නොහැකි වන බව නාගරික කොමසාරිස්වරයාගේ මතය වන විට, මේ කොටසේ 24වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් අනුව ක්‍රියාකිරීම සඳහා තමාගේ මතය, නගරාධිපතිවරයා මගින් මහා නගර සභාවට ඉදිරිපත් කළ යුතුය. ඒ ආකාරයෙන් නාගරික කොමසාරිස්වරයාගේ මතය මහා නගර සභාව වෙත වාර්තා වී ඇති අවස්ථාවක දී, මේ කොටසේ 24 වන අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කිරීමට මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන වගන්තියේ සඳහන් ආකාරයෙන් මේ කොටසේ 24 වන අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කිරීමට මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති යම් අවස්ථාවක, එකී ටෙන්ඩර් කැඳවීමට අනුව ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට, අවලංගු වී ඇති ගිවිසුමේ එක් පාර්ශ්වකරු වන බදුකරුට හිමිකමක් නොමැත්තේ ය.

29. කවර හෝ පෞද්ගලික වෙළෙඳ පොළක ඇතුළත කඩ කාමරවල සහ වෙළෙඳ මැහිවල වෙළෙඳාමේ යෙදෙන එක් එක් තැනැත්තෙකුම, මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් පිළිපැදීම කළ යුතුවාත් හැර, එකී තැනැත්තන් විසින් ඒ නියමයන් පිළිපදිනු ලබන බවට වගබලා ගැනීම එකී වෙළෙඳ පොළෙහි බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

30. මේ කොටසේ 32 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් පිළිපැදීම සෑම පෞද්ගලික වෙළෙඳ පොළකම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

31. කවර හෝ පෞද්ගලික වෙළෙඳ පොළකට අදාල අතුරු ව්‍යවස්ථා වල සඳහන් කාර්යයන්හි සඳහන්-

(i) ''පොදු වෙළඳ පොළ'' යන්න වෙනුවට, එකී පෞද්ගලික වෙළෙඳ පොළ ද ;

(ii) ''කුලීකරු'' යන්න වෙනුවට, එකී පෞද්ගලික වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක වෙළෙඳාමේ යෙදෙන තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ ඒ අවස්ථාවේ එකී කඩ කාමරයේ පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද ;

(iii) ''නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා" හෝ -මහා නගර සභාව" යන්න වෙනුවට, එකී පෞද්ගලික වෙළෙඳ පොළෙහි බලපත්‍රලාභියා අදහස් වියයුතු අතර ඔහුගේ අනුයෝජිතයා හෝ ඒ අවස්ථාවේ එකී පෞද්ගලික වෙළෙඳ පොළෙහි බලපත්‍රලාභියාගේ කාර්යය හෝ කර්තව්‍ය භාරව සිටින යම් තැනැත්තෙකු ද ;

අදහස් විය යුතු ය.

32. කිසියම් පෞද්ගලික වෙළෙඳ පොළක් විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේ ද, යන්න ත්‍රිවිධ භාෂාත්‍රයෙන්ම වූ දැන්වීමක් හෝ දැන්වීම් මගින් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් එකී පෞද්ගලික වෙළෙඳ පොළකට ඇතුල්වීමේ දොරටු අසළ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

ඉටුනොකළයුතු කාර්යයන් (33 - 60)

33. මෙහි පහත සඳහන් කවර හෝ ක්‍රියාවක්, කවර හෝ තැනැත්තෙකු විසින් කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

(i) කඩ කාමරයක් හෝ ඉඩකඩක් සඳහා බලපත්‍රයක් හෝ අවසරපතක් දරන තැනැත්තෙකුට සිටිමින්, ඒ වෙළෙඳ පොළට පැමිණෙන කවර හෝ තැනැත්තෙකු අනවශ්‍ය සහ පීඩාකාරී කරදරයකට හෝ ප්‍රමාදයකට පාත්‍ර කිරීම.

(ii) පොදු වෙළෙඳ පොළක ඉවුම් පිහුම් කිරීම.

(iii) පොදු වෙළෙඳ පොළක හෝ ඊට යාබද පරිශ්‍රයෙහි නොහික්මුණු ආකාරයට හැසිරීම හෝ සිඟාකෑම හෝ යම් කරදරයක් සිදු කිරීම.

(iv) පොදු වෙළෙඳ පොළක් පස්වරු 9.00 ට වසනු ලැබීමෙන් පසුව, පිළිගත හැකි හේතු දැක්වීමක් කළ නොහැකිව පොදු වෙළෙඳ පොළෙහි රැඳී සිටීම.

(v) පොදු වෙළෙඳ පොළක හෝ ඊට යාබදව ඇති ගොඩනැගිලි වල, කඩ කාමර වල, විදුලි ලාම්පු වල හෝ මහා නගර සභාවට අයත් දේපලයන්හි යම් කොටසකට අලාභයක් කිරීම හෝ කවර හෝ ආකාරයකින් විරූප කිරීම හෝ ඒ පොදු වෙළෙඳ පොළෙහි ප්‍රයෝජනය සඳහා සපයා ඇති ජලය කෙළසීම හෝ යම් ආකාරයකින් හෝ නාස්ති කිරීම හෝ එයින් ස්නානය කිරීම හෝ රෙදි, වාහන, සතුන් සේදීම.

(vi) නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් විධිමත් ආකාරයෙන් අවසරයක් දී ඇත්තේ නම් මිස, තම කඩ කාමරයේ නාම පුවරුව නොවන වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීම, බැනර් ඇඳ තැබීම හෝ වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක කාර්යයක් කිරීම.

(vii) වැසිකිළි, කැසිකිළි හැර සෙසු ස්ථාන වල මලපහ, මූත්‍රා කිරීම.

(viii) කෘෂිකර්ම ද්‍රව්‍යයන් විකිණීම් කරන නිෂ්පාදකයන්ගෙන් කොමිස් මුදල් ලබාගැනීම.

(ix) කෘෂිකර්ම නිෂ්පාදන ද්‍රව්‍යයන් හැර අනෙකුත් වියලි ආහාර ද්‍රව්‍යයන් වෙළෙඳ මැහි වල තබා විකිණීම.

34. යම් පොදු වෙළෙඳ පොළක් ඇතුළත හෝ ඊට යාබදව ඇති පරිශ්‍රයෙහි ඝෝෂා කිරීම හෝ කෝලාහල කිරීම නැතහොත් දබර කිරීම හෝ අපහාසාත්මක, අපවාදාත්මක හෝ අශිෂ්ට වචන පාවිච්චි කිරීම යනාදි කාර්යයන්හි නියුක්ත කවර හෝ තැනැත්තෙකුව, වෙළෙඳ පාලක විසින් හෝ ඔහුගේ සහායක විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙකු විසින් හෝ පිටමං කිරීමට හැකි ය.

35. මහා නගර සභාවේ බලපත්‍රයක් නොමැතිව හෝ එවැනි බලපත්‍රයක කොන්දේසි වලට පටහැනිව, කිසිම තැනැත්තෙකු විසින් (මහා නගර සභාව විසින් සපයා ඇති පොදු වෙළෙඳ පොළ හැර) මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත කවර හෝ ස්ථානයක හෝ වීථියක, මාළු,කුකුල් මස්, ගව මස්, එළු මස් හෝ වෙනත් මසක් හෝ අතුණුබහන් ආදියක් හෝ විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම නැතහොත් එහා මෙහා ගෙනයාම හෝ නොකළ යුතු ය. ඒ සමඟ මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කළ විශෙෂ බලපත්‍රයක් නොමැතිව, මහා නගර සභාවේ පොදු වෙළෙඳ පොළේ සිට කිලෝ මීටර් 1/2ක අරයක් ඇතුළත කවර හෝ මස් වර්ගයක්, මාළු, විකිණීම නොකළ යුතු ය. එසේ ම, මහා නගර සභාවේ පොදු වෙළෙඳ පොළේ සිට කිලෝ මීටර් 1/2ක අරයක් ඇතුළත එළවළු වර්ගයන් (පොල් ඇතුළුව), පළතුරු වර්ගයන් යනාදිය ද කිසිම තැනැත්තෙකු විසින් විකිණීම නොකළ යුතු ය.

පොදු වෙළෙඳ පොළේ අරය යන්නෙන්, මහා නගර සභාවෙන් තීරණය නොකළ විටක,පොදු වෙළෙඳ පොළේ සිට කිලෝ මීටර් 1/2ක ඇතුළත් ප්‍රදේශ වේ. කිලෝ මීටර් 1/2කට අඩු පොදු වෙළෙඳ පොළේ අරය මහා නගර සභාවෙන් තීරණය කරනු ලැබ ප්‍රසිද්ධ කළ හැකි ය.

36. කවච මසුන් හැර ආහාරයට ගන්නා මසුන්ව බර අනුව මිස, පොදු වෙළෙඳ පොළ සීමාව ඇතුළත විකිණීම නොකළ යුතු ය.

37. මහා නගර සභාවෙන් නිකුත් කරන ලද බලපත්‍රයේ නිශ්චිතව සඳහන් භාණ්ඩය හෝ දෙය හැර අන් කිසිවක් කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළක් තුළ තබා ගැනීම හෝ විකිණීම නොකළ යුතු ය. පොදු වෙළෙඳ පොළ තුළ හෝ මේ කොටසේ 22 වන අතුරු ව්‍යවස්ථාවට අනුව විශේෂ බලපත්‍රයක් දෙන ලද ස්ථානයක හෝ මේ කොටසේ 35 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව කවර හෝ තැනැත්තෙකු විසින් කිසිම මසක් හෝ අතුණුබහන් ආදියක් විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතු ය. තවද, මස් විකුණන හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කරන කවර හෝ තැනැත්තෙකුගෙන් එකී බලපත්‍රය ඉදිරිපත් කරන ලෙස යම් බලය පවරන ලද මහා නගර සභාවේ නිලධරයෙකු විසින් හෝ පොලිස් නිලධරයෙකු විසින් ඉල්ලා සිටීම නීත්‍යානුකූල වන අතර එය ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එසේ බලපත්‍රයක් නොමැතිව හෝ බලපත්‍රයෙහි නියමයන්ට පටහැනිව එම වෙළෙඳ පොළෙහි ඇති මස් කිසිවක් තහනමට ගෙන නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි හෝ විනිසුරුවරයා විසින් ආඥා කරනු ලැබිය හැකි පරිදි බැහැර කරනු ලැබීම පිණිස මහා නගර සභා කාර්යාලයට හෝ පොලිස් ස්ථානයකට හෝ ගෙනයාම නීත්‍යානුකූල වන්නේ ය.

38. මහා නගර සභාවේ විධිමත් බලපත්‍රයක් නොමැතිව කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළේ කිසිම කඩ කාමරයක කුකුල් මස් විකිණීම නොකළ යුතු ය.

39. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් නොමැතිව කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළක් තුළ යම්කිසි කඩ කාමරයක හෝ ස්ථානයක යම් භාණ්ඩයක් විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කිරීමට ස්ථානයක් තබාගැනීම හෝ පරිහරණය කිරීම හෝ දැරීම නොකළ යුතු ය.

40. මහා නගර සභාවෙන් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි දෛනික ගාස්තුවක් ගෙවා එළවළු, පළතුරු සහ වෙනත් භාණ්ඩ විකුණන තැනැත්තන් සඳහා පොදු වෙළෙඳ පොළකම නිසි පරිදි සලකුණු කොට අංක යොදා ඇති වෙළෙඳ මැහි තිබිය යුතු ය. කවර හෝ තැනැත්තෙකු ඇතුල්වීමේ අවසරපතක් නොමැති වෙළෙඳ මැහි පාවිච්චි කිරීම නොකළ යුතු අතර ඇතුල්වීමේ අවසරපතේ සඳහන් නොවන කිසිම වර්ගයක එළවළු, පළතුරු හෝ වෙනත් භාණ්ඩ කිසිවක් එහි විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය. නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තෙකු විසින් අත්සන් තබන ලද ඇතුල්වීමේ අවසරපතක්, එම ගාස්තුව ගෙවන එක් එක් තැනත්තාට නිකුත් කරනු ලැබිය යුතු ය.

41. පොදු වෙළෙඳ පොළක යම් ස්ථානයක් සඳහා නිකුත් කර ඇති බලපත්‍රයක් හෝ අවසරපතක් කවර හෝ තැතැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකුට පවරා දීම හෝ එවැනි කඩ කාමරයක් හෝ

ඉඩකඩක් හෝ ඒ යමක කොටසක් අතුරු කුලීයකට දීම නොකළ යුතු ය. තව ද, නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ අවසරය නොමැතිව සිදු කරන ලද යැයි කියන එවැනි පවරා දීමක් යටතේ කිසිම තැනැත්තෙකු කඩ කාමරයක් හෝ ඉඩකඩක් හෝ යමකින් කොටසක් ප්‍රයෝජනයට ගැනීම හෝ පරිහරණය කිරීම හෝ දැරීම නොකළ යුතු ය.

42. පොදු වෙළෙඳ පොළක යම් ඉඩකඩක් සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ අවසරපතක් දරන කවර හෝ තැනැත්තෙකු විසින් කවර ව්‍යාජයකින් වුව ද, වෙනත් තැනැත්තෙකුට ඒ ඉඩකඩ හෝ ඉන් කොටසක් ප්‍රයෝජනයට ගැනීමට හෝ පරිහරණය කිරීමට හෝ එහි කවර හෝ බඩු භාණ්ඩ හෝ දේවල් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට ඉඩ හැරීම හෝ අවසර දීම නොකළ යුතු ය.

43. අවසරපතක් දරන්නෙකු හැර වෙනත් කිසිම තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළක යම් ඉඩක් හෝ ඉඩකඩකින් කොටසක් ප්‍රයෝජනයට ගැනීම හෝ පරිහරණය කිරීම හෝ එහි යම් බඩු විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

44. යම් පිළිකුල් සහගත හෝ ස්පර්ශක හෝ ආසාදන රෝගයකින් පෙළෙන තැනැත්තෙකුව සිටිමින්, යම් පොදු හෝ පෞද්ගලික වෙළෙඳ පොළක යම් කඩ කාමරයක්, ආසනයක් හෝ ඉඩකඩක් පරිහරණය කිරීම හෝ කවර භාණ්ඩයක් ඒ වෙළෙඳ පොළෙහි හෝ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නැතහොත් එහා මෙහා ගෙනයාම. තව ද, එවැනි යම් රෝගයක් වැළඳී ඇති යම් තැනැත්තෙකු යම් පොදු හෝ පෞද්ගලික වෙළෙඳ පොළක කිසිම තැනැත්තෙකු විසින් කවර හෝ තත්ත්වයකින් සේවයේ නියුක්ත නොකළ යුතු අතර එවැනි රෝගයක් වැළඳී ඇති යම් තැනැත්තෙකු යම් වෙළෙඳ පොළකට ඇතුළු නොවිය යුතු ය. එවැනි යම් තැනැත්තෙකු වෙළෙඳ පොළ පරිශ්‍රයෙන් පිටමං කරනු ලැබිය යුතු ය.

45. පොදු වෙළෙඳ පොළෙහි යම් කඩ කාමරයක් සඳහා බලපත්‍රයක් දරන කවර හෝ තැනැත්තෙකු විසින් කවර ව්‍යාජයකින් වුව ද, වෙනත් තැනැත්තෙකුට එකී කඩ කාමරය හෝ ඉන් යම් කොටසක් නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ අවසරයකින් තොරව ප්‍රයෝජනයට ගැනීමට හෝ පරිහරණය කිරීමට හෝ එහි කවර හෝ බඩු භාණ්ඩ හෝ දේවල් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට ඉඩ හැරීම හෝ අවසර දීම නොකළ යුතු ය.

46. පොදු වෙළෙඳ පොළක යම් කඩ කාමරයක් හෝ ඉඩකඩක් සඳහා බලපත්‍රයක් හෝ අවසරපතක් දරන තැනැත්තෙකු විසින් කුලීයට ගෙන ඇති කාමර වල හෝ ඉඩකඩෙහි හෝ සීමාවන්ට පිටස්තර කිසි බිම් ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීම හෝ පරිහරණය කිරීම හෝ ඔහු වෙනුවට ක්‍රියා කරන කවර හෝ තැනැත්තෙකුට ප්‍රයෝජනයට ගැනීමට හෝ පරිහරණය කිරීමට අවසර දීම හෝ ඉඩ හැරීම නොකළ යුතු ය. තව ද, එවැනි බලපත්‍රයක් හෝ අවසරපතක් දරන තැනැත්තෙකු කිසිම අනු නියෝජිතයෙකු හෝ සේවකයෙකු එවැනි බිම් ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීම හෝ පරිහරණය කිරීම නොකළ යුතු ය.

47. කවර හෝ තැනැත්තෙකු විසින් තත් කාර්යය සඳහා සපයා ඇති භාජනයකට හැර කුණු කසල, ඉවත දමන දේවල්, ඇටකටු, සතුන්ගේ සම් හෝ එවැනි වෙනත් දේ යම් පොදු වෙළෙඳ පොළකට හෝ එහි පරිශ්‍රයට නැතහොත් වෙළෙඳ පොළ පරිශ්‍රයෙහි හෝ ඒ අසල ඇති යම් ඉඩමකට විසි නොකළ යුතු ය.

48. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා, අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති අවස්ථාවන්හි හැර පළාත් පාලන ආයතන ඝාතනාගාරයක ඝාතනය නොකළ කිසිම සතෙකුගේ මසක් පොදු වෙළෙඳ පොළකට මේ කොටසේ 22 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන් විශේෂයෙන් බලපත්‍රයක් දෙන ලද යම් ස්ථානයකට ගෙන යාම හෝ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතු ය. දිවයිනට ආනයනය කරනු ලබන මස් හෝ මාළු වලට මේ අතුරු ව්‍යවස්ථා වල විධිවිධාන අදාල නොවිය යුතු ය. එසේ ආනයනය කරන මස් හෝ මාළු ඒවා විකිණීම සඳහා විශේෂයෙන් බලපත්‍රලත් ස්ථානයක විකිණිය යුතු ය.

49. කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළකට සුනඛයෙකු ගෙන ඒම හෝ ඔහුට අයත් හෝ ඔහු භාරයේ සිටින යම් සුනඛයෙකු යම් වෙළෙඳ පොළ පරිශ්‍රයක කවර හෝ කොටසක සිටින්නට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

50. (i) පොදු වෙළෙඳ පොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළෙඳාම සඳහා යොදා ගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණීම සඳහා වෙළෙඳ පොළ තුළට රැගෙන එනු ලබන අවස්ථාවක දී හෝ ඉන් බැහැරව ගෙනයනු ලබන අවස්ථාවක දී හැර වෙනත් කවර හෝ අවස්ථාවක දී කිසියම් කොරිඩෝරයක හෝ වේදිකා බැම්මක හෝ රඳවා තැබීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(i) පොදු වෙළෙඳ පොළ ඇතුළත කවර හෝ කොරිඩෝරයක් මත හෝ වේදිකා බැම්මක් මත හෝ කවර හෝ ආකාරයක වෙළෙඳාමක් නොකළ යුතු අතර පොදු වෙළෙඳ පොළේ ගමන් මාර්ග, කොරිඩෝර, මහජනයා යෑමට ඒමට වෙන්කර ඇති ස්ථාන, වේදිකා බැම් යනාදි ස්ථාන වල කිසිම තැනැත්තෙකු විකිණීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

51. මහා නගර සභාව විසින් කලින් තීරණය කර ගත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් පොදුවෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

52. කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළෙඳ පොළ ඇතුළත කවර හෝ ස්ථානයක වෙළෙඳ මැස්සක් ඉදිකිරීම හෝ තහඩු කිරීමක් නොකළ යුතු ය.

53. මේ කොටසේ 12 වන අතුරු ව්‍යවස්ථාවෙහි නියමය යටතේ නිකුත් කරනු ලැබූ වලංගු අවසරපතක් දරන්නෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ වන්නේ නම් හා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල වන්නේ නම් මිස, පොදු වෙළෙඳ පොළෙහි ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් යුතු කොටසෙන් බැහැරව තනා ඇති වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතු ය. තව ද, පොදු වෙළෙඳ පොළ වැසීම සඳහා නිශ්චය කරනු ලැබූ වේලාවෙන් පසුව කවර හෝ තැනැත්තෙකු එලෙස වූ යම් ස්ථානයක් මත කවර හෝ දෙයක් නොතැබිය යුතු ය.

54. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ මහා නගර සභාව සමඟ අත්සන් කළ කුලී ගිවිසුකමකට එළැඹ ඇති තැනැත්තෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයකු හෝ වන්නේ නම් සහ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සහ එකී කුලී ගිවිසුමේ සඳහන් නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කවර හෝ කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කරනු නොලැබිය යුතු ය.

55. කිසියම් කඩ කාමරයක කුලී කාලය අවසන් වන දින සිට එක් මාසයක කාලයක් ගතවීමට මත්තෙන් මේ කොටසේ 16 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරි වර්ෂය සඳහා කුලී කාලය වලංගු කරවා ගෙන ඇත්තේ නම් මිස, කවර හෝ කුලීකරුවෙකුට පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දී ඇති එකී කඩ කාමරය, එකී කුලීය කල් යාමේ මාසය අවසන් වන දිනෙන් පසුව පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට හිමිකමක් නොතිබිය යුතු ය.

56. පොදු වෙළෙඳ පොළෙහි කිසියම් කඩ කාමරයක් අතුරු කුලීයට ගැනීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය. කිසියම් තැනැත්තෙකු විසින් කිසියම් කඩ කාමරයක් අතුරු කුලීයට ගනු ලැබීම හේතුවෙන් එකී කඩ කාමරය කුලීකරු සමඟ මහා නගර සභාව එළැඹ ඇති ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් ද, එකී කඩ කාමරය ආපසු මහා නගර සභාවට පවරා ගැනීම හේතුවෙන් ද, එකී අතුරු කුලීකරුට සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ පාඩුවක් එකී අතුරු කුලීකරු වෙතම පැවරෙන අතර මහා නගර සභාව හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ ඒ පිළිබඳ වගකීමට යටත් නොවන්නේ ය.

57. පොදු වෙළෙඳපොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයකින් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ කඩ කාමරයකට විදුලි සැපයුමක් හෝ ජල සැපයුමක් ලබා ගැනීම හෝ එසේ ලබා ගැනීමට ඉඩදීම හෝ නොකළයුතු ය.

58. (i) කවර හෝ බලපත්‍රලාභියෙකු හෝ විකිණීම් සඳහා වලංගු අවසරපතක් ලබාගෙන ඇති තැනැත්තෙකු මේ කොටසේ 62 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළයුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථා වල නියමයන් යටතේ පෞද්ගලික පොදු වෙළෙඳ පොළක බලපත්‍රලත් තැනැත්තෙකු සහ පොදු වෙළෙඳ පොළේ සිටින කවර හෝ තැනැත්තෙකු නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට අදාළ වෙළෙඳ පොළ කිරීමට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර, එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

59. පොදු වෙළෙඳ පොළ පාලකයෙකුව හෝ බදුකරුවෙකුව හෝ ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලැබී තැනැත්තෙකුව සිටින තැනැත්තාට ලැබිය යුතු බලය, ලබා දී ඇති බදු කුලියට වඩා වැඩි ප්‍රමාණයක් ඉල්ලා සිටීම හෝ ලබාගැනීම නැතහොත් තමා වෙත පැවරී ඇති හෝ තමාට නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීමේ නියායෙන් යම් තැනැත්තෙකුට අනවශ්‍ය සහ පීඩාකාරී කරදරයක් සිදුකිරීම නොකළ යුතු ය.

60. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් පොදු වෙළෙඳ පොළකට අදාල නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ පෞද්ගලික වෙළෙඳ පොළකට බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්ය භාරය (61 - 64)

61. මහා නගර සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළෙඳ පොළක් සම්බන්ධයෙන් මේ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් පිළිපැදීම මහා නගර සභාව විසින් කළ යුතු ය. එනම් එකී පොදු වෙළෙඳ පෙළෙහි -

(i) ස්ථිර ගොඩනැගිලි සියල්ල ම ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර බිත්ති වල උස අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 3.0ක් උසින් යුක්ත විය යුතු ය.

(ii) වහලය කිසියම් ස්ථිර සණ ද්‍රව්‍යයකින් තනා නිමකර තිබිය යුතු ය.

(iii) ඇතුළත කඩ කාමර වල වහලයට ඇතුල් වහලක් (සිවිලිමක්) සවිකර තිබිය යුතුවාත් හැර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0ක් උසින් පිහිටා තිබිය යුතු ය ;

(iv) ගොඩනැගිල්ල ඇතුළත කඩ කාමර වල ඉදිරිපස අවම වශයෙන් මීටර් 2.5ක පළලින් යුතු කොරිඩෝරයකින් යුක්ත විය යුතුවාත් හැර එක් එක් කඩ කාමරයක්ම කොරිඩෝරයට සම්බන්ධ වන ස්ථානයේ අකුලන දොරකින් හෝ පළු වශයෙන් ගලවා විවෘත කළ හැකි දොරකින් යුක්ත විය යුතු ය ;

(v) කඩ කාමර සහිත ගොඩනැගිල්ලේ බිත්ති වල පිටත මායිමේ සහ කොරිඩෝව පිටත මායිමේ අවම වශයෙන් මීටර් එකක පළලින් යුතු වේදිකා බැමි සහ වැසි ජලය ගලායාමේ කාණු තනා තිබිය යුතු ය ;

(vi) ගොඩනැගිල්ලේ කඩ කාමර වලින් යුතු කොටසෙන් බැහැරව තාවකාලික වෙළෙඳුන් සඳහා වෙළෙඳ මැහි තනා තිබිය යුතු ය ;

(vii) ඇතුළත ඉදි කරනු ලබන එක් එක් වෙළෙඳ මැස්සක් ම ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් ඉදිකළ කුඩා බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මල නොබැඳෙන ලෝහ තහඩුවකින් තට්ටුව නිමකර තිබිය යුතු ය. කෙසේ

වුව ද, කොන්ක්‍රීට් තහඩුවකින් තට්ටුව නිමකර ඇති විටක, එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔපදමා හෝ බිම් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ඒ ආකාරයෙන් වෙළෙඳ මැහි තැනීමට නොහැකි වන යම් අවස්ථාවක, පොළොව මත සමතලා ආකාරයෙන් වූ ඉඩ කොටස් තනා තිබිය යුතු අතර එකී කොටස් ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් නිමකර සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු අතර එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සලකුණු සුදු පාටින් ලකුණු කර තිබිය යුතු ය.

(viii) එක් එක් වෙළෙඳ මැස්සක ම වර්ගඵලය අවම වශයෙන් වර්ග මීටර් 2.0ට නොඅඩු විය යුතු ය.

(ix) එක් එක් වෙළෙඳ මැස්සක්ම ආවරණය වන සේ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් හෝ ගැල්වනයිස් කළ යකඩ බට වලින් වැර ගැන් වූ ඇළුමිනියම් බට යෙදූ කණු මත අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25ක උසකින් යුක්ත වහලයක් තනා තිබිය යුතු අතර අගුව අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.1ක් උසකින් යුක්ත විය යුතු ය.එසේම, එකී කණු ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් හෝ අනුමතික වෙනත් ගලෙන් තනා ඇත්තේ නම්, කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු අතර ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇත්තේ නම්, එකී කණුවලත් තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(x) සෑම වහලයක් ම ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර වැහිපීලි හා වැහිපීලි වල රැස්වන ජලය පහලට බැසයාමට ප්‍රමාණවත් බට සවිකර තිබිය යුතු ය.

(xi) සෑම වෙළෙඳ මැස්සක් වටා පොළොවේ සිට අවම වශයෙන් මීටර් 1.0ක පළලින් කුඩා වේදිකා බැමි තනා තිබිය යුතු ය.

(xii) පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් මෙන් ම, අවම වශයෙන් සෑම මාස හයකට වරක් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතුය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය මෙම ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම්, එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(xiii) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(xiv) ස්ත්‍රී හා පුරුෂ පක්ෂයට වෙන වෙනම වෙන් වූ වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර එකී සෑම වැසිකිළියකම බිම ද අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.0 ක් උසට බිත්ති වල ද බිම්ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(xv) සියළුම කඩ කාමර වලට වෙළෙඳ මැහි අසළට වැසිකිළි හා කැසිකිළි තුළට හා කොරිඩෝර ඇතුළුව සියළුම පොදු කොටස් ඇතුළත ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා දී තිබිය යුතු අතර සෑම විදුලි පරිපථයක් ම විදුලි කුසන්නායක ද්‍රව්‍යයකින් තැනූ ආවරණයකින් ආවරණය කර තිබිය යුතු ය.

(xvi) එක් එක් කඩ කාමරයකටම විදුලි මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ස්ථාන ආලෝකකරණය සඳහා වැය වන විදුලිය ඒකක ගණන මැනීම සඳහා වෙනම මනුවක් සවිකර තිබිය යුතු ය.

(xvii) පරිශ්‍රය ඇතුළත පොදු ජල කරාම සවිකර තිබිය යුතු ය.

(xviii) එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙනම ස්ථානයක් වෙන්කර තිබිය යුතු ය.

(xix) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජලය ලබාගන්නා විට, වෙළෙඳාමේ ස්වභාවය අනුව ජලය පාවිච්චි කිරීම අවශ්‍ය කරන සෑම කඩ කාමරයකට ම ජල සම්බන්ධතාවක් බැගින් ලබා දී තිබිය යුතු ය. එකී එක් එක් ජල සම්බන්ධතාව වෙනුවෙන් වෙන වෙනම වූ ජල මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ජල කරාම වල සහ එළවළු සහ පළතුරු සේදීම වෙන්කළ ස්ථානයේ ජලපරිභෝජනය මැනීම සඳහා වෙනම ජල මනුවක් බැගින් සවිකර තිබිය යුතු ය.

(xx) ඍජුවම ඇතුළට හා වහලය මතට පතිත වන වැහි ජලය, එළවළු සහ පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයෙන් බැහැර කෙරෙන ජලය නිසි ආකාරයෙන් ගලායාමට ප්‍රමාණවත් කාණු පද්ධතියක් තනා තිබිය යුතු අතර, එකී අපජලය බාධාවකින් තොරව ගලායාමට සලස්වා තිබිය යුතු ය.

(xxi) ඇතුළත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් සකස් කර තිබිය යුතු අතර විදුලි බලය හේතුවෙන් ඇතිවන ගිනි, ඉන්ධන මගින් ඇතිවන ගිනි හා වෙනත් ආකාරයකින් ඇතිවන ගිනි මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය කරන වෙන් වෙන් වූ වර්ගයේ ගිනි නිවීමේ උපකරණ සවිකර තිබිය යුතු ය.

(xxii) පාරිභෝගිකයින් විසින් මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන්හි බර කිරා තහවුරු කර ගැනීම පිණිස සම්මත පොදු තරාදියක් පැහැදිලිව පෙනෙන ස්ථානයක තබා තිබිය යුතු ය.

(xxiii) පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමර වල පිහිටීම සැලකිල්ලට ගනිමින් මහා නගර සභාව විසින් මස්, මාළු, එළවළු, පළතුරු, සිල්ලර බඩු හා වෙනත් වෙළෙඳ ද්‍රව්‍ය විකිණීම සඳහා වෙළෙඳ පොළ කොටස් වලට බෙදා වෙන් කිරීම ද, ඒ ආකාරයෙන් ම වෙළෙඳ මැහි ද කොටස් වලට වෙන් කිරීම ද මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

(xxiv) පරිශ්‍රය තුළ ජනනය වන අපද්‍රව්‍ය -

(අ) ජෛවහායන අපද්‍රව්‍යය;
(ආ) වීදුරු;
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍යය;
(ඈ) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍යය;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍යය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
(ඊ) අන්තරායකර අපද්‍රව්‍යය;
වෙන වෙනම රැස්කළ හැකි වළවල් හෝ භාජන හෝ ටැංකි හෝ එකී පොදු වෙළෙඳ පොළෙහි වෙනම ස්ථානයක තනා තිබිය යුතු අතර ජෛවහායන අපද්‍රව්‍යය බහාලීම සඳහා තනනු ලබන වළේ හෝ භාජනයේ හෝ ටැංකියේ බළලන්ට, මැස්සන්ට, වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියෙකුට ඇතුල්වීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තිබිය හැකි පියනක් සවිකර තිබිය යුතු ය.

(xxv) වෙළෙඳ පොළට පැමිණෙන පාරිභෝගිකයින්ගේ වාහන, භාණ්ඩ ප්‍රවාහනය කරන තැනැත්තන්ගේ වාහන, පා පැදි, යතුරු පැදි, මෝටර් වාහන යනාදිය නතර කර තැබීමට ප්‍රමාණවත් ඉඩකඩක් වෙන්කර තිබිය යුතු ය.

(xxvi) ගොවීන් තම තමන්ගේ නිෂ්පාදන ද්‍රව්‍යයන් තොග වශයෙනුත්, සිල්ලර වශයෙනුත් වෙළෙඳ පොළෙහි තබා විකිණීමට වෙනම වූ පොදු ස්ථානයක් වෙන්කර දීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. ඒ සමඟින් මෙම අතුරු ව්‍යවස්ථා

වල ඇතුළත් සෙසු විධිවිධානයන්හි සඳහන් ක්‍රියාමාර්ගයන් පිළිපැදීම ගොවීන්ගේ වගකීම වන්නේ ය.

(xxvii) මහා නගර සභාවෙන් නඩත්තු කරනු ලබන පොදු වෙළෙඳ පොළේ ගොඩනැගිලි සංකීර්ණයේ ස්ථාන වෙන්කිරීම් කරනු ලැබූ සටහන, මහජනයාට පහසුවෙන් බලාගැනීමට හැකි අයුරින් එක් තැනක ප්‍රදර්ශනය කර තිබිය යුතු ය. මහා නගර සභාවෙන් අනුමත කළ පරිද්දෙන් සාප්පු සවාරි, වෙළෙඳ මැහි, මාළු වෙළෙඳ සැල්, මස් වෙළෙඳ සැල්, කෘෂිකර්ම ඵලදා ද්‍රව්‍යයන් වෙළෙඳ සැල් යනාදි වශයෙන් වර්ග කරනු ලැබූ කොටස් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් විය යුතු ය.

62. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් පොදු වෙළඳ පොළක හෝ පෞද්ගලික වෙළෙඳ පොළක විකිණීමටතබා ඇති හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩා කර ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක් පරීක්ෂණ අරමුණ සඳහා එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

63. මහා නගර සභාවෙන් ස්ථාන වෙන්කිරීම් කරන ලද සටහනට අනුව වෙළෙඳ මැහි වල එළවළු වර්ගත්, සාප්පු සවාරිය ඇතුළත වූ කඩ කාමර වල ගිවිසුමට අනුව ද්‍රව්‍යයන් ද විකුණුම් කරනු ලබන බවට සහතික කිරීම මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

64. විශේෂ අවශ්‍යතා ඇති තැනැත්තන් සහ ඔවුන්ගේ රෝද පුටුත්, පොදු වෙළෙඳ පොළ ඇතුළට ඇතුල්වීමට හැකි පරිද්දෙන් ගොඩනැගිල්ලේ පියවර බැවුම, අත් ඇල්ලීම යනාදි නිර්මාණ ඉදිකර තිබිය යුතු ය.

65. (i) වෙළෙඳ පොළ කඩ කාමර වල කුලී මුදල, රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුකූලව කඩ කාමර කුලීකරු සමඟ කරන ලද ගිවිසුමට අනුව අයකර ගැනීම නාගරික කොමසාරිස්වරයාට නිත්‍යානුකූල වන්නේ ය. අයකිරීම් හා ගාස්තු

(ii) වෙළෙඳ පොළක වෙළෙඳ මැහි පාවිච්චි කරන්නන්ගෙන් ඇමුණුම II හි සඳහන් පරිදි මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තුව අයකර ගැනීමටත්, වෙළෙඳ මැහි වලට අතිරේකව වෙළෙඳ පොළේ පොදු ස්ථාන වල තබා විකුණන ගොවීන්ගෙන්/තැනැත්තන්ගෙන් තොග විකුණුම් මිළෙන් 5% ප්‍රතිශතයකට නොඉක්ම වූ මහා නගර සභාවෙන් තීරණය කළ ගාස්තුවක් අයකිරීම නිත්‍යානුකූල වන්නේ ය. ඉහත මෙම වගන්තියේ සඳහන් ගාස්තුව අයකර ගැනීමේ හිමිකම වාර්ෂික බදුකරු සමඟ ගිවිස ගත් ගිවිසුමට අනුව බදු වශයෙන් අයකර ගැනීමේ බලයත් මහා නගර සභාවට ඇත්තේ ය. කෙසේ වුව ද, සියළු ම ගාස්තු සම්බන්ධ විස්තර ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙන් පළකිරීම කළ යුතු ය.

(iii) පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

(iv) පෞද්ගලික වෙළෙඳ පොළකට රැගෙන එනු ලබන නිෂ්පාදන ද්‍රව්‍යයන් තොග වශයෙන් විකුණුම් කරනු ලබන විට, තොග විකුණුම් මිළෙන් 5% ක ප්‍රතිශතයකට නොඉක්ම වූ මහා නගර සභාවෙන් තීරණය කරනු ලබන අදාළ ප්‍රතිශතය සඳහා වූ ගාස්තුවක් පෞද්ගලික වෙළෙඳ පොළ හිමිකරු අයකර ගැනීමෙහි දී, එයින් 25 % ක ප්‍රතිශතයක් මහා නගර සභාවට ගෙවීම් කළ යුතු වන්නේ ය. ඒ සඳහා වෙනම ම ගිවිසුමක් ගිවිසා ගත යුතු ය. මේ සඳහා මහා නගර සභාව විසින් අනුමත කළඅවසරපත්‍ර පොත් පමණක් මෙම අයකිරීමට පාවිච්චි කළ යුතු ය.පෞද්ගලික මාළු වෙළෙඳ පොළටත් මෙම අතුරු ව්‍යවස්ථාව අදාල විය යුතු ය.

66. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

67. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (68 - 71)

68. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට, කිසියම් පොදු වෙළෙඳ පොළක් හෝ පෞද්ගලික වෙළෙඳ පොළක් වෙළෙඳාමේ කටයුතු සඳහා විවෘත කර තබනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

69. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයකට පොදු යහපත අවධානය කරමින් බලපත්‍රය නිකුත් කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සභාවට බලය තිබිය යුතු වන්නේ ය. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, මේ කොටසේ 61 වන අතුරු ව්‍යවස්ථාව සමඟ කියවියයුතු සහ මේ කොටසේ 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරුව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට හෝ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරනලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

70. මේ කොටසේ 69 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

71. මේ කොටසේ 70 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය (72 - 73)

72. කවර හෝ කඩ කාමරයක, ස්ථානයක,කුණු බක්කි, කුලීයක් හෝ ගාස්තු සම්බන්ධව යම්කිසි මතයක් පටහැනි වන අවස්ථාවක දී, එකී කාරණය විසඳාලීමට සුදුසු වන තමාගේ මතය නියෝග කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

73. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් මහා නගර සභාවේ නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

74. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

75. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත්

කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

76. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල - අර්ථ නිරූපනය හා නිර්වචන

-නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''කලත්‍රයා" යන්නෙන්, කිසියම් කුලීකරුවෙකුගේ හෝ බදුකරුවෙකුගේ නීත්‍යානුකූල භාර්යාව හෝ ස්වාමි පුරුෂයා අදහස් වේ.

''පොදු වෙළෙඳ පොළ" යන්නෙන්, මහා නගර සභාව විසින් ඉදිකර පවත්වා ගෙන යනු ලබන වෙළෙඳාමක නියුක්ත වීම සඳහා ඉදිකළ කඩ කාමර හා තම තමන්ගේ ගෙවත්තේ හෝ නිවසෙහි නිෂ්පාදනය කරනු ලබන එළවළු හෝ පළතුරු ද ඇතුළු වෙනත් ද්‍රව්‍යයන් හෝ භාණ්ඩ විකිණීමට ස්ථාන ඇති කර තිබෙන්නා වූ ද, කිසියම් නිෂ්පාදනයක් තොග වශයෙනුත්, සිල්ලර වශයෙනුත් මිළ දී ගැනීම හෝ විකිණීම කරනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

''පෞද්ගලික වෙළෙඳ පොළ" යන්නෙන්,මහා නගර සභාව නොවන වෙනත් කවර හෝ තැනැත්තකු විසින් හෝ තැනැත්තන්ගේ මණ්ඩලයක් පොදු වෙළෙඳ පොළක කාර්යයට සමාන කාර්යයක් හෝ කාර්යයන් පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් විය යුතු ය.

''ප්‍රධාන තක්සේරුකරු" යන්නෙන්,තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර මහා නගර සභාව අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් එකී පත් කරනු ලැබ ඇති නිලධාරියෙකු ද ඊට ඇතුළත් විය යුතු ය.

''කඩ කාමර කුලීකරු" යන්නෙන්,මහා නගර සභාව සමග ඇතිකර ගත් ගිවිසුමක් සහිතව කිසියම් පොදු වෙළෙඳ පොළක යම් කඩ කාමරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තකු අදහස් විය යුතු ය.

''වෙළෙඳ මැහි" යන්නෙන්, කිසියම් පොදු වෙළෙඳ පොළක කඩ කාමර වලින් වෙන් වූ හා එකී පොදු වෙළෙඳ පොළ ඇතුළත එදිනෙදා වෙළෙඳාම් කිරීම සඳහා ඉදිකර ඉරි සලකුණු වලින් වෙන් කරනු ලැබූ මැස්සක් අදහස් වන යුතු අතර එකී පොදු වෙළෙඳ පෙළෙහි පොළොව මත ඉරි සලකුණු ඇඳීමෙන් වෙළෙඳාම් කටයුතු සඳහා වෙන් කරනු ලැබ ඇති කවර හෝ ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

''වෙළෙඳ පොළ බදුකරු'' යන්නෙන්, පොදු වෙළෙඳ පොළක වෙළෙඳ මැස්සක් හෝ පොළොව පාවිච්චි කරන හෝ පරිහරණය කරන තැනැත්තෙකුට අවසරපතක් නිකුත් කර, ඒ සඳහා වූ මුදල් අයකරන, ගාස්තු රැස් කරන්නා යන්නෙනුත්, ඔහු එසේ මුදල් රැස් කිරීමට වාර්ෂික බද්දට ලැබූ තැනැත්තා යන්නෙනුත් අදහස් විය යුතු ය.

''කවර හෝ පොදු වෙළෙඳ පොළක වෙළෙඳාම සඳහා වෙන්කළ ඉඩ ප්‍රමාණය'' යන්නෙන්, කඩ කාමරයක් වන විට, එකී කඩ කාමරයේ පිටුපස බිත්තියේ සිට මේ කොටසේ 61 වන අතුරු ව්‍යවස්ථාවේ IV වන වගන්තියේ සඳහන් දොර සවිකර ඇති සීමාව දක්වා කොටස ද, වෙළෙඳ මැස්සක් වන විට, එකී වෙළෙඳ මැස්සේ මතුපිට වර්ග ප්‍රමාණය සහ වෙළෙඳාමේ යෙදෙන තැනැත්තාට රැඳී සිටීමට ඉඩ දී තිබෙන එකී වෙළඳ මැස්ස පිටුපස භූමි ප්‍රමාණය ද අදහස් විය යුතු ය.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය'' යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

ඇමුණුම. i

**මහා නගර සභාවේ පොදු වෙළෙඳ පොළේ වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා වන අවසරපත්‍රය**

අවසරපතේ හිමියාගේ නමඃ..........................................................................................................................................

ජාතික හැඳුනුම්පතේ අංකයඃ.......................................................................................................................................

වෙන්කළ වෙළෙඳ මැස්සේ/කොටු ඇදි කොටසේ අංකයඃ..................................................................................................

වෙන්කර දුන් කාලයඃ 20.......................................................................... දින සිට........................................................... දින දක්වා

වෙන් කළ දින ගණනඃ දින 01/දින 07/මාස 01යි :.........................................................................................................

අයකර ගනු ලැබූ ගාස්තුවඃ රුපියල් ..........................................................................................................................

නිකුත් කල දිනයඃ.......................................................................................................................................................

..............................................................................

ගාස්තු රැස්කරන්නාගේ අත්සන.
නාගරික කොමසාරිස්වරයා/වෙළෙඳ පොළ බදුකරු
වෙනුවට.

ඇමුණුම. ii

**පොදු වෙළඳ පොළක වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අයකරනු ලබන ගාස්තු චක්‍රය**

| වෙළඳ මැස්සේ ස්වභාවය | එක් දිනක් සඳහා ගාස්තුව රු. | දින හතක් සඳහා ගාස්තුව රු. | එක් මාසයක් සඳහා ගාස්තුව රු. |
|---|---|---|---|
| පොළොවෙන් ඉහළට ඉදිකළ වෙළෙඳ මැස්ස | .................. | .................. | .................. |
| පොළොව මත ඉරි සලකුණු යොදා වෙන්කළ කොටස | .................. | .................. | .................. |

ඇමුණුම.III

**මහා නගර සභාව**

පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු /වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20...........................වර්ෂය

1. පෞද්ගලික වෙළෙඳ පොළේ නමඃ ..........................................................................................................................................

2. පෞද්ගලික වෙළෙඳ පොළ පිහිටා ඇති ස්ථානයඃ

   (i) කොට්ඨාශයඃ .....................................................
   (ii) වරිපනම් අංකයඃ....................................................
   (iii) වීථියේ/ පාරේ නම ඃ .......................................................................
   (iv) ග්‍රාම නිලධාරීඃ- කොට්ඨාශ අංකය . ඃ .......................................................................
   කොට්ඨාශයේ නම ඃ .......................................................................

3. අයදුම්කරුගේ ඃ
   (i) සම්පූර්ණ නම ඃ .......................................................................
   (ii) ස්ථිර ලිපිනය ඃ .......................................................................
   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඃ .......................................................................
   (iv) ජාතික හැඳුනුම්පතේ අංකය ඃ .......................................................................
   (v) දුරකථන අංකය ඃ.......................................................................
   (vi) විද්‍යුත් තැපැල් ලිපිනය ඃ.......................................................................

4. (i) පෞද්ගලික වෙළෙඳ පොළ ආරම්භ කළ දිනය ඃ..........................................................................................................
   (ii) පෞද්ගලික වෙළෙඳ පොළේ හිමිකරුගේ/ කළමනාකරුගේ/නියෝජිතයාගේ ඃ
   (අ) නමඃ.......................................
   (ආ) දුරකථන අංකයඃ......................................

5. පෙළොව/ගොඩනැගිල්ල, කුලියට/බද්දට ලබාගෙන ඇත්තේ නම් ඃ
   (i) අයිතිකරුගේ නම ඃ ..........................................................................
   (ii) ලිපිනය ඃ ..........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබගෙන තිබේද? ඔව් ................................ නැත ................................
   ඔව් නම් ඃ බලපත්‍රය අංකය ඃ ...................................... දිනය ඃ ................................

7. අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඃ
   (i) වෙළෙඳ මැහිවල සංඛ්‍යාව ඃ ..........................................................................
   (ii) කඩ කාමර වල සංඛ්‍යාව ඃ ..........................................................................

8. වෙළෙඳ පොළ පවත්වාගෙන යාමට නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරු ද සමග) ඃ

9. වැසිකිළි/කැසිකිළි -
   (i) පිරිමින් සඳහා වූ වැසිකිළි / කැසිකිළි සංඛ්‍යාව ඃ ..........................................................................
   (ii) කාන්තාවන් සඳහා වූ සේවක වැසිකිළි/කැසිකිළි සංඛ්‍යාව ඃ ............................................................

10. ජලය ඃ

    පාරිභෝගිකයින් සඳහා වූ පානිය ජල සම්පාදන ප්‍රභවය/ප්‍රභවයන් හා ඒවායේ සංඛ්‍යාව ඃ
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................

    එළවළු සේදීම සඳහා ජල සම්පාදන ප්‍රභවය/ප්‍රභවයන් හා ඒවායේ සංඛ්‍යාව ඃ
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................

11. අපජලය බැහැර කරන ක්‍රමවේදය/ක්‍රමවේදයන් ඃ ..........................................................................................

12. ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය ඃ
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................
    ..........................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු පෞද්ගලික වෙළෙඳ පොළක් පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 .......................................................................... වර්ෂය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීතිවලට මම එකඟ වෙමි.

..........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය ඃ ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

...........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත් නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශය:........................................................................ වරිපනම් අංකය:..........................................................................

වීථියේ/පාරේ නම :..........................................................................
අයිතිකරුගේ නම :..........................................................................
දේපළෙහි ස්වභාවය :..........................................................................
වාර්ෂික වටිනාකම:..........................................................................
හිඟ වරිපනම් මුදල:.......................................................................... ඇත:......................................... නැත:...............................................

.........................................
පරිපාලන නිලධාරි.

දිනය : .........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:..........................................................................
ගෙවිය යුතු ගාස්තුව:..........................................................................
ඒකකය A, B, C :..........................................................................
සටහන් :..........................................................................

.................................................................
ආදයම් පරීක්ෂක.

දිනය : .........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................
.......................................................................................................................................................................................................

...................................................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : .........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

.........................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : .........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ............................................................ව්‍යාපාරයේ ස්වභාවය:.................................................................... පාරිසරික බලපත්‍ර:............................................................ MOH වාර්තාව.........................................................................

අනුකූලතා සහතිකය : ........................................................... මත්පැන් බදු බලපත්‍ර:.......................................................... පහත සඳහන් හේතුන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

............................................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය : ............................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

............................................................
ගණකාධිකාරී.

දිනය : ............................................................

අනුමත කරමි. / නොකරමි.

............................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ............................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ.................................................................................. ලදුපත් දිනය ඃ..................................................................................

බලපත්‍ර අංකය ඃ .................................................................................. බලපත්‍ර දිනය ඃ ..................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

..................................................................................

ආදයම් පරිපාලන නිලධාරි

දිනය ඃ ..........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

..................................................................................

ගණකාධිකාරි

දිනය ඃ ..........................................................

..................................................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය ඃ ..........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

---

**11 වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ පරිභෝජනයට අයෝග්‍ය ආහාර අත්පත් කර ගැනීම, තහනම් කිරීම, ඉවත් කිරීම, විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පරිභෝජනයට අයෝග්‍ය ආහාර අත්පත් කර ගැනීම,තහනම් කිරීම, ඉවත් කිරීම,විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. (අතුරු ව්‍යවස්ථාවේ නාමය)

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගරසභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. (අරමුණ)

3. මහා නගර සභා ආඥාපනතේ 267(1) වන වගන්තිය සමඟ කියවිය යුතු 272 (8) (ඇ), (ඉ) වන උපවගන්ති යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. (අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන)

ඉටු කළයුතු කාර්යයන්

4. කිරි පට්ටියක සේවයේ නියුක්ත කර ඇති සියලුම සංචාරක කිරි වෙළෙන්දෙකුට ම අදාල ආකෘති පත්‍රයකින් මුද්‍රිත කාඩ්පතකට අයදුම් කිරීම ද, අනුක්‍රමික අංක යෙදූ කාඩ්පත වාර්ෂිකව නාගරික කොමසාරිස්වරයාගෙන් ලබාගැනීම කිරි පට්ටිකරුගේ කාර්යය සහ වගකීම වන්නේය. මෙහි දී ඉහත කාඩ්පතෙහි කිරි වෙළෙන්දාගේ නම, ලිපිනය, විකුණුම් කරනු ලබන ස්ථාන යනාදිය සඳහන් කළයුතු අතර වෙළෙන්දාගේ ඡායාරූපයේ පිටපතක් අලවා තිබිය යුතු ය.

ඉටුනොකල යුතු කාර්යයන් (5 - 15)

5. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් පවත්නා වර්ෂය සඳහා ඔහුගේ නමට නිකුත් කරනු ලැබූ කාඩ්පතක් ඔහු ළඟ ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු කිරි විකිණීම, තැනින් තැනට ගෙනයාම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

6. කිරි විකුණුම් කරනු ලබන විටත්, හඬ නංවමින් විකුණුම් කරනු ලබන විටත් හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන විටත් කිරි පට්ටිකරුවෙක් යටතේ සේවයේ නියුක්ත තැනැත්තෙකු නම්,කිරි පට්ටිකරුගේ නම, තොරතුරු කාඩ්පතෙහි සඳහන් කර ඇත්තේ නම් මිස, කිරි විකිණීම, විකිණීමට ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

7. පහත උපලේඛනය 01හි දැක්වෙන කිරි සංයුතියෙන් නොමැති කිරි, කිරි ද්‍රව්‍යයන් කිසිවක් කවර හෝ තැනැත්තෙකු විකුණුම් කිරීම හෝ ඒ සඳහා ඉදිරිපත් කිරීම හෝ කටයුතු කිරීම හෝ නොකළ යුතු ය.

8. මනුෂ්‍ය පරිභෝජනයට අයෝග්‍ය කිසිම මස්, මාළු, සත්ව ආහාර, එළවළු, පළතුරු, වෙනත් ආහාර ද්‍රව්‍යයන් මහා නගර සභා බල ප්‍රදේශය තුළට රැගෙන ඒම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

9. ආහාර ද්‍රව්‍යයන් එකී තත්ත්වයෙන් ම විකිණීමෙහි අරමුණින් යම් කිසිවක් එකතු කිරීම, කලවම් කිරීම, එය වර්ණවත් කිරීම, සායම් පෙවීම හෝ පිටි බවට පත් කිරීම නැතහොත් එසේ කිරීමට නියම කිරීම හෝ ඉඩ හැරීම නොකළ යුතු ය.

10. කවර හෝ තැනැත්තෙකු විසින් කලවම් කරනු ලැබූ, වර්ණවත් කරනු ලැබූ, සායම් පොවන ලද, පිටි බවට පත් කරනු ලැබූ යම් ද්‍රව්‍යයක් විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

11. මනුෂ්‍ය පරිභෝජනයට අයෝග්‍ය හෝ කල්ගිය ටින් වල ඇසුරුම් කළ හෝ ලුණු දැමූ මස්, මාළු, වෙනත් ආහාර ද්‍රව්‍යයන් විකිණීම නොකළ යුතු ය.

12. කවර හෝ තැනැත්තෙකු විසින් යොදය ඉවත් කළකිරි, ඔහු විසින් එය විකුණන හෝ විකිණීමට ඉදිරිපත් කරනු ලබන තැනැත්තාට එහි යොදය ඉවත් කර ඇති බව කලින් දැනුම් දී ඇත්නම් මිස,විකිණීම හෝ විකිණීම සඳහා කටයුතු නොකළ යුතු ය.

13. කවර හෝ තැනැත්තෙකු විසින් යම් පිසින ලද ආහාරයක්, පිටි වලින් සෑදූ ආහාරයක්, පැණි රස කෑමක්, රස කැවිල්ලක් හෝ ශීත කළ හෝ වියලි පළතුරු වර්ගයක් එය දූවිල්ලෙන්, මැස්සන්ගෙන් හෝ දුර්ගන්ධයෙන් ආරක්ෂා කිරීමට සියළු සාධාරණ සර්වාරක්ෂක පියවර ගෙන ඇත්නම් මිස,මනුෂ්‍ය පරිභෝජනයේ අරමුණු පිණිස විකිණීම හෝ විකිණීම සඳහා කටයුතු නොකළ යුතු ය.

14. මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු නරක් වූ හෝ කලවම් කළ සම්පූර්ණ යොද සහිත කිරි කිසිවක් කවර හෝ තැනැත්තෙකු විසින් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළයුතු ය.

15. කවර හෝ තැනැත්තෙකුගෙන් ටින් වල ඇසුරුම් කළ හෝ ලුණු දැමූ මස්, මාළු, වෙනත් ආහාර ද්‍රව්‍යයන් මිළ ගෙවීම් කර ලබාගත් ලදුපත,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ මහා නගර සභාවෙන් බලයලත් කවර හෝ නිලධාරියෙකු විසින් ඉල්ලා සිටී අවස්ථාවක එකී ලදුපත ඉදිරිපත් කිරීමට විරුද්ධ විය නොවිය යුතු ය.

මහා නගර සභාවේ කාර්ය භාරය

16. ලියාපදිංචි කරන ලද කිරිපට්ටිකරුවෙක් යටතේ සේවයේ නියුක්ත කර ඇති සියළුම සේවකයින්ට ප්‍රමාණවත් අනුක්‍රමික අංක යෙදූ කාඩ්පත වාර්ෂිකව නිකුත් කිරීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේය. නිකුත් කරනු ලබන කාඩ්පතේ අලවන ලද ඡායාරූපයේ පිටපතක් මහා නගර සභා කාර්යාලයේ තිබිය යුතු ය. මහා නගර සභාවෙන් නිකුත් කරනු ලබන

කාඩ්පතේ කිරිපට්ටි හිමිකරුගේ නම, ලිපිනය, විකිණීම, ගෙනයාම, ප්‍රදර්ශනය කිරීම යනාදිය ඇතුළත් කළ යුතු ය.

17. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

18. බලපත්‍රලත් කිරිපට්ටි හිමිකරු හෝ කිරි විකුණන, විකිණුම් කිරීම සඳහා තැනින් තැනට ගෙනයන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන යම් තැනැත්තෙකු සන්තකයේ තිබෙන කිරි කිසිවකින් විශ්ලේෂණය කිරීමේ කාර්යය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ බලයලත් මහා නගර සභා කිසියම් නිලධාරියෙකු හෝ විසින් කවර හෝ වේලාවක සාම්පලයක් ලබාගත හැකි අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් ඇති කිරීමේ යම් ලියාපදිංචි කිරිපට්ටිකරුවෙකු හෝ වෙනත් තැනැත්තෙකු වරදකට වරදකරු වන්නේ ය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (18 - 20)

19. බලයලත් මහා නගර සභා යම් නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධරයෙකු විසින් හෝ සංචාරක කිරි වෙළෙන්දුන්ට වාර්ෂිකව නිකුත් කරනු ලබන හැඳුනුම්කාඩ්පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින විටක, එකී කාඩ්පත ඉදිරිපත් කිරීම එවැනි තැනැත්තෙකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ වරදට අත්අඩංගුවට ගන්නා අතර අප්‍රමාදව ඒ තැනැත්තා ළඟම ඇති පොලිසියට ගෙන යා යුතු ය. ඒ තැනැත්තා අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ වරෙන්තුවක් නොමැතිව පොලිස් නිලධරයෙකු විසින් අත්අඩංගුවට ගනු ලැබුවාක් සේ, ඒ පොලිස් ස්ථානභාර නිලධරයා ඒ තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ය. ඉහත කී කාඩ්පත අවලංගු කිරීම මහජන සෞඛ්‍ය පිණිස අවශ්‍ය යැයි නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පෙනී ගියහොත්, ඒ කවර අවස්ථාවක වුව ද එසේ අවලංගු කරනු ලැබිය හැකි ය.

20. (i) වාතික පාන (සිසිල් බීම) නිෂ්පාදනය හෝ විකිණීම සඳහා පාවිච්චි කරන කවර හෝ ස්ථානයකට, ඒ ස්ථානය විවෘතව පවත්නා කවර හෝ වේලාවක ඇතුළු වී එහි නිෂ්පාදනය කරන හෝ විකිණීම සඳහා තබා ඇති යම් වර්ගයක වාතික පාන (සිසිල් බීම) සාම්පල් බෝතලයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ බලයලත් මහා නගර සභා නිලධරයෙකු විසින් මිළ දී ගැනීම නීත්‍යානුකූල වන අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් ඇති නොකළ යුතු ය. ඒ සාම්පලය අප්‍රමාදව රජයේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර පාවිච්චියට අයෝග්‍ය යැයි රජයේ රස පරීක්ෂකවරයා විසින් නිකුත් කරනු ලබන සහතිකය මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බවට සාක්ෂියක් වන්නේ ය.

(ii) කිරි සාම්පල ගන්නා විට, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ බලයලත් මහා නගර සභා කිසියම් නිලධාරියෙකු හෝ විසින් සාම්පල 3ක් ලබාගත යුතු අතර ඒවා ලබාගනු ලැබූ ලියාපදිංචි කිරිපට්ටිකරුවෙකු හෝ වෙනත් තැනැත්තෙකු ඉදිරිපිට දී ඒවාට මුද්‍රා තබා, ඉන් එකක් එකී ලියාපදිංචි කිරිපට්ටිකරුවාට හෝ වෙනත් තැනැත්තාට භාර දී, දෙවැන්න නාගරික හෝ රජයේ රස පරීක්ෂකවරයාට ද, තුන්වැන්න මහා නගර සභා කාර්යාලයට ද යැවිය යුතු ය. එම සාම්පලය බාල කළ කිරි බවට ප්‍රකාශ වන එකී නාගරික හෝ රජයේ රස පරීක්ෂකවරයා විසින් අත්සන් තබන ලද සහතිකයක් ඒ සාම්පල ලබාගනු ලැබූ කිරි බාල කර තිබුණු බවට සාක්ෂියක් වන්නේ ය.

(iii) ටින් කළ හෝ ලුණු දැමූ මස් විකිණීම සඳහා තබා ඇති යම් සාප්පුවකට හෝ වෙනත් ස්ථානයකට ඒ සාප්පුව හෝ ඒ ස්ථානය විවෘතව පවත්නා කවර හෝ වේලාවක දී ඇතුළු වී, මනුෂ්‍ය ආහාරය සඳහා අයෝග්‍ය යැයි සාධාරණව සැක කරන ටින් කළ හෝ ලුණු දැමූ මස් කිසිවක්, අවස්ථාවෝචිත පරිදි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ පශු වෛද්‍යවරයා හෝ බලයලත් මහා නගර සභා නිලධාරියෙකු හෝ විසින් තහනමට ගනු ලැබිය යුතු අතර, ඒ ටින් කළ හෝ ලුණු දැමූ මස් ඔහු විසින් අප්‍රමාදව රජයේ රස පරීක්ෂකවරයා වෙත යවනු ලැබිය යුතු ය. එම ටින් කළ හෝ ලුණු දැමූ මස් මනුෂ්‍ය ආහාරය සඳහා අයෝග්‍ය බවට ඒ බලයලත් රජයේ රස පරීක්ෂකවරයෙකු සහතිකයෙන් ප්‍රකාශ වන්නේ නම්,

ප්‍රතිවිරුද්ධව ඔප්පු කරනු ලබන තෙක් ඒ සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂියක් වන්නේ ය. තව ද, ඒ ටින් කළ හෝ ලුණු දැමූ මස් තහනමට ගන්නා ලද්දේ යම් සාප්පුවකින් හෝ ස්ථානයකින් ද, ඒ ව්‍යාපාරික ස්ථානයේ අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා ඉහත සඳහන් පරිදි ප්‍රතිවිරුද්ධව ඔප්පු කරනු ලැබුවහොත් මිස, වරදකට වරදකරු වන්නේ ය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

21. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

22. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක්වන්නේය.

දඩ හා දණ්ඩන

23. (i) ඉහත අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානයන් ප්‍රකාරව යම්කිරි සාම්පලයක් බාල කර ඇති බව ඔප්පු වුවහොත්, එය ගන්නා ලද්දේ යම් තැනැත්තෙකුගේ සන්තකයෙන් ද, ඒ තැනැත්තා වරදකරු වන්නේ ය. ඒ තැනැත්තා යම් කිරි පට්ටිකරුවෙකුගේ කිරිවිකුණන්නෙකු හෝ කිරිපට්ටි හිමිකරුවෙකු යටතේ සේවයේ නියුක්ත තැනැත්තෙකු හෝ කිරි පට්ටිකරුවෙකු වශයෙන් ක්‍රියා කරන්නෙකු හෝ නම් ඒ තැනැත්තා සහ කිරිපට්ටිකරු යන දෙදෙනාම වරදකට වරදකරු වන්නේ ය.

(ii) බලයලත් මහා නගර සභා නිලධාරියෙකු විසින් මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය මස්, මාළු, සත්ව ආහාර, එළවළු, පළතුරු, වෙනත් ආහාර ද්‍රව්‍යයන් තහනමට ගනු ලබන අවස්ථාවේ දී, ඒවා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත හෝ පශු වෛද්‍යවරයා වෙත හෝ එකී නිලධාරීන් නොමැති විට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත වූ අධිකරණ මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ගෙන යාම නීත්‍යානුකුල වන අතර මස්, කුකුළු, මාළු, සත්ව ආහාර, එළවළු, පළතුරු, වෙනත් ආහාර ද්‍රව්‍යයන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා අයෝග්‍ය බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට හෝ පශු වෛද්‍යවරයාට හෝ මහේස්ත්‍රාත්වරයාට පෙනී ගියහොත්, ඒවා විනාශ කිරීමට හෝ ආහාරයක් වශයෙන් පාවිච්චි කිරීම තහනම් කරනු ලබන ආකාරයෙන් ඉවත් කරන මෙන් ඔහු විසින් නියෝග කිරීමට හැකි ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල-

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා

නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය'' යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පොලිස් අධිකාරී'' යන්නෙන්, තත්කාර්යය සඳහා මූලස්ථාන පොලිස් ස්ථානාධිපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ පොලිස් ස්ථානයේ යම් නිලධාරියෙකු ද අදහස් වේ.

''සිසිල් බීම(වාතික පාන)'' යන්නෙන් පළතුරු, එසන්ස්, සිරප් යන සියල්ලම හෝ එක් වර්ගයක් උපයෝගී කරගෙන නිෂ්පාදනය කරනු ලබන හා බෝතල්වල හෝ වෙනත් යම්ආකාරයක ඇසුරුමක අසුරනු ලබන බීම වර්ග අදහස් වන අතර සෝඩා බීම ද ඊට ඇතුළත් විය යුතු ය.

*උපලේඛන 01 - කිරි වල සංයුතිය*

| | *I වන තීරය කිරි වර්ගය* | *II වන තීරය කිරි වල නාමය* | *III වන තීරය ක්ෂීර මේදය අවම ප්‍රතිශතය* | *IV වන තීරය ෂීර මේදය හැර ක්ෂීර සණද්‍රව්‍ය අවම ප්‍රතිශතය* |
|---|---|---|---|---|
| 1. | මීකිරි | සකස් නොකළ පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 7.0 | 9.0 |
| 2. | එළකිරි | - එම - | 3.5 | 8.5 |
| 3. | ප්‍රමිත කළ | පැස්ටරි කෘත හෝ ජීවාණු හෘත. | 3.25 | 8.25 |
| 4. | සකස් කළ | - එම - | 2.0 | 8.5 |
| 5. | රස කළ | - එම - | 2.0 | 7.2 |
| 6. | යොදය රහිත හෝ මේදය රහිත | - එම - | – | 8.5 |

### *III වන කොටස - මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර විධිමත් කිරීම, නියාමනය කිරීම,අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර නියාමනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

අරමුණ

2. මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥා පනතේ 147, 148, 267(1) යන වගන්තින් සමඟ කියවිය යුතු 272(15)වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන් (4 - 15)

4. ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂික බලපත්‍රයක් ලබාගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය සහ වගකීම වන්නේය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර යනාදියට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(i) බලපත්‍රලත් ස්ථානය පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ii) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(iii) ඉහත බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ හුණු ගලෙන් නැතහොත් අනුමතික වෙනත් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර නැතහොත් මතුපිට කොටස සිමෙන්තියෙන් ඔපදමා, තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල(සීලිමක්) සවිකර තිබිය යුතු අතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(v) එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය. කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර සණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක් වත් තිබිය යුතු ය.

(vii) එක් එක් කාමරයකම බිම් කොටස,සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් (බිම්ගඩොල්) අල්ලා තිබිය යුතු ය.

(viii) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මැස්සන්, කෘමීන් හෝ වෙනත් සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(ix) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා මේ කොටසේ 8 වන අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතුය.

(x) බලපත්‍රලත් ස්ථානයෙන් කවර හෝ කොටසකින් පාවිච්චියෙන් අනතුරුව බැහැර කරන අප ජලය බාධකයක් නොමැතිව ගලායාමට සුදුසු ජලාපවහන පද්ධතියක් ඇති කර තිබිය යුතුය.

(xi) මහා නගර සභාව විසින් අප ජලය ජලාපවහන පද්ධතියක් පවත්වා ගෙනයනු ලබන්නේ නම්,බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහා නගර සභාවේ උපදේශයට අනුව අපජලය ජලාපවහන පද්ධතියට ගලායාමට සැලැස්විය හැකි ය. එසේ නොවන අවස්ථාවන්හි දී, එකී අපජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතුය. නැතහොත් ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාමය මගින් පිරිසිදුකර, පොදු ජලාපවහන පද්ධතියට ගලායාම කර තිබිය යුතුය. තවද, එකී අපජලය උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් වසා තැබිය යුතුඅතර ළඟින් තැනූ ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් මෙය තනා තිබිය යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතුයැයි මේ කොටසේ5 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසකට ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළයුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළමේ කොටසේ9 වන අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු ය. එකී කසළ අවම වශයෙන් දිනකට එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කළයුතු අතර එකී භාජන වලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේදී හැර, අන් සියළු වේලාවන්හි දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

9. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්,එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවහායන අපද්‍රව්‍යය ;
(ආ) වීදුරු ;
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍යය ;
(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍යය ;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍යය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍ය වලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(උ) අන්තරායකර අපද්‍රව්‍යය ;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍යය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස,නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

10. එක් එක් බලපත්‍රධාරියෙකුම, කර්මාන්තය කරගෙන යාම සඳහා අවශ්‍ය වන සියලු ද්‍රව්‍යයන් දුගඳ හැමීමෙන් හෝ වෙනත් පීඩාවන් ඇතිවීමෙන් වැළැක්විය හැකි ආකාරයෙන් ගබඩාකර තැබිය යුතු ය.

11. එක් එක් බලපත්‍රධාරියෙකුම, පීඩාවන් ඇති කිරීමට හෝ දුගඳහැමීමට ඉඩ ඇති ද්‍රව්‍යයන්, පොදු ස්ථානයක හෝ මංමාවතක් ඔස්සේ රැගෙනයාමේ දී කිසිදු පීඩාවක් ඇතිවීම වැළැක්විය හැකි ආකාරයෙන් ආවරණය කරන ලද අපාරගම්‍ය භාජනවල දමා රැගෙන යායුතු ය.

12. එක් එක් බලපත්‍රධාරියෙකුම,යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියක දී විමෝචනය වන පීඩාකාරී වාෂ්ප හෝ වායු, ඒවා විහිදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයෙන් හා උස්ව වායුගෝලයට මුදා හැරීම කළ යුතු ය. නැතහොත් ගින්දර හෝ ඝණීකරණ උපකරණයක් තුලින් පිටවීමට සැලැස්විය යුතු ය.

13. එක් එක් බලපත්‍රධාරියෙකුම, තම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි බිත්ති, අපවිත්‍ර ජලය වැනි දෑ උරා ගැනීමෙන් ආරක්ෂාවන පරිදි යහපත් තත්වයකින් තබා ගත යුතු ය.

14. එක් එක් බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතු වලදී භාවිතාකරනු ලබන උපකරණ හා භාජන ඇතුළු උපාංග පිරිසිදුව තැබිය යුතුඅතර, දිනපතා පිරිසිදු කළ යුතු ය.

15. එක් එක් බලපත්‍රධාරියෙකුම, හම් හෝ වෙනත් ද්‍රව්‍යයන් සේදීම හෝ පෙගවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතු ය.

ඉටු නොකල යුතු කාර්යයන් (16 - 18)

16. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රය මගින් ඉල්ලුම් කරනු ලබන ඉල්ලීම මත තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළපීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර පවත්වාගෙන යාම නොකළ යුතු ය.

17. බලපත්‍රලාභියා හෝ වෙනත් තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානය දිවා හෝ රාත්‍රී කාලයෙහි නිදාගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම නොකළ යුතු ය.

18. බලපත්‍රලත් එක් එක් තැනැත්තෙකු ම, කවර හෝ ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක්, මුහුදක් හෝ යම්විවෘත ජල ප්‍රදේශයක් තුළට යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ වෙනත් ආකාරයකින් ඉහත සඳහන් ස්ථාන අපවිත්‍ර කිරීම නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්යභාරය (19 - 21)

19. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන සථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

20. මහා නගර සභාව විසින් නිශ්වය කරන ලද පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායකර ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිවෙලින් අංක I, II සහ III දරන උපලේඛනයන්හි ඇතුළත් කර්මාන්ත වලට බලපත්‍ර නිකුත් කිරීම, ඉල්ලුම්කරුට දන්වා යැවීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේය.

21. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ යම්කිසි ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිනිස යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින තිහක් (30)ඇතුළත අදාල පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම්,බලපත්‍ර නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම කරන්නේ නම් හේතු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම්කරුට දන්වා යැවීම නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

22. කිසියම් පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර පවත්වා ගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2)වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය. අයකිරීම් හා ගාස්තු

23. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. බලය පැවරීම

24. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුව හොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය. බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

25. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන්,නිසි කාලය තුළබලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය. පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (25 - 27)

26. මේ කොටසේ 19 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

27. මේ කොටසේ 26 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය. පැමිණිලි හා පිළියම් යාන්ත්‍රණය

28. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

29. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය. අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

30. (i) මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් දඩ හා දණ්ඩන

අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

(ii) මහා නගර සභා ආඥා පනතේ 147(3) වන වගන්තිය ප්‍රකාරව, බලපත්‍රයක් නොමැතිව මහා නගර සභා බල ප්‍රදේශය තුළපහත උපලේඛන අංක I, II, III න් දැක්වෙන කර්මාන්තයක් පවත්වාගෙන යන වරදකට,වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහක් නොඉක්මවන දඩයටකට ඔහු යටත් විය යුතු අතර අධිකරණ තීන්දුවෙන් පසුත්,ඒ වරද කරගෙන යන එක් එක් දවස සඳහා රුපියල් පන්සීයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''නගරාධිපතිවරයා"යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලද යැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු හෝ නිෂ්පාදන කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්,මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්,මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

*උපලේඛනය - I*

**පීඩාකාරී ව්‍යාපාර**

01. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම.
02. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම.
03. සම් පදම් කිරීම.
04. සම් විකිණීමට තබා ගැනීම.
05. සත්ව පාලන (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම.
06. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50ට වඩා ගබඩා කිරීම.

07. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී (Sheet) තබා ගැනීම.
08. පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම.
09. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම.
10. කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.
11. මාළු හෝ මස් ජාඩි දැමීම, හෝ වේලීම හෝ අයිස් දැමීම.
12. පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම.
13. දුම්කොළ වියලීම.
14. සත්ව ආහාර නිපදවීම.
15. පුන්නක්කු නිපදවීම.
16. සත්ව මාංශ හෝ ලේ පැසවීම.
17. සබන් නිෂ්පාදනය.
18. සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.
19. ට්‍රන්ක් පෙට්ටි සෑදීම.
20. අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම.
21. ලෝහ සුන්බුන් තබා ගැනීම.
22. ගෘහ භාණ්ඩ නිපදවීම.
23. වේවැල් භාණ්ඩ නිපදවීම.
24. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
25. සිරප් හෝ පළතුරු බීම නිපදවීම.
26. රස කැවිලි නිපදවීම.
27. පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම).
28. බුරුසු වර්ග නිපදවීම. (දත්බුරුසු හැර)
29. දත් බුරුසු නිපදවීම.
30. රා එකතු කිරීම.
31. විනාකිරි නිපදවීම.
32. දැව ඉරීම.
33. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම.
34. සෝඩා නිපදවීම.
35. කෙඳි සායම් කිරීම.
36. සම් භාණ්ඩ නිපදවීම.
37. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම.
38. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම.
39. බේකින් පවුඩර් නිපදවීම.
40. ගෑස් මැන්ටල් නිපදවීම.
41. ලී භාණ්ඩ සඳහා වූ පොටි නිපදවීම.
42. ඉටි පන්දම් නිපදවීම.
43. කපුරු නිපදවීම.
44. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
45. රෙදි සෝදන නිල් නිපදවීම.
46. ලාකඩ නිපදවීම.
47. සුවඳ විලවුන් නිපදවීම.
48. පාසල් රටහුණු නිපදවීම.
49. ටයර් හෝ ටියුබ් නිපදවීම.
50. ටයර් නැවත පිරවීම.
51. ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම.
52. සිමෙන්ති නිපදවීම.
53. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
54. වැලි කඩදාසි නිපදවීම.
55. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
56. ගඩොල් පිළිස්සීම.
57. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.

58. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම.
59. උළු නිෂ්පාදනය.
60. පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.
61. යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම.
62. නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම.
63. කුකුළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම.
64. විෂබීජ නාශක නිපදවීම.
65. ටයර්/ටියුබ්/අළුත්වැඩියා කිරීම.
66. සපත්තු/බෑග්/සම්/භාණ්ඩ නිෂ්පාදනය.
67. සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම.

*උපලේඛනය - II*

**අන්තරාදායක ව්‍යාපාර**

01. කළු ගල් තැනීම හෝ කැඩීම.
02. සිසිල් බීම නිෂ්පාදනය.
03. අයිස් නිෂ්පාදනය.
04. එළවළු තෙල් නිෂ්පාදනය.
05. පොල් තෙල් නිෂ්පාදනය.
06. ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
07. මෙතිලේට් ස්ප්‍රීත්තු නිෂ්පාදනය.
08. තේ පෙට්ටි නිෂ්පාදනය.
09. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය.
10. කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ.
11. පිදුරු තබා ගැනීම.
12. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියාව.
14. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
15. හිරිගල් හෝ හුණු ගල් කැණීම.
16. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම.
17. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම.
18. පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම.
19. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම.
20. විසිතුරු පින්තාරු කිරීම.
21. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම.
22. ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම).
23. වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම.
24. බැටරි පිරවීම, නිපදවීම, අළුත්වැඩියාව.
25. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
26. පුපුරන ද්‍රව්‍යයන්, පුපුරන බෙහෙත් ගබඩා කිරීම.
27. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.

*උපලේඛනය - III*

**පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර**

01. තලාතු මිනිරන් ශුද්ධ කිරීම.
02. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
03. ඩ්‍රයික්ලීන් කිරීම.
04. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම.

05. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම.
06. තෙල් හෝ සත්ව මේද නිපදවීම.
07. හුණුගල් හෝ හිරිගල් නිපදවීම.
08. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම.
09. මෝර තෙල් සකස් කිරීම.
10. බෝට්ටු තැනීම.
11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
12. ලෝහ වර්ග පෑස්සීම.
13. මෝටර් වාහන අළුත්වැඩියාව.
14. මෝටර් වාහන සේවා කිරීම.
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
17. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
18. මෝටර් වාහන බොඩි තැනීම.
19. කෘමි නාශක, දිලීර නාශක, පැළෑටි හෝ පළිබෝධ නාශක නිපදවීම.
20. විෂබීජ නාශක නිපදවීම.
21. මදුරු දඟර නිපදවීම.
22. දැව ආරක්ෂණ තෙල් නිපදවීම.
23. ගල් තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම.
24. වීදුරු භාණ්ඩ නිපදවීම.
25. කැඩපත් වීදුරු නිපදවීම.
26. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.
27. පාස්සන ඊයම් නිපදවීම.
28. ඇලුමිණියම් භාණ්ඩ නිපදවීම.
29. කටු කම්බි නිපදවීම.
30. කම්බි ඇණ නිපදවීම.
31. කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
32. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම.
33. ජී. අයි. බාල්දි නිපදවීම.
34. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම.
35. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අළුත්වැඩියා කිරීම.
36. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම.
37. යන්ත්‍රෝපකරණ නිපදවීම.
38. විදුලි භාණ්ඩ නිපදවීම.
39. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම.
40. සංචායන බැටරි නිපදවීම.
41. ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.
42. රේඩියේටර් නිපදවීම.
43. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම.
44. වියළි කෝෂ බැටරි නිපදවීම.
45. වී මෝල්.
46. මිනී පෙට්ටි තැනීම.
47. දුරකථන නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම.
48. විද්‍යුත් උපකරණ අළුත්වැඩියාව හෝ එකලස් කිරීම.
49. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව.
50. අවමංගල්‍ය සේවා මධ්‍යස්ථානය (මල් ශාලාව) පවත්වා ගෙන යාම.

ඇමුණුම. 01

**මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, පීඩාකාරී හා අන්තරාදායකර ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරික බදු /වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20 ....................................වර්ෂය**

1. ව්‍යාපාරික ස්ථානයේ නමඃ ..............................................................................................

2. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ස්ථානයඃ

(i) කොට්ඨාශයඃ .....................................................

(ii) වීථියේ/ පාරේ නම ඃ ........................................................................

(iii) ග්‍රාම නිලධාරීඃ- කොට්ඨාශඅංකය . ඃ ........................................................................
කොට්ඨාශයේ නම ඃ ........................................................................

3. අයදුම්කරුගේ ඃ

(i) සම්පූර්ණ නම ඃ ........................................................................

(ii) ස්ථිර ලිපිනය ඃ ........................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය ඃ ........................................................................

(iv) ජාතික හැඳුනුම්පතේ අංකය ඃ ........................................................................

(v) දුරකථන අංකය ඃ........................................................................

(vi) විද්‍යුත් තැපැල් ලිපිනය ඃ........................................................................

4. (i) ව්‍යාපාරය ආරම්භ කළ දිනය ඃ........................................................................

(ii) ව්‍යාපාරයේ ස්වභාවය ඃ........................................................................

(iii) කර්මාන්තය/ව්‍යාපාරික ස්ථානයේ කළමනාකරුගේ/නියෝජිතයාගේ ඃ

(a) නමඃ.......................................

(b) දුරකථන අංකයඃ.......................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් ඃ

(i) අයිතිකරුගේ නම ඃ ........................................................................

(ii) ලිපිනය ඃ ........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබාගෙන තිබේද? ඔව් ............................... නැත ...............................
ඔව් නම් ඃ බලපත්‍රය අංකය ඃ ...................................... දිනය ඃ ................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. කර්මාන්තය/වෙළෙඳම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 ............................................... වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

........................................................................
අයදුම්කරුගේ අත්සන

දිනය ඃ ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

............................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයඃ........................................................................ වරිපනම් අංකයඃ...............................................................................................

වීථියේ/පාරේ නම :...........................................................................
අයිතිකරුගේ නම :...........................................................................
දේපලෙහි ස්වභාවය :...........................................................................
වාර්ෂික වටිනාකමඃ...........................................................................
හිඟ වරිපනම් මුදලඃ........................................................................... ඇතඃ.............................. නැතඃ..............................

...........................................................................
පරිපාලන නිලධාරි.

දිනය : ........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවයඃ...........................................................................
ගෙවිය යුතු ගාස්තුවඃ...........................................................................
ඒකකය A B C :...........................................................................
සටහන් :...........................................................................

...........................................................................
ආදයම් පරීක්ෂක.

දිනය : ........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :
..................................................................................................................................................................
..................................................................................................................................................................
..................................................................................................................................................................
..................................................................................................................................................................

...........................................................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : ........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

.........................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : .........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ..........................................................ව්‍යාපාරයේ ස්වභාවය:..........................................................................................

පාරිසරික බලපත්‍ර:.......................................................... MOH වාර්තාව..........................................................................................

අනුකූලතා සහතිකය : .......................................................... මත්පැන් බදු බලපත්‍ර:..........................................................................

පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

..........................................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ..........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.................................................................
ගණකාධිකාරී.

දිනය : ..........................................................

අනුමත කරමි. / නොකරමි.

..............................................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ..........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකයඃ.................................................................................... ලදුපත් දිනය ඃ....................................................................................

බලපත්‍ර අංකය ඃ .................................................................................... බලපත්‍ර දිනය ඃ ....................................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

..........................................................................

ආදයම් පරිපාලන නිලධාරි

දිනය ඃ ...........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

..........................................................................

ගණකාධිකාරි

දිනය ඃ ...........................................................

(බලපත්‍රය අත්සන් කරන ලදී.)

..........................................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය ඃ ...........................................................

***IV* වන කොටස - මහා නගරසභා බල ප්‍රදේශය තුළ ඝාතනාගාර විධිමත් කිරීම, නියාමනය කිරීම,අධීක්ෂණය කිරීම හා පාලනය කිරීමපිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.**

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඝාතනාගාර පවත්වාගෙනයාම නියාමනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. අතුරු ව්‍යවස්ථාවේ නාමය

2. මහා නගරසභාආඥා පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඝාතනාගාරයේ පිරිසිදුභාවය හා සෞඛ්‍ය ආරක්ෂා කිරීම හා එහි වාසය කරන මහජනයාට යෝග්‍ය ආහාර ද්‍රව්‍යයන් ලබාදීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අරමුණ

3. මහා නගර සභා ආඥාපනතේ 145 වන වගන්තියට අනුව හා 267(1)වන වගන්තිය සමඟ කියවිය යුතු 272(9)වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව ද, ගෝ ඝාතක ආඥා පනතේ iii වන අධිකාරයට අනුව ද මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන් (4 - 30)

4. ප්‍රසිද්ධ එක් එක් ඝාතනාගාරයක් ම, නිසි බලධාරියා විසින් තත් කාර්යය සඳහා පත් කරන ලද නිලධාරියෙකුගේ අධිකාරීත්වය යටතේ තිබිය යුතු ය. මොහුව ඝාතනාගාර අධීක්ෂකයා යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

5. නගරාධිපතිවරයාහෝ නාගරික කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි එකී වේලාවන් තුළ පමණක්, බලපත්‍රලත් ඝාතකයන්ට හෝ විශේෂ අවසරපතලත් තැනැත්තාට සතුන් ඝාතනය කිරීමට අනුමත කිරීම කළ යුතු ය.

6. බලපත්‍රලත් ඝාතකයෙකු හෝ විශේෂ අවසරපත්‍රලත් තැනැත්තෙකු,ඝාතනාගාර අධීක්ෂකයා විසින් ඔහුට ඝාතනාගාරය ඇතුළත නිශ්චිතව වෙන්කර දෙනු ලැබූ එකී ස්ථාන වල දී පමණක්, සතුන් ඝාතනය කළ යුතු ය.

7. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කළ ආකෘතියෙහි නිසියාකාරව මුද්‍රිත සම්පූර්ණ කරන ලද අවසරපත්‍රයක් බලපත්‍රලත් ඝාතකයාට නිකුත් කරනු ලැබ ඇත්නම් මිස, කවර හෝ සතෙකු ඝාතනය නොකළ යුතු ය. ඉහත මුද්‍රිත අවසර පත්‍රය නිකුත් කිරීමට ප්‍රථම, පශු වෛද්‍යවරයා හෝ නිසි නිලධාරියා විසින් නිසියාකාරයෙන් සම්පූර්ණ කිරීමත්, ඔහු විසිනුත්, එය නිකුත් කරනු ලැබූ ඝාතකයා විසිනුත් අත්සන් කළ යුතු අතර නිකුත් කරනු ලබන දිනය ද සඳහන් විය යුතු ය.

8. ගෝ ඝාතක ආඥා පනතට අනුව ඝාතනාගාර ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

9. මේ කොටසේ 38 වනඅතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ඝාතනය කිරීමට ඇති සතුන්ව ඝාතනාගාර පරිශ්‍රය තුළට අනුමත කිරීමට පෙර නියමිත සහතික ඝාතනාගාර අධීක්ෂකයාට පෙන්විය යුතු ය.

10. ඝාතනය කිරීමට පෙර ප්‍රසිද්ධ ඝාතනාගාර පරිශ්‍රයේ ප්‍රදර්ශනය කොට සිටිය දී, යම් සතෙක්ව, යම් තැනැත්තෙකු හිමිකම් පානු ලැබුවහොත්, එකී සතා වෙනුවෙන් අයවිය යුතු ගාස්තු වහාම ගෙවීම් කිරීමටත්, එකී සතා ඝාතනාගාරයෙන් ඉවත් කර ගැනීමටත් නියම කළ යුතු ය.

11. ඝාතනාගාරයට ගෙන එනු ලබන හෝ එහි රඳවා තබන සියළු සතුන් පැනයාම වැළැක්වීම පිණිස කඹ වලින් නිසි පරිදි බැඳ තැබිය යුතු ය.

12. එක් එක් බලපත්‍රලත් ඝාතකයෙකු ම, තමාගේ බලපත්‍රයේ සහ ඝාතනාගාරයේ තමා සේවයේ නියුක්ත කරවන එක් එක් සේවකයෙකුගේ ම ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත් ලබාගත් වහාම ඝාතනාගාරයේ අධීක්ෂකයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

13. ඝාතනය කරන ලද සම්, බඩවැල් සහ ඉවත දමන කොටස් ඉවත් කිරීමට පෙර, සෝදා පිරිසිදු කිරීමට ඒ සඳහා වෙන්කර ඇති ස්ථානවලින් ඝාතක විසින් හෝ ඔහුගේ සේවා නියුක්තකයන් විසින් එකතු කළ යුතු ය.

14. බලපත්‍රලත් ඝාතකයෙකු හෝ ඔහුගේ ලියාපදිංචි කළ සේවකයන් විසින් ඝාතනාගාරය පාවිච්චිකරන විට දී, බලපත්‍රලත් ඝාතකයාගේ ස්වකීය ක්‍රියාවෙන් නැතහොත් ඔහුගේ සේවකයන්ගෙන් කිසිවෙකුගේ ක්‍රියාවක් හේතුවෙන් ඝාතනාගාරයට සිදු වූ යම් අලාභ හානියකට නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සුදුසු යැයි අදහස් කරන මුදල් ප්‍රමාණයක් ඉල්ලා සිටි විට, එකී මුදල ගෙවීමට ඝාතකයා බැඳී සිටිය යුතු ය. එසේ මුදල් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, නාගරික කොමසාරිස්වරයා විසින් එක්කෝ ඔහුගේ බලපත්‍රය අවලංගු කිරීම හෝ බලපත්‍රලත් ඝාතකයාගෙන් හෝ ඔහුගේ ඇපකරුවන්ගෙන් අයකිරීම හෝ ඒ දෙදෙනාගෙන්ම එකී අලාභහානි මුදල අයකිරීමට කැමැත්ත ප්‍රකාශ කරන්නන් විය යුතු ය.

15. ඝාතනාගාරයේ සිට මස් ප්‍රවාහනය කිරීමට අතුරු ව්‍යවස්ථාවෙන් නියම කර ලැබ ඇති ඝාතකයන්ගේ සහ සෙසු අයගේ මෝටර් වාහන ඝාතනාගාර පරිශ්‍රයට ඇතුල් වන සෑම විටකම පරීක්ෂාව පිණිස ඝාතනාගාර අධීක්ෂකයා හමුවේ පෙන්විය යුතු ය. අදාල අධීක්ෂකයා තෘප්තිමත් වන ආකාරයෙන් එකී වාහන පිරිසිදුව, සේවයට සුදුසු ආකාරයෙන් ඇත්නම් මිස, ඝාතනාගාරයෙන් මස් ප්‍රවාහනය කිරීමට

අනුමත නොකළ යුතු ය.

16. පහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අයකළ යුතු ගාස්තු යෝජනා සම්මතයෙන් කලින් කල සභාවෙන් නිර්දේශ කළ යුතු ය. - එක් එළුවෙක් / එක් ගවයෙක්

(i) පහත සඳහන් සතුන් සඳහා ඝාතනාගාර පාවිච්චිකිරීම:-
 (අ) ගවයන් (මී හරක් හැර)
 (ආ) ඌරන්
 (ඇ) එළුවන්

(ii) පහත සඳහන් සතුන්ට කෑම දීම:- (පැය විසි හතරක කාලයක් හෝ ඉන් කවර හෝ කොටසක කාලසීමාවේ සෑම එකක් පිණිස)
 (අ) එළුවන්, ගවයන්
 (ආ) ඌරන්

(iii) මඩුව පාවිච්චි කිරීම:-
 (අ) එළුවන්, ගවයන්

17. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කරන ලද ශබ්ද විකාශන ප්‍රචාරය මගින් දවස් දෙකක දැනුම් දීමෙන් පසුව, ඒ මත අයවිය යුතු ගාස්තු ගෙවීම පැහැර හැරීමේ වරදට, ඝාතනාගාරයේ රඳවා ගන්නා ලද කවර හෝ සතෙකු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට හැකි ය. එකී සතා වෙනුවෙන් අයවිය යුතු යම් ගාස්තුවක් සහ දරන ලද යම් වියදමක් විකිණීමෙන් ලැබෙන මුදලින් රඳවා ගැනීමත්, ඉතිරි මුදලක් වෙතොත් එය ඉල්ලීමක් මත ඝාතනය කිරීමට එකී සතාව ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

18. ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන සතුන් ඝාතනාගාරයට ගෙන එන ලැබූ විට, ඔවුන් භාරගෙන නගරාධිපතිවරයාහෝ නාගරික කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලබන එකී ස්ථානයට හෝ ස්ථානවලට නාගරික කොමසාරිස්වරයා සුදුසු යැයි අදහස් කරන ආකාරයට එහි දී විනාශ කිරීමට හෝ අන් ආකාරයකින් කටයුතු කර විසදාලීමට ගෙන යනු ලැබිය යුතු ය.

19. ඝාතනය කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ තහනම් කරනු ලැබූ යම් සතෙකු එකී ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ තහනම් කිරීමෙන් පසුව පැය දොළහක් ඇතුළත ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තා එකී සතාව ඝාතනාගාර පරිශ්‍රයෙන් ඉවත් කිරීම පැහැර හැරියහොත්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කරන ලද ශබ්ද විකාශන ප්‍රචාරය මගින් දවස් දෙකක දැනුම් දීමෙන් පසුව එකී සතාව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැළැස්විය හැකි අතර එකී සතා වෙනුවෙන් අයවිය යුතු යම් ගාස්තුවක් සහ දරන ලද යම් වියදමක් විකිණීමෙන් ලැබෙන මුදලින් රඳවා ගැනීමත්, ඉතිරි මුදලක් වෙතොත් එය ඉල්ලීමක් මත ඝාතනය පිණිස එකී සතාව ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය.

20. මේ කොටසේ 41 වනඅතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව එකී මස්, හම්, බඩවැල් හෝ අවමස් ඉවත් කරගෙන යන යම් තැනැත්තෙකු, මහා නගර සභාවේ යම් නිලධාරියෙකුගේ හෝ පොලිස් නිලධාරියෙකුගේ ඉල්ලීම මත පරීක්ෂාව පිණිස එකී අවසර පත්‍රය හෝ අවසරපත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එකී තැනැත්තා විසින් එසේ ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලැබුවහොත්, එකී මස්, සම්, බඩවැල් හෝ අවමස් ආදිය තහනමට ගෙන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් විධාන කරන ආකාරයට අයිතිකරුට වන්දි ගෙවීමකින් තොරව බැහැර කිරීම සඳහා මහා නගර සභා කාර්යාලයට හෝ පොලිස් ස්ථානයට ගෙන යනු ලැබීමට යටත් විය යුතු ය.

21. මේ කොටසේ 44 වනඅතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව(473 වැනි අධිකාරය වන) එළුවන්, ගවයන් හංවඩු ගැසීම, විකිණීම සහ පැවරීම පිළිබඳ ආඥා පනතේ උපලේඛනයේ 'අ' ආකෘතියට හා සමානව විස්තර ඇතුළත් සතා සම්බන්ධයෙන් වූ තොරතුරු එවැනි විශේෂ බලපත්‍රයක් සඳහා වූ අයදුම් පත්‍රයකින් විය යුතු ය. සතා ඉල්ලුම්කරුට අයත් බවට සහතික කරවීම සඳහා ඉල්ලුම්කරුගේ ප්‍රදේශයේ පොලිස් නිලධරයෙකුගේ හෝ මහා නගර සභා නිලධරයෙකුගේ හෝ ග්‍රාම සේවා නිලධරයාගේ හෝ වාර්තාවක් ඒ සමඟ විය යුතු ය.

මෙම විශේෂ බලපත්‍රය සඳහා සභාව විසින් කලින් කලට තීරණය කරන ලද යම් මුදලක් අයකළ යුතු ය.

22. එක් එක් ඝාතනාගාරයක් ම නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වේලාවන්හි,දෛනිකව අවම වශයෙන් දෙවරක්වත් මුළුමනින් සෝදා අතු ගෑම කළ යුතු ය.

23. එක් එක් ඝාතනාගාරයක ම ඇතුලේ සහ පිටත අවම වශයෙන් සෑම තුන් මසකට එක් වරක්වත් හුණු පිරියම් කළ යුතු ය. නැතහොත් තීන්ත ආලේප කළ යුතු ය.

24. එක් එක් ඝාතනාගරයක ම බිම් කොටසේ, කළුගල් හෝ පැතලි බිම් ගඩොල් නැතහොත් උළු හෝ කොන්ක්‍රීට් හෝ ගල් තාර හෝ යොදා ඇති ස්ථාන වලින් ඇතිවන කැඩීම්, අවම වශයෙන් අවුරුද්දකට එක් වරක්වත් බදාම යොදා අළුතින් සකස් කළ යුතු ය.

25. ඉහත කී පරිදි අනුමත කරන යම් සතෙකු ඝාතනය කිරීමෙන් පසුව එම සතාගේ මළකඳ රෝගයකට පාත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය ආහාරය සඳහා යෝග්‍ය නොවන බවට අදාල අධීක්ෂකයාට පෙනී ගියහොත්, වහාම එකී මස් එහිදීම විනාශ කිරීමට නැතහොත් එය විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ මනුෂ්‍ය ආහාරයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වනු පිණිස නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් අන් ආකාරයකින් බැහැර කිරීමට කටයුතු කර විසඳාලීමට ඉඩ සැලැස්විය යුතුය. එකී මස මනුෂ්‍ය ආහාරයට යෝග්‍ය නොවන බව ප්‍රතික්ෂේප කිරීමෙන් අදාල අධීක්ෂකයා හෝ වෙනත් බලයලත් නිලධාරීයෙකු, තමා සමඟ පශු වෛද්‍යවරයාව හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාව සතනාගාරයට වහාම පැමිණෙන මෙනුත්, එහිදී අදාල මස පරීක්‍ෂා කරන මෙනුත් ඉල්ලීමක් කළ යුතු ය. අදාල මස මනුෂ්‍ය ආහාරයට යෝග්‍ය නොවේ යැයි අදාල පශු වෛද්‍යවරයා හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් තීරණය කළහොත් (මෙම කාර්යයෙහි දී මොවුන්ගේ තීරණය අවසාන තීරණය විය යුතු ය.) අදාල අධීක්ෂකයාට හෝ වෙනත් බලයලත් නිලධාරියෙකුට මෙම අතුරු ව්‍යවස්ථාවේ මෙයට අනුකූලව කලින් නියම කළ ආකාරයෙන් එකී මස ඉන්පසුව ද විනාශ කිරීම හෝ අන් ආකාරයකින් කටයුතු කරමින් විසඳාලීම නීත්‍යානුකූල වන්නේ ය.

26. ඝාතනාගාරයට අනුයුක්ත ඝාතකයන්, ඔවුන්ගේ සහායකයන්, මහා නගර සභා නිලධරයන් සහ බලයලත් අයවළුන් පමණක් සතුන් ඝාතනය කිරීමේ, හම ගැසීමේ හෝ මස් කිරීමේ යනාදි ක්‍රියාවලියන් සඳහා පරිශ්‍රයට අනුමත කළ යුතු ය.

27. ඝාතකයන් හෝ ඔවුන්ගේ සහායකයන් විසින් ඝාතනාගාරයෙහි දමා යන සියළු අවමස් ද, බඩවැල් හෝ වෙනත් කුණු කසල ද, සත්ව අවමස් අපද්‍රව්‍ය ලෙසින් කටයුතු කර විසඳාලිය යුතු ය.

28. අධීක්ෂකයාගේ අනුමැතියක් නොමැතිව නියම කර ඇති පැය ගණන්වලට පසුව ඝාතනාගාරයේ දමා තිබෙන සම්, අවමස්, බොකු, බඩවැල් හෝ වෙනත් කුණු කසල අත්හරින ලද දේවල් සේ සළකා මහා නගර සභාවේ දේපළ බවට පත් කළ යුතු ය. මහා නගර සභාව සුදුසු යැයි අදහස් කරන ආකාරයට ඒ සම්බන්ධව කටයුතු කර විසඳාලිය හැකි ය.

29. ඝාතනාගාර අධීක්ෂකයා හෝ ඉහත කී පරිදි බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තෙකු විසින් පරීක්ෂා කරන ලද සියළු එළුවන්, ගවයන් යනාදි සතුන් පිළිබඳ විස්තර සහ ඔවුන්ගේ හණ නිවරණ ද මහා නගර සභාව විසින් අනුමත කළ ආකෘති පත්‍රයක් දැක්වෙන පරිදි වූ වෙනත් සියළු විස්තර ද ඇතුළත් ලේඛනයක් ඔහු විසින් පවත්වා ගෙන යා යුතු ය. එකී ලේඛනය ඉරුදින සහ රජයේ නිවාඩු දින හැර අනෙකුත් දිනවල ඝාතනාගාර කායාලයේ දී පස්වරු එකත් (1.00) පස්වරු හතරත් (4.00) අතර කාලය තුළ දී මහජනයාට බලාගත හැකි විය යුතු ය.

30. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද විශේෂ බලපත්‍රයක් ලබාගෙන නොමැතිව හෝ එකී බලපත්‍රයේ සාමාන්‍ය අර්ථයට පටහැනිව බලපත්‍රලත් ඝාතකයෙකු නොවන කිසිම තැනැත්තෙකු විසින් යම් ගවයෙකු, බැටළුවෙකු, එළුවෙකු හෝ ඌරෙකු ඝාතනාගාරයක ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන අතර මහා නගර සභාව විසින් යෝජනා සම්මතයෙන් තීරණය කරන ලද පරිදි වූ ගාස්තුවක් එකී එක් එක් විශේෂ බලපත්‍රයක් සඳහා ම අයකිරීම කළ යුතු ය.

ඉටු නොකළයුතු කාර්යයන් (31 - 44)

31. බලපත්‍රලත් එක් එක් ඝාතකයෙකු විසින් ඝාතකයෙකු වශයෙන් තමාගේ ව්‍යාපාරය හා සම්බන්ධ ඝාතනාගාරයෙහි සේවයෙහි නියුක්ත කිරීමට අපේක්ෂා කරන සේවකයන්ගේ නම්, මහා නගර සභා කාර්යාලයෙහි ලියාපදිංචි කළ යුතු අතර නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නිශ්චිත කරනු ලැබූ කිසියම් නමක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය. නැතහොත් ඒ වන විටත් ලියාපදිංචි කර ඇති අය අතුරෙන් කිසිවෙකුගේ නමක් අවලංගු කළ හැකි ය. එවැනි බලපත්‍රලත් ඝාතකයෙකු විසින් එසේ ලියාපදිංචි කරනු නොලැබූ හෝ එසේ නම අවලංගු කරනු ලැබූ කිසිම තැනැත්තෙකු සේවයේ නියුක්ත කිරීම හෝ සේවයෙහි තබා ගැනීම නොකළ යුතු ය.

32. යම් චර්ම රෝගයකින්, ලාදුරු රෝගයකින් හෝ ආසාදන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙකුට ඝාතනාගාරය තුළට අනුමත නොකළ යුතු ය.

33. රෝගීව සිටීම හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඝාතනය කිරීමට අන් ආකාරයකින් යෝග්‍ය නොවන බවට තීරණය කරනු ලබන කිසිම සතෙකු ඝාතනය කිරීමට ඒ වන විටත් අවසරපත්‍රයක් නිකුත් කර තිබුණත්, නැතත් එකී සතා ඝාතනය කිරීම, තහනම් කිරීම ඝාතනාගාර අධීක්ෂකයාට හෝ පශු වෛද්‍යවරයාට නීත්‍යානුකූල වන්නේ ය. ඒ සමඟ ම එවැනි සතෙකු කිසිම තැනැත්තෙකු විසින් ද ඝාතනය නොකළ යුතු ය.

34. රෝගී වූ එළුවන්, ගවයන් කිසිවක් ඝාතනාගාරයට රැගෙන ආ නොයුතු ය.

35. (i) නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිසක්, කිසිම තැනැත්තෙකු මහා නගර සභා බල ප්‍රදේශය තුළට පිටතින් ඝාතනය කරන ලද බැටළුවෙකු, එළුවෙකු, ගවයෙකු, ඌරෙකු හෝ ගොවිපළක ඇති කරන කුකුල්ලු වැනි කිසිම සතෙකුගේ මස් මහා නගර සභා බල ප්‍රදේශයට රැගෙන ආ නොයුතු ය.

එසේ වුව ද, වායුරෝධිත ලෙස සම්මුද්‍රිත ටින්වල ඇසුරු මස්වලට මේ වගන්තියේ මීට පූර්වයෙන් ඇති විධිවිධාන අදාල නොවිය යුතු ය.

(ii) මහා නගරසභා ආඥා පනතේ 145 වන වගන්තිය ප්‍රකාරව, මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඝාතනාගාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නොමැතිව කවර හෝ ස්ථානයක් කිසිම තැනැත්තෙකු ඝාතනාගාරයක් වශයෙන් පාවිච්චි කිරීම නොකළ යුතු ය. නගරාධිපතිවරයාගේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ අභිමතය මත, ඒ සඳහා අනුමැතිය ලබාදීම කළහැකි ය. නැතහොත් ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවා තැබීම හෝ නැවත පවරාගැනීමක් කළ හැකි ය.

(iii) බලපත්‍රලත් ඝාතකයෙකුට හෝ මේ කොටසේ 30 වන අතුරු ව්‍යවස්ථාවට අනුව විශේෂ වලංගු බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ නම් මිස, සතුන් ඝාතනය කිරීමට අනුමත නොකළ යුතු ය.

36. කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ මෙහි පහත සඳහන් කවර හෝ මසක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(අ) මහා නගර සභා බල ප්‍රදේශයෙන් පිටත දී ඝාතනය කරන ලද කිසිම බැටළුවෙකු, එළුවෙකු, ගවයෙකු, ඌරෙකු හෝ ගොවිපළක ඇති කරන කුකුල්ලු වැනි සතුන්ගේ මස්,

හෝ

(ආ) දිවයිනට ආනයනය කළ (ශීත කළ, හිමායික, ලුණු දැමූ දුම් ගැස් වූ හෝ අන්‍යාකාරයකින් පරිරක්ෂිත) කවර හෝ මසක්, ප්‍රධාන නාගරික පශු වෛද්‍යවරයා විසින් හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයෙකු විසින් හෝ පරීක්ෂා කර බලා එකී මස් මනුෂ්‍ය පරිභෝජනය සඳහා යෝග්‍ය බවට අනුමත කර ඇත්නම් මිස,

කෙසේ වුව ද, මෙම අතුරු ව්‍යවස්ථාවේ මීට ඉහතින් සඳහන් විධිවිධාන වායුරෝධිත ලෙස සම්මුද්‍රිත ටින් වල ඇසුරු මස් වලට අදාල නොවිය යුතු ය.

37. කිසිම තැනැත්තෙකු විසින් මහා නගර සභා ඝාතනාගාරයේ සිට හෝ වෙනත් ඝාතන ස්ථානයක සිට හෝ මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත වූ වෙළෙඳ පොළට හෝ වෙනත් ස්ථානයකට කවර හෝ සතෙකුගේ මස් හිරු එළියෙන්, දූවිල්ලෙන් සහ වැස්සෙන් සාර්ථකව ආරක්ෂා වන ආකාරයට සහ මහජනයාට නොපෙනෙන පරිදි ආවරණය සහිතව තැනූ එකී මස් මෝටර් වැන් රථයකින් ගෙන යන්නේ නම් මිස, ඉවත් කිරීම හෝ ඉවත් කිරීමට අනුමත කිරීම හෝ කරවීම හෝ නොකළ යුතු ය. එසේ ම තැනින් තැනට ගෙන යාමේ දී, කවර හෝ සතෙකුගේ සමක් හෝ සම් කිසිම තැනැත්තෙකු විසින් නිරාවරණය කිරීමට සැළැස්වීම නොකළ යුතු ය.

38. ගෝ ඝාතක ආඥා පනතේ (473 වන අධිකාරය වන) එළුවන්, ගවයන් හණ සලකුණු කිරීම, විකිණීම සහ පැවරීම පිළිබඳ වූ උපලේඛනයේ නිර්දේශිත ආකෘති පත්‍රය, එකී බලපත්‍රලත් ඝාතකයා ඔහුට හිමි සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, එකී සතා ඝාතකයාට විකිණීමට කැමැත්තෙන් සිටින තැනැත්තා, ඝාතකයා ද සමඟ ඝාතනාගාර අධීක්ෂකයා හමුවට ඉදිරිපත් වී, ඔහුට හිමි ඒ හා සමාන සහතිකයක් ඉදිරිපත් කර, ඝාතකයාට විකිණීමට තමා සූදානමින් සිටින බව අත්සන් කරන ලද එළිකිරීමක් ඉදිරිපත් කළහොත් මිස, එළුවන්, ගවයන් ඝාතනය කිරීම සඳහා අවසරපත්‍ර කිසිවක් නිකුත් නොකළ යුතු ය.

39. ඝාතනය සඳහා ඉදිරිපත් කරන ලද සතා සම්බන්ධයෙන් නිකුත් නොකරන ලද හෝ යම් විස්තරයක් සාවද්‍ය වන්නා වූ හෝ එහි වූ පිළිතුරු එකී සතා කුමන සතෙකු යන්න පෙන්නුම් කරන්නේ ද, එකී සතාගේ විස්තරයන් සමගත්, හණ නීවරණ වලට සර්වප්‍රකාරයෙන් ම අනුකූල නොවන සටහන් සමගත් ඝාතන අවසර පත්‍රයක් ලබාගැනීමේ අරමුණට අවශ්‍ය වන යම්කිසි සහතිකයක් ඉදිරිපත් කිරීම කවර හෝ බලපත්‍රලත් ඝාතකයාට හෝ වෙනත් තැනැත්තෙකුට නීත්‍යානුකූල නොවන්නේ ය. එවැනි යම් සතෙකු, එකී සතා ගෙන ආ තැනැත්තා විසින් වහාම ඉවත් කර ගෙන යායුතු අතර ඝාතනාගාර පරිශ්‍රය තුළට අනුමත කිරීමක් නොකළ යුතු ය.

40. ඝාතනාගාරයට අයවිය යුතු සියළු ගාස්තු හා වියදම් ගෙවන තෙක්, ඝාතනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කර ඇති කවර හෝ සතෙකු කිසිම තැනැත්තෙකු ඝාතනය නොකළ යුතු අතර ගෙවනු නොලැබූ අවස්ථාවක එකී සතා සම්බන්ධයෙන් මේ කොටසේ 19 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කටයුතු කළ යුතු ය.

41. කිසිම තැනැත්තෙකු ප්‍රසිද්ධ ඝාතනාගාරයක ඝාතනය කළ කවර හෝ සතෙකුගේ මස්, හම්, බඩවැල් හෝ අවමස් කිසිවක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කළ ආකෘතියක වූ ද, ඝාතනාගාර අධීක්ෂකයා හෝ එකී අවසරපත්‍ර නිකුත් කිරීමට පත් කරන ලද වෙනත් නිලධාරියෙකු විසින් හෝ අත්සන් කර ඇත්තා වූ ද, අවසර පත්‍රයක් ඇතිව මිස, ඉවත් කරගෙන නොගිය යුතු ය.

42. කිසිම සුනඛයෙකු ඝාතනාගාරය තුළට ගෙන ඒමට ඉඩ නොදිය යුතු අතර, සුනඛයෙකු අයිතිකරු හෝ භාරව සිටින කවර හෝ තැනැත්තෙකු යම් ඝාතනාගාරයකට එකී සුනඛයා ගෙන ඒම හෝ ඇතුළ්වීමට අනුමත නොකළ යුතු ය. ඝාතනාගාරයක සිට හමුවන සියළුම සුනඛයින්, දඩාවතේ යන සුනඛයින් ලෙස සළකා කටයුතු කිරීමට පොලිස් නිලධරයන්ට භාර දිය යුතු ය.

43. කිසිම බලපත්‍රලත් ඝාතකයෙකු හෝ ඝාතකයෙකු ලියාපදිංචි කළ යම් සේවකයෙකු හෝ ඝාතනාගාරය තුළට පැමිණීමට ඉඩ දෙන ලද වෙනත් යම් තැනැත්තෙකු හෝ විසින් ඝාතනාගාරය තුළ යම් ශබ්ද නැගීම, කෝලාහල හෝ දබර කිරීම, අපහාසාත්මක, අපවාදාත්මක හෝ අශිෂ්ඨ වචන පාවිච්චි කිරීම නොකළ යුතු අතර මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කරන යම් තැනැත්තෙකුව ඝාතනාගාර අධීක්ෂකයා විසින් හෝ ඔහුගේ සහායකයන් විසින් ඝාතනාගාරයෙන් පිටමං කරනු ලැබිය හැකිය.

44. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද විශේෂ බලපත්‍රයක් නොමැතිව,මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ බලපත්‍රලත් ඝාතකයෙකු නොවන කවර හෝ තැනැත්තෙකුට, යම්කිසි එළුවෙකු, ගවයෙකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන අතර විශේෂ

බලපත්‍රයක් ලබාගන්නා ලද කවර හෝ තැනැත්තෙකු විසින් එකී බලපත්‍රයෙහි නාමය සඳහන් කර ඇති ස්ථානයේ දී හැර හෝ එහි දැක්වෙන යම් කොන්දේසියක් යටතේ හැර එකී ඝාතනය සිදු නොකළ යුතු ය.

45. ප්‍රසිද්ධ ඝාතනාගාරයක ඝාතනය කළ සතුන්ගේ මස් පමණක්, මස් වෙළෙඳ සැල් වල විකිණීම් කරනු ලබන සහතික කිරීම පරීක්ෂා කිරීමට, නිසි බලධාරියා විසින් බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. — මහා නගර සභාවේ කාර්ය භාරය

46. මහා නගර සභාවෙන් කලින් කල තීරණය කරනු ලබන ගාස්තු, මෙම අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් ආකාරයේ මහා නගර සභාවට එක් එක් සතෙකු ඝාතනය කිරීමට පෙර ගෙවීම් කළ යුතු ය. — අයකිරීම් හා ගාස්තු

47. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට හෝ පශු වෛද්‍යවරයාට හෝ මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය. — බලය පැවරීම

48. සතුන් ඝාතනය කිරීම පිණිස නිකුත් කරනු ලබන අවසරපත්‍ර, නිකුත් කළ දිනයේ සිට දවස් හතකට වලංගු වේ. — බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

49. මෙම අතුරු ව්‍යවස්ථාවලින් විධානය කරනු ලැබ ඇති නියමයන්,නිසි කාලය තුළ අදාල ස්ථානය පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය. — පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය

50. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය. — පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

51. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේය. — අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

52. (i) මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය. — දඩ හා දණ්ඩන

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවලින් ඇතුළත්ව මේ කොටසේ 35 වන අතුරු ව්‍යවස්ථාවේ II වන වගන්තියෙහි ප්‍රකාරව විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 145 වන හා 146 වන වගන්තියෙහි සඳහන් දඩයකට යටත් විය යුතු ය.එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 145 වන හා 146 වන වගන්තියෙහි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

53. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''නගරාධිපතිවරයා" යන්නෙන්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නිසි බලධාරියා" යන්නෙන්,මහා නගර සභාවේ නගරාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සළකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥා පනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

''මහා නගර සභාව" යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සළකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා" යන්නෙන්, තත් කාර්යය සදහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය" යන්නෙන්, එකී ස්ථානයේ රැකියා කටයුතු හෝ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''පශු වෛද්‍ය අධිකාරී"යන්නෙන්,මහා නගර සභාවේ පශු වෛද්‍ය නිලධාරියා අදහස් වේ.

-සතා"යන්නෙන්,සිවුපාවුන්, බැටළුවා, එළුවා, ඌරා, මුහුදු ඉබ්බා අදහස් වේ.

''සිවුපාවුන්" සහ - බලපත්‍රලත් ඝාතකයා"යන්නෙන්,ඝාතක ආඥා පනතේ ක්‍රමවේදයේ ඊට දී ඇති අර්ථය ම අදහස් වේ.

*V වන කොටස - මහා නගරසභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම,අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. මහා නග රසභා ආඥාපනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනයකර ඇත.

3. (201 වන අධිකාරය ගෝ ඝාතක ආඥා පනත සමඟ, මහා නගර සභා ආඥා පනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272(8)(ඇ) වන උපවගන්තිය යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත. අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

4. ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍රයක් ලබාගැනීමට අයදුම් කරනු ලබන වෙළෙඳ සැල මෙහි පහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. ඉටු කළයුතු කාර්යයන් (4 - 15)

(i) විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය බිම් ගඩොල් (පිඟන් ගඩොල්)අල්ලා හෝ සිමෙන්තියෙන් කපරාරු කර හෝ මල නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

(ii) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම, සිමෙන්තියෙන් කපරාරු කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(iii) මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ කවුළු විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය.කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(v) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල (සීලිමක්)සවිකර තිබිය යුතු අතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර, පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක්වත් තිබිය යුතු ය.

(vii) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්లූ කාණු තිබිය යුතු ය.

(viii) ඉහත (vii) වන වගන්තියේ සඳහන් කාණු තුළින් ගලාගෙන යන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාම වැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සළස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වළකට ගලායෑමට ඉඩ සළස්වා තිබිය යුතු ය.

(ix) අපජලය ගලායාමට සළස්වන ලද උරාගන්නා වල, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් ආවරණය කර තිබිය යුතු ය.

(x) මස් අලෙවි ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායනික අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරු ඇති වලක වැළලීමට හෝ මහා නගර සභාව විසින් කලින් කල තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව මහා නගර සභාවේ කුණු කසල රැස්කරන වාහනයට භාරදීමට කටයුතු කළ යුතු ය.

(xi) වෙළෙඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

(xii) එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, අඩුම වශයෙන් එක් පඩික්කමක්වත් පරිශ්‍රයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි බලපත්‍රලත් පරිශ්‍රයේ තැබීමට සැළැස්විය යුතු ය.

(xiii) එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, පරීක්ෂණය සඳහා බලපත්‍රලත් ස්ථානයෙන් පිටත තරාදියක ස්වරූපයෙන් ''තමන්ගේ නමත්'','' බලපත්‍රලත් මස් අලෙවි සැල'' යන වාක්‍ය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් සවිකර තිබිය යුතු ය.

(xiv) එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, මස් වෙළෙඳුන් ඇතුළුව සියළුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක්, පරීක්ෂණය සඳහා බලපත්‍රලත් ස්ථානයේ තබාගත යුතු ය.

(xv) යටත් පිරිසෙයින් අවුරුද්දකට සිව්වරක්වත්, ඒ සමග නාගරික කොමසාරිස්වරයා විසින් ලිඛිතව නියම කරනු ලැබිය හැකි පරිදි, එකී වෙනයම් වේලාවන්හි දී ද, එක් එක් මස් වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, වෙළෙඳ සැලෙන් කොටසක් වන එක් එක් කාමරයක ම බිත්ති, පිඟන් ගඩොල් අල්ලා හෝ සිමෙන්ති කපරාරු කර ඇති එකී කොටස් හැර, හුණු පිරියම් කිරීමට ද, ලීයෙන් කළ සියළු කොටස් පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආලේප කර ඇත්නම්, සබන් ගා උණු දියෙන් සේදීමට ද සැලැස්විය යුතු ය.

5. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම ද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද, මස් කැපීම සඳහා ගන්නා කොටය ද, උපකරණ ද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන විෂබීජනාශක දියර යොදා පිරිසිදු කිරීමට සැළැස්විය යුතු ය.

6. මැස්සන්, කෘමීන් හෝ වෙනත් කවර සතෙකුට ඇතුළ්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් කවර හෝ මසක් ප්‍රවාහනය නොකළ යුතුවාක් හැර, එකී මස් ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මස් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චිකළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජන විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක සහ එහි අවට ඇති කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියළු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබාගැනීමට සැළැස්විය යුතුය.

8. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුළ්විය නොහැකි ආකාරයෙන් තබා ගත යුතු ය.

9. බලපත්‍රලත් මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම් සහ වෙනත් අවශ්‍ය ආරක්ෂිත පැළඳුම් සපයා තිබිය යුතු අතර, එකී සේවකයන් මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම්පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සියලුම සේවකයින් සඳහා ම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

12. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවහායන අපද්‍රව්‍ය;

(ආ) වීදුරු;

(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය;

(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්ත

(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවනකොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්;

(උ) අන්තරායකර අපද්‍රව්‍ය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

13. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා, මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් ඔහුට කරනු ලබන ඉල්ලීම් මත, ඝාතනාගාරයේ සිට මස් වෙළෙඳ සැල වෙතට මස් ගෙන යෑමෙහි දී එකී බලපත්‍රලාභීයා විසින් සේවයේ නියුක්ත කරවන ලද එක් එක් තැනැත්තෙකුගේ ම ප්‍රයෝජනය සඳහා නොමිලේ ලියාපදිංචි කළ කාඩ්පත් නිකුත් කරනු ලැබිය යුතු ය.

14. සියළුම මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් බලපත්‍රලත් ස්ථානයේ බීමට සුදුසු ප්‍රමාණවත් ජලය ලබාදිය යුතු ය.

15. සියළුම මස් වෙළෙඳ සැල් බලපත්‍රලාභීන්, බලපත්‍රලත් ස්ථාන හෝ වෙළෙඳ ස්ථාන ශ්‍රී ලංකා රජයෙන් හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් වසා තැබිය යුතු යැයි නිශ්චය කරනු ලබන දවස් හැර සෙසු සෑම දවසක ම විවෘතව කර තැබිය යුතු අතර විවෘතව කර තබන වේලාවන් සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා විය යුතු ය.

16. කවර හෝ තැනැත්තෙකු,වෙළෙඳ පොළ නොවන වෙනත් කිසියම් ස්ථානයක නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස,මස් විකිණීම පිනිස යම් ස්ථානයක් පාවිච්චි කිරීම නොකළ යුතු ය. ඉටු නොකල යුතු කාර්යයන් (16 - 25)

17. කිසිම මස් වෙළෙඳ සැලක බලපත්‍රලාභීයෙකු, මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ ද, (201 වන අධිකාරය) ගෝ ඝාතක ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ යථා පරිදි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ද, ප්‍රසිද්ධ ඝාතනාගාරයක හෝ එකී ආඥා පනතේ 11 වන වගන්තිය යටතේ නිසි බලධාරියා විසින් තත් කාර්යය සඳහා නියම කරන ලද ස්ථානයක හෝ එකී ආඥා පනතේ 14 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසරපත්‍රයක් යටතේ හෝ ඝාතනය කරනු ලැබූ සතුනගේ මස් නොවන කිසියම් මසක් බලපත්‍රලත් වෙළෙඳ සැලේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය හෝ නොකළ යුතු ය. එසේ ඝාතනය කරනු ලබන මස් හඳුනා ගැනීම සඳහා නාගරික පශු වෛද්‍ය නිලධාරියා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියෙකු හෝ අනුමත මුද්‍රාවක් තැබිය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකි ශේෂ වන මස් අධිශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කල අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළෙඳ සැල විවෘතකරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස, ශේෂ වන කවර හෝමසක් ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධිශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබාගැනීම නොකළ යුතු ය.

19. කිසිම තැනැත්තෙකු බලපත්‍රලත් ස්ථානයේ කුමන කාරණාවක් වුව ද, කවර හෝ සත්ත්වයෙකු හෝ පක්ෂියෙකු තබාගැනීම නොකළ යුතු ය.

20. කිසිම තැනැත්තෙකු අදාල කාර්යය සඳහා නියම කර ඇති පඩික්කම ඇතුලේ හැර, මස් වෙළෙඳ සැල තුළ කෙළ නොගැසිය යුතු ය.

21. කිසිම තැනැත්තෙකු මහා නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ මසක් තැනින් තැනට ගෙන යමින් විකුණුම්කිරීම නොකළ යුතු ය.

22. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ සැලක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු ය.

23. කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේ සඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

24. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකු ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

25. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර, කිසිම භාජනයක් හෝ ඇඳුමක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්ය භාරය (26 - 27)

26. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් අලෙවි ස්ථානයෙහි විකිණීමටතබා ඇති හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝඇතුළත ගබඩාකර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

27. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

28. කිසියම් මස් අලෙවි ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තෘව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නිත්‍යානුකූල වන්නේ ය.

බලය පැවරීම

30. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

31. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන්, නිසි කාලය තුළබලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (31 - 34)

32. නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමටනගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

33. මේ කොටසේ 27 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

34. මේ කොටසේ 33 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

35. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

36. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීමවරදක්වන්නේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

36. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වූ වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

දඩ හා දණ්ඩන

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

අර්ථ නිරූපනය හා නිර්වචන

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්,මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය'' යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''මස් කඩ හෝ මස් අලෙවි ස්ථානය'' යන්නෙන්,මස් විකිණීමට හෝ විකිණීමට ප්‍රදර්ශනය කරන ස්ථානය හෝ යම් ඉඩමක, කඩයක විකිණීමටගබඩා කර ඇති ස්ථානය අදහස් වේ.

''මස්'' යන්නෙන්, ගව මස්, එළු මස්, ඌරු මස් යනුවෙන් අදහස් වේ.

ඇමුණුම.01

**මහා නගර සභාව බල ප්‍රදේශය තුළ මස් වෙළෙඳ සැලක් පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20 ................................ වර්ෂය**

1. මස් වෙළෙඳ සැලේ නමඃ ............................................................
2. මස් වෙළෙඳ සැල පිහිටා ඇති ස්ථානයඃ

(i) කොට්ඨාශයඃ .................................................... වරිපනම් අංකය : ......................................................................

(ii) වීථියේ/ පාරේ නම : .........................................................................

(iii) ග්‍රාම නිලධාරිඃ- කොට්ඨාශඅංකය . : .........................................................................
කොට්ඨාශයේ නම : .........................................................................

3. අයදුම්කරුගේ :

(i) සම්පූර්ණ නම : .........................................................................

(ii) ස්ථිර ලිපිනය : .........................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : .........................................................................

(iv) ජාතික හැඳුනුම්පතේ අංකය : .........................................................................

(v) දුරකථන අංකය :...........................................................................

(vi) විද්‍යුත් තැපැල් ලිපිනය :........................................................................

4. (i) මස් වෙළෙඳ සැල ආරම්භ කළ දිනය :........................................................................

(ii) මස් වෙළෙඳ සැලේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :

(අ) නම:.......................................

(ආ) දුරකථන අංකය:.......................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් :

(i) අයිතිකරුගේ නම : ........................................................................

(ii) ලිපිනය : ........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබගෙන තිබේද? ඔව් ................................................ නැත .....................................................
ඔව් නම් : බලපත්‍රය අංකය : ...................................... දිනය : ................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. කර්මාන්තය/වෙළෙඳම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 .............................................. වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

..........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිනිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශයඃ................................... වරිපනම් අංකයඃ................................................................................................

වීථියේ/පාරේ නම :........................................................................

අයිතිකරුගේ නම :........................................................................

දේපලෙහි ස්වභාවය :........................................................................

වාර්ෂික වටිනාකමඃ........................................................................

හිඟ වරිපනම් මුදලඃ........................................................................ ඇතඃ.......................................... නැතඃ................................................

.

..............................................................
පරිපාලන නිලධාරි.

දිනය : ........................................

**ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවයඃ..........................................................................

ගෙවිය යුතු ගාස්තුවඃ..........................................................................

ඒකකය A B C ඃ..........................................................................

සටහන් ඃ..........................................................................

..................................................................

ආදායම් පරීක්ෂක.

දිනය ඃ ........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්‍ෂකගේ වාර්තාව ඃ

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය ඃ ........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................................

..........................................................................

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය ඃ ........................................

**ප්‍රධාන ආදායම් පරීක්‍ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුමඃ ..........................................................ව්‍යාපාරයේ ස්වභාවයඃ..........................................................................................................

පාරිසරික බලපත්‍රඃ.......................................................... MOH වාර්තාව......................................................................................අනුකූලතා

සහතිකය : ........................................................... මත්පැන් බදු බලපත්‍ර:..............................................................................................
පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

..........................................................................
ප්‍රධාන ආදායම් පරීක්ෂක.

දිනය : ...........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

..................................................................................
ගණකාධිකාරී.

දිනය : ...........................................................

අනුමත කරමි. / නොකරමි.

....................................................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ...........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය:............................................................................ ලදුපත් දිනය :.........................................................................................
බලපත්‍ර අංකය : ..................................................................................... බලපත්‍ර දිනය : .............................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

...............................................................................
ආදායම් පරිපාලන නිලධාරී

දිනය : ...........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

.............................................................................

ගණකාධිකාරී

දිනය : ...................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

...................................................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ...................................................

*VI වන කොටස - මහා නගරසභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා.*

අතුරු ව්‍යවස්ථාවේ නාමය

1. මහා නගර සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම විධිමත් කිරීම, නියාමනය කිරීම,අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබිය හැකිය.

අරමුණ

2. මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහා නගරසභා බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ආරක්‍ෂා කිරීමේ අරමුණින් මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

අතුරු ව්‍යවස්ථාව සම්පාදනය සඳහා වූ නෛතික ප්‍රතිපාදන

3. මහා නගර සභා ආඥාපනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු 272(8)(ඇ) වන සහ 19 වන උපවගන්ති යටතේ මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ඇත.

ඉටු කළයුතු කාර්යයන් (4 - 15)

4. ඇමුණුම.01හි දැක්වෙන අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් බලපත්‍රයක් ලබාගැනීමට අයදුම් කරනු ලබන වෙළෙඳ සැල මෙහිපහත දැක්වෙන නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් පමණක්, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළුවෙළෙඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(i) විකිණීම සඳහා මාළු ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය, පිඟන් ගඩොල් අල්ලා හෝ සිමෙන්තියෙන් කපරාරු කර හෝ මල නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

(ii) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම, සිමෙන්තියෙන් කපරාරු කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(iii) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ එක් එක් කාමරයකට ම පිටතට හෝ පාර්ශ්විකව විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු ය. ඒ එක් එක් කාමරයේ කවුළු

විවෘත කළ විට ඒ කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය.කෙසේ වුව ද, කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාල නොවිය යුතු ය.

(iv) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම බිත්ති මීටර් තුනකට නොඅඩු උසකින් යුක්ත විය යුතු ය.

(v) බලපත්‍රලත් ස්ථානයේ එක් එක් කාමරයක ම ඇතුල් වහල (සීලිමක්)සවිකර තිබිය යුතුඅතර එකී ඇතුල් වහල පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 3.0කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(vi) වහලය කිසියම් ස්ථිර ඝණ ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට උසින් පිහිටා තිබිය යුතුය. අගු පියසි පළල අවම වශයෙන් මීටර් 1.0ක්වත් තිබිය යුතු ය.

(vii) අපජලය ගලායාම පහසුකිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල්ඇල්ලූ කාණු තිබිය යුතු ය.

(viii) ඉහත (vii) වන වගන්තියේ සඳහන් කාණු තුලින් ගලාගෙන යන අපජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමවැලැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී අපජලය උරා ගන්නා වළකට ගලායෑමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ix) අපජලය ගලායාමට සලස්වන ලද උරාගන්නා වළ, මාර්ගය සම්බන්ධ නොවන ආකාරයෙන් ආවරණය කර තිබිය යුතු ය.

(x) මාළු අලෙවි ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායනික අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර, දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5ක් ගැඹුරු ඇති වලක වැළලීමට හෝ මහා නගර සභාව විසින් කලින් කල තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව මහා නගර සභාවේ කුණු කසල රැස්කරන වාහනයට භාරදීමට කටයුතු කළ යුතු ය.

(xi) වෙළෙඳ ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයාතිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

(xii) එක් එක් මාළු වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, අඩුම වශයෙන් එක් පඩික්කමක්වත් පරිශ්‍රයේ සේවයේ නියුක්ත කර ඇති තැනැත්තන්ට පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි පරිදි බලපත්‍රලත් පරිශ්‍රයේ තැබීමට සැලැස්විය යුතු ය.

(xiii) එක් එක් මාළු වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, පරීක්ෂණය සඳහා බලපත්‍රලත් ස්ථානයෙන් පිටත තරාදියක ස්වරූපයෙන් ''තමන්ගේ නමත්'', ''බලපත්‍රලත් මස් අලෙවි සැල'' යන වාක්‍ය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂා වලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් සවිකර තිබිය යුතු ය.

(xiv) එක් එක් මාළු වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, මාළු වෙළෙඳුන් ඇතුළුව සියළුම සේවා නියුක්තයන්ගේ නම්, ලිපින යනාදිය ඇතුළත් ලැයිස්තුවක් පරීක්ෂණය සඳ ලපත්‍රලත් ස්ථානයෙහි තබාගත යුතු ය.

(xv) යටත් පිරිසෙයින් අවුරුද්දකට සිව්වරක්වත්, ඒ සමඟ නාගරික කොමසාරිස්වරයා විසින් ලිඛිතව නියම කරනු ලැබිය හැකි පරිදි, එකී වෙනයම් වේලාවන්හි දී ද, එක් එක් මාළු වෙළෙඳ සැලේ බලපත්‍රලාභියෙකු ම, වෙළෙඳ සැලෙන් කොටසක් වන එක් එක් කාමරයක ම බිත්ති, පිඟන් ගඩොල් අල්ලා හෝ සිමෙන්ති කපරාරු කර ඇති එකී කොටස් හැර, හුණු පිරියම් කිරීමට ද, ලීයෙන් කළ සියළු කොටස් පිරියම් කිරීමට හෝ තෙල් සායම් ආලේප කර ඇත්නම්, සබන් ගා උණු දියෙන් සේදීමට ද සැලැස්විය යුතු ය.

5. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම ද, බිත්තිවල පිඟන් ගඩොල්ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද,මාළු කැපීම සඳහා ගන්නා කොටය ද, උපකරණ ද, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන විෂබීජ නාශක දියර යොදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

6. මැස්සන්, කෘමීන් හෝ වෙනත් කවර සතෙකුට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයකහෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින්කවර හෝ මාළු වර්ගයක් ප්‍රවාහනය නොකළ යුතුවාක් හැර, එකී මාළු ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මාළු ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චිකළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජන විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළෙඳ ස්ථානයක සහ එහි අවට ඇති කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හාසම්බන්ධව පාවිච්චි කරන සියළු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබාගැනීමට සැලැස්විය යුතුය.

8. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි ආකාරයෙන් තබා ගත යුතු ය.

9. බලපත්‍රලත් මාළු වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත එක් එක් සේවකයෙකු වෙතම ආරක්ෂිත මුඛ වැසුම්, අත් වැසුම් සහ වෙනත් අවශ්‍ය ආරක්ෂිත පැළඳුම්සපයා තිබිය යුතු අතර එකී සේවකයන් මාළු වෙළෙඳ ස්ථානයේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම්පැළඳ සිටින බවට සහතික කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සියලුම සේවකයින් සඳහා ම පිරිසිදු පානීය ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතු ය.

12. (i) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත ප්‍රතිචක්‍රීකරණයට ගන්නේ නම්, එකී අපද්‍රව්‍ය පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) ජෛවහායන අපද්‍රව්‍යය;
(ආ) වීදුරු;
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍යය;
(ඈ) පොලිතීන්,ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍යය;
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍යය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවනකොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍යය හෝ කොටස්;
(උ) අන්තරායකර අපද්‍රව්‍යය;

යන ආකාරයෙන් වර්ග කර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍යය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

(ii) ඉහත (i) වන වගන්තියේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතුය.

13. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා, මාළු වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් ඔහුට කරනු ලබන ඉල්ලීම් මත, සාතනාගාරයේ සිට මාළුවෙළෙඳ සැල වෙතට මාළු ගෙන යැමෙහි දී එකී බලපත්‍රලාභියා විසින් සේවයේ නියුක්ත කරවන ලද එක් එක් තැනැත්තෙකුගේ ම ප්‍රයෝජනය සඳහා නොමිලේ ලියාපදිංචි කළ කාඩ්පත් නිකුත් කරනු ලැබිය යුතු ය.

14. සියළු ම මාළු වෙළෙඳ සැල් බලපත්‍රලාභීන් විසින් බලපත්‍රලත් ස්ථානයේ බීමට සුදුසු ප්‍රමාණවත් ජලය ලබාදිය යුතු ය.

15. සියළුම මාළු වෙළෙඳ සැල් බලපත්‍රලාභීන්, බලපත්‍රලත් ස්ථාන හෝ වෙළෙඳ ස්ථාන ශ්‍රී ලංකා රජයෙන් හෝ නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයාවිසින් වසා තැබිය යුතු යැයි නිශ්චය කරනු ලබන දවස් හැර සෙසු සෑම දවසක ම විවෘතව කර තැබිය යුතු අතර විවෘතව කර තබන වේලාවන් සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා විය යුතු ය.

16. කවර හෝ තැනැත්තෙකු,වෙළෙඳ පොළ නොවන වෙනත් කිසියම් ස්ථානයක නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස,මාළු විකිණීම පිනිස යම් ස්ථානයක් පාවිච්චි කිරීම නොකළ යුතු ය. ඉටු නොකල යුතු කාර්යයන් (16 - 25)

17. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකි ශේෂ වන මාළු අධිශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කල අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළෙඳ සැල විවෘතකරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවති තිබුණේ නම් මිස, ශේෂ වන කවර හෝ වර්ගයකට අයත් මාළු ඊළඟ දිනයේ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධිශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබාගැනීම නොකළ යුතු ය.

18. කිසිම තැනැත්තෙකු බලපත්‍රලත් ස්ථානයේ කුමන කාරණාවක් වුව ද, කවර හෝ සත්ත්වයෙකු හෝ පක්ෂියෙකු තබාගැනීම නොකළ යුතු ය.

19. කිසිම තැනැත්තෙකු අදාල කාර්යය සඳහා නියම කර ඇති පඩික්කම ඇතුලේ හැර, මාළු වෙළෙඳ සැල තුළ කෙළ නොගැසිය යුතු ය.

20. සංචාරක වෙළෙඳාම සඳහා බලපත්‍ර ලබාගෙන මාළු වෙළෙඳාම් කරනු ලබන තැනැත්තන් විසින් මාළු විකිණීමේ දී, තමා විසින් ශුද්ධ කරනු ලබන මාළු වල අපද්‍රව්‍ය පාර අසබඩ හෝ වෙනත් ප්‍රසිද්ධ ස්ථාන වල නොදැමිය යුතු අතර එම අපද්‍රව්‍ය සියල්ලම නිසි පරිදි බැහැර කරලීමට කටයුතු කළ හැකි ය.

21. කවර හෝ තැනැත්තෙකු නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලබාගන්නා ලද බලපත්‍රයක් නොමැතිව, මහා නගර සභා බල සීමාව තුළ සංචාරක මාළු වෙළෙඳාම කළ නොහැකි ය. ආවරණය කළ වාහනයක හෝ ආවරණය කළ වෙනත් යෝග්‍ය භාජනයක හැර, තමාගේ බලපත්‍රලත් ස්ථානයත් වෙළෙඳාම සඳහා මාළු කිසිවක් ප්‍රවාහනය කිරීමට කවර හෝ මාළු වෙළෙඳ සැල් බලපත්‍රධාරියෙකු විසින් කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතු ය. එවැනි සෑම වාහනයක්, කූඩයක්, බෙලෙක්කයක් හෝ වෙනත් භාජනයක් සෑම විටම පිරිසිදුව සහ යහපත් තත්ත්වයෙන් පවත්නා බවට බලපත්‍රධාරියා වගබලාගත යුතු ය.

22. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ මාළු වෙළෙඳ සැලක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු ය.

23. කිසියම් ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ සඳහා වෛද්‍ය වාර්තාවේසඳහන් කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, ඉහත කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීමට හෝ නියුක්ත කරවීමට ඉඩදීම නොකළ යුතු ය.

24. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් ඇඳ නොමැති කවර හෝ තැනැත්තෙකු ව, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක ඔහුව නියුක්ත කරවීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

25. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර, කිසිම භාජනයක් හෝ ඇඳුමක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

මහා නගර සභාවේ කාර්ය භාරය (26 - 27)

26. නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් මාළුඅලෙවි ස්ථානයෙහි විකිණීමටතබා ඇති හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩාකර ඇති යම් මාළු වර්ගයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

27. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයට බලපත්‍රලාභියා, මෙම අතුරු ව්‍යවස්ථා වල කවර හෝ නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදිය යුතු ය.

අයකිරීම් හා ගාස්තු

28. කිසියම් මාළු අලෙවි ස්ථානයක් පවත්වා ගෙනයාම සඳහා මහා නගර සභා ආඥා පනතේ 247අ(2) වන උපවගන්තියට අනුකූලව උපරිම ගාස්තුව නොඉක්මවන ආකාරයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් අයකිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

බලය පැවරීම

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වලින් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීම නීත්‍යානුකූල වන්නේ ය.

බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ වලංගු කාලය

30. මෙම අතුරු ව්‍යවස්ථාවන් යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහාද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් විය යුතුය.

පරීක්ෂණ ක්‍රියා පටිපාටිය හා අධිකාරය (31 - 34)

31. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන්, නිසි කාලය තුළබලපත්‍රලත් ස්ථානයේ පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට බලය ඇත්තේ ය.

32. මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයක් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් නැවැත්වීමට බාධා කිරීමක් නොකළ යුතුය.

33. මේ කොටසේ 27 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කෙසේ වුව ද, ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතුය.

34. මේ කොටසේ 33 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට නීත්‍යානුකූල බලය ඇත්තේය.

පැමිණිලි හා පිලියම් යාන්ත්‍රණය

35. බලපත්‍රලාභියෙකු හෝ කවර හෝ තැනැත්තෙකු ලිඛිතව හෝ වාචික කිසියම් පැමිණිල්ලක් නගරාධිපතිවරයාට හෝ නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට ඉදිරිපත් කළ හැකි අතර, එම නිලධාරියා විසින් විධිමත් පරීක්ෂණයක් පවත්වා විසඳුම් ලබාදිය යුත්තේය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම

36. මෙම අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීමවරදක් වන්නේය.

දඩ හා දණ්ඩන

37. මෙම අතුරු ව්‍යවස්ථා වල ඇතුලත් කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම පිළිබඳ වු වරදක් සම්බන්ධව නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 252 වන අධිකාරය වු මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (අ),(ආ) හි සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසිබලය ඇති අධිකරණයක් විසින් වරදකට යම් තැනැත්තෙකු වරදකරු කිරීමෙන් අනතුරුව ඉහත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම තව දුරටත් කරගෙන යනු ලබන විටෙක ඉහත කී 267 වන වගන්තියෙහි 3 වන උපවගන්තියේ (ඇ) හි සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

අර්ථ නිරූපනය හා නිර්වචන

38. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''නගරාධිපතිවරයා''යන්නෙන්,පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද මහා නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස අදහස් වේ.

''නාගරික කොමසාරිස්වරයා'' යන්නෙන්, එය යම් මහා නගරයක් සම්බන්ධයෙන් වූ විට ඒ මහා නගරය සඳහා මහා නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මෙම මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තෙකුට, කොමසාරිස්වරයාගේ බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීම, ඉටුකිරීම හෝ කිරීම සඳහා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ බලය පවරනු ලැබේ. ඒ සභාවේ යම් නිලධාරියෙක්ද, ඒ නිලධාරියාට එසේ බලය පවරනු ලැබූ ප්‍රමාණය ද ඊට ඇතුලත් වේ.

''මහා නගර සභාව'' යන්නෙන්,මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරන ලදැයි සලකනු ලබන මහා නගර සභාව අදහස් වන්නේය.

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියෙක් අදහස් වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන්හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු වේ.

''බලපත්‍රලත් ස්ථානය'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ සෑම කටයුත්තක් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇති හා පාවිච්චි කරන ස්ථානය අදහස් වේ.

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය'' යන්නෙන්, එකී ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන ඕනෑම වේලාවක් යනුවෙන් අදහස් වේ.

''මාළු කඩ හෝ මාළු අලෙවි ස්ථානය" යන්නෙන්,මාළු විකිණීමට හෝ විකිණීමට ප්‍රදර්ශනය කරන ස්ථානය හෝ යම් ඉඩමක, කඩයක විකිණීමටගබඩා කර ඇති ස්ථානය අදහස් වේ.

ඇමුණුම.01

**මහා නගර සභාව බල ප්‍රදේශය තුළ මාළු වෙළෙඳ සැලක් පවත්වා ගෙනයාම සඳහා ව්‍යාපාරික බදු / වෙළෙඳ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය - 20..............................වර්ෂය**

1. මාළු වෙළෙඳ සැලේ නම: ....................................................................
2. මාළු වෙළෙඳ සැල පිහිටා ඇති ස්ථානය:

 (i) කොට්ඨාශය: .....................................................
 (ii) වීථියේ/ පාරේ නම : .........................................................................
 (iii) ග්‍රාම නිලධාරී:- කොට්ඨාශ අංකය . : .........................................................................
 කොට්ඨාශයේ නම : .........................................................................

3. අයදුම්කරුගේ :
 (i) සම්පූර්ණ නම : .........................................................................
 (ii) ස්ථිර ලිපිනය : .........................................................................
 (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය : .........................................................................
 (iv) ජාතික හැඳුනුම්පතේ අංකය : .........................................................................
 (v) දුරකථන අංකය :.........................................................................
 (vi) විද්‍යුත් තැපැල් ලිපිනය :.........................................................................

4. (i) මාළු වෙළෙඳ සැල ආරම්භ කළ දිනය :.........................................................................
 (ii) මාළු වෙළෙඳ සැලේ කළමනාකරුගේ/නියෝජිතයාගේ :
 (අ) නම:........................................
 (ආ) දුරකථන අංකය:.......................................

5. ගොඩනැගිල්ල කුලියට ලබාගෙන ඇත්තේ නම් :
 (i) අයිතිකරුගේ නම : .........................................................................
 (ii) ලිපිනය : .........................................................................

6. පසුගිය වසරේ බලපත්‍රය ලබගෙන තිබේද/ ඔව් ............................... නැත ...............................
 ඔව් නම් : බලපත්‍රය අංකය : ...................................... දිනය : ................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි. කර්මාන්තය/වෙළෙඳම පවත්වාගෙන යන ස්ථානය සඳහා 20 .............................................. වර්ෂය වෙනුවෙන් කර්මාන්ත/වෙළෙඳ බලපත්‍රයක් මා වෙත නිකුත් කරන ලෙස ඉල්ලමි. මේ පිළිබඳව පවත්නා නීතිරීති වලට මම එකඟ වෙමි.

.........................................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ..........................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පහත ඉදිරිපත් කළ පරිද්දෙන් වාර්තා කිරීම පිණිස

..........................................................................
නාගරික කොමසාරිස්වරයා/බලයලත්නිලධාරියා

**වරිපනම් අංශයේ වාර්තාව පිණිස**

කොට්ඨාශය:.......................................................... වරිපනම් අංකය:..................................................................................................

වීථියේ/පාරේ නම :.........................................................................
අයිතිකරුගේ නම :.........................................................................
දේපලෙහි ස්වභාවය :.........................................................................
වාර්ෂික වටිනාකම:.........................................................................
හිඟ වරිපනම් මුදල:......................................................................... ඇත:.............................. නැත:..............................

......................................................................
පරිපාලන නිලධාරී.

දිනය : .........................................

**ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

ව්‍යාපාරයේ ස්වභාවය:.........................................................................
ගෙවිය යුතු ගාස්තුව:.........................................................................
ඒකකය A B C :.........................................................................
සටහන් :.........................................................................

.........................................................................
ආදයම් පරීක්ෂක.

දිනය : .........................................

**ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව :
.............................................................................................................................................................................................
.............................................................................................................................................................................................
.............................................................................................................................................................................................
.............................................................................................................................................................................................

.....................................................................................
මහජන සෞඛ්‍ය පරීක්ෂක.

දිනය : .........................................

**සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව පිණිස**

.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................

.............................................................................
ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී.

දිනය : .........................................

**ප්‍රධාන ආදායම් පරීක්ෂක අංශයේ වාර්තාව පිණිස**

කුලී ගිවිසුම: ...........................................................ව්‍යාපාරයේ ස්වභාවය:..........................................................................................

පාරිසරික බලපත්‍ර:........................................................... MOH වාර්තාව...........................................................................................

අනුකූලතා සහතිකය : ........................................................... මත්පැන් බදු බලපත්‍ර:........................................................... පහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍රය නිර්දේශ කරමි. / නොකරමි.

.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................

.............................................................................
ප්‍රධාන ආදයම් පරීක්ෂක.

දිනය : ...........................................................

**ගණකාධිකාරීවරයාගේ නිර්දේශය**

බලපත්‍රය නිකුත් කිරීමට අනුමැතිය සඳහා නිර්දේශ කරමි.

.................................................................................
ගණකාධිකාරී.

දිනය : ...........................................................

අනුමත කරමි. / නොකරමි.

.........................................................................................
නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/
බලයලත් නිලධාරියා

දිනය : ...........................................................

**නානාවික ආදායම් අංශයේ වාර්තාව පිණිස**

ලදුපත් අංකය:................................................................................ ලදුපත් දිනය :...............................................................................

බලපත්‍ර අංකය : ................................................................................ බලපත්‍ර දිනය : ...............................................................................

බලපත්‍රය නිකුත් කිරීමට නිර්දේශ කරමි.

....................................................................................

ආදායම් පරිපාලන නිලධාරි

දිනය : ..........................................................

නාගරික කොමසාරිස්වරයාගේ අත්සනට ඉදිරිපත් කරමි.

..................................................................................

ගණකාධිකාරි

දිනය : ..........................................................

බලපත්‍රය අත්සන් කරන ලදී.

.....................................................................................

නගරාධිපතිවරයා/නාගරික කොමසාරිස්වරයා/

බලයලත් නිලධාරියා

දිනය : ..........................................................

02-493

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.